329 වන කාණ්ඩය - 04 වන කලාපය
தொகுதி 329 - இல. 04
Volume 329 - No. 04

2026 අගෝස්තු 21වන සිකුරාදා
2026 ஓகஸ்ட் 21, வெள்ளிக்கிழமை
Friday, 21th August, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 585]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 585]

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 590]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 591]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 592-645]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

"එක්ස්ප්‍රස් පර්ල්" ව්‍යසනය සඳහා වන්දි ලබා ගැනීමේ ප්‍රගතිය [තීරුව 645]

බැටරි බලශක්ති ගබඩා පද්ධතිය හඳුන්වා දීම හරහා පුනර්ජනනීය විදුලිය ප්‍රවර්ධනය කිරීම [තීරුව 648]

**පරිපූරක මුදල:**

සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සහ සමුපකාර සමිති හරහා 2026 යල කන්නයේ වී මිලදී ගැනීම [තීරු 651 - 667]

**කල් තැබීමේ යෝජනාව:**

රටේ ඇතැම් ප්‍රදේශවල පවතින නියඟ තත්ත්වය [තීරු 668– 758]

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**

அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 585]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 585]

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்** [ப: 590]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 591]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 592-645]

**தனி அறிவித்தல் மூல வினா:**

"எக்ஸ்பிரஸ் பேர்ள்" விபத்துக்கான இழப்பீடு கோரும் நடவடிக்கையின் முன்னேற்றம் [ப: 645]

பேட்டரி ஆற்றல் சேமிப்பு அமைப்பை அறிமுகப் படுத்துவதன்மூலம் புதுப்பிக்கத்தக்க மின்சாரத்தை ஊக்குவித்தல் [ப: 648]

**குறைநிரப்புத் தொகை:**

2026 சிறுபோகத்தில் சிறிய மற்றும் நடுத்தர அளவிலான அரிசி ஆலை உரிமையாளர்கள் மற்றும் கூட்டுறவுச் சங்கங்கள் ஊடாக நெல் கொள்வனவு [ப: 651-667]

**ஒத்திவைப்புப் பிரேரணை:**

நாட்டின் சில பிரதேசங்களில் நிலவும் வரட்சி நிலைமை [ப: 668-758]

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Twenty Second Amendment to the Constitution Bill: Petitions to the Supreme Court [Col. 585]

AUDITOR-GENERAL'S REPORT [Col. 585]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 590]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 591]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 592-645]

QUESTION BY PRIVATE NOTICE:

Progress of Claiming Compensation for "X-Press Pearl" Disaster [Col. 645]

Promotion of Renewable Electricity through Introduction of Battery Energy Storage System [Col. 648]

SUPPLEMENTARY SUM:

Purchase of Paddy through Small and Medium-scale Rice Millers and Co-operative Societies in Yala Season, 2026 [Cols. 651-667]

ADJOURNMENT MOTION:

Prevailing Drought Situation in Certain Areas of the Country [Cols. 668-758]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 අගෝස්තු 21වන සිකුරාදා***
*2026 ஓகஸ்ட் 21, வெள்ளிக்கிழமை*
*Friday, 21st August, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
### அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
### TWENTY SECOND AMENDMENT TO THE CONSTITUTION BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 අගෝස්තු 19 හා 20 දිනැති මාගේ නිවේදනයන්හි සඳහන් පෙත්සම් හතට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, “විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය” නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් දෙකක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩය - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අටවැනි හා නවවැනි පාර්ලිමේන්තු වාරයන් පිළිබඳව සිදු කරන ලද විශේෂ විගණන වාර්තාව මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

අවස්ථාවක් ලද විගස එකී විගණන වාර්තාව පිළිබඳව පාර්ලිමේන්තුවේ සාකච්ඡාවකට අවස්ථාව සලසා දෙන ලෙසත් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාවේ විශේෂ අවසරය ඇතිව, ගරු අග්‍රාමාත්‍යතුමිය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ඊයේ දිනයේ අපේ (ආචාර්ය) නන්දා මාලනී මහත්මිය අභාවප්‍රාප්ත වුණා. එතුමියට ගෞරවයක් ලෙස මේ සභාවේ අපි සියලුදෙනා මිනිත්තුවක නිශ්ශබ්දතාවක් පවත්වමු කියා මම යෝජනා කරනවා.

***[ඊට අනුකූලව විනාඩියක නිශ්ශබ්දතාවක් පවත්වන ලදී.]***
*[அதன்படி, ஒரு நிமிடம் மௌனம் அனுஷ்டிக்கப்பட்டது.]*
*[Whereupon one-minute silence was observed.]*

ගරු කථානායකතුමනි, ලිපි ලේඛනාදිය ඉදිරිපත් කිරීමට පෙරාතුව, අභාවප්‍රාප්ත (ආචාර්ය) නන්දා මාලිනී මහත්මිය වෙනුවෙන් ශෝක පණිවුඩයක් ඉදිරිපත් කිරීමට මා ඔබතුමාගේ අවසරය බලාපොරොත්තු වෙනවා.

ශ්‍රී ලාංකීය සංගීත ක්ෂේත්‍රයේ ස්වර්ණමය හඬ ලෙස සම්භාවනාවට පාත්‍ර වූ, දශක අටකට ආසන්න කාලයක් සිය අද්විතීය ගායන පෞරුෂයෙන් මෙරට සංගීතය හා සංස්කෘතිය පෝෂණය කළ (ආචාර්ය) නන්දා මාලනී මහත්මියගේ අභාවය පිළිබඳ පුවත අසා මම ඉමහත් සංවේගයට පත්වීමි. නන්දා මාලනී මහත්මියගේ ගීත ඇසෙමින්, ඒ ගීත සමඟ ජීවිතයේ විවිධ අවස්ථා ගෙවී ගිය රසිකාවියක ලෙස, එතුමියගේ වියෝව මට දැනෙන්නේ හුදෙක් ශ්‍රී ලාංකීය සංගීතයේ අසමසම කලා පෞරුෂයක් අපට අහිමිවීමක් ලෙස පමණක් නොවෙයි, එය අපේ ජීවිතවලට සමීපව, අපේ මතකයන් සමඟ බැඳී සතුටේදීත්, වේදනාවේදීත් අප සමඟ සිටි හුරුපුරුදු හඬක් අපෙන් වෙන්වීමක් ලෙසයි. එතුමියගේ ගීත

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

අපේ පරම්පරාවේ ජීවිත අත්දැකීම් සමඟ බැඳී තිබූ අතර, ඒ මනරම් හඬ සමඟ ගොඩනැඟුණු මතකයන් අද ඇයගේ වියෝව සමඟ වඩාත් තදින් සිහිපත් වේ.

ළමා වියේදී "බුදු සාදු මම සඳුන් ගසක් වෙන්නම්" ගීතය ගායනා කරමින් සංගීත ලොවට පා තැබූ එතුමිය, (ආචාර්ය) ඩබ්ලිව්.ඩී. අමරදේවයන්ගේ ගුරුහරුකම් ලබමින් "රන්මුතු දූව" චිත්‍රපටය ඔස්සේ සිනමා ගීත ක්ෂේත්‍රයට පිවිසියා ය. එතැන් සිට දශක ගණනක් පුරා එතුමියගේ හඬ අපේ නිවෙස්වලත්, අපේ පාසල් සමයේත්, අපගේ උත්සව හා ජාතික අවස්ථාවලත්, නිහඬව අපේ දෛනික ජීවිතය සමඟ ගමන් කළේය. එතුමිය ගැයූ ගීත බොහෝමයක් අපට හුදෙක් අසන්නට ලැබුණු ගීත නොව, අපේම ජීවිතයේ කොටස් බවට පත්ව තිබුණි.

එතුමියගේ ගායන දිවිය ශ්‍රී ලාංකීය ගීත කලාවේ එක් යුගයක් පමණක් නොව, මෙරට ජන ජීවිතයේත්, සමාජ චලනයන්ගේත්, මිනිස් හැඟීම්වලත් සජීවී ප්‍රකාශනයක් විය. ප්‍රේමය සහ විරහව වැනි මානව හැඟීම් ගැයීමෙන් ඔබ්බට ගිය එතුමිය, පොදු ජනතාවගේ දුක, බිය, බලාපොරොත්තු සහ අරගළය සිය ගීත තුළින් හඬක් බවට පත් කළාය. ඒ නිසාම ඇගේ ගීත ඇසෙන විට අපට දැනුණේ ගායිකාවකගේ හඬක් පමණක් නොව, අපේ සමාජයේ හඬයි. එතුමිය කිසිවිටෙකත් සමාජයෙන් වෙන් වූ කලාකාරිනියක් නොවූවාය. අයුක්තිය ඉදිරියේ නිහඬ නොවෙමින්, සාමය සහ සහජීවනය වෙනුවෙන්ද, මනුෂ්‍යත්වය හා සමාජ සාධාරණත්වය වෙනුවෙන්ද නොබියව එතුමිය සිය හඬ අවදි කළාය. "පවන" සහ "සත්‍යයේ ගීතය" වැනි නිර්මාණාත්මක මැදිහත්වීම් ඔස්සේ එතුමිය අපට පෙන්වා දුන්නේ කලාකරුවෙකුගේ හඬට සමාජයේ වේදනාව වෙනුවෙන් කථා කළ හැකි බවත්, ගීතයකට මිනිසා තුළ සංවේදීත්වය අවදි කරමින් යහපත් සමාජයක් පිළිබඳ බලාපොරොත්තුවක් ගොඩනැඟිය හැකි බවයි.

නන්දා මාලනී මහත්මියගේ ගීත සමඟ මගේ පෞද්ගලික මතකයන්ද බොහෝමය. ඒ ඇතැම් ගීත අසා ඇත්තේ සතුටින් පිරුණු අවස්ථාවලදීය. ඇතැම් ගීත වේදනාවක් හෝ නිහඬ මොහොතක් සමඟ බැඳී ඇත. තවත් ඇතැම් ගීත අප ජීවත් වූ කාලය, අප මුහුණ දුන් සමාජ ඇත්දැකීම් සහ අප තුළ තිබුණු බලාපොරොත්තු මතක් කර දෙනවා. එබැවින් එතුමියගේ හඬ අපට හුදෙක් සංගීතය නොවීය. එය අපේ ජීවිතය සමඟ ගමන් කළ, අපේ හැඟීම් හඳුනා ගත්, ඇතැම් විට අප වෙනුවෙන්ම කථා කළ හඬක් විය. ශාස්ත්‍රීය සංගීතයේ ගැඹුරු ප්‍රගුණත්වයත්, අසමසම හඬ පෞරුෂයත්, හැඟීම් ප්‍රකාශ කිරීමේ විශිෂ්ට හැකියාවත් සමඟ ශ්‍රී ලාංකීය ගීත කලාවට එතුමිය එක් කළ දායකත්වය අතිමහත්ය. එහෙත් එතුමිය ලද සම්මාන හා ගෞරව සියල්ලටම වඩා, පරම්පරා ගණනාවක ජනතාවගේ හදවත් තුළ එතුමිය දිනා ගත් ආදරය එතුමියගේ කලා මෙහෙවරේ සැබෑ අගය සනිටුහන් කරනවා. මගේ පරම්පරාවටත්, මටත් එතුමියගේ හඬ එතරම්ම සමීප වූයේ ඒ නිසායි.

අද එතුමියගේ වියෝව පිළිබඳව ශෝක වන මොහොතේ, ශ්‍රී ලාංකීය සංගීතයට අභිමි වූ අසමසම කලාකාරිනිය ගැන පමණක් නොව, අපේ ජීවිතයේ බොහෝ මතකයන් සමඟ බැඳුණු ආදරණීය හඬක් ගැනද මම සිහිපත් කරමි. අදින් වසරකට ඉහත මෙවැනිම දිනක එතුමියගේ 82වැනි ජන්ම දිනය සමරමින් එතුමියගේ මියුරු හඬ සජීවීව විඳිමින් අපට ආදරය සහ ගෞරවය පුද කරන්නට ලැබුණු ඒ අවස්ථාව මේ මොහොතේදී මම ඉතාම ගෞරවයෙන් හා සංවේගයෙන් සිහිපත් කරමි.

දශක ගණනාවක් පුරා අප සමඟ ගමන් කළ ඒ හඬ අද නිහඬ වුවද, එතුමිය ගැයූ ගීත අපේ මතකයන් තුළත්, අපේ හදවත් තුළත් දිගටම ජීවත් වනු ඇත. එතුමිය දායාද කළ ගීත සමුදායත්, ගොඩනැඟු කලා සම්ප්‍රදායයත්, සමාජය වෙනුවෙන් කලාකරුවෙකුට ඉටු කළ හැකි වගකීම පිළිබඳව තැබූ ආදර්ශයත් මතු පරම්පරාවට ද මඟ පෙන්වනු ඇත. එතුමියගේ හඬ ඉදිරියටත් ඇසෙනු ඇත්තේ ගීතයක් ලෙස පමණක් නොව යුක්තිය, සාමය, මනුෂ්‍යත්වය සහ මේ දේශය කෙරෙහි වූ ආදරය වෙනුවෙන් නැඟුණු එඩිතර හඬක් ලෙසයි.

අපේ ජීවිතයේ බොහෝ මතකයන්ට හඬක් වූ පරම්පරා ගණනාවක් ආදරයෙන් වැළඳ ගත් ශ්‍රී ලංකා ගීත කලාවේ අමරණීය පරිච්ඡේදයක් සනිටුහන් කළ (ආචාර්ය) නන්දා මාලනී මහත්මියට මාගේ ගෞරවයත්, ආදරයත් මේ අවස්ථාවේදී පුද කරමි. එතුමියට අජරාමර නිවන් සුව ප්‍රාර්ථනා කරමි. එතුමියගේ දියණියන් දෙදෙනා ඇතුළු පවුලේ සියලුදෙනාටත්, එතුමියටත්, ඒ හඬට ආදරය කළ සමස්ත ශ්‍රී ලාංකීය ජනතාවටත් මාගේ බලවත් සංවේගය පළ කරමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, අප හිතවත් නන්දා මාලනී මැතිනියගේ හදිසි වියෝව පිළිබඳව අපේ බලවත් ශෝකය, ඒ වාගේම සාතිශය සංවේගය මේ මොහොතේ පළ කර සිටිනවා. නන්දා මාලනී මැතිනිය මා කුඩා කාලයේ ඉඳලාම පෞද්ගලිකව හොඳින් හඳුනා ගත්, කිසිම දේකට නැමුණේ නැති, හැම විටම මහජනතාවත් එක්ක හිටගත් කලාකාරිනියක් හැටියටත්, මානව දයාව, කරුණාව, අනුකම්පාව ඉතා ඉහළින්ම තිබුණු අපේ රටේ බිහි වුණු ශ්‍රේෂ්ඨ කලාකාරිනියක් හැටියටත් හඳුන්වන්න පුළුවන්. ඇත්තටම මම නන්දා මාලනී මැතිනියව ආමන්ත්‍රණය කළේ "නන්දා මාලනී ඇන්ටි" කියලායි. පොඩි කාලයේ ඉඳලා ඒ තරමටම අපි එතුමියව ආශ්‍රය කළා. එතුමියගේ සංගීත කලාව තුළ ඉතාම විශිෂ්ට ගණයේ ශූරත්වයක්, කුසලතාවක්, හැකියාවක් එතුමිය සතුව තිබුණා.

මට මතක් වනවා, විශේෂයෙන්ම මේ රටේ පරිවර්තනාත්මක යුගයක් නිර්මාණය වුණු 1977 මැතිවරණ ව්‍යාපාරය. කලාකරුවන්, සංගීතඥයන් අතරින් සියයට 95ක් වාගේ ප්‍රමාණයක් එක්සත් ජාතික පක්ෂ වේදිකාවේ හිටියා. නමුත් ගරු නන්දා මාලනී මැතිනිය ඒ වේදිකාවේ හිටියේ නැහැ. උතුම් මානව හිතවාදී සංකල්පයන් තුළ හෘදය සාක්ෂියට එකඟව, තමන් දරපු මතය කිසිදාක නොවෙනස්ව, නොකිලිටිව, තමන් හිට ගත්ත ඒ ස්ථාවරයේ ඉන්නා වූ විශිෂ්ට ගුණාංගය එතුමිය සතුව තිබුණා. අපේ රටේ විවිධ කාල වකවානු තුළ, අපේ ප්‍රජාතන්ත්‍රවාදී ඉතිහාසය තුළ ඛේදවාචකයන් රැසක් නිර්මාණය වුණු බව අපි දන්නවා. අපි අවංකවම, හදවතට එකඟව කියන්න කැමැතියි, 1971 කාල වකවානුවත්, 1988-1989 කාල වකවානුවත් අපේ රටේ ඉතිහාසයේ ඛේදනීය කාල වකවානුවක් බව. එය ඛේදනීය තත්ත්වයක්.

ගරු නන්දා මාලනී මැතිනිය විවිධ අවස්ථාවලදී අපේ රටේ යොවුන් පරපුර වෙනුවෙන්, මානව සම්පත වෙනුවෙන්, මානව හිතවාදීත්වය වෙනුවෙන් වාගේම මූලික අයිතිවාසිකම් සහ මානව අයිතිවාසිකම් වෙනුවෙන් කෙළින්ම හිට ගත්තා. විවිධ අවස්ථාවලදී එතුමියගේ ආකල්පවලට, ඒ අදහස්වලට පවතින ආණ්ඩුත් විරුද්ධ වුණු බව අපි දන්නවා. අපි ඇත්ත කථා කරනවා නම්, සමහර විට රාජ්‍ය මාධ්‍යවල එතුමියට ලබා දුන්නු ඒ ඉඩකඩ

අභිමි කළා. මම නම් ඒ කාලයේ දේශපාලනයේ හිටියේ නැහැ. නමුත්, ඒ කාරණා කියනකොට ඒ පාර්ශ්වය නියෝජනය කරපු අපි, අපිටම ඇඟිල්ල දිගු කර ගැනීමත් වැදගත්.

නන්දා මාලනී මැතිනිය විශිෂ්ට කලාකාරිනියක්. එතුමිය තුළ තිබුණු කුසලතාව, ශක්තිය අතිවිශිෂ්ටයි. අපේ ගරු ලතා වල්පොල මැතිනිය, ගරු ඇන්ජලීන් ගුණතිලක මැතිනිය යනාදී වශයෙන් විශිෂ්ට කලාකාරිනියන් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. ඒ කාලයේ බිහි වුණු කලාකාරිනියන් අතර විශිෂ්ටත්වයේ ඉහළටම ගිය කලාකාරිනියක් හැටියට අපිට ගරු නන්දා මාලනී මැතිනියව හඳුන්වන්න පුළුවන්. එතුමිය ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් හිට ගත්තා. මානව අයිතිවාසිකම් උල්ලංඝනය වනකොට එතුමිය නොපැකිළව ඉදිරියට ආවා. එතුමිය කිසි දවසක තමන්ගේ ස්ථාවරය වෙනස් කළේ නැහැ.

නොපැකිළව, නොබියව තමන් විශ්වාස කරපු මතය වෙනුවෙන් එතුමිය හැම විටම පෙනී හිටියා. නන්දා මාලනී ඇන්ටිගේ - අපි කිව්වේ, "ඇන්ටි" කියලා - නිර්මල චරිතය ගත්තාම, කිසිදාක එතුමිය පැත්තෙන් පැත්තට යන්නේ නැතිව හොඳ ශක්තිමත් මතයක සිටීම ඇත්තවශයෙන්ම ලංකාවාසී ලක්ෂ 220ක් වූ ජනතාවටම ආදර්ශයක්.

එතුමියගේ මේ හදිසි වියෝව අපි හැමෝටම දුකට කරුණක්. විශේෂයෙන්ම කලා ක්ෂේත්‍රයට, සංගීත ක්ෂේත්‍රයට දැඩි ඇල්මක් දක්වන මමත් ඇත්තවශයෙන්ම shock වුණා, එතුමියගේ හදිසි වියෝව පිළිබඳ ආරංචිය ඇහුවාම. සත්‍ය වශයෙන්ම අපි එතුමියට ගරු කරනවා. මේ අවස්ථාවේදී, එතුමියගේ අභාවය වෙනුවෙන් විනාඩියක නිශ්ශබ්දතාව දැක්වීම පිළිබඳව මම දැනගෙන හිටියේ නැහැ. ඒ ගැන දැනගෙන හිටියා නම් අපි හැමෝම ඒ අවස්ථාවට සහභාගි වෙනවා. මම මදක් ප්‍රමාද වුණා, සභාවට පැමිණෙන්න. ඒ සම්බන්ධයෙනුත් මම සමාව ඉල්ලා සිටිනවා වාගේම කනගාටුව පළ කරනවා. මොකද, ඒ තරමටම නන්දා මාලනී මැතිනියට - නන්දා මාලනී ශූරීන්ට; නන්දා මාලනී ඇන්ටිට - අප තුළ ලොකු ගරුත්වයක් තිබෙනවා.

නන්දා මාලනී මැතිනිය වැනි ඒ කුසලතාව, දක්ෂතාව, නිපුණතාව, හැකියාව තිබෙන උතුම් විශිෂ්ට කලාකාරිනියක් නැවත වරක් බිහි වෙයිදෝ කියන එක අපට හිතාගන්නට අමාරුයි. එතුමිය රටටත්, කලාවටත්, සංගීත ක්ෂේත්‍රයටත් සිදු කළ සේවය පිළිබඳව වාගේම, දේශපාලනයේ විශ්වාස කරපු මතයත් එක්ක නිරතුරුවම රැඳී ඉඳලා ඒ ස්ථාවරාත්මකව සිටගැනීම පිළිබඳවත් අපේ අවංක ගරුත්වය තිබෙනවා. එතුමියගේ අභාවය පිළිබඳව ඒ පවුලේ සියලුම සාමාජිකයින්ට, දියණියන් දෙපළ ඇතුළු පවුලට සම්බන්ධ සියලු දෙනාට අපේ බලවත් ශෝකය පළ කරමින්, එතුමියට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, අභාවප්‍රාප්ත නන්දා මාලනී මැතිනිය වෙනුවෙන් මෙම සභාවේදී ශෝකය පළ කරමින් ඉදිරිපත් කළ කරුණු සමඟ මම ද එක්වන අතර, එතුමියට නිවන් සුව අත්වේවායි ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙනුවෙන් ප්‍රාර්ථනා කරමි.

ලිපිලේඛනාදිය පිළිගැන්වීම.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Speaker, I present the Report on the observations and steps taken in terms of the Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the Ministry of Defence in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් නියෝග සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 202 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මැයි 19 දිනැති අංක 2489/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

[ගරු බිමල් රත්නායක මහතා]

(ii) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 141, 143, 144, 157අ, 168 සහ 190 වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජුනි 17 දිනැති අංක 2493/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ තාවකාලික සභාපතිවරයා වශයෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද 2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා 2025 අංක 23 දරන විසර්ජන පනතේ ශීර්ෂය 118 - වැඩසටහන 02 යටතේ පරිපූරක මුදල සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

ගරු කථානායකතුමනි, හල්තොට, පෙතිගමුව, "විචිත්‍රානි" යන ලිපිනයෙහි පදිංචි කේ.ආර්. පියතිස්ස මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

ගරු කථානායකතුමනි, විල්ගමුව, හෙට්ටිපොළ, පොළ පාර, අංක 469/5 යන ලිපිනයෙහි පදිංචි බිමල් දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අගලවත්ත, හල්ඕවිට යන ලිපිනයෙහි පදිංචි ජී.ඒ.ජේ. ජයසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) දොඩම්පේ, මිල්ලකඩේ, අංක 177/ඒ/3 යන ලිපිනයෙහි පදිංචි පී.එම්.ජී. කාංචනා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### වැලිසර ඩිපෝව: ධාවනයට සුදුසු බස් රථ
### வெலிசர டிப்போ: சேவைக்குத் தகுதியான பேருந்துகள்
### WELISARA DEPOT: ROADWORTHY BUSES

785/2025

**1. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වැලිසර ඩිපෝව සතුව මේ වනවිට ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවේ මේ වනවිට ඇති සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) උතුරු කොළඹ ශික්ෂණ රෝහල රාගම නගරයේ පිහිටා ඇති බැවින් රාගම නගරයේ සිට උදෑසන, දහවල් සහ සවස් කාලවලදී දුරගමන් බස් රථ සේවා ආරම්භ කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வெலிசர டிப்போவுக்குச் சொந்தமான, இன்றளவில் சேவையில் ஈடுபடுத்துவதற்குத் தகுதியான நிலையிலுள்ள பேருந்துகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி டிப்போவில் தற்பொழுது நிலவும் ஊழியர் வெற்றிடங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) வட கொழும்பு போதனா வைத்தியசாலை ராகம நகரில் அமைந்துள்ளதால், ராகம நகரிலிருந்து காலை, பகல் மற்றும் மாலை வேளைகளில் தூரப் பயணப் பேருந்துச் சேவையை ஆரம்பிப்பது தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the number of roadworthy buses that are currently owned by the Welisara Depot;

(ii) the number of vacancies currently exist at the said depot; and

(iii) the measures that will be taken to commence long-distance bus services from Ragama Town during the morning, daytime and evening, given that the Colombo North Teaching Hospital is located in the vicinity?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) වැලිසර ඩිපෝවේ දැනට පවතින ධාවනයට සුදුසු බස් රථ සංඛ්‍යාව 35කි.

(ii) වැලිසර ඩිපෝවේ රියදුරු පුරප්පාඩු 6ක් හා කොන්දොස්තර පුරප්පාඩු 6ක් පවතී.

(iii) රාගම නගරයේ සිට කිලෝමීටර 3ක් දුරින් කොළඹ නුවර A 1 මාර්ගයද පිහිටා ඇති බැවින් උදෑසන, දහවල් සහ රාත්‍රී කාලවලදී මෙම මාර්ගවල දුර ගමන් සේවා බස් රථ නිතර ධාවනය වේ.

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඇත්තටම අපි, අපේ පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය - public transport - දියුණු කරන්න ඕනෑ. ඒක ඉතාම වැදගත් දෙයක්. විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ අවධානය යොමු කර තිබෙන low-floor buses, එහෙම නැත්නම් Metro Bus ක්‍රමවේදයෙන් මඟීන්ට යම් ආකාරයෙන් පහසුවක් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බස් එකකට රුපියල් මිලියන 36.5කට ආසන්න මුදල් ප්‍රමාණයක් වියදම් කරලා ඔබතුමන්ලා බස් රථ 10ක් ගෙනාවා. ඊට පසුව ඔබතුමන්ලා නැවත බස් රථ 100ක් ගන්න ටෙන්ඩර් එකක් දැම්මා, එකම specifications, එකම supplier. මා හිතන විධියට, FOTON International Corporation කියන supplier. එහිදී බස් රථයක cost එක වෙලා තිබෙනවා, රුපියල් මිලියන 43කට ආසන්න මුදලක්. අප දන්නා සාමාන්‍ය ක්‍රමවේදය තමයි, quantity එක වැඩි වන කොට මිල අඩු වීම. බස් රථ 10ක් ගන්න කොට බස් රථයකට ගියේ රුපියල් මිලියන 36කට ආසන්න මුදල් ප්‍රමාණයක් නම්, බස් රථ 100ක් ගන්න කොට රුපියල් මිලියන 43කට ආසන්න මුදල් ප්‍රමාණයක් යනවා කියන්නේ, රුපියල් මිලියන 6.5කට ආසන්න ප්‍රමාණයක් වැඩි වෙලා තිබෙනවා කියන එකයි. රුපියල් මිලියන 650ක් වාගේ මුදල් ප්‍රමාණයක් ඒ සඳහා වියදම් කර තිබෙනවා. ඔබතුමා මාධ්‍යයට කියනවා මම දැක්කා, බස් රථ මිල දී ගැනීමේදී බස් රථ 4ක් අපට නොමිලේ ලැබුණා කියලා. ඇත්තටම ඒ මිලියන 650 ගණනය කරලා බැලුවොත්, අපට බස් රථ 18කට ආසන්න ප්‍රමාණයක් නොමිලේ ලැබෙන්න තිබුණා. ඒ ප්‍රමාණය නොලැබුණේ ඇයි කියන එක මා දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු මන්ත්‍රීතුමනි, මම පළමුවෙන්ම කියන්න ඕනෑ, ඔබතුමා ඉදිරිපත් කළ දත්තවල වැරැද්දක් තිබෙනවා කියලා. අනෙක, බස් රථ 100ට අදාළ ප්‍රසම්පාදන කටයුතු පටන් ගන්න කොට අපි ඉස්සෙල්ලාම document එක හදනවා, මොන ආකාරයේ ආකෘතියක බස් රථ ද අවශ්‍ය වන්නේ කියලා. ඒක TEC එක හරහා තමයි හදන්නේ. ඊට පසුව Bid Evaluation Committee එක ඒක අනුමත කරනවා. රුපියල් මිලියන 750ට වැඩි නිසා කැබිනට් එක අනුමත කරන ලද ප්‍රසම්පාදන කමිටුවකින් අනුමැතිය ලබා ගෙන තමයි එම ටෙන්ඩර් කටයුතු කරන්නේ; ලංසු කැඳවන්නේ. ලංසු කැඳෙව්වාට පසුව අපි ඉස්සෙල්ලාම බලනවා, බස් රථ සම්බන්ධව තාක්ෂණික වශයෙන් අප ඉල්ලා තිබෙන පිරිවිතරවලට අනුව මොන සමාගම්වල ලංසු තේරෙනවාද කියන එක. ඉන් පසුව තමයි අපි financial bids open කරන්නේ. ඉන් පසුව තමයි ඒ තේරෙන කට්ටියගෙන් අඩුම ලංසුව ඉදිරිපත් කරන කෙනාට ටෙන්ඩරය පිරිනමන්නේ. මේ විධියට තමයි ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ නියමිත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය හරහා අඩුම ලංසුව ඉදිරිපත් කරන සමාගමට බස් රථ සම්බන්ධ ටෙන්ඩරය පිරිනැමීම සිදු වන්නේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කෙසේ වෙතත්, රුපියල් මිලියන 650ක විතර දැවැන්ත වෙනසක් තිබෙනවා, මේ ටෙන්ඩර් පටිපාටියේ.

ඊළඟට, මම තවත් කාරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. කොටුවේ සිට කන්කසන්තුරේට ගිය දුම්රිය - train එක - මඟදී නතර වෙලා තිබෙනවා; කැඩී තිබෙනවා. ඒ නිසා මඟීන් පැය 5කට ආසන්න කාලයක් තිස්සේ අපහසුතාවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම වීඩියෝවලින් අපි දැක්කා, එහි සංචාරකයනුත් සිටි බවක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රධාන ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය ඇසුවා නම් හොඳයි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු කථානායකතුමනි, එකම අමාත්‍යාංශයට අදාළ නිසා මේ ගැන අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බස් ගැන කථා කරලා පසුව කෝච්චියෙන් නතර කරනවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු කථානායකතුමනි, මේක කාලීන ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එසේ දුම්රිය ගමන අඩාළ වීම පිළිබඳව පරීක්ෂණයක් කර තිබෙනවාද? මොකක්ද ඒකට හේතුව කියා මා දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු කථානායකතුමනි, එම අතුරු ප්‍රශ්නය එතුමාගේ ප්‍රධාන ප්‍රශ්නයට අදාළ එකක් නොවෙයි. නමුත් මම උත්තරයක් දෙන්නම්. එම දුම්රිය ගමන අඩාළ වෙන්න හේතුව වෙලා තිබෙන්නේ, දුම්රිය එන්ජින් සම්බන්ධව තිබෙන ගැටලුවයි. අපට සාමාන්‍යයෙන් දෛනික ධාවනය සඳහා Class M කියන එන්ජින් දළ වශයෙන් 60ක් විතර අවශ්‍යයි. නමුත් කාලාන්තරයක් තිස්සේ පරණ එන්ජින් ගොඩක් තමයි තිබෙන්නේ. එම නිසා කැඩෙන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා.

අපි දන්නවා, සාමාන්‍යයෙන් කාර් එකක් කිලෝමීටර 5,000ක් ධාවනය කළාට පසුව සර්විස් කරන්න ඕනෑ බව. කෝච්චි එන්ජින් ද ඒ වාගේ තමයි. නමුත් කෝච්චි දෛනිකව ධාවනය කරන නිසා due service periodsවල එම එන්ජින් සර්විස් කිරීම සඳහා ගලවා පැත්තක තබන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා ඒවා සර්විස් නොකරම ධාවනය කරන්න සිදු වෙලා තිබෙනවා. මේක කාලයක් තිස්සේ ඇදෙමින් ආපු ප්‍රශ්නයක්. දුම්රිය fleet එක අඩු වෙලා තිබෙන්නේ ඒ නිසායි. දැනට දළ වශයෙන් දෛනික ධාවනය සඳහා එකතු වන්නේ දුම්රිය 50ක්, 51ක් වාගේ ප්‍රමාණයක්. ඒ නිසා ඒවා කැඩෙන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. නමුත් අපි මේ අංශය කොහොමද උඩට ගන්නේ කියන පියවර ගැන සොයා බලා අලුතින් දුම්රිය කට්ටල එකතු කර ගන්නා සැලැස්ම හදාලායි තිබෙන්නේ. ප්‍රසම්පාදන කටයුතු කරගෙන යන්නේ, අලුත් දුම්රිය කට්ටල 5ක් ගෙනෙන්නයි. ලබන අවුරුද්දේ අය වැයෙනුත් යම්කිසි මුදලක් වෙන් වනවා, දුම්රිය කට්ටල ගෙන එන්න. ඒත් එක්කම, අපි අලුත් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒ කියන්නේ, එන්ජිම විතරක් හදලා එළියට දාන්නේ නැතුව සම්පූර්ණ දුම්රියක් විධියට මැදිරි සහ දුම්රිය එන්ජින් සියල්ල නවීකරණය කරලා එළියට දැමීමේ වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරගෙන යනවා. එහි දෙවන කෝච්චියත් අපි මේ වන කොට රත්මලාන හරහා එළියට දාලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -903/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

## මාළිගාවත්ත වකුගඩු රෝහල: පුරප්පාඩු
## மாளிகாவத்தை சிறுநீரக வைத்தியசாலை: வெற்றிடங்கள்
## KIDNEY HOSPITAL, MALIGAWATTA: VACANCIES

910/2025

**3. ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ, මාළිගාවත්ත ප්‍රදේශයේ වකුගඩු රෝහලක් තිබෙන බව දන්නේද;

(ii) එම රෝහලේ වෛද්‍ය, හෙද, පරිපූරක වෛද්‍ය සහ සුළු සේවක තනතුරුවල මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝහල සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு, மாளிகாவத்தைப் பிரதேசத்தில் சிறுநீரக வைத்தியசாலையொன்று அமைந் துள்ளதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி வைத்தியசாலையில் வைத்தியர், தாதியர், நிறைவுகாண் மருத்துவ வல்லுநர் மற்றும் சிற்றூழியர் பதவிகளில் தற்போது நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை வெவ் வேறாக யாதென்பதையும்;

(iii) மேற்படி வைத்தியசாலையை அபிவிருத்தி செய்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether he is aware that there is a Kidney Hospital in Maligawatta, Colombo;

(ii) the number of current vacancies, categorized separately, for the posts of doctor, nurse, paramedic professionals and minor staff at the said hospital; and

(iii) the measures that will be taken to develop the said hospital?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඇමුණුම මඟින් දක්වා ඇත. දීර්ඝ ඇමුණුමක් බැවින් එය **සභාගත*** කරමි.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

මා එහි සංක්ෂිප්ත සටහනක් ඉදිරිපත් කරන්නම්. විශේෂඥ වෛද්‍යවරු 10ක් ඉන්න ඕනෑ; එයින් 9ක් ඉන්නවා; 1ක් පුරප්පාඩුයි. Medical officersලා 50ක් ඉන්න ඕනෑ; 46ක් ඉන්නවා; 4ක් පුරප්පාඩුයි. Nursesලා 110ක් ඉන්න ඕනෑ; 105ක් ඉන්නවා; 5ක් පුරප්පාඩුයි. ඒ වාගේම, සෞඛ්‍ය කාර්ය සහායකයින් 75ක් ඉන්න ඕනෑ; 50යි ඉන්නේ; 25ක් පුරප්පාඩුයි.

(iii) මෙම රෝහල සංවර්ධනය සඳහා ඉඩ කඩ ප්‍රමාණවත් නොවන බැවින්, පළාත් සභාව මඟින් පාලනය වන යාබද රෝහල් ඉඩමේ කොටසක් හා මෙම රෝහලේ ඉඩමේ කොටසක් ඒකාබද්ධ කර නව ගොඩනැඟිල්ලක් ඉදි කිරීමේ යෝජනාවක් ඉදිරිපත් විය.

2026 වර්ෂය තුළ ඒ සඳහා දළ ඇස්තමේන්තුව සකස් කර පළාත් සභාව සමඟ සාකච්ඡා කිරීමේදී, පළාත් සභා රෝහල සඳහාද ඉඩකඩ අවශ්‍ය බැවින් එම යෝජනාව ක්‍රියාත්මක නොකළ අතර, අත්‍යවශ්‍ය අලුත්වැඩියා කටයුතු පමණක් දැනට සිදු කරනු ලබනවා.

(ආ) පැන නොනඟී.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා යටිතල පහසුකම්, සේවකයන්ගේ පුරප්පාඩු පිළිබඳව ප්‍රකාශ කළා. මෙම රෝහලේ dialysis කිරීම සඳහා දැනට තිබෙන්නේ ඇඳවල් 21ක් විතර. දවසකට එන ලෙඩ්ඩු ප්‍රමාණයත් එක්ක බැලුවාම ඒ 21 කිසිසේත් ප්‍රමාණවත් නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ guidelines අනුව, ඇඳන් 3කට හෙදියන් දෙන්නෙක් ඉන්න ඕනෑ. නමුත් මේ රෝහලේ එක නර්ස් කෙනෙක් ඇඳන් තුනක් බලා ගන්නවා; අනෙක් පැත්ත වෙන්නේ. කාර්ය මණ්ඩලයේ ඒ අඩුකම, ඒ අයට පැය 24 පුරාම වැඩ කරන්න වීම සහ අධික ලෙඩ්ඩු ප්‍රමාණයක් පැමිණීම නිසා කාර්ය මණ්ඩලය විශාල ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. දැන් කාර්ය මණ්ඩලයට අවශ්‍ය පහසුකම් සහ අවශ්‍ය දේවල් ලබා දෙන්න බැරිකමක් තිබෙනවා. ඔබතුමන්ලාට පුළුවන්ද ඉතා ඉක්මනින් ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගන්න? ලෙඩ්ඩු විශාල ප්‍රමාණයක් එන නිසා තිබෙන ඇඳන් ප්‍රමාණය වැඩි කර ගන්න වෙනවා. සමහර අයට සතියකට තුන් පාරක් dialyse කර ගන්න ඕනෑ. ඒ සමහර අය ඒ රෝහලෙන් කර ගන්න බැරි හින්දා විශාල මුදලක් ගෙවලා පෞද්ගලික රෝහල්වලට යනවා. මම හිතන විධියට, පෞද්ගලික රෝහල්වල 11,000ක් වාගේ ගන්නවා dialysis එකක් කරන්න. ඒ නිසා ඉතා ඉක්මනින් මේ රෝහලේ හෙදියන්ගේ පුරප්පාඩු ප්‍රමාණය පුරවා ගැනීමට සහ ඇඳන් ප්‍රමාණය වැඩි කර ගැනීමට හැකියාව තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ඇත්තටම kidney diseasesවල dialyse කරන මට්ටමට එන රෝගීන් ප්‍රමාණය වැඩි වෙමින් පවතිනවා. මීට අවුරුදු ගණනාවකට ඉස්සෙල්ලා ඒකට ප්‍රධාන හේතුව වුණේ "හඳුනා නොගත් වකුගඩු රෝගය" කියලා හඳුනා ගත් රෝගය. නමුත් දැන් දැන් දියවැඩියාවේ සංකූලතා නිසා වකුගඩු ආබාධ ඇති වුණු රෝගීන් තමයි විශාල ප්‍රමාණයක් එන්නේ. ඇත්තටම අපි මෙහිදී ප්‍රධාන වශයෙන්ම කරන්න ඕනෑ dialysis units වැඩි කරන එක නොවෙයි, දියවැඩියාව පාලනය කිරීම සඳහා වඩාත් හොඳ සෞඛ්‍ය සේවයක් ගොඩනැඟීමයි. මොකද, අපේ ජනගහනයෙන් සියයට 25ක් විතර දියවැඩියා රෝගයෙන් පෙළෙනවා. ඒ සියයට 25න් සෑහෙන පිරිසක් දියවැඩියා රෝගයේ සංකූලතාවලින් පෙළුණොත් ඒක ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා අපි බෝ නොවන රෝග පාලනයට වැඩි ඉඩකඩක් වෙන් කරලා තිබෙන්නේ. ඊට අමතරව අපි පිළිගන්නවා dialyse කරන්න ඕනෑ රෝගීන්ට අවශ්‍ය පහසුකම් ප්‍රමාණය ලංකාවේ සීමිතයි කියලා. ඒක වැඩිදියුණු කිරීම සඳහා අපිට ජාතික මට්ටමේ වැඩ පිළිවෙළක් සහ ක්‍රියාදාමයක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, සේවක හිඟය ගැනත් මම කියන්න ඕනෑ. මුළු රෝහල් පද්ධතියේම සේවක හිඟයක් තිබෙනවා. අපට ප්‍රශ්නය වුණේ මේ සේවකයන් බඳවා ගැනීමේ නිශ්චිත ක්‍රමයක් තිබුණේ නැති එක. ඒ නිසා අපි හොඳ වැඩ පිළිවෙළක් යටතේ වෛද්‍යවරු, විශේෂඥ වෛද්‍යවරු, nursesලා බඳවා ගැනීමේ වැඩ පිළිවෙළක් ජාතික මට්ටමින් පටන් අරගෙන තිබෙනවා. නමුත්, මෙහෙි ප්‍රතිඵලය එන්න යම් කාලයක් ගත වෙනවා. මොකද, nurse කෙනෙක්ට අද job එක දීලා හෙට වැඩට යොදවන්න බැහැ. අපි බලාපොරොත්තු වෙනවා, මේවා යම් විධිමත්භාවයකින් කරන්න. මේ කටයුතු පුළුල් කරන්න පුළුවන් කියලා මම හිතනවා. අපි ඒ සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් ඇතිව ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේකත් සෞඛ්‍ය අමාත්‍යාංශයට සම්බන්ධ ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කොටහේන ප්‍රදේශයේ හම්දි ෆස්ලීම් කියන අවුරුදු තුනක දරුවෙකුගේ එක වකුගඩුවක් නරක් වෙලා තිබුණා. 2023 ජූලි 27වෙනි දා ඒකට බෙහෙත් ගන්න රෝහලට ඇතුළත් කළාම ඒ වකුගඩු දෙකම අයින් කළා. ඊට පස්සේ ඒ දරුවා මිය ගියා. ඊට පස්සේ දෙමාපියන් සෞඛ්‍ය අමාත්‍යාංශයට පැමිණිලි කළා. ඒ operation එක කරපු වෛද්‍යවරු, ඒකට සහාය වෙච්ච වෛද්‍යවරු, lab එක භාරව හිටපු සියලුදෙනාම දැන් විදේශගත වෙලා තිබෙන්නේ. ඒ ළමයා මිය යෑමත් එක්ක ඒ සියලුදෙනාම රට ගියා; දැන් ඉන්නේ රට. මේ ගැන 2023දී සෞඛ්‍ය අමාත්‍යාංශයට පැමිණිලි කළා. දැනට අවුරුදු තුනක් වෙනවා. මම පාර්ලිමේන්තුවේදී ඇමතිතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්නේ තුන්වන වතාවට. 2024 වසරේ හිටපු සෞඛ්‍ය අමාත්‍ය රමේෂ් පතිරණ මහතාගෙනුත් මම මේ ප්‍රශ්නය ඇහුවා, මේ වාර්තාව ඇයි දෙන්නේ නැත්තේ කියලා. ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමාගෙනුත් මම මීට මාස ගණනකට කලින් ඇහුවා, මේ වාර්තාව දෙන්නේ නැත්තේ ඇයි කියලා. සෞඛ්‍ය අමාත්‍යාංශය මේ දරුවාගේ මරණය සම්බන්ධව පරීක්ෂණයක් කර තිබුණා. මම හිතන හැටියට දැන් ඒක භාරව ඉන්නේ දොස්තර අතපත්තු. ඒ දෙමාපියන්ට මේ වාර්තාව දෙන්නේ නැහැ. දැනට අවුරුදු තුනක්! ඇයි දන්නේ නැහැ මේ වාර්තාව හංගන්නේ. මේ වාර්තාව දෙන්න පුළුවන් දිනයක් ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ඇත්තටම එහෙම නිශ්චිතව කියන්න අමාරුයි. ඔවුන්ට කියන්න වාර්තාව ඉල්ලන්න කියලා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ඉල්ලලා තිබෙන්නේ. ඒ දෙමාපියන් පෞද්ගලිකවත් හමු වෙලා ඒ වාර්තාව ඉල්ලලා තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

ඒ ගැන හොයා බලා ඔබතුමාට කියන්නම්, ඇත්තටම මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. මට ඒක නිශ්චිතවම මේ අවස්ථාවේ කියන්න බැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මේ ප්‍රශ්නය මේ සභාවේදී කිහිප වරක් ඇහුවා. දැනට අවුරුදු තුනක් වෙනවා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

හොඳයි. ඒ පිළිබඳ සොයා බලා අපි ඔබතුමාට දන්වන්නම්.

## 2015 සිට පළමුවරට විදේශගත වූ ගෘහ සේවකයන්: විස්තර

### 2015 தொடக்கம் முதன்முறையாக வெளிநாடு சென்றுள்ள வீட்டுப் பணியாளர்: விபரம்

### DOMESTIC WORKERS MIGRATED FOR THE FIRST TIME SINCE 2015: DETAILS

948/2025

**4. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා පළමු වරට විදේශගත වූ ගෘහ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් විදේශගත වූ රටවල් කවරේද;

(iii) එම ගෘහ සේවකයන් අතරින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ලබාදෙන පුහුණුව ලබාගෙන සහ ලබා නොගෙන විදේශගතවී ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම කාර්යාංශයේ චක්‍රලේඛ අනුව පළමු වරට විදේශගත වන සේවකයන් සඳහා ලබාදිය යුතු පුහුණුවේ ස්වභාවය කවරේද;

(v) නිසි පුහුණුවක් නොලබා විදේශගත වන පුද්ගලයන්ට විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදුවන බව දන්නේද;

(vi) එසේ නම්, නිසි පුහුණුවක් නොලබා විදේශගත වීම වැළැක්වීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரையில் முதன்முறையாக வெளிநாடு சென்றுள்ள வீட்டுப் பணியாளர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இவர்கள் சென்ற நாடுகள் யாவை என்பதையும்;

(iii) மேற்படி வீட்டுப் பணியாளர்களுள் இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தினால் வழங்கப்படும் பயிற்சியைப் பெற்ற மற்றும் பெறாதவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(iv) மேற்படி பணியகத்தின் சுற்றுநிருபத்தின்படி முதன்முறையாக வெளிநாடு செல்லும் பணியாளர்களுக்கு வழங்கப்பட வேண்டிய பயிற்சியின் தன்மை யாதென்பதையும்;

(v) முறையான பயிற்சியைப் பெறாமல் வெளிநாடு செல்லும் நபர்கள் பல்வேறு பிரச்சினைகளுக்கு முகம் கொடுக்க நேரிடுவதை அறிவாரா என்பதையும்;

(vi) ஆமெனில், முறையான பயிற்சியின்றி வெளிநாடு செல்வதைத் தடுப்பதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை யென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the number of domestic workers who went abroad for foreign employment for the first time from 2015 to date;

(ii) the countries to which they migrated;

(iii) the number of such migrant domestic workers who have and have not received training from the Sri Lanka Foreign Employment Bureau, separately;

(iv) the nature of the training that should be provided to first-time migrant domestic workers in accordance with the Bureau's circulars;

(v) whether he is aware that migrant workers without proper training face various difficulties; and

(vi) if so, the measures that will be taken to prevent migrant workers from going abroad for employment without proper training?

(b) If not, why?

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු සහ විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 295,606යි.

(ii) ප්‍රධාන වශයෙන් සවුදි අරාබිය, කුවේට් රාජ්‍යය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, බහරේනය, කටාර් රාජ්‍යය, ජෝර්දානය, ඕමානය, සයිප්‍රසය, සිංගප්පූරුව, මාලදිවයින, මැලේසියාව ආදී රටවල්.

(iii) පුහුණුව ලබා විදේශගත වූ ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව 155,046ක් වන අතර, පුහුණුව නොලබා ගෘහස්ථ අංශයේ රැකියාවක් සඳහා විදේශගත වූ ශ්‍රී ලාංකියන්ගේ සංඛ්‍යාව 140,560ක් වේ.

ඒ අතර 2022.06.15 සිට 2024.06.26 දක්වා කාලසීමාවේදී සභාපති විසින් අනුමැතිය ලබාදී ක්‍රියාත්මක වූ ක්‍රමවේදයක් හරහා පමණක් පුහුණුවෙන් නිදහස් කර ඇති කාන්තා ශ්‍රමිකයන් 33,936ක් ද ඉහත 140,560ට ඇතුළත් වේ.

(iv) "ගෘහස්ථ ගෘහ පාලන සහකාර" පාඨමාලාව ගත්තොත්, මැද පෙරදිගට දින 28ක පාඨමාලාවක් තිබෙනවා. ඒ වාගේම "ගෘහස්ථ ගෘහ පාලන සහකාර" පාඨමාලාව යුරෝපය සහ නැඟෙනහිර ආසියාවට දින 28ක පාඨමාලාවක් ලෙස තිබෙනවා. "සාත්තු සේවක/සේවිකා පුහුණු පාඨමාලාව" දින 45යි. ඉංග්‍රීසි පාඨමාලාව දින 14යි. පෙර විගමනික පුහුණුව - ඊශ්‍රායල් දින 7යි. දින 2ක පෙර විගමනික නම්නීකරණ පුහුණුව, ඒ වාගේම දින 5ක පිරිසිදු කිරීමේ පාඨමාලාව, දින 3ක පෙර විගමනික පුහුණුව රුමේනියා රාජ්‍යය සඳහා. ඒ වාගේම දින 2ක පාඨමාලාවක් තිබෙනවා. ඊළඟට, ජපන් භාෂා පුහුණු පාඨමාලාව N5 කියන කාණ්ඩ කිහිපයක් තිබෙනවා.

(v) ඔව්.

(vi) රැකියාවක් සඳහා විදේශගත වන සියලුම ශ්‍රමිකයන් පුහුණුව ලබා ගත යුතුයි. වෘත්තීය රැකියා - professional category රැකියා - සඳහා යන අයට ඒක අවශ්‍ය නැහැ. එහෙම නැත්නම් සියලුදෙනාට ඒක අත්‍යවශ්‍යයි. NVQ Level 3 පාඨමාලාව අරගෙන තිබුණා නම්, අවුරුදු 10කට ඒක වලංගුයි.

ඒ වාගේම කටුනායක ගුවන් තොටුපළේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ශාඛා මඟින් මේ සම්බන්ධයෙන් සියලු ශ්‍රමිකයින් පරීක්ෂණයට ලක් කරනවා. එතැනදී මොනවා හරි ප්‍රශ්න, ගැටලු තිබෙනවා නම් ඔවුන්ව කාර්යාංශයට යොමු කරන තත්ත්වයක් තමයි තිබෙන්නේ. අපි මේ සම්බන්ධව අභ්‍යන්තර විගණන නිතරම පවත්වනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, මම විශේෂයෙන්ම මේ කාරණය මතක් කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විදේශ රැකියා ක්ෂේත්‍රය ගත්තොත්, මේ වෙනකොට ලෝකයේ බහුතර රටවල් ප්‍රමාණයක් කම්කරු සේවය සඳහා විශේෂයෙන්ම පුහුණු කණ්ඩායම් පිට රටවලින් ඒ රටවලට ගෙන්වා ගැනීමේ ප්‍රවණතාව වැඩි වෙලා තිබෙනවා. ශ්‍රී ලංකාවේ ගම්වල සිටින බහුතරයක් තරුණ තරුණියන් පිට රට යන්න සූදානමින් ඉන්නවා. හැබැයි අපි දන්නවා, ගම්වල ඉන්න තරුණයෙක් කුඩු ටිකක්, ගංජා ටිකක්, මොනවා හරි බීලා අහු වුණාට පස්සේ ගෙනැල්ලා කුඩු කරලා, හිර ගෙවල් පුරවන එක තමයි මේ වෙනකොට කරලා තිබෙන්නේ කියලා. මේ හිර ගෙවල් පුරවන එක දැන් ලංකාවේ ජනප්‍රිය වැඩසටහනක් විධියට ඉදිරියට යනවා; ආණ්ඩුවේත් ජනප්‍රිය වැඩසටහනක් විධියට යනවා. විදේශ සේවා නියුක්ති කාර්යාංශයත්, ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයත්, අනෙකුත් අමාත්‍යාංශත් සම්බන්ධ කර ගනිමින් මේ රටේ තරුණ පරපුර ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් ගම තුළ ක්‍රියාත්මක කරන්න බැරිද? යම් ආකාරයක පුහුණු මධ්‍යස්ථාන වෙන්න පුළුවන්, එහෙම නැත්නම් දැනුවත් කිරීමේ මධ්‍යස්ථාන වෙන්න පුළුවන්, සුබසාධන මධ්‍යස්ථාන වෙන්න පුළුවන්, මේ කුමන ආකාරයකට හරි කමක් නැහැ යම් කිසි වැඩසටහනක් සකස් කරලා අඩුම තරමින් මේ තරුණ තරුණියන් රැකියාවක් සඳහා විදේශගත කරන්න අවශ්‍ය කරන මානුෂිකත්වය සහ සමාජයීය තත්ත්වයත්, ඒ වාගේම ආර්ථික වශයෙන් යම් ශක්තිමත් කිරීමක් කරන්න පුළුවන් නම් හොඳයි. ඔබතුමන්ලා දැන් භාණ්ඩාගාරය පුරවලා නේ තිබෙන්නේ. ඒ සල්ලිවලින් යම් ප්‍රමාණයක් මේගොල්ලන් වෙනුවෙන් වෙන් කරන්න පුළුවන්. ආණ්ඩුවෙන් ඒ මුදල් දීලා ඔවුන්ව රැකියා සඳහා යැව්වත් පාඩු නැහැ. මොකද, අද වනකොට ගම තුළ බරපතළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඔබතුමන්ලා මේ සම්බන්ධව යම්කිසි පියවරක් ගන්නවාද කියන එක තමයි පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට මම අහන්නේ.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු කථානායකතුමනි, දැනටමත් Joint Cabinet Subcommittee එකක් තිබෙනවා. විශේෂයෙන්ම තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය වාගේම අධ්‍යාපන අමාත්‍යාංශය කියන අමාත්‍යාංශ තුනම ඒකාබද්ධ වෙමින් දැනටමත් අපි ඒ පිළිබඳව සාකච්ඡා කර ගෙන යනවා. අපි තවම මුල් අදියරයේ තමයි ඉන්නේ. මේ ප්‍රශ්න හඳුනා ගැනීම සහ ඒකට අදාළ කරන තිරසර විසඳුම ලබා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා පටන් ගෙන තිබෙනවා. ඒ වාගේම අපි විදේශ කටයුතු අමාත්‍යාංශය විධියට, විදේශ රැකියා ක්ෂේත්‍රයට ඇතුළු කර ගන්න පුළුවන් සියලු පාර්ශ්වකරුවන් එක්ක දැනටමත් ඒ පිළිබඳව සාකච්ඡා පටන් ගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා යෝජනා කරපු මේ කාරණාවට අදාළව මැදිහත් වෙන්න පුළුවන් ප්‍රවේශයක් ගන්න කෙටි කාලයක් තුළ හැකියාවක් ලැබෙයි කියලා අපි හිතනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඒ පිළිතුර පිළිබඳව සෑහීමකට පත් වෙන්නේ නැහැ. මේක මේ අවස්ථාවේදී රටේ ඉතාම භාරදූර වැදගත් කාර්යයක්. ඒක නිසා රජය මීට වඩා විශාල මැදිහත්වීමකට එයි කියලා මම හිතනවා. විපක්ෂයක් හැටියට මේ සඳහා කරන්න පුළුවන් හැම උදව්වක්ම කරන්න අපි සියලුදෙනාම සූදානම් බව එකහෙළා ප්‍රකාශ කරනවා. මොකද, අපේ රටේ තරුණ පරපුර සහ ජනතාව ආරක්ෂා කර ගැනීම අප සියලුදෙනාගේම වගකීමක් වන නිසා.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම ලෝකයේ මේ වෙනකොට nursingවලට, drivingවලට, IT ක්ෂේත්‍රයට ඉල්ලුම තිබෙනවා. ඒ වාගේම මේ

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

වෙන කොට chefsලා සහ cookලා සඳහාත් විශාල ඉල්ලුමක් තිබෙනවා. මේ රටේ ඒ සඳහා වෙනම අධ්‍යාපන මධ්‍යස්ථාන හදන්න අපි උත්සාහ කරන්නේ නැත්තේ ඇයි? උපාධිය වෙන්න පුළුවන්, ඩිප්ලෝමා වෙන්න පුළුවන්, වෙනත් ආකාරයේ පාඨමාලා වෙන්න පුළුවන්, එවැනි දේ හදලා පැහැදිලිව අපට මෙවැනි කණ්ඩායමක් නිර්මාණය කරන්න බැරිද? මොකද, ඒ හරහා විදේශ විනිමය විශාල ප්‍රමාණයක් අපේ රටට අරගන්න පුළුවන් නිසා. ඊශ්‍රායලය විශාල වශයෙන් අපට අවස්ථාව ලබා දීලා තිබෙනවා. හැබැයි, අපි ඒවා කඩාගන්න උත්සාහ කරනවා මිසක්, ඒවා හදාගන්න උත්සාහ කරන්නේ නැහැ. ඒක නිසා කරුණාකරලා ලෝකයේ තිබෙන ඉල්ලුම පිළිබඳව හරියට හොයා බලලා, මේ සම්බන්ධව අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරන්න ඔබතුමන්ලා හදා තිබෙන සැලැස්ම ගැන මම දැන ගන්න කැමැතියි.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු කථානායකතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නයෙන් යම්කිසි කාරණාවක් ගරු මන්ත්‍රීතුමා මතු කරලා තිබුණා. දෙවැනි අතුරු ප්‍රශ්නයට උත්තරයක් දෙන්න කලින්, ඒකටත් උත්තරයක් සපයන්න අවශ්‍යයි. විශේෂයෙන්ම විෂ මත්ද්‍රව්‍ය ඇතුළු ඒ දේවල්වලට සම්බන්ධ වෙච්ච ප්‍රජාව පුනරුත්ථාපනය කරමින් තමයි අපට ඔවුන් පිට රටවලට යවන්න සිදු වෙන්නේ. ගරු කථානායකතුමනි, ඒ රටවල පවතින අභ්‍යන්තර නීති-රීතිවලට අනුරූපීව තමයි ඒ කටයුතු සිදු කරන්න වෙන්නේ. ඒකට අපි රාජ්‍යයන් එක්ක සාකච්ඡා කළ යුතුයි. ඒ සම්බන්ධව පූර්ව වැඩසටහන්, - විශේෂයෙන්ම පුනරුත්ථාපනය හරහා - අපි දැන් කරන්න පටන් අරගෙන තිබෙනවා. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - National Dangerous Drugs Control Board - ඇතුළු විවිධ ආයතන මේකට සම්බන්ධ වෙලා තිබෙන බව අපි දන්නවා. පුනරුත්ථාපනයට අදාළ කරන මහජන ආරක්ෂක අමාත්‍යාංශය ඇතුළු සියලු ආයතන මේ සම්බන්ධව පූර්ව සාකච්ඡාවල නිරත වෙලා තිබෙනවා. මේක විශේෂ කාරණාවක් නිසා G2G agreement එකක් හරහා තමයි යන්න වෙන්නේ. ඒ වාගේම තමයි මේ අදාළ පුද්ගලයන්ගේ චෝදනාව බරපතළම චෝදනා නොවේ නම්, ඒ අයට නිසි පරිදි නීත්‍යනුකූලව පිට රටවලට යන්න පුළුවන් ක්‍රමවේදයක් දැනටමත් රට තුළ තිබෙනවා.

ඊළඟට, පුහුණු ශ්‍රමිකයින් පිටරටවල රැකියා සඳහා යැවීම ගත්තොත්, මේ මොහොත වන විට පුහුණු නොවන ශ්‍රමිකයින්ගේ - unskilled workersලාගේ - සංඛ්‍යාවට වඩා පුහුණු ශ්‍රමිකයින්ගේ සංඛ්‍යාව ඉතාම වේගයෙන් ඉස්සරහට යන තත්ත්වයක් තමයි දක්නට තිබෙන්නේ. ඒ නිසා අපි හැම පැත්තෙන්ම ඒ පුහුණුව ප්‍රවර්ධනය කරනවා. ඒ වාගේම පුහුණුව නොසලකා කවුරු හරි පුද්ගලයෙකු මැදිහත් වෙලා පිටරටවල රැකියා සඳහා යොමු කරනවා නම් ඊට අදාළව දඬුවම් ලබා දෙන ක්‍රමවේදයකුත් තිබෙනවා. මේ මොහොත වනකොට අපේ target එක ඒ sector එක තමයි. ඒ සම්බන්ධව විවිධ රටවල විවිධ අවස්ථා ලැබිලා තිබෙනවා. දැනටමත් මේ සම්බන්ධව ප්‍රමාණවත් වැඩ කටයුත්තක් අපි කරගෙන යනවා. විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශය පැත්තෙන් වුණත් අපි සෘජුවම SLITHM එකත් එක්ක සම්බන්ධ වෙලා hotel housekeeping වාගේම restaurant sector එක ඇතුළු දේවල්වලට අදාළව මැදිහත් වෙලා ඉන්නවා. ඒ වාගේම තමයි, වෙන පෞද්ගලික ආයතනත් මැදිහත් වෙලා විශේෂයෙන්ම NVQ පාඨමාලාවත් එක්ක ඒකාබද්ධ වෙමින් මේ කටයුත්ත දැනටමත් කරගෙන යනවා.

ඒ වාගේම තවත් විශේෂ කාරණාවක් කියන්න තිබෙනවා. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණත් එක්ක අපි බලාපොරොත්තු වනවා, ඕනෑම ළමයෙක් අපොස සාමාන්‍ය පෙළ විභාගය අසමත් වුණත්, යම්කිසි ආකාරයකින් තමන් තෝරාගන්නා වෘත්තීය පුහුණුව හරහා NVQ පාඨමාලාවත් එක්ක එළියට එනකොට අනිවාර්යයෙන් ඉතාම ලෙහෙසියෙන් විදේශ රැකියා වෙළෙඳ පොළකට ප්‍රවේශ වෙන්න පුළුවන් අවස්ථාවක් ඒ ළමයාට ලැබෙයි කියලා. ඒ නිසා දැනට පවතින රාමුව තුළ, පවතින system එක තුළ අපට කරන්න පුළුවන් උපරිම දේවල් අපි කරගෙන යනවා. ඒ වාගේම අනාගතයේදී අපි බලාපොරොත්තු වනවා, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයත් එක්ක - විශේෂයෙන්ම අපි තැන් තැන්වල අලුතෙන් ඒවා පටන් ගන්න ඕනෑ නැහැ - සියලු පාසල්, එහෙම නැත්නම් තෝරාගත් විශේෂ පාසල් පුහුණු මධ්‍යස්ථාන විධියට පරිවර්තනය වෙයි කියලා.

## 2000 වසරේ සිට බිඳ වැටුණු සමුපකාර ග්‍රාමීය බැංකු : විස්තර

### 2000ஆம் ஆண்டு முதல் வீழ்ச்சியடைந்துள்ள கிராமிய வங்கிகள்: விபரம்

### CO-OPERATIVE RURAL BANKS COLLAPSED SINCE 2000: DETAILS

1038/2025

**5.ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වන විට ක්‍රියාත්මක වන සමුපකාර ග්‍රාමීය බැංකු සංඛ්‍යාව කොපමණද;

(ii) එම බැංකුවල නම් කවරේද;

(iii) 2000 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ එම ග්‍රාමීය බැංකු අතරින් බිඳ වැටී ඇති බැංකු සංඛ්‍යාව කොපමණද;

(iv) එම බැංකුවල නම් කවරේද;

(v) එම තත්ත්වය හේතුවෙන් පීඩාවට පත්ව සිටින තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(vi) එම තැන්පත්කරුවන්ට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ලබා දී ඇති සහන කවරේද;

(vii) එම බැංකුවල මූල්‍ය වංචා සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ සිදු කර ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்போது இயங்கும் கூட்டுறவுக் கிராமிய வங்கிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி வங்கிகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி கிராமிய வங்கிகளுள் 2000ஆம் ஆண்டு முதல் இதுவரையான காலப்பகுதியில் வீழ்ச்சியடைந்துள்ள வங்கிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) மேற்படி வங்கிகளின் பெயர்கள் யாவை என்பதையும்;

(v) இந்நிலைமையின் காரணமாக பாதிக்கப் பட்டிருக்கும் வைப்பாளர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(vi) மேற்படி வைப்பாளர்களுக்குக் கூட்டுறவு அபிவிருத்தித் திணைக்களத்தின் மூலம் வழங்கப்பட்டுள்ள நிவாரணங்கள் யாவை என்பதையும்;

(vii) மேற்படி வங்கிகளின் நிதி மோசடி தொடர்பில் முறையான விசாரணைகளை மேற்கொண்டு அதற்குப் பொறுப்புக் கூறவேண்டிய நபர்களுக்கு எதிராக சட்டத்தை நடைமுறைப்படுத்துவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House the -

(i) number of Co-operative Rural Banks currently operating in Sri Lanka;

(ii) names of those banks;

(iii) number of Rural Banks among them which have collapsed during the period from the year 2000 to date;

(iv) names of the said banks;

(v) number of depositors who have been affected by that situation;

(vi) reliefs granted to the said depositors by the Department of Co-operative Development; and

(vii) measures that will be taken to conduct formal investigations into the financial frauds of those banks and to enforce the law against the persons responsible for them?

(b) If not, why?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2,469යි.

| පළාත | සමුපකාර ග්‍රාමීය බැංකු |
|---|---|
| බස්නාහිර | 531 |
| මධ්‍යම | 343 |
| වයඹ | 421 |
| උතුරු මැද | 181 |
| උතුර | 110 |
| නැගෙනහිර | 87 |
| දකුණ | 367 |
| සබරගමුව | 261 |
| ඌව | 168 |
| එකතුව | 2469 |

(ii) ඇමුණුම 01 මඟින් දක්වා ඇත. එය දීර්ඝ ලේඛනයක් බැවින් සභාගත* කරමි.

(iii) 77යි.

| | |
|---|---|
| බස්නාහිර | 48 |
| මධ්‍යම | 01 |
| වයඹ | නැත |
| උතුරු මැද | නැත |
| උතුර | නැත |
| නැගෙනහිර | නැත |
| දකුණ | 26 |
| සබරගමුව | නැත |
| ඌව | 02 |
| එකතුව | 77 |

(iv) ඇමුණුම 02 ලෙස පහත දක්වා ඇත.

**ඇමුණුම 02:**

**I. බස්නාහිර**

| අනු අංකය | විවිධ සේවා සමුපකාර සමිතිය | සමුපකාර ග්‍රාමීය බැංකුව |
|---|---|---|
| 01 | සී/ස දෙහිවල ගල්කිස්ස විවිධ සේවා සමුපකාර සමිතිය | නුගේගොඩ ග්‍රාමීය බැංකුව |
| 02 | | වුඩ්ලන්ඩ් ග්‍රාමීය බැංකුව |
| 03 | | බණ්ඩාරනායකපුර ග්‍රාමීය බැංකුව |
| 04 | | කරගම්පිටිය ග්‍රාමීය බැංකුව |
| 05 | | දෙහිවල ග්‍රාමීය බැංකුව |
| 06 | | ගල්කිස්ස නගර ග්‍රාමීය බැංකුව |
| 07 | | රත්මලාන නගර ග්‍රාමීය බැංකුව |
| 08 | | රත්මලාන ග්‍රාමීය බැංකුව |
| 09 | | අත්තිඩිය ග්‍රාමීය බැංකුව |
| 10 | | රජසිරිපුර ග්‍රාමීය බැංකුව |
| 11 | | කවුඩාන ග්‍රාමීය බැංකුව |
| 12 | | කිරුළපන ග්‍රාමීය බැංකුව |
| 13 | | කළුබෝවිල බටහිර ග්‍රාමීය බැංකුව |
| 14 | සී/ස නැගෙනහිර හේවාගම කෝරළයේ විවිධ සේවා සමුපකාර සමිතිය | ඇස්වත්ත ග්‍රාමීය බැංකුව |
| 15 | | පුවක්පිටිය ග්‍රාමීය බැංකුව |
| 16 | | කුඩගම ග්‍රාමීය බැංකුව |
| 17 | | අවිස්සාවේල්ල ග්‍රාමීය බැංකුව |
| 18 | | කොස්ගම ග්‍රාමීය බැංකුව |
| 19 | | මාවල්ගම ග්‍රාමීය බැංකුව |
| 20 | | සුදුවැල්ල ග්‍රාමීය බැංකුව |
| 21 | | හංවැල්ල ග්‍රාමීය බැංකුව |
| 22 | | තිරිපොල ග්‍රාමීය බැංකුව |
| 23 | | කහහේන ග්‍රාමීය බැංකුව |
| 24 | | වැලිකන්න ග්‍රාමීය බැංකුව |
| 25 | | වග ඉරිදාපොළ ග්‍රාමීය බැංකුව |
| 26 | | තුම්මෝදර ග්‍රාමීය බැංකුව |

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

| | | |
|---|---|---|
| 27 | | බෝපේ ග්‍රාමීය බැංකුව |
| 28 | | කහවල ග්‍රාමීය බැංකුව |
| 29 | | සාදුක්ක ග්‍රාමීය බැංකුව |
| 30 | | අරුක්වත්ත ග්‍රාමීය බැංකුව |
| 31 | | සින්නාවල ග්‍රාමීය බැංකුව |
| 32 | | පිටුම්පේ ග්‍රාමීය බැංකුව |
| 33 | | මීපේ ග්‍රාමීය බැංකුව |
| 34 | | කුන්නාපාන ග්‍රාමීය බැංකුව |
| 35 | | උඩුමුල්ල ග්‍රාමීය බැංකුව |
| 36 | | අංගමුව ග්‍රාමීය බැංකුව |
| 37 | | හංවැල්ල නගර ග්‍රාමීය බැංකුව |
| 38 | සී/ස මහරගම විවිධ සේවා සමුපකාර සමිතිය | පතිරගොඩ ග්‍රාමීය බැංකුව |
| 39 | | පමුණුව ග්‍රාමීය බැංකුව |
| 40 | | කොල්වත්ත ග්‍රාමීය බැංකුව |
| 41 | | දඹහේන ග්‍රාමීය බැංකුව |
| 42 | | මාදිවෙල ග්‍රාමීය බැංකුව |
| 43 | | තලපත්පිටිය ග්‍රාමීය බැංකුව |
| 44 | | පන්නිපිටිය ග්‍රාමීය බැංකුව |
| 45 | | නාවින්න ග්‍රාමීය බැංකුව |
| 46 | | බොරලැස්ගමුව උතුර ග්‍රාමීය බැංකුව |
| 47 | | පැපිලියාන ග්‍රාමීය බැංකුව |
| 48 | | මහරගම ග්‍රාමීය බැංකුව |

| පළාත | විවිධ සේවා සමුපකාර සමිතිය | සමුපකාර ග්‍රාමීය බැංකුව |
|---|---|---|
| මධ්‍යම | සී/ස මාතලේ නගර බැංකු සණස සමිතිය | |
| දකුණ | | හබරාදූව, අහංගම, උණවටුන, ඉමදූව, අගුළුගහ, දික්කුඹුර, හොරදූගොඩ, කහවැන්නගම, කබරගල, හීනටිගල, ගිනිගල, ලීසිං අංශය පරවාහැර තාඹටුන්න, කනත්තගොඩ, වෙහෙරහේන, කුඹල්ගම, දියගහ, ගොඩගම, වල්ගම, කුඩාව, මැද්දවත්ත, කැකණදුර, කොටුවෙගොඩ, මාකවිට, රෝහල් ශාඛාව, මාතර |
| ඌව | සී/ස උඩපලාත විවිධ සේවා සමුපකාර සමිතිය අඹගස්දෝව බැංකු ශාඛාව, පදිනාවෙල බැංකු ශාඛාව | අඹගස්දෝව බැංකු ශාඛාව, පදිනාවෙල බැංකු ශාඛාව |

(v) පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන් වාර්තා කරන පරිදි 200,068කි.

| | |
|---|---|
| බස්නාහිර | 139,811 |
| දකුණ | 60,128 |
| මධ්‍යම | 129 |
| වයඹ | අදාළ නොවේ |
| උතුරු මැද | අදාළ නොවේ |
| උතුර | අදාළ නොවේ |
| නැඟෙනහිර | අදාළ නොවේ |
| සබරගමුව | අදාළ නොවේ |
| ඌව | තැන්පත්කරුවන් පීඩාවට පත්ව නැත. අනෙකුත් බැංකු හරහා ඔවුන් ගනුදෙනු කරගෙන යනු ලැබේ. |
| එකතුව | **200,068** |

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මධ්‍යම පළාතේ සමිතියේ නම කියන්න පුළුවන්ද?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
නම් ටික මම පසුව කියන්නම්.

(vi)

| පළාත | ලබා දී ඇති සහන |
|---|---|
| බස්නාහිර | • බස්නාහිර පළාත් සමුපකාර අරමුදල මඟින් සීමාසහිත දෙහිවල ගල්කිස්ස විවිධ සේවා සමුපකාර සමිතියේ තැන්පතු ගෙවීම සඳහා රුපියල් මිලියන 25ක ණය මුදලක් සහන පොලී අනුපාත යටතේ ලබා දී ඇත.<br>• බස්නාහිර පළාත් සමුපකාර අරමුදල මඟින් සීමාසහිත මහරගම විවිධ සේවා සමුපකාර සමිතියේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 20ක ණය මුදලක් සහන පොලී අනුපාත යටතේ ලබාදී ඇත. |
| දකුණ | ආණ්ඩුකාරතුමා සමඟ සමිතියේ විධායක නිලධාරින් සමඟ සියලුම ග්‍රාමීය බැංකු කළමනාකරුවන් සමඟ සාකච්ඡා සිදු කරමින් පවතී. |
| මධ්‍යම | අදාළ නොවේ |
| වයඹ | අදාළ නොවේ |
| උතුරු මැද | අදාළ නොවේ |
| උතුර | අදාළ නොවේ |
| නැඟෙනහිර | අදාළ නොවේ |
| සබරගමුව | අදාළ නොවේ |
| ඌව | ග්‍රාමීය බැංකුවල ගනුදෙනුකරුවන් අපහසුතාවකට පත්ව ඇති බවක් අනාවරණය නොවේ. |

(vii) ඇමුණුම 03 ලෙස පහත දක්වා ඇත.

**ඇමුණුම 03:**

බස්නාහිර පළාත

| | විවිධ සේවා සමිතියේ නම | බිදැවී ඇති ශාඛා ගණන | අනාවරණය වූ ක්‍රියාව | ගත් ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 01 | සී/ස නැගෙනහිර හේවාගම කෝරළයේ විවිධ සේවා සමුපකාර සමිතිය | 24 | මුදල් වංචා | බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 47 (2) වගන්තිය යටතේ සිදුකළ විමර්ශනය අනුව අනාවරණය වූ මූල්‍ය හානිය වන රු.545,083,030.80 ක මුදල සඳහා වගකිව යුතු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ධූර වලින් ඉවත් කර ඇත.<br>එකී මූල්‍ය හානිය අයකර ගැනීම සඳහා බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 58 වගන්තිය යටතේ තීරකකරණයට යොමුකර ඇති අතර ඊට එරෙහිව වගඋත්තරකරුවන් මහාධිකරණය මගින් අතුරු තහනම් නියෝගයක් ලබාගෙන ඇත. |
| 02 | සී/ස දෙහිවල ගල්කිස්ස විවිධ සේවා සමුපකාර සමිතිය | 13 | මුදල් වංචා | දෙපාර්තමේන්තුව මගින් සමිතියේ මූල්‍ය අර්බුදය ඇතිවූ 2002 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 47 (2) වගන්තිය යටතේ විමර්ශනයක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී.<br>සමිතියේ කරගම්පිටිය ග්‍රාමීය බැංකුවේ 2017-2018 කාලය තුළ සිදු වූ රු.49,800,000.00 ක මූල්‍ය වංචාව හා දෙපාර්තමේන්තුව මගින් උසාවි බල ගන්වා මහාධිකරණ නඩු අංක HC/7855 යටතේ විභාග වෙමින් පවතී. ඊට අමතරව මෙ සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශණ ඒකකය මගින්ද අංක PA/DCI/P/6114/13 යටතේ පරීක්ෂණයන් සිදු කරනු ලබයි.<br>අත්තිඩිය ග්‍රාමීය බැංකුවේ සිදු වී ඇති රු.2,401,775.00 ක මූල්‍ය වංචාව පිළිබඳව මේ වන විට සමුපකාර ප්‍රඥප්තියේ 58 වගන්තිය ප්‍රකාරව කටයුතු කර ඇත.<br>2022 වර්ෂයේ විගණනය අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිදුකරන ලද පැමිණිල්ල අනුව විභාග කටයුතු සිදු වෙමින් පවතී. |
| 03 | සී/ස මහරගම විවිධ සේවා සමුපකාර සමිතිය | 11 | මුදල් වංචා | බස්නාහිර පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 47 (2) වගන්තිය යටතේ විමර්ශන දෙකක් සිදු කරමින් පවතී. |

මධ්‍යම පළාත

46/1 පරීක්ෂණ සිදුකරන ලද වංචා සහ එම වංචාවලට අදාල මුදල අයකර ගැනීම සඳහා අධිභාර නියෝග නිකුත්කර එම අධිකරණය වෙත යොමු කර ඇත.

දකුණු පළාත

- ගාල්ල විවිධ සේවා සමිති බල ප්‍රදේශයේ රුවනි සුමුදු කරුණාරත්න / විවිධ ආරවුල සමන් නිලන්ත ළමාහේවා HC 2020/5265 අධිකරණයට යොමු කර ඇත.
- හබරාදූව විවිධ සේවා සමිති බල ප්‍රදේශයේ එක් නඩුවක් අධිකරණයේ විභාගවෙමින් පවතී. සියළුම බැංකු ඒකාබද්ධ කර එක් බැංකු ශාඛාවක් පවත්වාගෙන යනු ලබයි.

මාතර

මේ සම්බන්ධව ගැටළුව හඳුනාගැනීම 2026 අප්‍රේල් මස සිදු වූ අතර ඉන් අනතුරුව 2026.04.29 දින දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 41(1) වගන්තිය යටතේ පොත්පත් පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා නිලධාරීන් හය දෙනෙකු වෙත බලය පවරා ඇති අතර දැනට පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. මෙ සමගම දකුණු පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 41 (5) වගන්තිය අනුව ග්‍රාමීය බැංකු ශාඛා 14 සඳහා පරීක්ෂණයක් සිදු කර ඇත. මීට අමතරව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ සිදු කරමින් පවතියි.

හම්බන්තොට

වීරකැටිය - 2005 වර්ෂයේ ජුලම්පිටිය ශාඛාවේ අනාවරණය වූ මුදල් වංචාවක් පිළිබඳ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් සිදු කර නඩු පවරා ඇත.

තංගල්ල -
2007 වර්ෂයේ කලුන්න ග්‍රාමීය බැංකුවේ සිදු වූ වංචාවක් සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් සිදු කර එම ණය අය කරගෙන ඇත.
2008 වර්ෂයේ රන්න ග්‍රාමීයබැංකුවේ විධිමත් නොවූ ණය කිහිපයක් ලබා දී ඇත. මේ වන විට අවශ්‍ය මූලික විමර්ශන කටයුතු සිදු වෙමින් පවතී.

2007-2008 වර්ෂයන්හි වාඩිගල ග්‍රාමීය බැංකුවේ ණය ලබා දීමේදී ගිවිසුමක් යටතේ ණය ලබා දී ඇත.

බෙලිඅත්ත - 2020 වර්ෂයේ මැදගොඩ ග්‍රාමීය බැංකු ශාඛාවේ අනාවරණය වූ මුදල් වංචාවකට සම්බන්ධව වූ සේවිකාවකට විනය පරීක්ෂණයක් සිදු කර දැනට සේවයෙන් පහ කර ඇත.

සබරගමුව පළාත

කෑගල්ල

- සී/ස බුලත්කොහුපිටිය වි.සේ.ස සමිතියේ පන්නල ග්‍රාමීය බැංකුවේ කළමණාකරු ලෙස සේවය කර ඇති හර්ෂණී රසාංගිකා යන අය විසින් අවභාවිතා කර ඇති මුදල් සම්බන්ධව 2017 වර්ෂයේ සිට අවිස්සාවේල්ල අපරාධ විමර්ශන අංශය විසින් නෛතික කටයුතු සිදු කරනු ලබයි.
- සී/ස බුලත්කොහුපිටිය වි.සේ.ස. සමිතියේ බුලත්කොහුපිටිය ග්‍රාමීය බැංකුවේ සිදු වී ඇති රු 1,313,416.00 ක මුදල සම්බන්ධයෙන් 2026.02.09 දින මූලික විමර්ශනයක් සිදු කර එත්කර වාසි යැවීමෙන් පසු රු 895,696.00 ක මුදල් ගෙවා ඇත. ඉතිරි රු. 417,720.00 ක මුදල තීරකකරණයට යොමු කර ඇත.
- සී/ස බුලත්කොහුපිටිය වි.සේ.ස. සමිතියේ බුලත්කොහුපිටිය, පන්නල ,දෙද්දුගල, තාරංගල, එරබදුවල යන ග්‍රාමීය බැංකු ශාඛා 05 හි ප්‍රධාන කාර්යාලීය අත්තිකාරම් ගිණුම හරහා සිදු වී ඇති මුදල් අවභාවිතාව සම්බන්ධව 2026.06.03 දින මූලික විමර්ශනයක් සිදු කිරීමට බලය පවරා එකී කටයුතු සිදු වෙමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ප්‍රශ්නයේ (අ) (v) කොටසට උත්තරයක් හැටියට කිව්වා, මධ්‍යම පළාතේ පීඩාවට පත් වී සිටින තැන්පත්කරුවන් සංඛ්‍යාව 129ක් කියලා. මම ඔබතුමාට කියනවා, ඒ තොරතුර වැරදියි කියලා. මොකද, මම එක සමිතියක් ගැන කියන්නම්. මම ඒකයි කිව්වේ, මධ්‍යම පළාතේ සමිතියේ නම කියන්න කියලා. මේ වනකොට උකුවෙල සණස සමිතියේ තැන්පත්කරුවන් 13,000ක් ඉන්නවා. රුපියල් කෝටි 90ක වංචාවක් පිළිබඳව කාලයක් තිස්සේ ඒ තැන්පත්කරුවන් මැසිවිලි නඟනවා. මොකද, ඒ අයගේ මුදල් ආපහු ගන්න විධියක් නැහැ. ඒ රුපියල් කෝටි 90න් රුපියල් කෝටි 50ක ණය දීලා තිබෙනවාය කියනවා. ඒ ණය වෙනුවෙන් ආයෝජනය කර තිබෙන්නේ රුපියල් කෝටි 20ක්ය කියනවා. ප්‍රතිලේඛනය කරලා ඉදිරියට එනකොට ඒකෙනුත් රුපියල් කෝටි 50ක වාගේ මුදලක් තමයි තිබෙනවා කියන්නේ. එතකොට මෙතැන වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා. මොකද, තැන්පත්කරුවන් ගිහින් මුදල් ගන්න හැදුවාම ඔවුන්ට ඒ මුදල් දෙන්නේ නැහැ. දෙන්නේත් රුපියල් 1,000ක්, 2,000ක් වාගේ මුදලක්. ඒ වාගේම මේ අය CID එකට ගිහිල්ලාත් පැමිණිලි කර තිබෙනවා, ලිඛිතවත් පැමිණිලි 47ක් දීලා තිබෙනවා. නමුත් මේ වෙනකම් ඒ පිළිබඳව කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. පොලීසියට ගිහින් පැමිණිල්ලක් දැම්මාම ඒකටත් ක්‍රියාත්මක වන්නේ නැහැ. මේ වනකොට මේ අය මේ සම්බන්ධව ජනාධිපතිතුමාව ලිඛිතව දැනුවත් කර තිබෙනවා. ඒ වාගේම විෂය භාර ඇමතිතුමා වන වසන්ත සමරසිංහ මහතා මුණ ගැහිලාත් මේ සම්බන්ධව ප්‍රකාශ කළා කියනවා. ඒ වාගේම දිස්ත්‍රික්කය නියෝජනය කරන නියෝජ්‍ය අමාත්‍ය ගමගෙදර දිසානායක මැතිතුමාවත් මේ සම්බන්ධව දැනුවත් කර තිබෙන බව කියනවා. එතකොට අර කියපු පිළිතුර පිළිබඳව අපට ගැටලුවක් තිබෙනවා. මේ ගැන ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක තමයි මම පළමුවැනි අතුරු ප්‍රශ්නයත්, දෙවැනි අතුරු ප්‍රශ්නයත් වශයෙන් අහන්නේ.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ කරුණු සමහර විට ඇත්ත වෙන්නත් පුළුවන්. ග්‍රාමීය බැංකු මුහුණ දීලා තිබෙන මේ ප්‍රශ්නය පිළිබඳව අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා.

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

පසුගිය දවස්වල පළාත් කොමසාරිස්වරුනුත්, පළාත් ආණ්ඩුකාරවරුනුත්, ඒ වාගේම පළාත්වල සමුපකාර සමිතිවල සභාපතිවරුන් සහ ඒකට අදාළ අනෙකුත් නිලධාරීනුත් ගෙන්වා අවස්ථා ගණනාවකදීම අපි මේ පිළිබඳව සාකච්ඡා කළා. ගරු කථානායකතුමනි, නමුත් ඒකේ තිබෙන ගැටලුවක් තමයි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පස්සේ මේ විෂය දෙකට බෙදිලා තිබීම. එතකොට මධ්‍යම රජය හැටියට අපට තිබෙන්නේ සමිති 70ක් විතර, අනෙක් සියලුම ඒවා තිබෙන්නේ පළාත් මට්ටමින් සමුපකාර කොමසාරිස්වරුන් යටතේ. මේවා අධීක්ෂණය කරනවා, අධීක්ෂණය කළාට අවසානයට මේකේ ප්‍රතිඵලය බවට පත්වෙලා තිබෙන්නේ ඒ අධීක්ෂණ ක්‍රියාවලියෙන් ගත්ත ක්‍රියාමාර්ග පිළිබඳව ගැටලුවක් මතුව තිබීමයි. *[බාධා කිරීමක්]* පළාත්වල විෂය බෙදිලා තිබෙන නිසා අපේ තිබෙන සමුපකාර පනතින් මධ්‍යම රජයේ අමාත්‍යාංශයට කිසිම අවස්ථාවක් නැහැ, ඒවා පරීක්ෂා කරන්න, ඒවාට මැදිහත් වන්න. ඒ නිසාම දැනට ක්‍රියාත්මක වන පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලියක් දැන් ආරම්භ කර තිබෙනවා. ඒ කටයුතු දැන් තිබෙන්නේ අවසාන අදියරේ.

අපි පසුගිය දවස්වල සියලුම පළාත්වල කොමසාරිස්වරුන් සහ ආණ්ඩුකාරවරුන් ගෙන්වා ඒකට අදාළ වගකීම දරන මේ පනත සංශෝධනය කිරීමේදී එක එක ගැටලු නිරාකරණය කරමින් මධ්‍යම රජය විධියට මේකට මැදිහත් වුණා. මොකද, මීට අදාළව තැන්පත්කරුවන් විශාල පිරිසක් සිටින නිසා. ඒ සම්බන්ධයෙන් මා සතුව විස්තරයකුත් ඇති. මම හිතන විධියට, ලංකාව පුරාම ගත්තොත් හොරකම්, වංචා සහ විවිධ දේවල් හරහා ඒ සියලුදෙනාට රුපියල් කෝටි 1,500ක විතර මුදලක් නැතිවෙලා තිබෙනවා. එතකොට මේවා ගෙවන්න හෝ වෙනත් කටයුතු කරන්න අපට හැකියාවක් නැහැ. නමුත් මේ පනත සංශෝධනය කිරීම හරහා අපි බලාපොරොත්තු වන්නේ නැහැ, පළාත් විෂය බෙදීම අපේ යටතට ගන්න. නමුත් අපට යම් අධීක්ෂණයක්, මැදිහත්වීමක් කරන්න පුළුවන් විධියට සංශෝධනය කරලා මේ වෙනුවෙන් මැදිහත් වෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

පළාත් සමුපකාර අරමුදලක් තිබෙනවා. ඊට අමතරව මධ්‍යම රජයේත් පළාත් සමුපකාර අරමුදලක් තිබෙනවා. ඒ අරමුදල් දෙකම පාවිච්චි කරලා මේකට යම් මැදිහත්වීමක් කරන්න පුළුවන්ද කියලා අපි උත්සාහ කරලා බැලුවා. නමුත් ගරු මන්ත්‍රීතුමියනි, මම බස්නාහිර පළාතේ සහ මධ්‍යම පළාතේ දඹුල්ල වාගේ තැන්වලටත් ගියා. ඒ තැන්වලත් තිබෙන ගැටලුව තමයි, එලෙස කරලා තිබෙන වංචාවේ ප්‍රමාණයට සාපේක්ෂව අරමුදල් වැඩි කරන්න බැරි වීම. ඒ නිසා මොකක්ද කරන්නේ කියලා අවසාන තීන්දුවක් ගැනීමට අපි ආසන්නතම දවසකදී සියලුම කොමසාරිස්වරු සහ ආණ්ඩුකාරවරු ගෙනැල්ලා නැවත සාකච්ඡාවක් පැවැත්වුවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ උත්තරය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරගන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමිය අතුරු ප්‍රශ්න දෙකම අහලා ඉවරයි නේ. *[බාධා කිරීමක්]* ආයෙත් පැහැදිලි කර ගැනීමක් කරන්න බැහැ. එතුමා ලබා දුන් උත්තරයෙන් පස්සේ කථාව ඉවරයි.

## ඊශ්‍රායල-ඉරාන ගැටුම: ශ්‍රී ලංකා ආර්ථිකයට සහ ඉන්ධන ආනයනයට ඇති බලපෑම
## இஸ்ரேல் - ஈரான் மோதல்: இலங்கையின் பொருளாதாரம் மற்றும் எரிபொருள் இறக்குமதி மீதான தாக்கம்
## ISRAEL-IRAN CONFLICT: IMPACT ON SRI LANKA'S ECONOMY AND FUEL IMPORTS

1077/2025

**6. ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඊශ්‍රායල-ඉරාන ගැටුම හේතුවෙන් ගෝලීය බොර තෙල් මිල සහ ආනයන පිරිවැය කෙරෙහි ඇති වී තිබෙන බලපෑම තක්සේරු කර තිබේද;

(ii) ඉන්ධන මිල ඉහළ යාම, උද්ධමනය සහ ජීවන වියදම යනාදිය අවම කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති හදිසි අවස්ථා ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඉන්ධන ආනයන විවිධාංගීකරණය කිරීම හෝ දිගු කාලීන සැපයුම් ගිවිසුම් ඇති කර ගැනීම සඳහා කිසියම් උපාය මාර්ගයක් තිබේද;

(iv) වෙළෙඳ මාර්ගවල බාධා පැමිණීම හේතුවෙන් කොළඹ සහ හම්බන්තොට වරායන් කෙරෙහි ඇති කරන බලපෑම තක්සේරු කර තිබේද;

(v) නැව්ගත කිරීමේ රක්ෂණ වාරික සහ භාණ්ඩ ප්‍රවාහන පිරිවැය මඟින් ශ්‍රී ලංකාවේ වෙළෙඳාම කෙරෙහි බලපෑම් ඇති වන්නේද;

(vi) ගැටුමෙන් ඇති වන අතුරු බලපෑම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධීකරණය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) තෙල් මිල ඉහළ යාම හේතුවෙන් ගෙවුම් ශේෂය, අය වැය හිඟය සහ ණය සේවාකරණය කෙරෙහි ඇති විය හැකි යැයි අපේක්ෂිත බලපෑම කවරේද;

(ii) අවදානමට ලක් විය හැකි ක්ෂේත්‍ර ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) මෙකී කම්පනවලින් ආර්ථිකය ආරක්ෂා කර ගැනීම සඳහා සූදානම් කර ඇති රාජ්‍ය මූල්‍ය හෝ මුදල් ප්‍රතිපත්තිමය මෙවලම් කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சர் மற்றும் கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) உலகளாவிய மசகு எண்ணெய் விலைகள் மற்றும் இறக்குமதிச் செலவுகள்மீது இஸ்ரேல் - ஈரான் மோதலின் தாக்கம் மதிப்பிடப்பட்டுள்ளதா என்பதையும்;

(ii) எரிபொருள் விலை அதிகரிப்பு, பணவீக்கம் மற்றும் வாழ்க்கைச் செலவு ஆகியவற்றைத் தணிப்பதற்காக நடைமுறையிலுள்ள அவசர ஏற்பாட்டு நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) எரிபொருள் இறக்குமதிகளைப் பல்வகைப்படுத்துவதற்கு அல்லது நீண்டகால விநியோக ஒப்பந்தங்களைப் பெற்றுக்கொள்வதற்கு ஏதேனும் மூலோபாயம் உள்ளதா என்பதையும்;

(iv) வர்த்தக மார்க்கங்களிலான தடங்கல்கள் கொழும்பு மற்றும் அம்பாந்தோட்டைத் துறைமுகங்களில் ஏற்படுத்தக்கூடிய தாக்கம் குறித்து மதிப்பிடப்பட்டுள்ளதா என்பதையும்;

(v) கப்பல் காப்புறுதிக் கொடுப்பனவுகள் மற்றும் சரக்குச் செலவுகள் இலங்கையின் வர்த்தகத்தைப் பாதிக்கின்றனவா என்பதையும்;

(vi) மோதலின் பக்கவிளைவுகளுக்கு முகம்கொடுப்பதற்காகக் காணப்படும் இராஜதந்திர ரீதியிலான ஒருங்கிணைப்பு யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சென்மதி நிலுவை, வரவுசெலவுத்திட்டப் பற்றாக்குறை மற்றும் கடனை மீளச் செலுத்துதல் ஆகியவற்றின் மீது அதிகரிக்கும் எண்ணெய் விலைகள் ஏற்படுத்தக்கூடியதாக எதிர்வுகூறப்படும் தாக்கம் யாது என்பதையும்;

(ii) பாதிக்கப்படக்கூடிய துறைகளைப் பாதுகாப்பதற்கான நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) இந்த அதிர்ச்சிகளிலிருந்து பொருளாதாரத்தைப் பாதுகாப்பதற்குத் தயார்செய்யப்பட்டுள்ள நிதிய அல்லது நாணயக் கருவிகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether the impact of the Israel-Iran Conflict on global crude oil prices and import costs has been assessed;

(ii) the contingency measures that are in place to mitigate fuel price increases, inflation and cost of living;

(iii) whether a strategy exists to diversify fuel imports or secure long-term supply contracts;

(iv) whether the effect on the Colombo and Hambantota Ports due to the disruptions in trade routes have been assessed;

(v) whether shipping insurance premiums and cargo costs are affecting Sri Lanka's trade; and

(vi) the diplomatic coordination that exists to respond to spillovers from the conflict?

(b) Will he also inform this House the -

(i) projected impact of rising oil prices on the balance of payments, Budget deficit and debt servicing;

(ii) measures taken to protect vulnerable sectors; and

(iii) fiscal or monetary tools prepared to cushion the economy from these shocks?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

2026 වසරේ පළමු භාගය තුළ සමුච්චිත ඉන්ධන ආනයන වියදම් දළ වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 3,168ක් වූ අතර, එය 2025 වසරේ අනුරූප කාල පරිච්ඡේදයේ වාර්තා වූ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,995කට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ අගයක් ලෙස වාර්තා වේ.

(ii)
- 2026 වසරේ මැයි මාසයේදී මහ බැංකුව එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පදනම් අංක 100කින් සියයට 8.75 දක්වා ඉහළ නංවමින් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කරන ලදී. දේශීය හා ගෝලීය ආර්ථික ප්‍රවණතා සහ මතු වෙමින් පවතින අවදානම් පිළිබඳව මහ බැංකුව තවදුරටත් සුපරීක්ෂාකාරීව ඇගැයීමට ලක් කරන අතර, දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා සුදුසු පරිදි තවදුරටත් ප්‍රතිපත්තිමය පියවර ගැනීමට සූදානම්ව සිටී.
- ඉන්ධන ඉල්ලුම පාලනය කිරීම සඳහා රජය විසින් පෙර පැවති QR කේත ක්‍රමය මෙන්ම වාහන අංකය පදනම්ව ඉන්ධන ලබා දීමේ ක්‍රමවේදය 2026 මාර්තු මස සිට වහාම ක්‍රියාත්මක කරන ලදී.
- පීඩාවට පත් ජනතාවට සහන සැලසීම අරමුණ කර ගනිමින් රජය විසින් රුපියල් බිලියන 100ක සහන පැකේජයක් 2026 අප්‍රේල් මස ගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයට පත් කරන ලදී.

(iii) පහත සඳහන් උපාය මාර්ග ගෙන තිබේ.

විවිධ සැපයුම් මාර්ග හරහා ලබා ගත හැකි විකල්ප බොර තෙල් වර්ග වෙත අවධානය යොමු කර ඇත. එහිදී සාමාන්‍යයෙන් සපුගස්කන්ද පිරිපහදුවට ආනයනය කරන Murban වර්ගයේ බොර තෙල්වලට අමතරව WTI, Miri Light සහ Saharan Blend යන බොර තෙල් වර්ග සඳහාද තනි ටෙන්ඩර් - single tenders - මඟින් ලංසු කැඳවන ලදී. තවද, එම අවස්ථාවේදී බොර තෙල් මිලදී ගැනීමේ ක්‍රියාවලියේ නම්‍යශීලීභාවය ඉහළ නැංවීම සඳහා නැවෙන් නැවට තෙල් මාරු කිරීමේ - STS - ක්‍රමවේදයටද ඉඩ ලබා දෙමින් එම ටෙන්ඩර් කැඳවන ලදී.

(iv) සෘජුවම තක්සේරු කර නොමැත.

(v) ඔව්.

ශ්‍රී ලංකාව සඳහා ආනයන කෙරෙහි එල්ල වන ප්‍රධානතම බලපෑම වන්නේ ආනයනික භාණ්ඩවල ගොඩබෑමේ පිරිවැය ඉහළ යාමයි.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

ඉන්ධන, ආහාර ද්‍රව්‍ය, පොහොර, කාර්මික අමුද්‍රව්‍ය සහ අනෙකුත් අත්‍යවශ්‍ය භාණ්ඩ ඇතුළුව සාගර ප්‍රවාහනය මත බෙහෙවින් යැපෙන වෙළෙඳ භාණ්ඩ සහ අතරමැදි යෙදවුම් සඳහා මෙය විශේෂයෙන්ම බලපානු ඇත.

අපනයනවලට අදාළව ගත් කල ඉහළ යන ප්‍රවාහන හා රක්ෂණ පිරිවැය හේතුවෙන් ශ්‍රී ලාංකීය නිෂ්පාදන විදේශීය වෙළෙඳ පොළවල් වෙත සැපයීමේ පිරිවැය ඉහළ යා හැකි අතර, එමඟින් අපනයනකරුවන්ගේ ලාභ ආන්තික සහ මිල තරගකාරිත්වය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල වේ. ජාත්‍යන්තර ගැනුම්කරුවන් භාණ්ඩ සැපයීමේ මිල සහ ඒ සඳහා වන පූරක කාලය පිළිබඳව වඩාත් සංවේදී වන ඇඟලුම්, තේ සහ රබර් වැනි අපනයන ක්ෂේත්‍ර සඳහා මෙය විශේෂයෙන්ම බලපෑ හැකිය.

(vi)
- කලාපීය සහ ජාත්‍යන්තර සාමය, ආරක්ෂාව සහ ස්ථාවරත්වය සඳහා ගැටුමේ බරපතළ ඇඟවුම් සැලකිල්ලට ගනිමින්, අර්ථවත් සංවාදයක නිරත වන ලෙස සහ ගැටුම් අවම කිරීම සඳහා තීරණාත්මක ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ සියලු පාර්ශ්වයන්ගෙන් ඉල්ලා සිටිමින් අවශ්‍ය අවස්ථාවන්හිදී මැදිහත් වීම.

- ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සහ ඔහුගේ පාර්ශ්වකරු අතර මෙන්ම විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යවරයා සහ මැද පෙරදිග රටවල ඔහුගේ පාර්ශ්වකරුවන් අතර අවශ්‍ය අවස්ථාවලදී දුරකථන සංවාද සඳහා පහසුකම් සැලසීම.

- මැද පෙරදිග පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල හරහා ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රදේශවල සිටින ශ්‍රී ලාංකිකයන් සඳහා කොන්සියුලර් සහාය සහ සුභසාධන සහාය සැපයීම සම්බන්ධීකරණය කිරීම හා අවශ්‍ය පරිදි කාලෝචිත තොරතුරු බෙදා හැරීම.

තවද, මැද පෙරදිග යුද ගැටුම් ආරම්භයේ සිට විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල, මෙරට පිහිටි විදේශ තානාපති කාර්යාල සහ අදාළ අංශයන් සම්බන්ධීකරණය කරමින් හදිසි ප්‍රතිචාර ඒකකයක් පවත්වාගෙන යන ලදී.

- එසේම ගැටුම් පවතින කලාප තුළ ජීවත් වූ ශ්‍රී ලාංකිකයන් සිය රටට පැමිණීමට කැමැත්ත ප්‍රකාශ කළ අවස්ථාවන්හිදී එම කටයුතු අදාළ විදේශ රාජ්‍යයන්හි බලධරයන් සමඟ සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය පහසුකම් සැපයීමද සිදු කරන ලදී.

- එම යුද ගැටුම් තීව්‍ර වූ අවස්ථාවේදී ගුවන් ගමන් ක්ෂණික අත්හිටුවීම් සහ බාධා සිදුවීම් හේතුවෙන් බලපෑමට ලක් වී ශ්‍රී ලංකාව තුළ රැඳී සිටි විදේශකයන් සිය රටට යැවීම සඳහා අවශ්‍ය ගුවන් සේවා සමඟ සාකච්ඡා පවත්වමින් සහ ඔවුන්ගේ රටට යෑම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණ කටයුතු සැලසීම මෙම හදිසි ප්‍රතිචාර ඒකකය විසින් සිදු කරන ලදී.

(ආ) (i) ගරු කථානායකතුමනි, ගෝලීය තෙල් මිල ඉහළ යෑම හේතුවෙන් අපේ රටට විතරක් නොවෙයි, පොදුවේ ගෝලීය රටවල් බොහොමයකට ප්‍රශ්න රාශියක් අත්විඳින්න සිද්ධ වෙලා තිබෙනවා. ඒවා අතර ඉන්ධන ආනයන වියදම ඉහළ යෑම, වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය පුළුල් වීම, ජීවන වියදම ඉහළ යෑම, අය වැය පරතරය පුළුල් වීම හා වෙළෙඳාමට ඇති වුණු බලපෑම් වැනි කාරණා තිබෙනවා. මෙවැනි තත්ත්ව අද අපේ රටට විතරක් නොවෙයි සීමා වෙලා තිබෙන්නේ. ගෝලීය වශයෙන් රටවල් බොහොමයකට මේ තත්ත්වය බලපානවා. මෙලෙස සිද්ධ වන කාරණාවලදී අපි වාගේ රටකට කරන්න පුළුවන් වෙන්නේ නිරන්තරයෙන් ඒවා ගැන නිරීක්ෂණය - observe - කරමින්, ඒවා analyse කරමින්, දත්ත හරියට ලබා ගනිමින් අවශ්‍ය අවස්ථාවන්හිදී ඒ සඳහා මැදිහත් වීමයි. එමඟින් ජනතාවට වෙන්න පුළුවන් බලපෑම අවම කිරීම සහ ජනතාවට වන බලපෑම් වෙනුවෙන් සුබසාධන වැඩසටහන් සකස් කිරීම සහ ඒකට සූදානම් වීම තමයි ගරු කථානායකතුමනි, එහිදී අපට කරන්න වෙන්නේ. සමස්ත ගෝලීය ආර්ථිකයට බලපාන තත්ත්වයන් ශ්‍රී ලංකාව වැනි රටක් හොඳට නිරීක්ෂණය කළ යුතුයි. අපි දකිනවා, අපේ අසල්වැසි රටවලත් විවිධ ප්‍රශ්න මතු වෙලා තිබෙන බව. ඒවා කොහොමද අපේ රටට බලපාන්නේ කියන එක පිළිබඳවත් අපට හොඳ අවබෝධයකින් තමයි වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

(ii), (iii) <u>රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග</u>

- පීඩාවට පත් ජනතාවට සහන සැලසීම අරමුණ කර ගනිමින් රජය විසින් රුපියල් බිලියන 100ක සහන පැකේජයක් 2026 අප්‍රේල් මස ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයට පත් කරන ලදී.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මතුපිට උද්ධමනය සියයට 5ක උද්ධමන ඉලක්කය මත හෝ එයට ආසන්න මට්ටමක පවත්වාගෙන යාම සඳහා ඉදිරි දැක්මක් සහිතව සහ දත්ත මත පදනම්ව මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සිදු කරනු ලබයි.
- නම්‍යශීලී උද්ධමන ඉලක්ක කරන රාමුවට අනුකූලව මහ බැංකුව විසින් නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් ක්‍රියාත්මක කරන අතර, එය ස්වයංක්‍රිය ආර්ථික කම්පන අවශෝෂකයක් ලෙස ක්‍රියා කරයි.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වසර තුනක කාල සීමාවක් පුරා පවත්වාගෙන ගිය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙනස් කරමින්, 2026 මැයි මාසයේදී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය - OPR - පදනම් අංක 100කින් සියයට 8.75ක් දක්වා ඉහළ නංවන ලදී.
- ඉදිරියටත් ගෝලීය ඛනිජ තෙල් මිල ගණන් ඉහළ යාම නිසා ඇති වන උද්ධමන පීඩන, අපේක්ෂිත කාල සීමාවට වඩා වැඩි කාලයක පැවතුණහොත් සහ උද්ධමන අපේක්ෂා උද්ධමන ඉලක්කයෙන් විතැන්වීමේ අවදානමක් මතු වුවහොත් සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව සූදානමින් සිටී.

(ඇ) අදාළ නොවේ.

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ சபாநாயகர் அவர்களே, சர்வதேச சூழ்நிலையால் இலங்கைக்கு ஏற்படக்கூடிய பொருளாதாரப் பாதிப்புகளை எதிர்கொள்வதற்காக எமது அரசாங்கம் இதுவரை எடுத்துள்ள முன்னெச்சரிக்கை நடவடிக்கைகளை நான் மனமாரப் பாராட்டுகின்றேன். குறிப்பாக, எரிபொருள் விநியோகம் மற்றும் நாட்டின் அத்தியாவசியத் தேவைகளைப் பேணுவதற்கு எமது அரசாங்கம் முன்னெடுத்துள்ள நடவடிக்கைகள் மக்களுக்கு நம்பிக்கையை ஏற்படுத்தியுள்ளபோதும், தற்போது சர்வதேச சந்தையில் ஏற்பட்டுவரும் மாற்றங்களால் எரிபொருள் விலையதிகரிப்பு, போக்குவரத்துச் செலவு மற்றும் அத்தியாவசியப் பொருட்களின் விலையேற்றம் தொடர்பான பொதுமக்களின் கவலை நீடித்துள்ளது. இந்த நிலை தொடர்ந்தால் குறைந்த வருமானம் பெறும் குடும்பங்கள், விவசாயிகள், மீனவர்கள் மற்றும் சிறுதொழில் முனைவோர் அதிகமாகப் பாதிக்கப்படக்கூடும் என்பதைக் கருத்திற்கொண்டு, பொதுமக்கள்மீது ஏற்படக்கூடிய பொருளாதாரச் சுமையைக் குறைப்பதற்காக எமது அரசாங்கம் எடுக்கும் நடவடிக்கைகள் தொடர்பாக கௌரவ பிரதம அமைச்சர் அவர்கள் தெளிவுபடுத்தியிருக்கின்றார். அது தொடர்பாக மேலதிக நடவடிக்கைகள் ஏதேனும் இருக்கிறதா?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එතුමා නඟපු අතුරු ප්‍රශ්නය මට හරියට පැහැදිලි වුණේ නැහැ. එතුමා නිශ්චිත ප්‍රශ්නයක් මතු කළේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, would you clearly ask your Supplementary Question please?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

අදහසක් ප්‍රකාශ කළා. නමුත් එතුමා නිශ්චිත ප්‍රශ්නයක් මතු කළේ නැහැ.

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ சபாநாயகர் அவர்களே, விலை மாற்றங்கள் தொடர்பாக கௌரவ பிரதம அமைச்சர் அவர்கள் தெளிவான பதிலை வழங்கியிருக்கின்றார். இருந்தபோதும் மக்கள் மத்தியில் சில கேள்விகள் இருக்கின்றன.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, you have to shorten your Question.

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

இப்படியான நிலைமைகள் தொடர்ந்து நீடிக்கும்பொழுது குறைந்த வருமானம் கொண்ட குடும்பங்கள் பாதிக்கப்படுகின்றன. எனவே, அது தொடர்பாக நீண்டகாலத் திட்டமொன்றை வகுப்பதற்கான நடவடிக்கை எடுக்கப்படுமா? எனக் கேட்கின்றேன்.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

පැහැදිලියි, ගරු මන්ත්‍රීතුමා. ඒ වෙනුවෙන් මේ අවුරුද්දෙත් බිලියන 100ක සහන පැකේජයක් රජය වෙන් කර තිබෙනවා. උදාහරණයක් ගත්තොත්, ඉන්ධන මිල සහනයක් නිශ්චිත ක්ෂේත්‍රවලට ලබා දීලා තිබෙනවා. විදුලි බිල ඉහළ යෑමත් සමඟම අඩු ආදායම්ලාභී හෝ විදුලිය අඩුවෙන් පාවිච්චි කරන - units 180ට අඩුවෙන් පාවිච්චි කරන - පවුල් සඳහා සහනයක් දීලා තිබෙනවා. ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට විවිධ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ වාගේම ආහාර සුරක්ෂිතතාවට හානියක් නොවන විධියට අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා දීම සඳහා කටයුතු කරමින් ඉන්නවා. අස්වැසුම වැනි සහනාධාරවල කාලය දීර්ඝ කර තිබෙනවා. නිශ්චිත කාලයකට සීමා වෙච්ච ඒ සහනාධාර දිය යුතු කාලය අපි දීර්ඝ කර තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய கேள்விகளுக்கு கௌரவ பிரதம அமைச்சர் அவர்கள் தெளிவான பதில்களை வழங்கினார். அதற்காக அவருக்கு நன்றி கூறுகின்றேன்.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පස් පරීක්ෂා කිරීම: ක්‍රමවේදය සහ ස්ථාපිත විද්‍යාගාර

கமத்தொழில் திணைக்களத்தினால் மண் பரிசோதனை: பின்பற்றப்படும் வழிமுறையும் நிறுவப்பட்டுள்ள ஆய்வுகூடங்களும்

SOILTESTING BY DEPARTMENT OF AGRICULTURE: METHODOLOGY ADOPTED AND LABS ESTABLISHED

1249/2025

**7.** ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) පස් පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iii) පස් පරීක්ෂා කිරීමේ අරමුණ කවරේද;

(iv) පස් පරීක්ෂා කිරීම සඳහා මේ වනවිට ස්ථාපිත කර ඇති විද්‍යාගාර සංඛ්‍යාව කොපමණද;

(v) ඒවා ස්ථාපිත කර ඇති ස්ථාන කවරේද;

(vi) 2024 වර්ෂයේ සිට මේ දක්වා පරීක්ෂා කර ඇති පස් සාම්පල් සංඛ්‍යාව, එම පස් සාම්පල් ලබා ගෙන ඇති ස්ථාන අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கமத்தொழில் திணைக்களத்தில் மண் பரிசோதனைக்கான வழிமுறையொன்று காணப் படுகின்றதா என்பதையும்;

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

(ii) ஆமெனில், அவ்வழிமுறை யாது என்பதையும்;

(iii) மண் பரிசோதனை செய்யப்படுவதன் நோக்கம் யாது என்பதையும்;

(iv) மண் பரிசோதனைக்காக இற்றைவரை நிறுவப் பட்டுள்ள ஆய்வுகூடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) அவை நிறுவப்பட்டுள்ள இடங்கள் யாவை என்பதையும்;

(vi) 2024ஆம் ஆண்டிலிருந்து இதுவரை பரிசோதனை செய்யப்பட்ட மண் மாதிரிகளின் எண்ணிக்கை, அந்த மண் மாதிரிகள் பெறப்பட்ட இடங்களின் அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether the Department of Agriculture has a methodology to test soil;

(ii) if so, the said methodology;

(iii) the purpose of testing soil;

(iv) the number of laboratories that have been established for soil testing at present;

(v) the locations where the said laboratories have been established; and

(vi) the number of soil samples that have been tested since 2024 up to now, separately by the locations from which the said soil samples were obtained?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

පස් පරීක්ෂා කර පොහොර යෙදීම සඳහා ක්‍රමවේදයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 1993 සිට මේ දක්වා ක්‍රියාත්මක වේ.

(ii)
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරින්, ගොවීන් හෝ වෙනත් පාර්ශ්වයන් විසින් ගොවි ක්ෂේත්‍රවලින් ලබාගන්නා පස් සාම්පල සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් පාංශු රසායනාගාර වෙතින් විශ්ලේෂණ වාර්තා ලබා ගත හැකිය.
- පස් සාම්පල ලබාගන්නා ආකාරය පිළිබඳව ව්‍යාප්ති නිලධාරින් සහ ගොවීන් දැනුවත් කර ඇති අතර, ඒ සඳහා අත්පත්‍රිකා ද මුද්‍රණය කර බෙදා හැර ඇත. එසේමගුවන්විදුලි හා අනෙකුත් විද්‍යුත් මාධ්‍ය මඟින්, රැස්වීම් මඟින් පස් පරීක්ෂාවේ වැදගත්කම සහ පස් සාම්පල ලබාගන්නා ආකාරය පිළිබඳව දැනුවත් කිරීම් සිදු කර ඇති අතර, එම දැනුවත් කිරීම් නිරන්තරයෙන් තවදුරටත් සිදු කරනු ලැබේ.
- එලෙස ලබා ගන්නා පස් සාම්පල නිවැරදිව ලේබල් කර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් රසායනාගාර වෙත ලබා දෙනු ලබයි. එක් පස් නියැදියක් පරීක්ෂා කිරීම සඳහා රුපියල් 290 වැනි සහනදායි මුදලක් අය කරනු ලැබේ. එම මුදල පාංශු රසායනාගාරය අයත් ආයතනයට හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංකයට ගෙවා ලබා ගන්නා ලද රිසිට් පත සමඟ පස් නියැදිය රසායනාගාරය වෙත භාර දිය යුතු වේ.
- රසායනාගාර මඟින් එම සාම්පල පහත පරාමිතීන් සඳහා විශ්ලේෂණය කරනු ලබයි.

  1. පී.එච්. අගය
  2. ලවණතාව
  3. ශාකයට ලබාගත හැකි පොස්පරස් පෝෂක ප්‍රමාණය
  4. ශාකයට ලබාගත හැකි පොටෑසියම් පෝෂක ප්‍රමාණය
  5. පසේ අඩංගු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය

- පස් පරීක්ෂාවේ ප්‍රතිඵල අනුව, ගොවීන් විසින් වගා කිරීමට සැලසුම් කරන බෝග සඳහා පොස්පරස් හා පොටෑසියම් පෝෂකයන්ට අදාළ පොහොර නිර්දේශ නිකුත් කරනු ලැබේ. තවද, පසේ ආම්ලිකතාව නිවැරදි කිරීමට සහ කාබනික ද්‍රව්‍ය යෙදීම සඳහා ද නිර්දේශ ලබාදෙන අතර, වගා භූමියේ ලවණතාව ඇති නොවන පරිදි වගා භූමිය නිසි ලෙස සකස් කර පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස් ද ලබා දෙනු ලැබේ. මෙම විශ්ලේෂණ දත්ත පදනම් කරගෙන පසේ පවතින පාංශු ගැටලු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ගොවීන් වෙත ලබා දෙනු ලැබේ.
- පස් විශ්ලේෂණ වාර්තාව ලබා දීමට සති 3ක පමණ කාලයක් ගත වේ.

(iii)
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ආහාර බෝග සඳහා, බෝග අවශ්‍යතා හා වර්ධන අවධි අනුව පොහොර නිර්දේශ සකස් කර ඇත.
- පස් පරීක්ෂාව මඟින් පසේ අඩංගු පොස්පරස් සහ පොටෑසියම් වැනි පෝෂක ප්‍රමාණාත්මකව නිර්ණය කළ හැකි බැවින්, පසෙහි එම පෝෂක ප්‍රමාණවත් ලෙස පවතින අවස්ථාවලදී නිර්දේශිත පොහොර ප්‍රමාණය අඩු කිරීමට හැකියාව ලැබේ.
- පසේ ආම්ලිකතාව (පී.එච්. අගය) පරීක්ෂා කිරීම මඟින් එය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා නිර්දේශ ලබා දේ. (පී.එච්. අගය 5ට අඩු නම්, එනම් පස ආම්ලික නම්,

අක්කරයකට ඩොලමයිට් හෝ අළුහුණු කිලෝග්‍රෑම් 800ක් යෙදීමට නිර්දේශ කරනු ලැබේ)

- පසේ ආම්ලිකතාව නිවැරදි කිරීම මඟින් බෝග සඳහා යොදන පොහොරවල කාර්යක්ෂමතාව වැඩි වන අතර, පොහොර අපතේ යාම සහ බෝගවලට විෂවීම් ඇතිවීම අවම වේ. බොහෝ ආහාර බෝග සඳහා සුදුසු පී.එච්. අගය 6-7 අතර වේ.
- පස් පරීක්ෂාව මඟින් පසේ ලවණතාව වැනි පාංශු ගැටලු හඳුනාගෙන ඒවා අවම කිරීම සඳහා උපදෙස් ලබා දේ.

- පසේ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය නිර්ණය කිරීම මඟින් යෙදිය යුතු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය පිළිබඳ නිර්දේශ ලබා දේ.
- පස් පරීක්ෂා කර නිවැරදිව පොහොර යෙදීම මඟින් භෝගවල පෝෂක ඌනතා හෝ විෂවීම් අවම කරයි.
- පොහොර අපතේ යාම අවම කරන අතර අධික පොහොර භාවිතය නිසා ඇති විය හැකි පාංශු හා පාරිසරික ගැටලු (පරිසර දූෂණ ආදිය) අවම කරයි.
- පොහොර සඳහා වැය වන පිරිවැය අවම කරයි.
- අස්වැන්න සහ භෝග නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නංවයි.
- අධික පොහොර භාවිතය හේතුවෙන් රෝග හා පළිබෝධ හානි වැඩි විය හැකි බැවින් පස් පරීක්ෂා කර නිවැරදිව පොහොර යෙදීම මඟින් රෝග හා පළිබෝධ හානි අවම කර පළිබෝධ නාශක භාවිතය ද අඩු කරයි.
- පස් පරීක්ෂා කර නිසි ලෙස පොහොර යෙදීම මඟින් පසෙහි සෞඛ්‍ය තත්ත්වය - soil health - සහ පසෙහි රසායනික, භෞතික හා ජෛවීය ගුණාංග වැඩිදියුණු කර සාරවත් පසක් ගොඩනැඟීමට දායක වේ.

(iv) පර්යේෂණ මධ්‍යස්ථාන තුළ 12

අන්තර් පළාත් තුළ 02

පළාත් සභා තුළ 20

(v) පහතින් දක්වා ඇති පර්යේෂණ මධ්‍යස්ථානයන්හි ස්ථාපිත පාංශු විද්‍යාගාර

01. බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය
02. බෝම්බුවල ප්‍රාදේශීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
03. අඟුණකොළපැලැස්ස මාශ හා තෙල් භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
04. ගන්නෝරුව උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
05. හොරණ පලතුරු භෝග පර්යේෂණ හා සංවර්ධනය ආයතනය
06. සීතාඑළිය ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
07. බණ්ඩාරවෙල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
08. මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
09. මාකඳුර තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
10. කිලිනොච්චි ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
11. තින්නවේලි ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
12. අරලගන්විල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

අන්තර් පළාත් සහ පළාත් දෙපාර්තමේන්තු යටතේ පහතින් දක්වා ඇති ස්ථානයන්හි පාංශු විද්‍යාගාර පිහිටුවා ඇත.

01. දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය, අඹේපුස්ස
02. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, මාදම්පේ
03. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, වාරියපොළ
04. නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය අන්තර් පළාත් (හසලක)
05. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, හාවාඑළිය, නුවරඑළිය
06. දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය, නාලන්ද
07. සේවා සංස්කරණ පුහුණු ආයතනය, මහඉලුප්පල්ලම
08. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, පොළොන්නරුව
09. දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය, කරපිංච
10. කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය, වාගොල්ල
11. සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, බිඳුණුවැව
12. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, මොනරාගල
13. නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය, අන්තර් පළාත්, අම්පාර
14. දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය, පොඩිවෙල
15. දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය, තෙලිජ්ජවිල
16. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, ත්‍රිකුණාමලය
17. සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, කරදියන්ආරු
18. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, මුලතිව්
19. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ සංවර්ධන, මන්නාරම

[ගරු නාමල් කරුණාරත්න මහතා]

20. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ සංවර්ධන, වවුනියාව
21. පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, ලබුදූව, ගාල්ල
22. දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය, නවයාලතැන්න

(vi) 2026 වර්ෂයේ ජනවාරි සිට මේ දක්වා පස් සාම්පල 6,288ක්ද, 2024 සහ 2025 වර්ෂවල සාම්පල 23,090ක්ද පරීක්ෂා කර ඇත. මෙම සාම්පල දිවයින පුරා විවිධ පාර්ශ්ව විසින් ලබා දෙන බැවින්, ස්ථාන අනුව වෙන් වෙන් වශයෙන් දත්ත ඉදිරිපත් කිරීම අපහසු වේ. කෙසේ වෙතත්, දිස්ත්‍රික්ක අනුව ලබාගත් සාම්පල සංඛ්‍යාව පහත දැක්වේ.

| අනු අංකය | අදාළ දිස්ත්‍රික්කය | විශ්ලේෂණය කරන ලද සාම්පල ප්‍රමාණය | |
|---|---|---|---|
| | | 2024 වර්ෂය | 2025 වර්ෂය |
| 1 | මහනුවර | 115 | 277 |
| 2 | බදුල්ල | 552 | 221 |
| 3 | නුවරඑළිය | 1725 | 918 |
| 4 | කුරුණෑගල | 551 | 1863 |
| 5 | කොළඹ | 115 | 600 |
| 6 | අනුරාධපුරය | 535 | 972 |
| 7 | කිලිනොච්චිය | 330 | 641 |
| 8 | පොළොන්නරුව | 75 | 507 |
| 9 | හම්බන්තොට | 900 | 1492 |
| 10 | කෑගල්ල | 149 | 774 |
| 11 | මාතලේ | 399 | 254 |
| 12 | ත්‍රිකුණාමලය | 767 | 486 |
| 13 | අම්පාර | 887 | 699 |
| 14 | මොනරාගල | 528 | 219 |
| 15 | මාතර | 418 | 488 |
| 16 | රත්නපුර | 776 | 497 |
| 17 | මන්නාරම | - | 02 |
| 18 | පුත්තලම | 33 | 694 |
| 19 | මඩකලපුව | 04 | 04 |
| 20 | ගම්පහ | 1169 | 245 |
| 21 | මුලතිව් | 01 | - |
| 22 | වවුනියාව | 03 | 04 |
| 23 | යාපනය | - | 01 |
| 24 | ගාල්ල | - | 11 |
| 25 | කළුතර | 806 | 383 |

(ආ) අදාළ නොවේ.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුර තුළ බොහෝ සාධනීය කාරණා තිබුණා. මේ වනවිට රට පුරා අන්තර් පළාත් සහ පළාත් තුළ ඉදිකර තිබෙන පර්යේෂණාගාරවල තිබෙන පහසුකම් බොහොම අඩුයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. අපි දන්නවා, පස් පරීක්ෂා කරන්න යනකොට, පස් සාම්පල ලබා ගන්න යනකොට, නියැදි ලබා ගන්න යනකොට එම නිලධාරීන් මුහුණ දෙන ගැටලු. ඒ වාගේම ගොවි ජනතාව මුහුණ දෙන ගැටලු. ඒ නිසා එම පහසුකම් ලබා දීම වෙනුවෙන් මේ වෙනකොට දෙපාර්තමේන්තුව ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද කියා මම දැන ගන්න කැමැතියි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වැදගත් ප්‍රශ්නයක් මතු කළේ. එහෙම ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. අපි එම ගැටලු හඳුනා ගෙන තිබෙනවා. ඒ අනුව අපි ඒවාට පිළිතුරු සපයමින් තිබෙනවා. ඊයේ දවසෙත් අපේ ලාල් කාන්ත ඇමතිතුමාගේ මූලිකත්වයෙන් සාකච්ඡාවක් තිබුණා. ඒක පැවැත්වුණේ විෂය පථයට අදාළව. එතැනදීත් ගැටලු විශාල ප්‍රමාණයක් මතු වුණා.

විශේෂයෙන්ම පසුගිය කාලවල රාජ්‍ය සේවයට බඳවා ගැනීම් කළේ නැහැ. අවුරුදු 5ක නිවාඩුවක් දුන්නා. ඒ වාගේම වන්දි අරගෙන යන්න පුළුවන් කියන අවසරයක් දුන්නා. 2016න් පසුව විශ්‍රාම වැටුප පිළිබඳ ප්‍රශ්න ඇති කළා. ඒ තත්ත්වයන් ඇතුළේ හිස්තැන් ගොඩක් රාජ්‍ය සේවයේ නිර්මාණය වෙලා තිබෙනවා. ඒක කෘෂිකර්ම අමාත්‍යාංශයටත් අදාළයි. ඒ සියල්ල මේ වෙනකොට අපි ක්‍රමානුකූලව නිවැරදි කරමින් තිබෙනවා. ඇත්තටම මේ විද්‍යාගාර ගත්තාමත්, විද්‍යාඥයන්ගේ සහ සේවකයන්ගේ අඩුවක්, හිඟයක් තිබෙනවා. ඒ ටික සම්පූර්ණ කිරීම සඳහා පියවර අරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි මීට අදාළ අනෙකුත් පහසුකම් වෙනුවෙන් පසුගිය කාලවල අවශ්‍ය මුදල්, අවශ්‍ය ප්‍රමාණයට වෙන් කරලා තිබුණේ නැහැ. ඒ සියලු ගැටලු අපි හඳුනාගෙන ඒ කටයුත්ත මේ වෙනකොට යාවත්කාලීන කරමින් තිබෙනවා. ඉදිරියේදී අපට ඒ ගැටලු ටික නිරාකරණය කර ගන්න පුළුවන් වෙයි.

ගරු මන්ත්‍රීතුමා, මෙහි වැදගත්කම අපි දකිනවා. මේ වෙනකොට ඇත්තටම වී අස්වැන්න සම්බන්ධව ගත්තොත්, "යාය" වැඩසටහන යටතේ අපි යාය 500ක් පටන් ගත්තා. අපි පොදුවේ මේ යාය 500 ගත්තොත්, අස්වැන්න වැඩි කරගෙන තිබෙනවා. අපි බිමට ගියා. අපේ නිලධාරීන්ගේ සංඛ්‍යා දත්ත අනුවත්, ගොවි ජනතාවගේ සංඛ්‍යා දත්ත අනුවත් අපි හෙක්ටෙයාරයකින් සාම්ප්‍රදායිකව ලබා ගත්ත අස්වැන්නට වඩා සැලකිය යුතු අස්වැන්නක් වැඩි කරගෙන තිබෙනවා. ඒ අස්වැන්න වැඩි කර ගැනීම සඳහා ක්‍රම කිහිපයක් අනුගමනය කරලා තිබෙනවා. ඒ ක්‍රමවලින් ප්‍රධානම එකක් තමයි, පස පරීක්ෂා කිරීම.

ඒ වාගේම තමයි ලොකු ලූනු වගාවේදී අපි සාම්ප්‍රදායික වගා ක්‍රම අනුගමනය කරලා ලබා ගන්නා අස්වැන්න දෙගුණයක් කරගෙන තිබෙනවා. ඒකෙදි අපි තාක්ෂණික ක්‍රම අනුගමනය කරලා තිබෙනවා. ඒ තාක්ෂණික ක්‍රමවලත් ප්‍රධානම එකක් තමයි පස පරීක්ෂා කරලා අදාළ විධියට, නිර්මිත විධියට පොහොර යොදන එක. ඒකෙදි පොටෑසියම් සහ පොස්පරස් සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කරන්න පුළුවන්. ඒ වාගේම ඒ අදාළ ප්‍රමාණයට පොහොර ටික යෙදුණාට පස්සේ භෝගවලට එන ලෙඩ රෝග අඩුයි. ලෙඩ රෝග අඩු වෙනකොට යොදන්න තිබෙන කෘමිනාශකත් අඩු වෙනවා. අස්වැන්න වැඩි වෙනවා. ඉතින් ඒ නිසා මේකේ ප්‍රතිඵල අපි මේ වෙනකොට ප්‍රායෝගිකව කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට රටට පෙන්වලා තියෙන තත්ත්වයක් ඇතුළේ ඔබතුමා මේ කියපු කාරණයට අදාළව අපේ විශේෂ අවධානයක් යොමු වෙලා තිබෙනවා. ඒ ගැටලු ටික අපි ඉදිරියේදී නිරාකරණය කරනවා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය වෙන්නෙත් ඒ හා සමාන එකක්. විශේෂයෙන්ම අපි දන්නවා, අපේ රටේ දිස්ත්‍රික්ක 25න් විශාල ප්‍රමාණයක් තිබෙනවා, කෘෂිකාර්මික දිස්ත්‍රික්ක; කෘෂිකර්මාන්තයත් එක්කම ගැට ගැහිලා ගොවි ජනතාව තමන්ගේ ආර්ථිකය සරු කර ගන්නා දිස්ත්‍රික්ක විධියට. එහිදී අපට දැන් ප්‍රධාන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා, බොහෝ දිස්ත්‍රික්කවල මේ පස් පර්යේෂණ මධ්‍යස්ථාන ප්‍රමාණයේ තිබෙන අඩුකම. සමහර ගොවි ජනතාවට පස් සාම්පල් එකක් අරගෙන කිලෝමීටර සියය හමාර යන්න වෙලා තිබෙනවා.

මෙතැනින් එහාට එය ව්‍යාප්ත කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට වැඩ පිළිවෙළක් තිබෙනවාද? අපි විශ්වාස කරනවා අවම වශයෙන් එය ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමටවත් පළල් වෙනවා නම්, ව්‍යාප්ත වෙනවා නම් හොඳයි කියලා. ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද කියා දැනගන්න කැමැතියි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, එයට අදාළව අපේම මැදිහත් වීම යටතේ අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡා තුනහතරක්ම පවත්වා තිබෙනවා. අපි එයට අදාළ වැඩ පිළිවෙළක් ද සකස් කර තිබෙනවා. අප මෙහිදී පස පරීක්ෂා කිරීමට අදාළව ඉලක්කයක් තබාගෙන තියෙනවා. ඒ තමයි, පළමුවෙන්ම වී වගාවට අදාළව එම කටයුත්ත අවසන් කර ගැනීම සහ ඉන් පසුව අනෙකුත් භෝගවලට සහ ගොඩ ඉඩම්වලට අදාළව ඒ කටයුත්තට අත ගැසීම. ඒ ඉලක්කයට යන්න නම් ඔබතුමා කියපු කාරණයට අනිවාර්යයෙන්ම අත ගහන්න ඕනෑකම තිබෙනවා.

අප පළමුවෙනි පියවර විධියට කරන්නේ, තිබෙන ආයතන ටික, තිබෙන විද්‍යාගාර ටික යාවත්කාලීන කරලා, ඒවායේ අඩුපාඩුකම් සම්පූර්ණ කරන එකයි. ඇත්තටම මේක තවදුරටත් ව්‍යාප්ත වෙන්න ඕනෑකම තිබෙනවා; විමධ්‍යගත වෙන්න ඕනෑකම තිබෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කරන ඔබතුමාට මේ පිළිබඳව අදහසක් තිබෙනවා. මේ ආයතන තවදුරටත් පුළුල් කිරීමේ කටයුතු ඉදිරියේදී අපි අනිවාර්යයෙන්ම සිදු කරනවා.

## ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය අම්පාර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති: වෙන් කළ මුදල්

### தேசிய அனர்த்த நிவாரண சேவைகள் நிலையத்தால் அம்பாறையில் செயற்படுத்தப்பட்ட அபிவிருத்திக் கருத்திட்டங்கள்: ஒதுக்கப்பட்ட நிதி

### DEVELOPMENT PROJECTS IMPLEMENTED IN AMPARA BY NATIONAL DISASTER RELIEF SERVICES CENTRE: ALLOCATIONS MADE

1365/2025

**8. ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් 2025 වර්ෂයේදී අම්පාර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කළ මුදල් පිළිබඳ විස්තර එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) තිල්ලෙයාරු-සම්බුක්කලප්පු, අඩ්ඩාලච්චේනෛ-කෝණාවත්ත යන ප්‍රදේශවල කානු පද්ධතිවල පවතින අවහිරතා හේතුවෙන් අඩ්ඩාලච්චේනෛ, අක්කරපත්තුව සහ ආලයඩිවේම්බු ප්‍රදේශවල ජනතාව සෑම වර්ෂයකදීම ගංවතුර හේතුවෙන් පීඩාවට පත් වන බව දන්නේද;

(iii) එම කානු පද්ධතිවල පවතින අවහිරතා ඉවත් කර එම ප්‍රදේශවල ජනතාව ගංවතුරෙන් පීඩාවට පත් නොවීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සැලැස්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய அனர்த்த நிவாரண சேவைகள் நிலையத்தினால் 2025ஆம் ஆண்டில் அம்பாறை மாவட்டத்தில் செயற்படுத்தப்பட்ட அபிவிருத்திக் கருத்திட்டங்களுக்காக ஒதுக்கப்பட்ட நிதி பற்றிய விபரங்கள், ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவுவாரியாக வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) தில்லையாறு-சம்புக்களப்பு, அட்டாளைச்சேனை -கோணாவத்தை ஆகிய பிரதேசங்களிலுள்ள வடிகால் கட்டமைப்புகளில் காணப்படும் அடைப்புகள் காரணமாக, அட்டாளைச்சேனை, அக்கரைப்பற்று மற்றும் ஆலையடிவேம்பு பிரதேசங்களில் வாழும் மக்கள் ஒவ்வொரு வருடமும் வெள்ளத்தினால் பாதிக்கப்படுவதை அறிவாரா என்பதையும்;

(iii) மேற்படி வடிகால் கட்டமைப்புகளிலுள்ள அடைப்புகளை நீக்கி, மேற்படி பிரதேச மக்கள் வெள்ளத்தினால் பாதிக்கப்படாமல் இருப்பதற்காகச் செயற்படுத்தப்படவுள்ள திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the details of the financial allocations made for development projects implemented by the National Disaster Relief Services Centre in each Divisional Secretary's Division in the Ampara District during the year 2025, separately;

(ii) whether he is aware that the residents of Addalaichenai, Akkaraipattu and Alayadivembu areas are affected by floods every year due to blockages in the drainage

[ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා]

systems in the areas of Thillaiyaru-Sambukkalappu, Addalachchenai/ Konawatte; and

(iii) the plan that will be implemented to remove the blockages in those drainage systems and to prevent the people in those areas from being affected by floods?

(b) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2025 වර්ෂයේදී ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් අම්පාර දිස්ත්‍රික්කයේ අදාළ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කර දී ඇත. එම ප්‍රතිපාදන අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත වෙන් වෙන් වශයෙන් ලබා දුන් ආකාරය ඇමුණුම 01 සහ 02 මඟින් ඉදිරිපත් කර ඇත.

➢ 103-02-18-001-1501 වැය විෂය යටතේ පහත සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් 38,310,933.83ක ප්‍රතිපාදන වෙන් කර දී ඇත.

- නිවාස පිරිසිදු කර ගැනීමේ දීමනාව
- මුළුතැන්ගෙයි උපකරණ මිල දී ගැනීම සඳහා දීමනා
- ජීවනෝපාය අහිමි වූ පුද්ගලයන් වෙත ගෙවන දීමනා
- නිවාස කුලී දීමනා
- පාසල් ළමුන් වෙත පාසල් උපකරණ මිල දී ගැනීමේ දීමනා
- ආගමික ස්ථාන පිරිසිදු කිරීමේ දීමනා
- මරණ වන්දි ගෙවීම
- කඩිනම් සහන හා පානීය ජලය සැපයීම
- පිසූ ආහාර හා වියළි සලාක සැපයීම
- සුරක්ෂිත මධ්‍යස්ථානවලට පහසුකම් ලබා දීම
- පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වීම වෙනුවෙන් කරනු ලබන ගෙවීම්
- ආපදා සහන ලබා දීමට අදාළ ඉන්ධන දීමනා

ඉහත ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත වෙන් කළ ආකාරය පහත පරිදි ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 01:

**District : Ampara**
**Allocation and Expenditure - 2025**
**Vote:103-2-18-1-1501**

| | Division Name | Net Allocation |
|---|---|---|
| 1 | District Secretariat - Ampara | 3,617,060.00 |
| 2 | Addalaichenai | 106,100.00 |
| 3 | Akkaraipattu | 610,300.00 |
| 4 | Alayadivembu | 224,150.00 |
| 5 | Ampara | 1,628,150.00 |
| 6 | Damana | 72,000.00 |
| 7 | Dehiattakandiya | 13,702,061.92 |
| 8 | Irakkamam | 19,180.00 |
| 9 | Kalmunai | 411,135.00 |
| 10 | Kalmunai North (sub) | 276,520.00 |
| 11 | Karativu | 700,805.00 |
| 12 | Lahugala | 2,953,058.00 |
| 13 | Mahaoya | 839,049.26 |
| 14 | Navithanveli | 688,230.00 |
| 15 | Ninthavur | - |
| 16 | Padiyathalawa | 1,504,322.00 |
| 17 | Pottuvil | - |
| 18 | Sainthamaruthu | 3,899,730.00 |
| 19 | Samanthurai | 3,113,400.00 |
| 20 | Tirukkovil | 47,447.00 |
| 21 | Uhana | 1,067,200.00 |
| | TOTAL | 35,479,898.18 |

| | | | |
|---|---|---|---|
| Total Allocation Received | 38,310,933.83 | | 38,166,073.83 |
| Released Allocation to Division | 35,479,898.18 | | |
| Remaining in the District | 2,831,035.65 | 2,831,035.65 | |
| Released Allocation to Division | 35,479,898.18 | | |
| Amount Expended by Division | 34,683,651.84 | 34,683,651.84 | |
| Remaining in the Division | 796,246.34 | 796,246.34 | |
| Total | | 38,310,933.83 | 38,166,073.83 |

➢ 103-02-18-007-2202 වැය විෂය යටතේ පහත සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් 197,140,000.00ක ප්‍රතිපාදන වෙන් කර දී ඇත.

- ආපදාවට පත් තනි සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා දීමනා
- නිවාස ප්‍රතිසංස්කරණය සඳහා ගෙවීම (අර්ධ හානි)
- ව්‍යාපාර ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය සඳහා ගෙවීම
- නැවත පදිංචි කිරීමේ වැඩසටහන (පූර්ණ හානි නිවාස හා අධිඅවදානම් නිවාස)

ඉහත ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත වෙන් කළ ආකාරය පහත පරිදි ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 02:’

**District : Ampara**
**Allocation and Expenditure - 2025**
**Vote:103-2-18-007-2202**

| | Division Name | Net Allocation |
|---|---|---|
| 1 | District Secretariat - Ampara | - |
| 2 | Addalaichenai | 4,797,525.53 |
| 3 | Akkaraipattu | 10,938,553.00 |
| 4 | Alayadivembu | 13,789,271.00 |
| 5 | Ampara | 6,037,511.00 |
| 6 | Damana | 3,100,327.82 |
| 7 | Dehiattakandiya | 34,483,105.00 |
| 8 | Irakkamam | 795,980.95 |
| 9 | Kalmunai | 4,165,580.97 |
| 10 | Kalmunai North (sub) | 4,243,988.71 |
| 11 | Karativu | 1,921,270.66 |
| 12 | Lahugala | 935,000.00 |
| 13 | Mahaoya | 2,148,061.80 |
| 14 | Navithanveli | 3,042,010.00 |
| 15 | Ninthavur | 182,324.33 |
| 16 | Padiyathalawa | 1,340,052.00 |
| 17 | Pottuvil | 584,524.55 |
| 18 | Sainthamaruthu | 4,701,657.84 |
| 19 | Samanthurai | 1,585,000.00 |
| 20 | Tirukkovil | 962,251.85 |
| 21 | Uhana | 5,417,355.27 |
| | TOTAL | 105,171,352.28 |

| | | | |
|---|---|---|---|
| Total Allocation Received | 197,140,000.00 | | 197,140,000.00 |
| Released Allocation to Division | 105,171,352.28 | | |
| Remaining in the District | 91,968,647.72 | 91,968,647.72 | |
| Released Allocation to Division | 105,171,352.28 | | |
| Expended by Division | 79,607,903.57 | 79,607,903.57 | |
| Remaining in the Division | 25,563,448.71 | 25,563,448.71 | |
| Total | | 197,140,000.00 | 197,140,000.00 |

(ii) තිල්ලෙයාරු - සම්බුක්කලප්පු, අඩ්ඩාලචේනෛ - කෝණාවත්ත යන ප්‍රදේශවල කානු අවහිරතා නිසා පහත දක්වා ඇති වර්ෂවලදී ජනතාව ගංවතුර ආපදා තත්ත්වයට ගොදුරු වී ඇති බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දත්ත පද්ධතිය අනුව තහවුරු වේ.

| වර්ෂය | ගංවතුරට යට වූ ප්‍රදේශය |
|---|---|
| 2013 | අඩ්ඩාලචේනෛ, අක්කරපත්තු, ආලයාඩිවෙම්බු |
| 2014 | අඩ්ඩාලචේනෛ, අක්කරපත්තු, ආලයාඩිවෙම්බු |
| 2019 | අඩ්ඩාලචේනෛ, අක්කරපත්තු, ආලයාඩිවෙම්බු |
| 2020 | ආලයාඩිවෙම්බු |
| 2021 | ආලයාඩිවෙම්බු |
| 2024 | අඩ්ඩාලචේනෛ, අක්කරපත්තු, ආලයාඩිවෙම්බු |
| 2025 | ආලයාඩිවෙම්බු |

(iii) මෙම ප්‍රදේශවල පවත්නා කානු පද්ධතිවල අවහිරතා ඉවත් කිරීම හා කානු පද්ධති නඩත්තුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විෂය පථයට අදාළ නොවේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ IV වන කොටසේ 79, 80, 81, 82 වගන්ති ප්‍රකාරව මෙම ගැටලුව සම්බන්ධ වගකීම ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවලට අදාළ වේ.

(ආ) අදාළ නොවේ.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ பாதுகாப்புப் பிரதி அமைச்சர் அவர்களிடம் எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

2024ஆம் ஆண்டில் அம்பாறை மாவட்டத்தில் ஏற்பட்ட வெள்ளத்தால் அம்மாவட்ட மக்களுக்கு 5,250 மில்லியன் ரூபாய் நஷ்டம் ஏற்பட்டது. மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களின் தலைமையில் அம்பாறை மாவட்டத்தில் நடைபெற்ற விஷேட மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலும், தேசிய அனர்த்த முகாமைத்துவ சபைக் கூட்டத்திலும் நான் இது தொடர்பான முன்மொழிவுகளை முன்வைத்தேன். குறிப்பாக, மழை காலங்களில் சேனாநாயக்க சமுத்திரத்தின் வான் கதவுகள் திறக்கப்படுவதால் அட்டாளைச்சேனை, அக்கரைப்பற்று, ஆலையடிவேம்பு பிரதேசங்களிலுள்ள சுமார் 8,500 ஏக்கர் காணிகள் - தங்கம் விளைவது போன்று நெல் விளைகின்ற காணிகள் - தொடர்ச்சியாகப் பாதிக்கப்பட்டு வருகின்றன. இது தொடர்பில் நாங்கள் irrigationக்குப் பொறுப்பான அமைச்சர் கௌரவ கே.டீ. லால் காந்த அவர்களுடன் கதைத்ததன் விளைவாக, தற்போது அதனைத் தடுப்பதற்குரிய ஏற்பாடுகள் நடைபெற்று வருகின்றன.

மழை காலங்களில் 'சல்வீனியா' எனும் தாவரம் இப்பிரதேசத்திலுள்ள ஆறுகளையும் வடிச்சல்களையும் தடைசெய்வதால் விவசாயிகளுக்கும் மக்களுக்கும் பெரும் பாதிப்பு ஏற்படுகின்றது. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, உங்களுடைய அமைச்சின்கீழ் வருகின்ற அனர்த்த முகாமைத்துவ மத்திய நிலையத்தின் ஊடாக நீரிலே மிதந்து

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

துப்புரவு செய்யக்கூடிய dredger ஒன்றைக் கொள்வனவு செய்து, அதனை அம்பாறை மாவட்ட அரசாங்க அதிபரிடம் அல்லது அம்பாறை மாவட்ட அனர்த்த முகாமைத்துவ நிலையத்திடம் கையளிக்க வேண்டுமென நான் கோரிக்கை முன்வைக்கின்றேன். ஏனெனில், நான் கிழக்கு மாகாண சபையில் நீர்ப்பாசனத்துக்குப் பொறுப்பான அமைச்சராக இருந்த காலத்தில், இவ்வாறான dredger ஒன்றைக் கொள்வனவு செய்து, அதை மத்திய நீர்ப்பாசன திணைக்களத்திடம் வழங்கி, வெள்ளம் ஏற்படும் ஒவ்வொரு முறையும் அதன்மூலம் அவற்றைத் துப்புரவு செய்யும் நடவடிக்கைகளை மேற்கொண்டிருந்தேன். எனவே, அட்டாளைச்சேனை, அக்கரைப்பற்று, ஆலையடிவேம்பு பிரதேசங்களில் 'சல்வீனியா' தாவரத்தால் ஏற்படுகின்ற தடையை நீக்குவதற்கு, உங்களுடைய அமைச்சினால் dredger ஒன்றைக் கொள்வனவு செய்து வழங்கினால் நன்றாக இருக்குமென நான் நினைக்கின்றேன். நீங்கள் அதற்குரிய ஏற்பாடுகளைச் செய்வீர்களா? எனக் கேட்கின்றேன்.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ගැන පැහැදිලි කර ගන්න ඕනෑ. මම කලිනුත් කිව්වා වාගේ, අඩ්ඩාලච්චේනෛ, අක්කරපත්තුව, ආලයඩිවෙම්බු යන ප්‍රදේශවල කානු පද්ධතිවල අවහිරතා පවතිනවා. එම ප්‍රදේශවල වගා කරනු ලබන ගොවි ඉඩම් අක්කර 8,500කට වඩා වැඩියෙන් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා හරි. එතැන තිබෙන ප්‍රශ්නය තමයි, එම කානු පද්ධතිවල සැල්වීනියා වැවිලා තිබීමෙන් කානු අවහිර වීම. එම නිසා වතුර ආවාම ඒ කානු උතුරලා ඒ වගාවලට හානි සිදු වෙනවා.

ජල ගැලීමක් වුණාට පසුව ඇති වන තත්ත්වය කළමනාකරණය කර ගන්න තමයි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සම්බන්ධ වෙන්නේ. මා ඔබතුමා අහපු ප්‍රශ්නයට පිළිතුරු සපයනකොටත් කිව්වේ ඒකයි, සැල්වීනියා සුද්ධ කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අයත් කාර්යයක් නොවෙයි කියලා. ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව සහ පළාත් සභාව තුළින් තමයි එය කරවා ගන්න ඕනෑ. අපිත් මැදිහත් වෙන්නම්, දිස්ත්‍රික් ලේකම්වරයාටත් කියලා. වෙනම ලෙජරයක් හදලා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට එය කිරීමට පරිපාලන වශයෙන් අපහසුතාවක් තිබෙනවා. නමුත් ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමාගේ ඉල්ලීම පරිදි ඒ පිළිබඳව නැවත සලකා බැලීමක් කරන්නම්.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, வெள்ளம் ஏற்படுகின்ற காலத்தில் மட்டுமாவது அவற்றைத் துப்புரவு செய்து தருவதற்கு dredger ஒன்றைக் கொள்வனவு செய்து தர வேண்டுமெனக் கேட்டுக்கொண்டு, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

2024ஆம் ஆண்டில் வெள்ள அனர்த்தம் ஏற்பட்டபோது, அம்பாறை மாவட்ட அரசாங்க அதிபரின் அனுமதியுடன், லகுகல, பொத்துவில், அக்கரைப்பற்று, அட்டாளைச்சேனை பிரதேச செயலாளர் பிரிவுகளில் வெள்ளத்தால் பாதிக்கப் பட்டவர்களுக்கு உலர் உணவுகளை வழங்கிய Rauff Traders, Majidhaz, MIMN Traders, Fahad Food City ஆகிய வியாபார நிலையங்களுக்கு இதுவரையும் கொடுப்பனவுகள் வழங்கப் படவில்லை என்பதைப் பாராளுமன்றத்தில் மாண்புமிகு சனாதிபதி அவர்களின் தலைமையில் நடைபெற்ற பாதுகாப்பு அமைச்சின் ஆலோசனைக் குழுக் கூட்டத்தில் நானும் கௌரவ எம்.எஸ். அப்துல் வாசித் அவர்களும் பல தடவை சுட்டிக் காட்டினோம். மாண்புமிகு சனாதிபதி அவர்கள் அக்கொடுப்பனவை வழங்குமாறு பணிப்புரை விடுத்தார். அதனையடுத்து, லகுகல பிரதேச செயலகத்துக்கு மாத்திரம் ஒரு பகுதி நிதி வழங்கப்பட்டு இருக்கிறது. ஆனால், இதுவரை பொத்துவில், அக்கரைப்பற்று, அட்டாளைச்சேனை பிரதேச செயலாளர் பிரிவுகளில் உலர் உணவு வழங்கிய தனியார் வியாபார நிலையங்களுக்கான கொடுப்பனவுகள் வழங்கப் படவில்லை. இந்த நிலையில், அந்த தனியார் வியாபார நிலையங்களின் உரிமையாளர்கள் நீதிமன்றில் வழக்குத் தாக்கல் செய்துள்ளனர். இந்த வழக்கு நடவடிக்கைக்காக குறித்த பிரதேச செயலாளர்களும் பிரதேச செயலகத்திலுள்ள கணக்காளர்களும் அக்கரைப்பற்று நீதிமன்றத்துக்குச் செல்ல வேண்டிய நிலை உருவாகியுள்ளது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

ගරු කථානායකතුමනි, මම මේ කථා කරන්නේ වුවමනාම විෂයයක් ගැනයි. මම මේ කථා කරන්නේ විෂයය ගැන නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රධාන ප්‍රශ්නයට අදාළව නොවෙයි අතුරු ප්‍රශ්නය අහන්නේ.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

எனவே, பொத்துவில், அக்கரைப்பற்று, அட்டாளைச்சேனை ஆகிய பிரதேச செயலாளர் பிரிவுகளில் வெள்ளத்தால் பாதிக்கப்பட்டவர்களுக்கு உலர் உணவுகளை வழங்கிய நிறுவனங்களுக்கான கொடுப்பனவுகளை வழங்க நடவடிக்கை மேற்கொள்வீர்களா? எனக் கேட்கின்றேன்.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ඔව්, ගරු මන්ත්‍රීතුමා.

2023 වසර අවසානයේ දෙසැම්බර් සහ 2024 ජනවාරි කියන මාසවල ඇති වෙච්ච ජල ගැල්ම නිසා පෞද්ගලික ආයතනවලින් සහන හැටියට ආහාර ලබා දීලා තිබෙනවා. ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඉදිරිපත් කරන ලද ඒ ඒ ආපදා තත්ත්ව වෙනුවෙන් බෙදා හරින ලද බඩුවල ලොකු විෂමතාවක් තිබිලා තිබෙනවා නේ. ඒ නිසා තමයි ඒ විමර්ශන කටයුතු කරලා තිබෙන්නේ. 2026 ජූලි 22වෙනි දා අඩ්ඩාලච්චේනෛ ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් මූලික පරීක්ෂණයක් කරලා, රුපියල් මිලියන 1.45ක මුදලක් ෆයිරූස් බ්‍රදර්ස් ආයතනයට ගෙවීම් කරන්න දැනට නිර්දේශ කර තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තා ටික ආපු ගමන් ඒ ගෙවීම කරන්න පුළුවන්. ලාහුගල ගෙවලා තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ අම්පාර සහ අඩ්ඩාලච්චේනෛ ප්‍රදේශවල. දැනට ඒ විමර්ශන කරගෙන යනවා. හෙට අනිද්දා ඒ විමර්ශන වාර්තා ආවාට පස්සේ ඒ ගෙවීම් කටයුතු ඉවර කරනවා.

## හීලෑ අලි-ඇතුන්: විස්තර

### பழக்கப்படுத்திய மற்றும் கொம்பன் யானைகள்: விபரம்

### TAMED ELEPHANTS AND TUSKERS: DETAILS

1375/2025

**9. ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සිටින හීලෑ අලි-ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලි-ඇතුන් හිමියන්ගේ නම් සහ ලිපින කවරේද;

(iii) එම අලි-ඇතුන් සන්තකයේ තබා ගැනීම සඳහා බලපත්‍ර ලබාදීමේදී සලකා බලනු ලබන කරුණු කවරේද;

(iv) එම අලි-ඇතුන් සම්බන්ධයෙන් පසු විපරමක් හා නිරන්තර සොයා බැලීමක් සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ඇති යන්ත්‍රණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் இலங்கையிலுள்ள பழக்கப்படுத்தப் பட்ட யானைகளினதும் கொம்பன் யானை களினதும் எண்ணிக்கை யாது;

(ii) மேற்படி யானைகளின் உரிமையாளர்களின் பெயர் மற்றும் முகவரிகள் யாவை;

(iii) மேற்படி யானைகளை தம்வசம் வைத்திருப் பதற்கான உரிமப்பத்திரம் வழங்கும்போது கவனத்தில் கொள்ளப்படும் விடயங்கள் யாவை;

(iv) மேற்படி யானைகள் தொடர்பில் பின்னாய்வு செய்வதற்கும் தொடர்ச்சியாக ஆராய்ந்தறி வதற்கும் நடவடிக்கை மேற்கொள்ளப் படுகின்றதா;

(v) ஆமெனில், அது தொடர்பில் அமுலில் உள்ள பொறிமுறை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the number of tamed elephants and tuskers living in Sri Lanka at present;

(ii) the names and addresses of the owners of those elephants and tuskers;

(iii) the criteria that are taken into consideration in issuing licences to keep such elephants and tuskers in possession;

(iv) whether follow-up and regular enquiries are made regarding those elephants and tuskers; and

(v) if so, the mechanism that is in place in that regard?

(b) If not, why?

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ලියාපදිංචි ලිපි ගොනු පදනම් කර ගනිමින් නෛතික ගැටලු නොමැති හීලෑ අලි-ඇතුන් සංඛ්‍යාව 56ක්.

(ii) ඉහත සඳහන් කරන ලද නෛතික ගැටලු නොමැති හීලෑ අලි-ඇතුන් සහ ඔවුන්ගේ හිමිකරුවන්ගේ ලිපින ඇතුළත් ලේඛනය පහතින් දැක්වේ.

ඇමුණුම 01

**නඩු කටයුතු නොමැති හීලෑ අලි ඇතුන් සහ ඔවුන්ගේ හිමිකරුවන්ගේ නාම ලේඛනය (ලිපිනයද ඇතුලත්ව)**

| අනු අංකය | ලියාපදිංචි අංක | අයිතිකරුගේ නම | ලිපිනය | අලි ඇතුන් ගණන |
|---|---|---|---|---|
| 1 | 14 | පූජ්‍ය කෙහෙල්පන්නල චන්ද්‍රාලෝක හිමි. | පුරාණ රජ මහා විහාරය, කෙරමිණිය, මාවනැල්ල. | 1 |
| 2 | 20 | සමන්ත වෙලගෙදර මයා. | වෙලගෙදර වලව්ව, පනලිය, පොල්ගහවෙල. | 1 |
| 3 | 23 | අයි.එන්. මුදුන්කෝන් මයා. | මුදුන්කෝන් ලි මෝල, කරලියද්ද පාර, මැණික්හින්න. | 1 |
| 4 | 26 | නිලන්ති බණ්ඩාර වීරසිංහ මිය. | කණ්ඩලම වලව්ව,මීරිගම. | 1 |
| 5 | 29 | ඩබ්.පි.එච්. දිප්ති කුමාර මයා. | අංක 199, බියගම. | 1 |
| 6 | 42 | ඩබ්.පි.එච්. දිප්ති කුමාර මයා. (මුල් ලි.ප.හි.- කේ.ඩී.ලීලාවති) | අංක 199, බියගම. | 1 |
| 7 | 44 | ආර්. අරංගල්ල මයා. | අංක 75, නිට්ටඹුව පාර, වෙයන්ගොඩ. | 1 |
| 8 | 45 | ජී.ටී.බී. වලිසුන්දර මයා. | ගනේගොඩ වලව්ව, බුටාවත්ත, තලාතුඔය. | 1 |
| 9 | 49 | බස්නායක නිලමේ. | ශ්‍රී විෂ්ණු මහා දේවාලය, දෙවිනුවර. | 1 |
| 10 | 52 | ක්‍රිශාන්ති ගිතිකා ඇලපාත මිය. | ඇලපාත වලව්ව. ඇලපාත, රත්නපුර. | 1 |
| 11 | 54 | එම්.ඩී.එස්.පෙරේරා මයා. | අංක 1143, කටුකුරුන්ද වත්ත, කොට්ටාව, පන්නිපිටිය. | 1 |
| 12 | 58 | නාලක කුමාර ජයසිංහ මයා. | "සමන්", ගොඩගම, හෝමාගම. | 1 |
| 13 | 61 | කේ.පී.ආර්.යු.එම්. කෙම්පිටිය මයා. | කිවුලපන, මොලගොඩ, කෑගල්ල. | 1 |
| 14 | 66,67 | සී. සමරසිංහ මිය. | "සමරගිරි ", රන්දෙනිය, හිරිවඩුන්න. | 2 |
| 15 | 75 | ඩබ්.එල්.ඩබ්. කන්නංගර මයා. | කහටපිටිය, කනන්විල, හොරණ. | 1 |
| | | | [illegible] | 1 |

[ගරු ඇන්ටන් ජයකොඩි මහතා]

| | | | | |
|---|---|---|---|---|
| 15 | 75 | [illegible] | | |
| 16 | 90 | කිත්සිරි කහටපිටිය මයා. | අංක 25ඒ, කුළුපන,පොකුණුවිට. | 1 |
| 17 | 94 | උචිත සුමල් රාජපක්ෂ මයා. | අංක ඒ- 2,රන්දෙනිය, හිරිවඩුන්න, කෑගල්ල. | 1 |
| 18 | 325 | ජගත් විතාන මයා. | "ජගත් මහල් ", ඕවිටිගල,මතුගම. | 1 |
| 19 | 114,115 | ඒ. විජේසිංහ මයා. | අංක 28/1, කල්තොටපාර, බලන්ගොඩ. | 2 |
| 20 | 116 | ආර්.ඩී.ඇම්.ජේ.පෙතියාගොඩ(මුල් ලි.ප.හි.- ආනන්ද හින්කෙන්ද) | අරංගල පාර, නත්තරම්පොත,කුණ්ඩසාලේ. | 1 |
| 21 | 117 | බස්නායක නිලමේ (මුල් ලි.ප.හි.- ආනන්ද හින්කෙන්ද) | ශ්‍රී කතරගම මහා දේවාලය, තලාතුඔය,මහනුවර | 1 |
| 22 | 120 | ජී.එම්.එස්. ගුණවර්ධන මිය. | අංක 112, නුවර පාර, හැලගල, දංඕවිට. | 1 |
| 23 | 135,352 | ජේ.පි.අයි. කමල් කිත්සිරි මයා. | අංක 655,අතුරුගිරිය පාර, කොට්ටාව. | 2 |
| 24 | 144 | ජී.එම්.ආර්. ගෝනකුඹුර මයා. | අංක 235/1, රත්නපුර පාර, බලන්ගොඩ. | 1 |
| 25 | 340 | පූජ්‍ය බ්‍රාහ්මණගම රතනසිරි හිමි./විහාරාධිපති. | ශ්‍රී විපශ්‍යාරාමය, මහරගම. | 1 |
| 26 | 149,156 | ප්‍රදීප් නිලංග දැල බණ්ඩාර මයා. | ගොඩැල්ල වලව්ව, දැල. | 2 |
| 27 | 152 | එස්.නන්දදාස මයා. | අංක 363/3, ගැමුණු මාවත, පැලැන්වත්ත පාර, පන්නිපිටිය. | 1 |
| 28 | 155 | බස්නායක නිලමේ. | රත්නපුර මහ සමන් දේවාලය, රත්නපුර. | 1 |
| 29 | 154 | බස්නායක නිලමේ. | රුහුණු මහා කතරගම දේවාලය, කතරගම. | 1 |
| 30 | 161 | පූජ්‍ය මොරතොට ජිනාලංකාර හිමි. | ශ්‍රී සුදර්ශනාරාමය, කන්දේගෙදර, හාලි ඇල. | 1 |
| 31 | 167 | තුඩුල්ලේ සීලක්කන්ද හිමි (විහාරාධිපති) | ඇත්කඳ රජමහා විහාරය, නුවර පාර, කුරුණෑගල. | 1 |
| 32 | 176 | එච්.ආර්.එස්.යූ. නිශ්ශංක මයා | අංක 246, පින්නගොල්ල වත්ත, කෑගල්ල. | 1 |
| 33 | 177,361 | පූජ්‍ය බෙල්ලන්විල විමලරතන හිමි | රජමහා විහාරය, බෙල්ලන්විල, බොරලැස්ගමුව. | 2 |
| 34 | 182 | රංජිත් ලාල් මල්ලව මයා. | "රංජනි නිවස ", හෙට්ටිමුල්ල, කෑගල්ල. | 1 |
| 35 | 194 | පූජ්‍ය උරුලෑවත්තේ ධම්මරක්ඛිත හිමි. | රජමහා විහාරය, මහියංගණය. | 1 |
| 36 | 188 | බුද්ධික දේශප්‍රිය මිරිහැල්ල මයා. | පල්ලේවත්ත, මාවෙල, හිඟුල. | 1 |
| 37 | 195 | සිසිර සමරකෝන් මයා. | දමුණුපොල,යටිගල්ඔලුව. | 1 |
| 38 | 197 | ඩබ්.ඒ.රංජිත් විජේසිංහ මයා. | මොරැන්වත්ත, අලුත්ගම, බෝගමුව,යක්කල. | 1 |
| 39 | 210,212,215,216,217, 218,219,221 | දියවඩන නිලමේ. | ශ්‍රී දළදා මාලිගාව, මහනුවර. | 8 |
| 40 | 328 | චානක චාමර ජයසේකර මයා. | ජයසේකර බංගලාව, පල්ලේබැද්ද. | 1 |
| 41 | 339 | උචිත නිශාන් ධම්මික මයා. | සමාධි පෙදෙස,කුරුවිට. | 1 |
| 42 | 357 | පූජ්‍ය අලුත්නුවර අනුරුද්ධ හිමි. | රජමහා විහාරය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ. | 1 |
| 43 | 208,360 | සේනාවිධායක | ශ්‍රී ලංකා පාබල හමුදාව, පනාගොඩ | 2 |
| | | එකතුව | | 56 |

(iii) හීලෑ අලි-ඇතුන් සන්තකයේ තබා ගැනීමෙන් ප්‍රථමයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු අතර, ඉන් පසු ඔවුන් වාර්ෂික බලපත්‍ර ලබා ගැනීම ද සිදු කළ යුතුය. මෙම කටයුතු වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ දක්වා ඇති ප්‍රතිපාදන මත සකස් කරන ලද අංක 662/4 සහ 1991.05.14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් සිදු කරනු ලැබ ඇත.

(iv) ඔව්.

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් දේශීයව බාහිර පාර්ශ්ව වෙත ලබා දුන් හස්තීන් අතුරෙන් දැනට ජීවත්ව සිටින හස්තීන් පිළිබඳ වාර්ෂිකව පසුවිපරමක් සිදු කරනු ලැබේ.

(v) හීලෑ අලි ඇතුන්ට හිංසා කිරීම ගැන යම් පැමිණිල්ලක් ලද විගස ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති අලි ඇතුන් සඳහා ද පසු විපරමක් වාර්ෂිකව සිදු කරනු ලැබේ. මෙම කටයුත්ත විද්‍යාත්මක සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු හා පශු වෛද්‍යවරයෙකු සහ සංවර්ධන නිලධාරියෙකු හෝ සත්ව පාලකවරයෙකු හෝ හස්ති භාරකරුවෙකු ඇතුළත් මණ්ඩලයකින් තමයි සිද්ධ කරන්නේ. අවම වශයෙක් ඒකට තුන්දෙනෙක්වත් සම්බන්ධ විය යුතුයි.

(ආ) අදාළ නොවේ.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපේ බෞද්ධ සංස්කෘතිය හා සම්බන්ධ උත්සවවලට, ආගමික වැඩසටහන්වලට හීලෑ අලි ඇතුන් සම්බන්ධ කර ගැනීම පිළිබඳ ලොකු කතිකාවක් පසුගිය දිනවල ඇති වෙලා තිබුණා. සෑම වසරකම මහනුවර දළදා පෙරහැර සමයේදී තමයි මේ කතිකාව ඇති වෙන්නේ, විශේෂයෙන්ම බෞද්ධ සංස්කෘතියට පටහැනි ඇතැම් පුද්ගලයන් වාගේම සමහර රටවලින් වෙන බලපෑම්වලට අනුව.

ගරු කථානායකතුමනි, පොඩ්ඩක් ඉතිහාසය මතක් කළොත්, අපේ රට බ්‍රිතාන්‍යයට යටත් රටක් හැටියට තිබෙන කොට තමයි, අපේ රටේ වැඩිම අලි සංඛ්‍යාවක් ඝාතනය වුණේ. සැමුවෙල් බේකර් කියන බ්‍රිතාන්‍ය ජාතිකයා විසින් ලියන ලද පොතේ තිබෙනවා, එතුමා පමණක් අලි 500කට ආසන්න සංඛ්‍යාවක් ඝාතනය කරලා තිබෙනවා කියලා. මහනුවර දළදා පෙරහැර වැනි ආගමික හා සංස්කෘතික උත්සව අපගේ ජාතික උරුමයේ සහ අනන්‍යතාවේ වැදගත් කොටසක්. ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කරපු ආකාරයට ශ්‍රී ලංකාවේ හීලෑ අලි-ඇතුන් සංඛ්‍යාව අඩු වෙමින් පවතිනවා. ඒ ගණන 56ක් කියලා ඔබතුමා කිව්වා. ඒ 56න් බහුතරයක්, සියයට 70ක්ම අවුරුදු 65ක්, 70ක් විතර වයස අය. මේ විදියට ගියොත් අපේ සම්ප්‍රදායයන් පවත්වාගෙන යෑමට අපහසු වෙනවා. විශේෂයෙන්ම අලි-ඇතුන්ගේ සුබසාධනය සහ ආරක්ෂාව තහවුරු කරමින්, මහනුවර දළදා පෙරහැර වැනි සියවස්

ගණනාවක් පැරණි සම්ප්‍රදායික උත්සව අනාගත පරපුරටත් රැගෙන යෑම සඳහා රජය ගැනීමට බලාපොරොත්තු වන දිගු කාලීන සැලැස්ම මොකක්ද කියලා මම අහන්න කැමැතියි.

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)

ගරු කථානායකතුමනි, මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, දළදා පෙරහැර හෝ වෙනත් ආගමික කටයුතුවලට අලි-ඇතුන් ලබා නොදීමේ කිසිදු තීරණයක් හෝ නියෝගයක් ලබා දීමේ තීරණයක රජය නැහැ කියන එක. ඒ වෙනුවෙන් අදාළ පහසුකම් අපි සපයනවා. ගරු කථානායකතුමනි, ඊට අමතරව, මේ කරුණ සම්බන්ධයෙන් නඩු කිහිපයක් පවරා තිබුණා.

මේ ගැසට් පත්‍රයට අදාළ එක එක කොටස් ඉවත් කිරීම සඳහා නඩු තීන්දු කිහිපයක්ම ලබා දී තිබුණා. එම නිසා විශේෂයෙන්ම බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයත්, විශේෂඥ කණ්ඩායමකුත් එකතුව වර්තමාන රජය විධියට අපි ගැසට් නිවේදනයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගත්තා. එහි හොඳ විශේෂඥයින් පිරිසක් ඉන්නවා. ඒ පිරිස මේ වෙනකොට ඒක සකසමින් තිබෙනවා. ඒ කටයුත්ත අවසාන අදියරයේ තමයි තිබෙන්නේ. හීලෑ අලි-ඇතුන් ළඟ තබා ගැනීම, විශේෂයෙන්ම සංස්කෘතික කටයුතු; පෙරහැරවල් සඳහා අලි ඇතුන් ලබා දීම සම්බන්ධයෙන් ගැසට් නිවේදනයක් ඉදිරියේදී නිකුත් කරනවා.

විවිධ පාර්ශ්ව නොයෙක් කාරණා කියන්න පුළුවන්. ඔබතුමියත් මතු කළා, බාහිර පාර්ශ්ව; බාහිර රටවලිනුත් මේ සම්බන්ධයෙන් අහනවා කියලා. ඇත්තටම තායිලන්තය විසින් ලබා දී ඇති ඇතුන් දෙදෙනෙක් සම්බන්ධයෙන් ඔවුන් ප්‍රශ්න කරනවා. නමුත්, ඒ ඇතුන් දෙදෙනා හොඳ තත්ත්වයෙන් ඉන්නවා. අපි මීට කලින් වතාවක veterinary surgeonsලාගෙන් සමන්විත කමිටුවක් දාලා ඒ ඇතුන් දෙදෙනාගේ සෞඛ්‍ය තත්ත්වය සහ අනෙකුත් දේවල් පරීක්ෂා කරලා තායිලන්තයට යැව්වා, මේ සතුන්ගේ condition report එක මේකයි කියලා. නමුත්, වෙනත් වූ අරමුණක් වෙනුවෙන් ඒ සම්බන්ධයෙන් විටින් විට යම් යම් විමසීම් කරනවා. මෙහිදී විශේෂයෙන්ම කියන්න ඕනෑ, තායිලන්තයේ ශ්‍රී ලංකා තනාපතිවරිය වන විජයන්ති මහත්මිය ඒ වෙනුවෙන් විශාල දායකත්වයක් සපයන බව. එතුමිය එයට අදාළ තොරතුරු ටික ඒ රජයට සහ බාහිර පාර්ශ්වයන්ට ලබා දෙමින් විශාල සහයෝගයක් ලබා දෙනවා.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

හීලා ඇතුන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සහ සුබසාධනය විශාල වශයෙන් රඳා පවතින්නේ එම සතුන් දිනපතා රැක බලා ගන්නා ඇත්ගොව්වන්ගේ දැනුම, පුහුණුව හා හැසිරීම මතයි. එබැවින් ශ්‍රී ලංකාවේ ඇත්ගොව්වන්ට අලි ඇතුන්ගේ හැසිරීම් රටා, පෝෂණය, සෞඛ්‍ය තත්ත්වය, රෝග හඳුනා ගැනීම, මානුෂීය ලෙස හැසිරවීම, හදිසි අවස්ථාවල කළමනාකරණය සහ සත්ව සුබසාධනය පිළිබඳව විධිමත් පුහුණුවක් ලබා දීමට රජය මේ වන විට ගෙන ඇති පියවර කුමක්ද?

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)

විශේෂයෙන්ම ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව හරහා ඇත්ගොව්වන් ඒ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් සිද්ධ කරනවා. ඇත්තටම ගත්තොත්, මෙහි විශේෂත්වය තමයි, මෙවැනි රැකියාවකට පැමිණීමේ විශාල අඩුවක් තිබීම. පෞද්ගලිකව කෙනෙකුට ඇතෙක් හෝ අලියෙක් ලබා දීමේදී මේ දක්වාම තිබුණු ක්‍රියා පිළිවෙළ තමයි, ඒ සඳහා අවශ්‍ය පහසුකම්, ඒ සඳහා අවශ්‍ය කරන සුදුසුකම් තිබෙනවාද කියලා බලලා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා ඒ ලයිසන් එක ලබා දීම. අර කමිටුවෙන් ගනු ලබන තීන්දු තීරණ එක්ක, ඒ කමිටුව විසින් යෝජනා කරන දේවල් අපි ඉස්සරහට ගැසට් නිවේදනයක් මඟින් නිකුත් කරනවා. ඔබතුමිය කියන කරුණුත් ඒ ගැසට් එකේ අඩංගු වෙනවා. මොකද, අලියෙක් හෝ ඇතෙක් ළඟ තබා ගැනීමේදී තිබිය යුතු මූලික ලක්ෂණ, මූලික ගුණාංග මොනවාද කියලා බලලා ඒවාට පිළියම් සකසන්න ඕනෑ. ඒ අනුව ඔබතුමිය ඉදිරිපත් කරපු ඇත්ගොව්වන්ගේ ප්‍රශ්නය අපට නිරාකරණය කර ගන්න පුළුවන් කියලා මම හිතනවා. රජය ඒ වෙනුවෙන් පහසුකම් සපයනවා, දැනුවත් කිරීම සහ ඒගොල්ලන්ට උපදෙස් ලබා දීම සිද්ධ කරනවා.

## විදේශ රැකියා අවස්ථා සැපයීම: විනිවිදභාවය සහ වංචා-නිදහස් ක්‍රියාවලිය
## வெளிநாட்டு வேலைவாய்ப்புகளை வழங்குதல்: வெளிப்படையான மற்றும் மோசடியற்ற செயன்முறை
## PROVISION OF FOREIGN EMPLOYMENT OPPORTUNITIES: TRANSPARENT AND FRAUD-FREE PROCESSS

1852/2026

**10.ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රජය මැදිහත්වී විදේශ රැකියා අවස්ථා ලබා දීමේදී බඳවා ගැනීමේ පටිපාටියෙහි විනිවිදභාවය තහවුරු කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) විදේශ රැකියා ලබා දෙන බවට පවසමින් සිදුකරන ජාවාරම් සහ වංචා වැළැක්වීමට හඳුන්වාදී ඇති විශේෂ විමර්ශන යාන්ත්‍රණය කවරේද;

(iii) එක් අයදුම්කරුවෙකු රැකියා කිහිපයක් සඳහා අන්තර්ජාලයෙන් අයදුම් කර පසුව ඒවා අතහැර දැමීමෙන් සිදුවන අවභාවිතයන් වැළැක්වීමට තොරතුරු තාක්ෂණික විසඳුමක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) විදේශ රැකියා නියෝජිතායතන නියාමනය කිරීමට සහ අකටයුතුකම් සිදුකරන ආයතනවල බලපත්‍ර අහෝසි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) එම ක්‍රියාමාර්ග මඟින් විදේශ රැකියා ක්ෂේත්‍රය දූෂණයෙන් තොර කාර්යක්ෂම සේවාවක් බවට පත් කිරීමට අපේක්ෂිත කාල රාමුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

( அ) (i) அரசாங்கம் இடையீடு செய்து வெளிநாட்டு வேலை வாய்ப்புகளை வழங்குகையில், ஆட்சேர்ப்பு நடவடிக்கை முறையின் வெளிப்படைத் தன்மையை உறுதிப்படுத்து வதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

[ගරු ලාල් ප්‍රේමනාත් මහතා]

( ii) வெளிநாட்டு வேலைவாய்ப்புகளை வழங்குவ தாகக்கூறி மேற்கொள்ளப்படும் தீத்தொழில்கள் மற்றும் மோசடிகளைத் தடுப்பதற்கு அறிமுகப்படுத்தப்பட்டுள்ள விசேட விசாரணைப் பொறிமுறை யாது என்பதையும்;

( iii) விண்ணப்பதாரி ஒருவர் ஒன்றுக்கு மேற்பட்ட தொழில்களுக்கு இணையவழி ஊடாக விண்ணப்பித்து பின்னர் அவற்றை கைவிடுவதால் ஏற்படும் தவறான பயன் பாடுகளைத் தடுப்பதற்கு தகவல் தொழில்நுட்பத் தீர்வொன்று செயற்படுத்தப்படுமா என்பதையும்;

( iv) வெளிநாட்டு வேலைவாய்ப்பு முகவராண்மை நிறுவனங்களை ஒழுங்குபடுத்துவதற்கும் சீர்கேடு கள் இடம்பெறும் நிறுவனங்களின் உரிமங்களை இரத்துச்செய்வதற்கும் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

( v) அந்த நடவடிக்கைகள்மூலம் வெளிநாட்டுத் தொழில்வாய்ப்புத் துறையை ஊழலற்ற வினைத்திறன்மிக்க சேவையாக மாற்றுவதற்கு எதிர்பார்க்கப்படும் கால வரம்பு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the steps that have been taken to ensure transparency in the recruitment process followed in providing foreign employment opportunities with the intervention of the Government;

(ii) the special investigation mechanism that has been introduced to prevent racketeering and frauds committed under the pretext of providing foreign employment;

(iii) whether an information technology solution will be implemented to prevent the abuses caused in a situation in which one applicant applies for several jobs online and then abandons them;

(iv) the measures that have been taken to regulate foreign employment agencies and to revoke the licences of the institutions that engage in misconduct; and

(v) the expected timeframe for the foreign employment sector to become an efficient service free from corruption through the measures mentioned above?

(b) If not, why?

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මේ ප්‍රශ්න විසඳීම සඳහා අපි අයදුම්පත් කැඳවීම සීමා කරලා තිබෙනවා. ඒ වාගේම තමයි අපි online මාර්ගයෙන් අයදුම්පත් කැඳවනකොට සීමා සහිතව; විශේෂයෙන්ම අපට ඇවිල්ලා තිබෙන ඇබෑර්තුවලට අදාළව තමයි කැඳවන්නේ.

ඒ වාගේම තුන්වැනි කාරණාව තමයි, අපි SLCERT ආයතනයේ සහයෝගය - support එක - ලබා ගෙන තිබෙනවා.

හතර වැනි එක, G2G agreements, එහෙම නැත්නම් රජය මැදිහත් වෙලා රක්ෂා ලබා දෙන එකේ යම් කිසි දූෂණ, වංචා සිද්ධ වෙලා තිබෙනවා නම් පොලීසිය සම්බන්ධ කර ගෙන අපේ විශේෂ විමර්ශන ඒකකයෙන් ඒ සම්බන්ධව විශේෂ විමර්ශන පවත්වනවා.

ඒ වාගේම ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ - physical fitness tests - සිදු වෙනවා. ඒවා වීඩියෝ පටිගත කිරීමට අදාළ යම්කිසි ක්‍රමයක් අපි දැන් සකස් කර තිබෙනවා. ඒ වාගේම තමයි G2G agreementsවලට අදාළ, විශේෂයෙන්ම Israel sector එකට අදාළ විශේෂ මෘදුකාංග - software - පද්ධතියක් හඳුන්වා දෙන යම්කිසි ක්‍රියාවලියක මේ මොහොත වනවිට අපි ඉන්නවා. ඒ හරහා මේ විනිවිදභාවය තවත් වැඩි කරගන්න අපට පුළුවන් කියන විශ්වාසය තිබෙනවා. ඒ වාගේම අපි checks and balances ඇති කරලා තිබෙනවා. ඒ අදාළ නිලධාරින්ගේ අත්සන්, ඒ නිර්දේශ අනුව තමයි මේ සියලු කටයුතු කරන්නට අපි නිර්දේශ ලබා දීලා තිබෙන්නේ. ඒක නිසා එතැනදී ඒ ප්‍රශ්නවලට උත්තර ලැබෙයි කියලා අපි හිතනවා.

(ii) විශේෂයෙන්ම ඕනෑම පුද්ගලයෙක් රැකියා සඳහා විදේශගත වෙනවා නම් ලියාපදිංචි විය යුතුයි කියලා අපි දන්නවා. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා තමයි මේක සිදු වන්නේ. ඒ වාගේම ඕනෑම ආයතනයක් හෝ පුද්ගලයෙකු තවත් පුද්ගලයෙකු විදේශගත කරනවා නම් අනිවාර්යයෙන්ම ලියාපදිංචි විය යුතුයි. ඒ සම්බන්ධ ප්‍රශ්න, ගැටලු නිර්මාණය වෙලා තිබෙනවා නම්, විශේෂයෙන් විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළව අපේ ක්‍රම කිහිපයක් තිබෙනවා. එකක් තමයි, මහජන පැමිණිලි කැඳවීම සහ මහජන පැමිණිලි භාර ගැනීම. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ශාඛා දිස්ත්‍රික්ක 22ක තිබෙනවා. ඒ සියලු ශාඛාවලදී මේ පැමිණිලි භාර දෙන්න පුළුවන්. ඒ වාගේම යම්කිසි බරපතළ වංචා, දූෂණ සිදු වෙලා තිබෙනවා නම්, සෘජුව බත්තරමුල්ල පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූලස්ථානයට ඒ පැමිණිලි භාර දෙන්න පුළුවන්. ඒක විශේෂ විමර්ශන ඒකකය හරහා සිදු වෙන්න ඕනෑ දෙයක් නම්, ඒ විමර්ශනය ඒ විධියට කරනවා. ඒ වාගේම අපි බැඳිලා ඉන්නවා, හදිසි වැටලීම් සහ ස්ථාන පරීක්ෂා කිරීමට. ඒකත් නිසි පරිදි සිදු වෙනවා. ඒ වාගේම පොලීසිය, ශ්‍රී ලංකා අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව, මිනිස් ජාවාරම සහ මිනිස් ප්‍රවාහන විමර්ශන අංශය, නීතිය ක්‍රියාත්මක කරන අනෙකුත් ආයතන එක්ක ඒකාබද්ධ වෙමින් නිරන්තරයෙන්ම වැටලීම් සහ පරීක්ෂණ පවත්වනවා. ඒ වාගේම විදේශ රැකියා නියෝජිත ආයතන සහ බලපත්‍ර නොමැති පුද්ගලයන් සම්බන්ධයෙන් අපි විමර්ශන කරනවා. දැනටමත් අපි ආයතන හරහා විවිධ විමර්ශන පවත්වාගෙන යමින් අදාළ විසඳුම් ලබා දෙමින් පවතිනවා.

(iii) අපි මෙතැනදීත් ක්‍රම කිහිපයක් හඳුන්වලා දීලා තිබෙනවා. එකක් තමයි, G2G agreements සහිත කාණ්ඩ හරහා විදේශගත වීමට යම්කිසි පුද්ගලයෙකුට අදහසක් තිබෙනවා නම් අපි ඒ පුද්ගලයන්ට අදාළ ක්ෂේත්‍රවලට විතරයි යොමු කරන්නේ. අතීතයේ යම්කිසි ප්‍රශ්න, ගැටලු තිබුණා. එවැනි කාණ්ඩ හතක් තිබුණා නම්, එකම පුද්ගලයා කාණ්ඩ හතටම අයදුම්පත් ලබා දෙන ක්‍රමයක් තිබුණා. නමුත් ඒක සමස්තයක් විධියට වෙනස් කරමින් අපි දැන් සමත් වෙලා ඉන්නවා, යම් විශේෂ ලෙස කාණ්ඩ දෙකකට අදාළ පුද්ගලයා යොමු කිරීමට. ඒ වාගේම අපි මේ ප්‍රශ්නයට අදාළව යම්කිසි සීමා සහිත කැඳවීම් තමයි කරන්නේ. විශේෂයෙන්ම රක්ෂා 3,000ක් විතර ලැබෙනවා නම්, රක්ෂා 4,000කට අදාළව තමයි අපි අයදුම්පත් කැඳවන්නේ. එතැනින් අපට තෝරාගෙන, බේරාගෙන යන්න පුළුවන්. එහෙම නැතුව අතීතයේ සිදු වෙච්ච විධියට අසීමිත කැඳවීම් කිරීමෙන් ඒ හරහා විවිධ අක්‍රමිකතා සිදු වෙන්න පුළුවන්. ඒක සමස්තයක් විධියට නතර කිරීමට අදාළ උත්සාහයේ පළමුවැනි ක්‍රියාමාර්ගයක් විධියට තමයි අපි සීමාසහිත කැඳවීම් ගන්නේ. ඒක කරන්නේ web portal එක හරහා.

(iv) විදේශ රැකියා සම්බන්ධ නියෝජිත ආයතන, එහෙම නැත්නම් ඒජන්සිවලට අදාළ ප්‍රශ්නයක් මේක. මේ ඒජන්සි නියාමනය කිරීමට අදාළව අපි බලපත්‍ර ක්‍රමයක් හඳුන්වලා දීලා තිබෙනවා. විශේෂයෙන්ම 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත හරහා තමයි ඒක ලබා දෙන්නේ. යම්කිසි ආයතනයක් ඕනෑම පුද්ගලයෙකු විදේශ රැකියාගත කිරීමට අදාළ කටයුත්තක් කරනවා නම්, අනිවාර්යයෙන්ම විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි විය යුතුමයි. ඒ වාගේම අපි ආයතනයක් විධියට ඒ ගැන අඛණ්ඩ පරීක්ෂණ කරනවා. එතැනදී විවිධ දේවල් අපි බලනවා. විශේෂයෙන් පැමිණිලි විමර්ශනය කිරීම, ලේඛන පරීක්ෂා කිරීම සිදු කරනවා. ඒ වාගේම නියමිත කොන්දේසිවලට අදාළවත් අපේ යම්කිසි පරීක්ෂණ ක්‍රමයක් තිබෙනවා. ඒ ටිකත් අපි නිසි පරිදි කරනවා.

ඊළඟට, තුන්වැනි කාරණය මෙයයි. විදේශ රැකියා නියෝජිතායතනයකින් යම්කිසි කොන්දේසියක් උල්ලංඝනය වෙලා තිබුණා නම් අපට අනුගමනය කළ හැකි ක්‍රම කිහිපයක් තිබෙනවා. එකක් තමයි බලපත්‍ර අහෝසි කිරීම. එහෙම නැත්නම් තාවකාලිකව බලපත්‍ර අත්හිටුවීම. ඒ වාගේම යම් කිසි වැරැද්දකට ඔවුන් උසාවියේදී වැරදිකරුවා බවට පත් වෙලා තිබුණා නම් අනාගතයේදී මේ බලපත්‍ර අලුත් කරනකොටත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විධියට ඒවා අත්හිටුවන්නත්, එහෙම නැත්නම් ඒවා අලුත් නොකරන්නත් අයිතියක් අපට තිබෙනවා. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගන්නටත් අපට අයිතියක් තිබෙනවා. මෙවා සම්බන්ධ විමර්ශනය කරන වෙනම ආයතනයක් තිබෙනවා. ඒ වාගේම විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නීති අංශය හරහා මේ සියලු කටයුතු අපි කරගෙන යනවා.

(v) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දැනටමත් පවතින නෛතික සහ පරිපාලන ක්‍රියාපටිපාටිය අනුව කාර්යාංශයේ සියලු කටයුතු විනිවිදභාවයකින් යුතුව සිදු කරමින් පවතී. තවද, යෝජිත නව පනත තුළින් විදේශ රැකියා ක්ෂේත්‍රය වඩාත් විධිමත්ව නියාමනය කිරීමට අපේක්ෂා කරනු ලබයි.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය ඇමතිතුමා ලබා දුන් පිළිතුර ආශ්‍රිතව මට විමසන්න අවශ්‍ය පළමු අතුරු ප්‍රශ්නය මෙයයි. අපි දන්නවා, මේ ආයතනය ඉතාම දූෂිත ආයතනයක් ලෙස පැවතුණු බව. එහි වගකීම දරපු ඇමතිවරු සහ ඊට අදාළ හිතවතුන් දැනටමත් නීතියේ රැහැනට හසු වෙලා තිබෙන බවත් අපි දන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, නමුත් ඔබතුමා ඉතා කෙටි කාලයකදී ඉතාම හොඳ පියවර කිහිපයක් තබා තිබෙනවා සහ අවශ්‍ය පියවර ගනිමින් ඉන්නවා. අපි ඒ ගැන සතුටු වනවා වාගේම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, නමුත් ඒ අයට අවශ්‍ය අවස්ථාව නොලැබෙන එක ගැන රැකියා අපේක්ෂිත තරුණයන්ගෙන් සහ දරුවන්ගෙන් අපට තවදුරටත් මැසිවිලි නැඟෙනවා. මොකද, ඒ අය ඔබතුමන්ලාගේ වෙබ් අඩවියේ ලියාපදිංචි වෙලා කාලයක් තිස්සේ බලා සිටිනවා. ඒ වාගේම ඔවුන් consultancy companies ගැනත් නිතරම අපෙන් ප්‍රශ්න නඟමින් ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඒ ගැනත් කරුණු දැනගන්න කැමැතියි.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු කථානායකතුමනි, මම ආයතන කියලා සමස්තයක් හැටියට කියනවාට වඩා විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ ගැටලු ගැන කියන්නම්. ලංකාවේ විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළව ප්‍රශ්න රාශියක් නිර්මාණය වෙලා තිබුණා. අපි ආණ්ඩුවක් විධියට මේ මොහොත වනකොට සමත් වෙලා තිබෙනවා, මේ රැකියාවලට අදාළ රාජ්‍ය අංශය සම්බන්ධවත් පැමිණිලි කරමින් යම්කිසි විමර්ශන කටයුත්තක් කරගෙන යන්න. මේ මොහොත වනකොට හිටපු අමාත්‍යවරයා, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හිටපු සභාපතිතුමා ඇතුළු විවිධ අයට විරුද්ධව විවිධ පාර්ශ්ව විසින් විමර්ශන කරගෙන යනවා. නීති රාමුව තුළ ඔවුන් වැරදිකරුවන් විධියට ඔප්පු වනවා නම් ඔවුන්ට දඬුවම් ලබා දීමට අදාළ ක්‍රියාමාර්ගවල අපි නිරත වී සිටිනවා. ඒ වාගේම ආයතනයේ අදාළ නිලධාරීන් කිහිපදෙනෙකුගේ වැඩ තහනම් කරන්නත් අපට සිදු වුණා. විශේෂයෙන්ම අපි පසුගිය අවුරුද්දේ එක විමර්ශනයක් කරගෙන යද්දි එකපාරටම හයදෙනෙකුගේ වැඩ තහනම් කරන්න සිද්ධ වුණා. අපේ යුතුකම අනුව මේක පිරිසිදු ක්ෂේත්‍රයක් බවට පත් කිරීමට අදාළව ඒ වාගේ විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා.

ඒ වාගේම රැකියා අපේක්ෂිත තරුණ තරුණියන්ට website එකේ දීර්ඝ කාලීනව රැඳී සිටීමට අදාළව යම්කිසි ප්‍රශ්නයක් ගරු මන්ත්‍රීතුමා අහලා තිබුණා. ඕනෑම දෙයක් ගත්තොත්, ගිවිසුම් ප්‍රකාරව තමයි සිද්ධ වන්නේ. ගිවිසුම් ප්‍රකාරව ගත්තොත්, website එකෙන් ඒ අදාළ පුද්ගලයා තෝරා රස්සාවක් ලබා දීමේ කාලරාමුවක් සඳහන් කරලා නැහැ. විශේෂයෙන්ම ඊශ්‍රායලයේ වෙන්න පුළුවන්, කොරියාවේ වෙන්න පුළුවන්, G2G කාණ්ඩය

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

හරහා ලැබිලා තිබෙන රැකියා අවස්ථාවලදී අපි ඒ අදාළ පාර්ශ්ව දිගින් දිගටම දැනුවත් කළා, යම් නිශ්චිත කාලවකවානුවක් තුළ අපට උත්තරයක් ලබා දෙන්න කියාත්, මේ සියලුදෙනාම බඳවා ගැනීමට අදාළ ක්‍රියාමාර්ගය ගන්න කියාත්. නමුත් අපට සමහර තැන්වලදී ඒකට අදාළව සාර්ථක උත්තර ලැබිලා නැහැ. නමුත් අපි අඛණ්ඩව අපේ පැත්තෙන් කරන්න පුළුවන් උපරිම මැදිහත්වීම් කරමින් මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න කටයුතු කරනවා.

ඒ වාගේම consultancy companies සම්බන්ධවත් කියලා තිබුණා. Consultancy companies කියන්නේ යම්කිසි උපදේශයක් ලබා දෙන ආයතන. කිසිසේත්ම රැකියා සඳහා කිසිම කෙනෙක් බඳවා ගැනීමට අදාළ අයිතිය, එහෙම නැත්නම් ඒ නීතිමය වටපිටාව consultancy companiesවලට නැහැ. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි නොවන කිසිම ආයතනයකට විදේශ රැකියා සඳහා කිසිම කෙනෙක් බඳවා ගැනීමට අදාළ අයිතිය නැහැ කියන කාරණාවත් මේ උත්තරීතර සභාවේදී මම කියන්න කැමැතියි.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, මම මතු කරන දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, ඉතාම දුප්පත් තරුණ තරුණියන් රැකියාවක් ලබා ගැනීම සඳහා තමයි මේ පෙළඹිලා ඉන්නේ කියලා.

ඒ වාගේම ඒ දුප්පත්කම නිසාම ඒ අයට මුදල් ගෙවලා විදේශ රැකියාවකට යෑමේ හැකියාවක් නැහැ. නමුත් අපි දකිනවා, ඒ රැකියා කොයි තරම් දුෂ්කර වුණත්, යුද තත්ත්වය තුළ පවා අදටත් එවැනි රටවල රැකියා සඳහා දරුවන් ඉල්ලුම් කරමින් තිබෙන බව. ඒ අතර අපි දකිනවා, තවදුරටත් මුදල් අයකරමින් මේ අය පිට රට යැවීම සඳහා කටයුතු කරන ආයතන තිබෙන බවත්. අපි මීට කලින් අහලා තිබෙනවා, කලින් ආණ්ඩුව යටතේ list හදලා ඒ list එකට අනුව මුදල් වැය කරගෙන රට යවපු අවස්ථා. මේ දෙක අතර වෙනසත් මම ඔබතුමාගෙන් පැහැදිලි කරගන්න කැමැතියි.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු කථානායකතුමනි, අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ, කිසිසේත්ම list ක්‍රමයකට විදේශ රැකියාවලට යවන්නේ නැහැ. අතීතයේ එවැනි අක්‍රමිකතා සිදු වෙලා තිබුණා. ඒ පිළිබඳ අපි දැන් විමර්ශන රාශියක් කරගෙන යනවා. මෙතැනදී අපි විනිවිදභාවයක් ඇති කර තිබෙනවා. විශේෂයෙන්ම online portals හරහා විතරයි අපි අයදුම්පත් කැඳවන්නේ. අපි ඒකට අදාළ system එකක් හදලා තිබෙනවා. මේක ජනතාවට අයිති quota එකක්. මේ quota එක සමස්තයක් විධියට ජනතාවටම යා යුතුයි කියන බලාපොරොත්තුව අපට තිබෙනවා. මන්ත්‍රීවරුන්, හිටපු අමාත්‍යවරුන් කටයුතු කරපු විධියට තමන්ගේ දිස්ත්‍රික්කයට හෝ තමන්ගේ ගජ මිතුරන් හරහා හෝ තමන්ට හිතවත් සමාගම් අතර මේ රැකියා බෙදා ගන්නවා වෙනුවට, මේක මේ රටේ ජීවත් වන සියලු තරුණ තරුණියන්ට, සියලු පුරවැසියන්ට හිමි quota එකක් කියලා අපි හිතනවා. ඒ නිසා අපි අනිවාර්යයෙන්ම මේ විනිවිදභාවය ඉදිරියටත් අරගෙන යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## මීරාවෝඩෙයි රජයේ රෝහල: සංවර්ධනය
### *மீராவோடை அரசாங்க வைத்தியசாலை: அபிவிருத்தி*
### MEERAVODAI GOVERNMENT HOSPITAL: DEVELOPMENT

903/2025

**2. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මීරාවෝඩෙයි රජයේ රෝහල දීර්ඝ කාලයක සිට සංවර්ධනය කර නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලට පැමිණෙන රෝගීන් විශාල ලෙස අපහසුතාවට ලක්වන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එම රෝහල සියලු පහසුකම් සහිත රෝහලක් බවට පත් කිරීම සඳහා වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மீராவோடை அரசாங்க வைத்தியசாலை நீண்ட காலமாக அபிவிருத்தி செய்யப்படவில்லை என்பதையும்;

(ii) அதன் காரணமாக வைத்தியசாலைக்கு வருகை தருகின்ற நோயாளர்கள் அதிகளவான சிரமங்களை எதிர்நோக்குகின்றனர் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வைத்தியசாலையை சகல வசதிகளையும் கொண்ட வைத்தியசாலையாக முன்னேற்றுவதற்கு ஏதேனும் வேலைத்திட்டம் உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அந்த வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Is he aware that -

(i) the Meeravodai Government Hospital has not been developed for a long time; and

(ii) patients visiting the said hospital face great inconvenience due to this reason?

(b) Will he inform this House -

(i) whether there is a programme to convert the said hospital into a hospital with all facilities; and

(ii) if so, the said programme?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i), (ii) මීරාවෝඩෙයි ප්‍රාදේශීය රෝහල දැනට 'B' වර්ගයේ ප්‍රාදේශීය රෝහලක් ලෙස ක්‍රියාත්මක වෙමින් ප්‍රදේශවාසීන් සඳහා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා අඛණ්ඩව සපයනු ලබයි. මෙම රෝහල වෙත දිනපතා සාමාන්‍යයෙන් බාහිර රෝගී අංශයෙන් - OPD එකෙන් - රෝගීන් 160ක් පමණ ප්‍රතිකාර ලබා ගන්නා අතර, නේවාසිකව ඇතුළත් කරගන්නා සාමාන්‍ය රෝගීන් සංඛ්‍යාව 3කි.

වාලච්චේනයි මූලික රෝහලේ සිට කිලෝමීටර 2.2ක් වැනි ආසන්න දුරකින් පිහිටා තිබුණද, ප්‍රදේශයේ ජනතාවට බාධාවකින් තොරව සෞඛ්‍ය පහසුකම් ලබා දීමේ ප්‍රමුඛ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් මෙම රෝහල B වර්ගයේ ප්‍රාදේශීය රෝහලක් ලෙස තවදුරටත් පවත්වාගෙන යනු ලබයි.

(ආ) (i), (ii) රෝහලේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන සැලසුම් කිහිපයක් ක්‍රියාත්මක වන අතර, ප්‍රාථමික සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය - PHSEP - යටතේ 2024 වසර සඳහා නියමිත ව්‍යාපෘති පහත පරිදි වේ.

1. පුරුෂ හා ස්ත්‍රී වාට්ටු අලුත්වැඩියා කිරීම, බාහිර රෝගී අංශය - OPD - ගොඩනැඟිල්ල වැඩිදියුණු කිරීම සහ මුළුතැන්ගෙය පුළුල් කර වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 11.5ක මුදලක් වෙන් කිරීම.
2. වෛද්‍ය නිල නිවාස වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 2ක මුදලක් වෙන් කිරීම.

මීට අමතරව, මීරාවෝඩෙයි ප්‍රාදේශීය රෝහල 'B' වර්ගයේ ප්‍රාදේශීය රෝහලක් ලෙස පවත්වාගෙන යමින්, මහජනතාවට අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා බාධාවකින් තොරව ලබා දීම තහවුරු කිරීම උදෙසා අවශ්‍ය මානව සම්පත්, උපකරණ සහ යටිතල පහසුකම් පියවරෙන් පියවර සංවර්ධනය කිරීමට මේ වන විට කටයුතු යොදා ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### "එක්ස්ප්‍රස් පර්ල්" ව්‍යසනය සඳහා වන්දි ලබා ගැනීමේ ප්‍රගතිය
### "எக்ஸ்பிரஸ் பேர்ள்" விபத்துக்கான இழப்பீடு கோரும் நடவடிக்கையின் முன்னேற்றம்
### PROGRESS OF CLAIMING COMPENSATION FOR "X-PRESS PEARL" DISASTER

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

2021 වසරේ සිදු වූ එක්ස්ප්‍රස් පර්ල් නෞකා ව්‍යසනය ශ්‍රී ලංකාවේ පරිසරයට, ධීවර ජනතාවට සහ සමස්ත ආර්ථිකයට සිදු කළ හානිය වෙනුවෙන් වන්දි අයකර ගැනීමේ ක්‍රියාවලියට වසර ගණනාවක් ගත වෙලා තිබෙනවා. විශේෂයෙන්ම, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මඟින් වන්දි ලබා ගැනීම සඳහා පැහැදිලි නීතිමය පදනමක් සකස් කර තිබියදී තීන්දුවේ නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා වන්දි මුදල් අයකර ගැනීම පිළිබඳව තවමත් පැහැදිලි තොරතුරු නොමැති බැවින් මේ සම්බන්ධ වර්තමාන තත්ත්වය පිළිබඳව කරුණු පැහැදිලි කර ගැනීම උදෙසා මම පහත සඳහන් ප්‍රශ්න යොමු කරනවා.

1. 2025 ජූලි 24 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියම කරන ලද ඇමෙරිකානු ඩොලර් බිලියනයක වන්දි මුදලින් පළමු වාරිකය 2025.09.23 දිනට පෙර ලැබී තිබේද? සම්පූර්ණ වන්දි මුදල ගෙවීමේ අවසන් දිනය වන 2026.07.23 දින වන විට සම්පූර්ණ මුදල ගෙවා තිබේද? නැතහොත්, රජයට මේ වන විට සැබෑවටම ලැබී ඇති සම්පූර්ණ මුදල කොපමණද? එම මුදල ලැබුණු දිනය, ගෙවූ පාර්ශ්වය කවුරුන්ද? ඒ අනුව කොපමණ වන්දි මුදලක් තවදුරටත් ලැබීමට නියමිතව තිබේද? ලැබුණු මුදල කවර ගිණුමකට බැර වී ඇත්ද? උදාහරණයක් වශයෙන් ඒකාබද්ධ අරමුදල ද, විශේෂ ගිණුමක්ද යන්න පිළිබඳව විස්තරයක් අවශ්‍යයි. ධීවර ප්‍රජාවට හෝ ප්‍රතිසංස්කරණ කටයුතුවලටත්, පරිසර හානි වැළැක්වීමේ වැඩ කටයුතුවලටත් ඒවා වැය කර තිබෙනවාද?

   විශේෂයෙන් මම මේ ප්‍රශ්නය අහන්නේ මේ නිසායි. ඇමෙරිකානු ඩොලර් බිලියනයක වන්දි මුදල් නියම වුණත් අපට ආරංචියක් ලැබී තිබෙනවා, 2025.09.22 දින දක්වා ගෙවා තිබෙන මුදල රුපියල් මිලියන 300යි කියලා. 2025.09.25 දින full journal entry එකේත් එහෙම සඳහන් වනවා. ඒ කියන්නේ, නියමිත ඩොලර් මිලියන 250ක පළමු වාරිකයෙන් ගෙවලා තිබෙන්නේ 0.4යි කියන කාරණාව. ඒ නිසා අපි ඇත්තවශයෙන්ම ගෙවපු මුදල පිළිබඳ සත්‍ය කරුණු කාරණා සහ දත්ත මොනවාද කියා රජයෙන් දැනගන්න කැමැතියි.

2. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝග කර ඇති ආරම්භක වන්දි මුදලට අමතරව ඇස්තමේන්තු කර ඇති සමස්ත පාරිසරික හා ආර්ථික හානිය කොපමණද? එම පුළුල් හානි සඳහා අතිරේක වන්දි ලබා ගැනීමට රජය ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද?

   මොකද, නැඟෙනහිර වෙරළට තදාසන්නව "නිව් ඩයමන්ඩ්" නමිනුත් මේ වාගේ පරිසර හානියක් වූ ඛේදවාචකයක් සිදු වුණු බව අපි දන්නවා. එම නිසා විශේෂයෙන්ම මේ එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ විනාශය තුළ ඇත්තවශයෙන්ම අපේ රටට ලබා ගත යුතු අරමුදල් ලබා ගන්නට ගෙන ඇති පියවර මොනවාද?

3. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියම කළ පරිදි අපරාධ විමර්ශන හා නඩු පැවරීමේ කටයුතු මේ වනවිට අවසන් කර තිබේද? වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග මොනවාද? ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගවලට අනුකූල නොවූ පාර්ශ්ව පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට ගෙන ඇති හෝ ගැනීමට අපේක්ෂා කරන නීතිමය ක්‍රියාමාර්ග මොනවාද? ඒ සඳහා යෝජිත කාල රාමුව ඉදිරිපත් කළ හැකිද?

   විශේෂයෙන්ම 2026.01.26වන දින full journal entry එකේ පැහැදිලිවම, “decided”, “proceedings terminated” යනුවෙන් සඳහන් වෙනවා. ඒ වාගේම, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මාස තුනක් ඇතුළත වැඩිදුර පරීක්ෂණ අවසන් කර, නඩු ගොනු කිරීම අවසන් කළ යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක සඳහන් වෙනවා. අපරාධ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ අනුව ක්‍රියා කර තිබෙනවාද, නැද්ද කියන එක පිළිබඳව මේ සභාව දැනුවත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

4. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව ස්ථාපිත කරන ලද එක්ස්ප්‍රස් පර්ල් වන්දි කොමිෂන් සභාවෙහි වර්තමාන ක්‍රියාකාරී තත්ත්වය කුමක්ද? එම කොමිසමේ සභාපතිවරයා විසින් 2026.03.06 දින ඉදිරිපත්කොට ඇති වාර්තාව පරිදි කොමිසමේ ක්‍රියාකාරිත්වයට බලපා ඇති නීතිමය, පරිපාලනමය හෝ ව්‍යවස්ථානුකූල ගැටලු විසඳීමට රජය ගෙන ඇති පියවර මොනවාද?

උදාහරණයක් වශයෙන් කියන්න පුළුවන්, තීන්දුවේ පිටපත ප්‍රමාද වීම, සහතික කළ ලේඛන නොලැබීම, කාර්යය සඳහා මාර්ගෝපදේශ හා ක්‍රියා පටිපාටි අනුමැතිය ක්‍රියාත්මක නොවීම, විශේෂයෙන්ම ToR සහ SOPs පිළිබඳව පැහැදිලිභාවයක් නොතිබීම යනාදී කාරණා. ඒ වාගේම තමයි, විශේෂඥවරුන්ට ගෙවීම් ප්‍රශ්නය. ඒ වාගේම කථා වෙනවා, සභාපතිවරයාගේ ඉල්ලා අස්වීමේ අදහස, නඩු කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව. මේ තත්ත්ව තුළ ඇත්තවශයෙන්ම බරපතළ ව්‍යාකූලත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ පිළිබඳව සත්‍ය තොරතුරු කවරේද කියන එක මම අහන්නට කැමතියි.

5. මේ වනවිට නඩු කටයුතු අවසන් වී තිබීම 2025.07.24වන දින ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මත ස්ථාපිත කරන ලද එක්ස්ප්‍රස් පර්ල් වන්දි කොමිෂන් සභාව සහ මුහුදු සහ වෙරළබඩ පරිසර ප්‍රතිසංස්කරණ හා ආරක්ෂණ කමිටුවල බලතල හා ක්‍රියාකාරිත්වයට බලපාන්නේ කෙසේද?

6. සිංගප්පූරු අන්තර්ජාතික වාණිජ අධිකරණයේ සිවිල් නඩුවක් පැවරීමේ තීරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් බව ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මඟින් ප්‍රකාශ කර ඇති අතර, එම ප්‍රකාශයෙන් පසුව එම නඩුව සම්බන්ධයෙන් ගෙන ඇති තීරණ කවරේද? විදේශීය නීති උපදේශන සහ වන්දි අය කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා මේ දක්වා වැය කර ඇති මුළු මුදල කොපමණද?

7. එක්ස්ප්‍රස් පර්ල් ව්‍යසනය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හඳුනා ගත් රාජ්‍ය ආයතනවල අසාර්ථකත්වය සහ නියාමන දුර්වලතා නැවත සිදුවීම වැළැක්වීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය - MEPA - ඇත්තවශයෙන්ම ලොකු සේවාවක් කරන්න උත්සාහ දරනවා. නමුත්, බරපතළ භෞතික සහ මානව සම්පත් හිඟයකින් පෙළෙනවා. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ අනෙකුත් අදාළ ආයතන සම්බන්ධයෙන් ක්‍රියාත්මක කර ඇති ආයතනික හා නීතිමය ප්‍රතිසංස්කරණ මොනවාද කියන එකත් මම මේ අවස්ථාවේදී දැන ගන්න කැමැතියි.

මම රජයෙන් ඉල්ලීමක් කරනවා, ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්නයක් හැටියට මේ ප්‍රශ්නයට අදම පිළිතුරු ලබා දෙන්න කියලා.

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, මෙය ඉතා වැදගත් සහ ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්නයක් බව මා පිළිගන්නවා. නමුත්, මෙම ප්‍රශ්නයේ ඇති කරුණුවලට තොරතුරු මගේ අමාත්‍යාංශය සතුව පමණක් නොවෙයි තිබෙන්නේ. නීතිපති දෙපාර්තමේන්තුවෙන්, මුදල් අමාත්‍යාංශයෙන්, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයෙන්, පරිසර අමාත්‍යාංශයෙන් සහ වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය මඟින් අදාළ තොරතුරු කැඳවා ගත යුතුයි. ඒ සඳහා දැනටමත් පියවර ගෙන තිබෙනවා. ඒ නිසා පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් මා ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

## II

## බැටරි බලශක්ති ගබඩා පද්ධතිය හඳුන්වා දීම හරහා පුනර්ජනනීය විදුලිය ප්‍රවර්ධනය කිරීම
## பேட்டரி ஆற்றல் சேமிப்பு அமைப்பை அறிமுகப்படுத்துவதன்மூலம் புதுப்பிக்கத்தக்க மின்சாரத்தை ஊக்குவித்தல்
## PROMOTION OF RENEWABLE ELECTRICITY THROUGH INTRODUCTION OF BATTERY ENERGY STORAGE SYSTEM

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, I wish to ask the following Question under Standing Order No. 27(2) from the Hon. Minister of Energy, especially with the effect of El Niño projected in the coming months.

Sri Lanka continues to discourage and curtail renewable electricity despite substantial investment in solar and wind generation. Delays in setting up Battery Energy Storage Systems - BESS - and grid constraints risk increasing dependence on expensive thermal generation, while adverse climatic conditions may reduce hydrogeneration and further increase electricity costs.

මෙම තත්ත්වය යටතේ ගරු බලශක්ති අමාත්‍යතුමාගෙන් මම පහත සඳහන් ප්‍රශ්න අහන්න කැමැතියි.

1. පසුගිය මාස 12 තුළ ලංකා විදුලිබල මණ්ඩලය/පද්ධති පාලන අංශය - CEB/System Control - විසින් සීමා කරන ලද පුනර්ජනනීය විදුලිබල ප්‍රමාණය gigawatt-hoursවලින් කොපමණද? එහි ඇස්තමේන්තුගත මූල්‍ය වටිනාකම හා එයට හේතු කවරේද?

රිළවු ප්‍රශ්නය විතරක් නොවෙයි.

පාඩු ලබන හෝ අකාර්යක්ෂම තාප විදුලිබල උත්පාදනය සම්බන්ධයෙන්ද මෙවැනි සමාන ක්‍රියාමාර්ග නොගන්නේ මන්ද?

2. තාක්ෂණික වශයෙන් විදුලිය සැපයීමට හැකියාව තිබියදීත්, උත්පාදනය සීමා කිරීමට නියෝග ලැබෙන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයන්ගේ අහිමි වන ආදායම සඳහා "deemed-energy" හෝ වෙනත් ක්‍රමයක් යටතේ වන්දි ගෙවන්නේද? එසේ නොමැති නම් එම පාඩුව දරන්නේ කවුරුන්ද?

3. දැනට ක්‍රියාත්මක Battery Energy Storage System - BESS - ගාස්තු කවරේද, ඒවා තීරණය කළේ කවදාද, ඒවා තීරණය කිරීම සහ අනුමත කිරීමේ බලය ඇත්තේ කාටද? වාණිජමය වශයෙන් ශක්‍ය නව ගාස්තු හඳුන්වා දෙන්නේ කවදාද, ඒවා කොපමණ කාලයකට වලංගු වන්නේද සහ ඇමෙරිකානු ඩොලරයට සම්බන්ධ කරන්නේද?

That is, against our US Dollar parity rate. And, what is the life cycle of this particular battery that is going to be used? Normally, they try to guarantee 10 to 15 years when its life cycle is expected to be 25 years, and that would help reduce the rate, Hon. Speaker.

4. දැනට ක්‍රියාත්මක ප්‍රසම්පාදනය යටතේ පවතින සහ ඉදිරි වසර තුන තුළ අවශ්‍ය BESS ධාරිතාව megawatt/megawatt-hoursවලින් කොපමණද? ගාස්තු, ප්‍රසම්පාදන හෝ නියාමන ප්‍රමාදය එහි ව්‍යාප්තියට බාධාවක් වී තිබේද? පවතින feed-in tariff ක්‍රමයට සමගාමීව BESS ආයෝජන දිරිගැන්වීමට සුදුසු ගාස්තුවක් ලබා දිය නොහැක්කේ මන්ද?

Sir, there was a feed-in tariff rate given, which had subsequently been suspended unilaterally, and I call upon the Hon. Minister to look into that positive step, which could increase production overnight.

5. පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයන්ට, ජාතික විදුලිබල පද්ධතිය හරහා හඳුනා ගත් පාරිභෝගිකයන්ට විදුලිය සැපයීමට හැකි වන පරිදි power wheeling/open access ක්‍රමයක් රජය හඳුන්වා දෙන්නේද? එසේ නම් ඒ කවදාද? Wheeling ගාස්තු තීරණය කරන්නේ කවුරුන්ද?

Is it the Public Utilities Commission of Sri Lanka?

6. ඉදිරි මාස 12 තුළ El Niño තත්ත්වය හේතුවෙන් ජල විදුලිබල උත්පාදනයට සහ ජලාශ මට්ටම්වලට ඇති විය හැකි බලපෑම කුමක්ද? අපේක්ෂිත විදුලිබල උත්පාදන හිඟය gigawatt-hoursවලින් කොපමණද?

එහි මූල්‍ය වටිනාකම කොපමණ වේවිද?

7. එවැනි ජල විදුලිබල හිඟයක් තාප විදුලි බලයෙන් පියවීමේ මූල්‍ය හා විදේශ විනිමය පිරිවැය කොපමණද? IMF සමඟ එකඟ වූ පිරිවැය පිළිබිඹු කරන විදුලි ගාස්තු ප්‍රතිපත්තිය - that is a cost-based invoicing system - සැලකිල්ලට ගත් විට එමඟින් විදුලි ගාස්තුවලට ඇති වන බලපෑම කුමක්ද?

8. විදුලි කප්පාදුවකින් හෝ අධික ගාස්තු වැඩිවීමකින් තොරව ඇති විය හැකි විදුලිබල හිඟය පියවීම සඳහා BESS, ජාලය ශක්තිමත් කිරීම, පුනර්ජනනීය විදුලිබල සීමා කිරීම අවම කිරීම, power wheeling සහ ඉල්ලුම් කළමනාකරණය ඇතුළු රජය ක්‍රියාත්මක කිරීමට නියමිත පියවර කවරේද?

9. ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු භාවිතය විදුලිබල උත්පාදන කාර්යක්ෂමතාවට සහ පිරිවැයට ඇති කරන බලපෑම කුමක්ද? එමඟින් සිදුවන උත්පාදන අහිමිවීම megawatt/gigawatt-hoursවලින් සහ අතිරේක මූල්‍ය පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද?

10. 2024, 2025 සහ 2026 වර්ෂවල ජුනි සහ දෙසැම්බර් මාස වන විට තාප, ජල සහ අනෙකුත් පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් සිදු කළ විදුලිබල උත්පාදනයේ සංයුතිය කුමක්ද? What is their generating composition? ඒ ඒ ප්‍රභවයේ විදුලිබල උත්පාදන පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය සඳහා පිළිතුර ලබා දීමට සති දෙකක කාලයක් අවශ්‍යයි කියා දැනුම් දී තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 1.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, පරිපූරක මුදල - ශීර්ෂය 118 - වැඩසටහන 02, ඉදිරිපත් කිරීම, කෘෂිකර්ම අමාත්‍යතුමා.

ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

## පරිපූරක මුදල: සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සහ සමුපකාර සමිති හරහා 2026 යල කන්නයේ වී මිලදී ගැනීම

குறைநிரப்புத் தொகை: 2026 சிறுபோகத்தில் சிறிய மற்றும் நடுத்தர அளவிலான அரிசி ஆலை உரிமையாளர்கள் மற்றும் கூட்டுறவுச் சங்கங்கள் ஊடாக நெல் கொள்வனவு

SUPPLEMENTARY SUM: PURCHASE OF PADDY THROUGH SMALL AND MEDIUM-SCALE RICE MILLERS AND CO-OPERATIVE SOCIETIES IN YALA SEASON, 2026

[පූ.භා. 11.36]

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන හත්දහස් පන්සියයක් (රු. 7,500,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 118 - | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යවරයා | |
| වැඩසටහන | 02 - | සංවර්ධන වැඩසටහන | |
| | | මූලධන වියදම් | රු. 7,500,000,000 |
| | | මුළු වියදම | රු. 7,500,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, කැබිනට් මණ්ඩලය පසුගිය දිනක රැස් වෙච්ච අවස්ථාවක තීරණයක් ගත්තා, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට භාණ්ඩාගාරය මඟින් ණය මුදලක් ලබා දෙන්න, ගොවීන්ට සාධාරණ වන මුදලට, එහෙම නැත්නම් රජය ප්‍රකාශයට පත් කර තිබෙන මුදලට වී මිලදී ගැනීම සඳහා. සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් විශාල ප්‍රමාණයක් බැංකුවලට ණය වෙලා තිබෙනවා. ඒ වාගේම, බැංකු එක්ක යම් යම් ආරවුල් තිබෙනවා සහ බැංකුවලින් ඒගොල්ලන්ට ණය නොදෙන තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. නමුත්, අපට වී අලෙවි මණ්ඩලය මඟින් පමණක් ගොවි ජනතාව නිෂ්පාදනය කරන වී සාධාරණ මිලට ලබා ගැනීමේ සම්පූර්ණ හැකියාවක් නැහැ. ඒ හැකියාව මීට වඩා වැඩි කිරීමේ වැඩ පිළිවෙළක අපි යෙදිලා ඉන්නවා. ඒක අපට ටික ටික තමයි ඉස්සරහට ගෙනයන්න වෙන්නේ. වී අලෙවි මණ්ඩලය සියයට 14ක තෙතමනය සහිත ප්‍රමිතිගත නාඩු වී කිලෝ එකක් රුපියල් 120කට මිලදී ගන්නවා. සම්බා වී කිලෝවක් රුපියල් 130කට මිලදී ගන්නවා. කීරි සම්බා වී කිලෝවක් රුපියල් 140කට මිලදී ගන්නවා. නමුත්, රට පුරා ගොවි ජනතාවට අවශ්‍ය තරම් වී අලෙවි කිරීමට වී අලෙවි මණ්ඩලයේ වී මිලදී ගැනීමේ වැඩසටහන ශක්තිමත් මදි. එතකොට ගොවි ජනතාව ප්‍රශ්නයකට මුහුණ දෙනවා. ඒක අපි පිළිගන්නවා.

අපට වී මිලදී ගැනීමේ තවත් යන්ත්‍රණ තිබෙනවා. ඒ, රජයට නොවෙයි. ඒ තමයි, සුළු පරිමාණ වී මෝල් හිමියෝ සහ මධ්‍ය පරිමාණ වී මෝල් හිමියෝ. හැබැයි, ඒ අය වී මිලදී ගන්න ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා, ඒගොල්ලන් පසුගිය කාලයේ මුහුණ දුන් විවිධ හේතූන් නිසා. ඒ කාරණය ගොවි ජනතාවට විශාල වශයෙන් බලපානවා. ඒ නිසා අපි සුළු සහ මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් අවස්ථා දෙකකදී අමාත්‍යාංශයට රැස් කරලා ඒ අයත් එක්ක සාකච්ඡා කළා. එහිදී ඒ අයගෙන් ඉල්ලීමක් තිබුණා, රජය ප්‍රකාශ කරලා තිබෙන මිලට ඒ අයට වී මිලදී ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ වෙන්න පුළුවන්; හැබැයි, බැංකුවලින් නොවෙයි, ඒ අයට රජය මැදිහත් වෙලා මූල්‍ය ප්‍රතිපාදනයක් දෙන්න කියලා. ඒ ඉල්ලීම ගැන අපි ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කළා. සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියනුත් එම සාකච්ඡාවට සම්බන්ධ වුණා. ඒ සාකච්ඡාවලින් පසුව අපි තීරණයක් ගත්තා රුපියල් මිලියන 25ක උපරිමයකට යටත්ව සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට මූල්‍ය ප්‍රතිපාදනයක් ලබා දෙන්න. දිසාපතිතුමා සහ ප්‍රාදේශීය ලේකම්තුමන්ලා හරහා තමයි එම වැඩසටහන ක්‍රියාත්මක වෙන්නේ. එම වැඩසටහනට අවශ්‍ය කරන ප්‍රතිපාදන වෙන් කර ගැනීම වෙනුවෙන් තමයි අද මෙම පරිපූරක මුදල සම්මත කර ගැනීමේ අවශ්‍යතාව ඇති වෙලා තිබෙන්නේ. මම හිතනවා ගරු සභාවේ කිසිදු ගරු මන්ත්‍රීවරයෙක් මෙම යෝජනාව සම්බන්ධයෙන් විරුද්ධතාවක් දක්වන එකක් නැහැ කියලා. මොකද, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියලාගේත් ඉල්ලීම වුණේ එයයි. ඒ අයගේ උනන්දුව සහ මත දැක්වීම් පසුගිය දිනවල ඉදිරිපත් කළා. අපේ ගරු විපක්ෂ නායකතුමාත් ස්ථාවර නියෝග 27 (2) යටතේ අහපු ප්‍රශ්නයකදී ඒ සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කළා. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාත් ඒ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කළා. අපි පාර්ලිමේන්තුවේ උදේ කථා කරන ප්‍රශ්න 10 තුළත් මේ සාකච්ඡාව පදනම් කරගෙන අදහස් හුවමාරු වුණා. ඒ සඳහා අපි උත්තර ලබා දුන්නා. මේක අපි පාර්ලිමේන්තුවේ සාකච්ඡා කළ ප්‍රශ්නයක්. එය රටේ තිබෙන ප්‍රශ්නයක්. ඒ සඳහා අවශ්‍ය කරන ප්‍රතිපාදන පාර්ලිමේන්තුවෙන් අනුමත කර ගන්න ඕනෑ.

මහ පරිමාණ වී මෝල් හිමියනුත් අපිත් එක්ක එකඟ වුණා. ඒගොල්ලන් දැන් ඒ වැඩසටහන කරගෙන යනවා. වී අලෙවි මණ්ඩලය වාගේ ප්‍රමිතිගත වී මිලදී ගන්නම් කිව්වා. හැබැයි, ඒගොල්ලන්ගේ ගබඩා තිබෙන තැන්වලට ගොවීන් වී ගෙනැල්ලා දෙන්න ඕනෑ කියලා ප්‍රකාශ කළා. දැන් එම වැඩසටහනත් ක්‍රියාත්මක වනවා. මහා පරිමාණ මෝල් හිමියන් තමන්ගේ වී මිලදී ගන්න ස්ථාන ඉදිරිපිට දැන් බැනර් ප්‍රදර්ශනය කරලා තිබෙනවා, රජයේ සහතික මිලට වී ගන්නවා කියලා. එම වැඩසටහනත් ක්‍රියාත්මක වනවා. ඒ සියල්ල ක්‍රියාත්මක වුණත් ගොවි ජනතාවගේ මේ ප්‍රශ්නයේදී සෑම ගොවියෙකුම සතුටට පත් වන උත්තරයක් අපට තවමත් ලබා දෙන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. ඒකට හේතුව, එක එක කලාපවල ගොවි ජනතාව අක්කරයකින් ලබන අස්වැන්නේ ප්‍රමාණය වෙනස් නිසා. අස්වනු ප්‍රමාණය අඩු වෙන්න, අඩු වෙන්න, අඩු වෙන්න වී කිලෝ එකක් සඳහා යන පිරිවැය වැඩියි.

මහා වාරි සහ මහවැලි කලාපවල අස්වැන්න හොඳ මට්ටමක තිබෙනවා. බොහෝ තැන්වල අස්වැන්න අක්කරයට වී බුසල් 120ට වැඩියි. ඒ අයට කීරි සම්බා වී කිලෝවක් සඳහා රුපියල්

120ක, සම්බා වී කිලෝවක් සඳහා රුපියල් 130ක මිල ප්‍රමාණවත්. මොකද, ඒ අයට ප්‍රමාණවත් අස්වැන්නක් ලැබෙන නිසා. නමුත්, අස්වැන්න අක්කරයට වී බුසල් 80ක් නම්, 70ක් නම්, 60ක් නම් ඒ අයට ඇත්තටම වී කිලෝවකට රුපියල් 120ක මිල මදි. ඒගොල්ලන්ට වියදම ගිහිල්ලා තිබෙනවා. නමුත්, අස්වැන්න අඩු නිසා ඒ මිල ඒගොල්ලන්ට මදි. මේක අපි මුහුණ දීලා තිබෙන ප්‍රශ්නයක්. මේක අපි විසඳා ගන්න ඕනෑ. විසඳා ගන්න තිබෙන එකම උත්තරය අස්වැන්න අඩු භූමිවල අස්වැන්න වැඩි කිරීමම පමණයි. ඒක තමයි උත්තරය. මොකද, පාරිභෝගිකයාගේ පැත්තත් බලනකොට මේක සමබර කරලා ගන්න වෙනවා. සහල් මිල පැත්තත් අපි හිතන්න ඕනෑ. මේ දෙකම සැලකිල්ලට අරගෙන තමයි අපි නාඩු වී කිලෝවකට රුපියල් 120ක්, සම්බා වී කිලෝවකට රුපියල් 130ක් සහ කිරි සම්බා වී කිලෝවකට රුපියල් 140ක් ප්‍රකාශයට පත් කරලා තිබෙන්නේ. කොහොම වුණත්, දැන් යන්ත්‍රණ තුනක් ක්‍රියාත්මක වනවා, රජයේ සහතික මිලට වී ගන්න.

වී අලෙවි මණ්ඩලය විතරක් නොවෙයි, සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියනුත් රජයෙන් දෙන ණය ප්‍රමාණය ගන්නවා නම්, ඒගොල්ලන් අනිවාර්යයෙන්ම බැඳිලා ඉන්නවා, රජයේ සහතික මිලට වී ගන්න. ඒගොල්ලන් ආපහු සල්ලි ගෙවන්න ඕනෑ. සමහර කාලවල ඒගොල්ලෝ හාල් ගෙවන්න එකඟ වෙලා තිබුණා; සමහර කාලවල වීවලින් ගෙවන්න එකඟ වෙලා තිබුණා. මේ වැඩසටහන ක්‍රියාත්මක කරද්දී ඒගොල්ලන් වී අරගෙන, සහල් කරලා, සහල් විකුණලා මුදල් තමයි ආපහු රජයට ලබා දෙන්න ඕනෑ. ඒකට පොලියක් අය කරන්නේ නැහැ. පොලී රහිත ණයක් තමයි ලබා දෙන්නේ. මේ ප්‍රශ්නයට, මේ මොහොතේ උත්තර හොයන්න තිබෙන ක්‍රම තමයි අප මේ කල්පනා කරන්නේ. ඇත්තටම, වී තොග එකවර වෙළෙඳ පොළට එන එක බරපතළ ගැටලුවක්ව තිබෙනවා. මොකද, යල මහ කියලා කන්න දෙකකට වගා කරන කොට එහෙම තමයි අපට වගා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ගොවීන් ළඟ ගබඩා කර ගන්නා වී ප්‍රමාණය බොහෝ දුරට අඩුයි. මොකද, ගොවීන්ට ඒ පහසුකම් නැහැ. ඒ නිසා නිෂ්පාදනය කරන සියල්ල එකවර වෙළෙඳ පොළට ආවාම, ඒ ප්‍රශ්නයේ බරපතළකම කවුරුත් දන්නවා. මිල පහළ යන්න ඒකෙන් බලපෑමක් සිදු වෙනවා. ඒ නිසා ගොවීන් ළඟ යම් ප්‍රමාණයක් වී ගබඩා කර ගැනීම වෙනුවෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කරන්න සාකච්ඡා කරලා, වැඩ පිළිවෙළ හදලා, අය වැයටත් යෝජනා කරලා ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ගොවි සමිතිවලට වී වේළා ගැනීමේ යන්ත්‍ර ලබා දීම වගේ දේවල් ඒකට ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම අස්වැන්න වැඩි කිරීමේ වැඩසටහනක් ද අපි ක්‍රියාත්මක කරනවා. එහි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කර තිබෙන package එකක් තිබෙනවා. අපි පසුගිය මාස් කන්නයේ ආරම්භ කළා වී නිෂ්පාදනයට අදාළව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ සැලැස්ම ක්‍රියාත්මක කරන යාය ජාතික වැඩසටහන, "යාය 500" වැඩසටහන නමින්. අපි බලාපොරොත්තු වෙනවා, මාස් කන්නය වන කොට එය තවත් යාය 500කින් වැඩි කරන්න. එතකොට, දැන් ආරම්භ කර තිබෙන යාය 500 අපි යාය 1,000ක් දක්වා ගෙන යනවා. ඊළඟ කන්නයේ තවත් 500ක් වැඩි කරන්න බලාපොරොත්තු වෙනවා. එහෙම තමයි ඒ වැඩසටහන ක්‍රියාත්මක වෙන්නේ. එතකොට ඒකක වර්ගඵලයකින් ගන්නා -අක්කරයකින් ගන්නා - අස්වනු ප්‍රමාණය වැඩි කර ගන්න අපට පුළුවන්. එහෙම වැඩසටහනක් තමයි කරගෙන යමින් තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, කාලය අවසන්.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
පාර්ලිමේන්තුවේ කවුරුත් මේ කටයුත්තට විරුද්ධ වන එකක් නැහැ. එම නිසා මෙම පරිපූරක මුදල සම්මත කරලා දෙන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Leader of the Opposition. You have 16 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා, කථා කරන්න. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තමයි ලැබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
මට කිව්වේ විනාඩි 16යි කියලා. මගේ කථාවටත් බාධා කළා. ප්‍රශ්නයක් නැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට විනාඩි 15ක් දෙන්න.

[පූ.භා. 11.48]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරියටම, කථාව පටන් ගන්න කොටම නැඟිටලා ගියා. බොහොම හොඳයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 76 වසරක ගොවියාගේ ඛේදවාචකය ගොවියාගේ සෞභාග්‍යයක් බවට පත් කරනවා කිව්වත්, මේ මොහොත වන විට ගොවියාගේ ජන ජීවිතය, ජීවනෝපාය ආර්ථික සංහාරයක් බවට පත් කරන්න මේ රජය

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කටයුතු කර තිබෙනවා. අප යෝජනා කරපු අදහස්වලින් එකක් හෝ ක්‍රියාත්මක කරන්න අද ඔබතුමන්ලා කටයුතු කිරීම පිළිබඳව අපේ ස්තුතිය පුද කරනවා. නමුත් අපි පැහැදිලිව කියන්න කැමැතියි, මේක ප්‍රමාණවත් වන්නේ නැහැ කියලා. ගරු ලාල් කාන්ත ඇමතිතුමා බොහොම පැහැදිලිව කියා තිබෙනවා, රතු නාඩු කිලෝවක් නිෂ්පාදනයට රුපියල් 76ක් යනවා, අක්කරයකට අස්වැන්න කිලෝ 2,315ක් ගන්න පුළුවන් කියලා. සුදු නාඩු කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 87යි. අක්කරයකට ලැබෙන අස්වැන්න කිලෝග්‍රෑම් 2,016යි. සම්බා කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 97යි. අක්කරයකට ලැබෙන අස්වැන්න කිලෝග්‍රෑම් 1,779යි. කීරි සම්බා කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 109යි කියලා එතුමා කියනවා. ඒ වාගේම, අක්කරයකට අස්වැන්න කිලෝග්‍රෑම් 1,589ක් ලබා ගන්න පුළුවන් කියලා කියනවා. මේ දත්ත පිළිබඳව අපේ එකඟතාවක් නැහැ. නමුත් නාඩු කිලෝවකට රුපියල් 120ක් දෙනවා, සම්බා කිලෝවකට රුපියල් 130ක් දෙනවා, කීරි සම්බා කිලෝවකට රුපියල් 140ක් දෙනවා යනුවෙන් එතුමා කියපු දේ හරි කියලා අපි උපකල්පනය කරමු. අපි උදාහරණයක් හැටියට නාඩු ගනිමු. ඇත්තවශයෙන්ම අපේ රටේ ඉල්ලුම ගත්තාම, රතු නාඩුවලට සහ සුදු නාඩුවලට ඉල්ලුම සියයට 76ක් වනවා. අපි උපකල්පනය කරමු, ලාල් කාන්ත මැතිතුමා කියන දේවල් හරි කියලා. ඒ අනුව අපි පොඩ්ඩක් ගණන් හදලා බලමු. එතුමාම කියන ආකාරයට අක්කරයකින් රතු නාඩු කිලෝග්‍රෑම් 2,315ක් එන කොට, කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 76ක් වැය වන කොට අක්කරයක නිෂ්පාදන වියදම රුපියල් 175,940ක් වනවා. මම ඒක නැවත කියන්නම්. රතු නාඩු කිලෝවක් නිෂ්පාදනය කරන්න යන වියදම රුපියල් 76යි. අක්කරයකට ලැබෙන අස්වැන්න කිලෝග්‍රෑම් 2,315යි. මුළු වියදම ගණනය කළාම රුපියල් 175,940ක් වනවා. මේවා, ලාල් කාන්ත මැතිතුමාගේම සංඛ්‍යාලේඛන. එතුමා වී සඳහා ලබා දෙන සහතික මිල වන රුපියල් 120 අක්කරයකට ලැබෙන කිලෝග්‍රෑම් ප්‍රමාණය වන 2,315න් වැඩි කළොත්, ආදායම රුපියල් 277,800යි. එතකොට ලාල් කාන්ත මැතිතුමනි, මාස හයකට ගොවියාට ලැබෙන ලාභය, ඒ කියන්නේ "ආදායම - වියදම = රුපියල් 100,000" යි. ඒ, මාස හයකට හෙවත් කන්නයකට. එතකොට මාසයකට රුපියල් 16,666යි. කොහොමද ලාල් කාන්ත ඇමතිතුමනි, රුපියල් 16,666කින් ගොවියා ජීවත් වෙන්නේ, තමන්ගේ දරු පවුල නඩත්තු කරන්නේ? මේ ගණනය කිරීමේ, මේ සහතික මිල ලබා දීමේ ක්‍රමවේදය පිළිබඳව ඔබතුමන්ලාට අලුතින් හිතන්න සිද්ධ වෙනවා කියන එක මම කියන්න කැමැතියි. ඔබතුමන්ලාගේ මේ සූත්‍රය, ඔබතුමන්ලාගේ දත්ත, ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම දෝෂ සහිතයි.

දැන් බලන්න, ඔබතුමන්ලා ගොවියාට කථා කරන ආකාරය. Artificial ගොවියාලු; කසිප්පු කාරයාලු. ගොවියා රජ කරනවා කියන එක රටේ හැමෝම හැම වෙලාවකම කියන දෙයක්. නමුත් ඔබතුමන්ලාගේම ඇමතිවරයෙක් කියනවා, "නැහැ නැහැ. ඒක හැමෝටම කියපු දෙයක් නොවෙයි. ඒක එක්තරා ප්‍රදේශයක, එක්තරා කුලයකට සම්බන්ධ ගොවීන්ට කියපු දෙයක්" කියලා. ඔබතුමා ඒක අනුමත කරනවාද? කුලවාදය ඔබතුමා අනුමත කරනවාද? කුල පීඩනය තුළ නිර්මාණය වුණු පක්ෂයක්, ජනතා විමුක්ති පෙරමුණ. රෝහණ විජේවීර සහෝදරයාගේ අදහස් ටික අද ඔබතුමන්ලාගේ දර්ශනයෙන් චුත වෙලා යෑම ඉතාම කනගාටුදායක කාරණාවක්.

ඒ වාගේම ඔබතුමන්ලා මිල පාලනයක් ක්‍රියාත්මක කරනවා. පාරිභෝගිකයා ආරක්ෂා කරන්නට ඔබතුමන්ලා පාලන මිලක් නියම කර තිබෙනවා. දැන් කීරි සම්බා කිලෝවකට දීලා තිබෙන පාලන මිල රුපියල් 260යි. වෙළෙඳ පොළේ තත්ත්වය මොකක්ද? රුපියල් 380යි. පාලන මිල රුපියල් 260යි; වෙළෙඳ පොළේ මිල රුපියල් 380යි. හැබැයි, ඒකට අත ගහන්නේ නැහැ. ඒ, කීරි සම්බා ක්‍රියාවලියට මේ රටේ ධන කුවේරයන් සම්බන්ධ නිසායි. මේක තමයි ඇත්ත කථාව.

අපේ රටේ මෑත ඉතිහාසයේ වැඩිම වී අස්වැන්න ලැබුණා කියලා කියන්නේ 2020 වර්ෂයේදී. එම වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 5.1යි. ආපසු 2021 වර්ෂයේ මෙට්‍රික් ටොන් 5.1ක අස්වැන්නක් ලබා තිබෙනවා. අපි දන්නවා, ඊට පසුව කාබනික පොහොර සූත්‍රය තුළ ඒ ගොවිතැන කඩා වැටුණු බව. හැබැයි, 2025 වර්ෂයේ අපි නැවත වරක් එනවා, මෙට්‍රික් ටොන් මිලියන පහේ ඉලක්කයට. අපි ඒ ගැන සත්‍ය වශයෙන්ම සතුටු වෙනවා. එසේ සතුටු වෙන ගමන් මේ අවස්ථාවේදී මම විශේෂයෙන්ම ඔබතුමන්ලාගෙන් දෙයක් අහන්න කැමැතියි. අපේ රටේ සැබෑ සහල් අවශ්‍යතාව මොකක්ද? මෙට්‍රික් ටොන් මිලියන 2.5යි. මේක තමයි අවශ්‍යතාව. හැබැයි, නිෂ්පාදනය? මෙට්‍රික් ටොන් මිලියන 3.2යි. අපි නිකමට කියමු, ඒ මෙට්‍රික් ටොන් 3.2න් යම් ප්‍රමාණයක් අතුරු නිෂ්පාදනවලට, වෙනත් ආහාර නිෂ්පාදනවලට යනවා කියලා. ඇත්තවශයෙන්ම මෙට්‍රික් ටොන් ලක්ෂ පහක අතිරික්තයක් තිබෙනවා, ලාල් කාන්ත මැතිතුමනි. හැබැයි, අතිරික්තයක් තිබියදීත් ඔබතුමන්ලාගේ රජය මේ මොහොත වනවිට සහල් මෙට්‍රික් ටොන් 340,000ක් ආනයනය කර තිබෙනවා.

දැන් මම ඔබතුමාට පොඩ්ඩක් කියන්නද, විරුද්ධ පක්ෂයේ ඉන්නකොට නාමල් කරුණාරත්න මැතිතුමා සහල් ආනයනය ගැන කියපු දේ? ඔන්න අහගන්න.

"රටේ ගොවිතැන කඩා වට්ටලා. රටින් හාල් ගෙනෙනවා. ගෙනෙන එක ඇතුළේ කොමිස් ගහනවා. කොමිස් ගහන්න නම් රටින් ගෙනෙන්න ඕනෑ. රටින් ගෙනෙන්න නම් රටේ හිඟයක් ඇති කරන්න ඕනෑ. හිඟයක් ඇති කරන්න නම් ගොවියාට වරද්දන්න ඕනෑ. දැන් ගොවියාට වරද්දලා මෙයාලා රටින් ගෙනෙනවා. රටින් ගෙනැල්ලා මෙහේ උදන් අනනවා."

කවුරු හරි අභියෝග කරනවා නම්, එතුමා ඒ කළ ප්‍රකාශය ඇතුළත් වීඩියෝ පටය මගේ ළඟ තිබෙනවා. ඕනෑ නම් ඒ වීඩියෝ පටයත් මම හැන්සාඩ්ගත කරන්නම්.

ලාල් කාන්ත ඇමතිතුමනි, ඔබතුමා එතුමාට ඇඟිලි දිගු කරන්න එපා. එකම සහෝදරයෝ නේ. එකම සහෝදර කණ්ඩායම.

දැන් මම කියන්නම්, වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා එදා විපක්ෂයේ ඉන්නකොට කියපු දේ.

"මෙට්‍රික් ටොන් 100,000ක් ගෙනෙනකොට, මෙට්‍රික් ටොන් එකකින් ඩොලර් 100,000ක්. මෙට්‍රික් ටොන් 100,000න් ඩොලර් ලක්ෂ 100ක්. ඩොලර් ලක්ෂ 100ක් කියන්නේ ඩොලර් මිලියන 10ක්. ඩොලර් මිලියන 10ක් කියන්නේ රුපියල් මිලියන 30,000ක්. රුපියල් මිලියන 30,000ක් කියන්නේ කෝටි 300ක්. ඉතින් මෙට්‍රික් ටොන් ලක්ෂ තුනක් ගෙනෙනකොට, කෝටි 900යි. එහෙමයි ගහන්නේ. මේ කුඹුරු කණාටු කරලා, හාල් ගෙනෙන්න වැඩේ හදලා ඒකෙනුත් ගහනවා."

කවුද එහෙම කියන්නේ? ලාල් කාන්ත මැතිතුමා, මෙතැන ජනාධිපතිතුමා නම් නැහැ ඔබතුමාට ඇඟිල්ල දික් කරන්න. එතුමා තමයි එහෙම කියා තිබෙන්නේ. ඕනෑ නම් ඒ වීඩියෝ පටයත් මම හැන්සාඩ්ගත කරන්නම්. මම ඔබතුමාට කියන්නේ මේකයි. කිසිම දවසක සහල් ඇටයක්වත් ආනයනය කරන්නේ නැහැ කියලා ඔබතුමන්ලා කියපු ප්‍රකාශය අද බොරුවක් වෙලා තිබෙනවා. අද ඒ කථාව රැවටිල්ලක් වෙලා තිබෙනවා. සහල් මෙට්‍රික් ටොන් 340,000ක් ඔබතුමන්ලා පිටරටින් ගෙන්වා තිබෙනවා. අපි ගනිමු, පසුගිය මාර්තු මාසයේ ගෙන්වූ මෙට්‍රික් ටොන් 157,000 ගැන.

විශේෂ ආනයන බද්ද විතරක් ගත්තොත්, ඒකෙන් මිලියන 10,000ක - බිලියන 10ක - බදු ආදායමක් ලැබී තිබෙනවා. ඇත්තම කථා කරනවා නම් ඔබතුමන්ලාගේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය තුළ පාරිභෝගිකයෝ ලක්ෂ 220ට සහනයකුත් නැහැ, වී ගොවිතැනේ නියැළී සිටින ගොවි පවුල් ලක්ෂ 21ට කිසිම සහනයකුත් නැහැ. මේක තමයි මහ පොළොවේ යථාර්ථය.

ඒ නිසා මේ අවස්ථාවේදී මම විශේෂයෙන්ම ඔබතුමාට කියන්න කැමැතියි, මෙන්න මේ කාරණාව. ඇත්තවශයෙන්ම අපේ රට තුළ ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් නිර්මාණය කරන්නට ඕනෑ. මම මේ පෙන්වන්නේ අපේ යෝජනා. මේවා අපේ රජයක් තුළ අපි කරන්නට අදහස් කරන දේ. ඇත්තවශයෙන්ම අපේ රටේ සහල් ඉල්ලුම මොකක්ද? රතු නාඩු, සුදු නාඩුවලට රට තුළ සියයට 76ක ඉල්ලුමක් තිබෙනවා. සම්බාවලට සියයට 12ක ඉල්ලුමක් තිබෙනවා. කීරි සම්බාවලට සියයට 12ක ඉල්ලුමක් තිබෙනවා. ඔබතුමා දන්නවා, 1948දී අපේ රටේ සහල් අවශ්‍යතාවෙන් සියයට 36යි සම්පූර්ණ කර ගත්තේ කියලා. 2010 වෙනකොට රටේම සහල් අවශ්‍යතාව සම්පූර්ණ කරගන්නට අපට බැරි වුණා. පැහැදිලි, විධිමත් කෘෂිකාර්මික සැලැස්මක්, වගා රටාවක් නිර්මාණය නොවීම තුළ අපි අද රටක් හැටියට අමාරුවේ වැටී තිබෙනවා.

අපි වී අලෙවි මණ්ඩලය තවදුරටත් ශක්තිමත් කරන්නට ඕනෑ. ඒකේ වී මිලදී ගැනීම - inflow එක - වාගේම, වී අළෙවිය - outflow එක - ගැනත් අවධානය යොමු කරන්නට ඕනෑ. ඔබතුමා හරි. මොකද, මම හැමදේටම දෝෂාරෝපණය කරන්නේ නැහැ. හොඳ පියවරක් ගත්තොත්, ඒකට හොඳ කියනවා. අද අපේ බල කිරීම තුළ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ මෝල් හිමියන්ට ඔබතුමන්ලා ලබා දෙන මේ පොලී රහිත ණය වැඩසටහන හොඳ ආරම්භයක්. ඒක හොඳ දෙයක්. මම හොඳ දේට හොඳයි කියනවා. නමුත් ප්‍රමාණාත්මකව මේකත් මදි. වී අළෙවි මණ්ඩලය සොච්චමක් මිලදී ගන්න නිසා මිල පාලනය සඳහා මීට වැඩිය වැඩි ශක්තියක් ලබා දෙන්නට ඕනෑ. හැබැයි, අසාදු ලේඛනගත - blacklist - කරපු මේ මෝල් හිමියන්ට ඇත්තවශයෙන්ම ඔබතුමන්ලා කරන දේ ගැන ආරම්භයක් හැටියට - අවසානය නොවෙයි - මම ස්තුතිවන්ත වෙනවා. මොකද, මම හොඳ දේට හොඳ කියනවා. අඩුපාඩුකම් තියෙනකොට ඒ අඩුපාඩුකම් පෙන්වලා දෙනවා.

මේ අවස්ථාවේ මම තව පුංචි වේලාවක් ගන්න කැමැතියි, තව කාරණයක් සඳහන් කරන්නට. විශේෂයෙන්ම මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි නිෂ්පාදන පිරිවැය - production cost එක - ගැන. මම පොඩි උදාහරණ දෙකක් විතර ඔබතුමාට දෙන්නම්. අපි ගනිමු, ග්ලයිෆොසේට්. ලීටර් 4ක අවශ්‍යතාවක් තිබෙනවා කියලා අපි හඳුනාගෙන තිබෙනවා. හැබැයි, අමාත්‍යතුමනි, රටට ගෙන්වන මුදල, ඒ යන පිරිවැයට වැඩිය දෙගුණයක් ගොවියා ගෙවනවා, ග්ලයිෆොසේට්වලට. මේ ගැන හොයලා බලන්න. මේවායේ මිල පාලනයක් තියෙන්නට ඕනෑ. මිල පාලනයක් පමණක් නොවෙයි, ගුණාත්මකභාවයේ පාලනයක් තිබෙන්නටත් ඕනෑ. අපි ගනිමු, එළවලු බීජ ආනයනය. ඒවාට ඔබතුමන්ලා දෙනවා, ආනයන බලපත්‍රය - import licence එක - නමුත් මිල තීන්දු කිරීම ගැන කිසිම නියාමනයක් නැහැ, කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා.

ඒ වාගේම මම ඔබතුමාට යෝජනා කරනවා, බොහෝ දෙනෙක් විරුද්ධ වෙන දෙයක් කරන්නට. Updated data system එකක් හදන්න. එතකොට කාටවත් බොරු කරන්නට බැහැ. රටේ වගා රටාවක් හදන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ ඒ ප්‍රදේශවල කෙරෙන වගා රටාව digitize කරන්න. ඒ digitize කිරීම තුළ ඒකාග්‍රතාවක් - integration - ඇති වෙනවා. මම හිතන විධියට, සමහර කෙනෙක් ඒවා කරනවාට විරුද්ධයි. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා කටයුතු කරන්න.

අවසාන කාරණාව මේකයි. මමත්, සම සභාපතිවරයා හැටියට කටයුතු කරන, ඔබතුමන්ලාගේ ඉතාම ප්‍රශස්ත මහජන මන්ත්‍රීවරයකු වන මහාචාර්ය එල්.එම්. අබේවික්‍රම මැතිතුමා සම සභාපතිවරයා හැටියට කටයුතු කරන ශ්‍රී ලංකා දේශගුණය පිළිබඳ පාර්ලිමේන්තු සංසදය - Caucus on Climate Parliament of Sri Lanka - මේ එල් නිනෝ සහ ලා නිනා ප්‍රශ්නය ගැන අවධානය යොමු කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අවසන් කරමු, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු අමාත්‍යතුමනි, භයානකම තත්ත්වය එන්නේ,-

ඇත්ත වශයෙන්ම අපි වාසනාවන්තයි. මේ එල් නිනෝ එන්නට ඉස්සෙල්ලා අපේ යල කන්නයේ වැඩකටයුතු බොහොමයක් අවසන් වුණා. හැබැයි, ජුනි, ජූලි මාසවල ක්‍රියාත්මක වුණු යල කන්නය බරපතළ ප්‍රශ්නයකට ලක් වෙන අවදානමක් තිබෙනවා, සමහර ප්‍රදේශවල. ඒ නිසා එල් නිනෝ සහ ලා නිනා තත්ත්වයන් තුළ සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි කියන ඊළඟ මාස ගණනාව පිළිබඳව පැහැදිලි ජාතික,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අවසන් කරන්න, 12.30 වෙනකොට දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු අත්හිටුවන්න ඕනෑ, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අවසන් කරනවා. මේ, අවසාන කාරණය.

ඉතින් පැහැදිලි ජාතික සැලැස්මක් අවශ්‍යයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කරලා, මේ එල් නිනෝ සහ ලා නිනා ප්‍රශ්නය සම්බන්ධයෙන් ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපනය කරලා මේ රටේ ආහාර සුරක්ෂිතතාවත්, රටේ ජනතාවගේ ආර්ථිකයත් ශක්තිමත් කරන වැඩ පිළිවෙළට යොමු වන්න.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.03]

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම අද කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළව පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා රුපියල් මිලියන 7,500ක් මේ පරිපූරක ඇස්තමේන්තුව හරහා ලබා ගැනීමට සූදානම් වෙලා තිබෙන්නේ, ඔබ අප කවුරුත් දන්නා අපේ රටේ වී වගා කරන ගොවි ජනතාව මැතක සිට මුහුණ දීලා ඉන්න ප්‍රශ්නයට උත්තරයක් විධියට.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ වී ගොවිතැනත් එක්ක ගැට ගැහිලා ඉන්න ගොවි ජනතාව වසර ගණනාවක් තිස්සේ මුහුණ දෙන ප්‍රශ්න ගණනාවක් තිබෙනවා.

ඒ ප්‍රශ්න ටික අපි හොඳින් හඳුනාගෙන තිබෙනවා. ඒ ප්‍රශ්නවලට පියවරෙන් පියවර උත්තර සපයන්නේ කොහොමද කියලා අපි ගෙවුණු මාස 20 ඇතුළේ උදාහරණ සහිතවත් කියලා තිබෙනවා, මේ පාර්ලිමේන්තුවේත් කථා කරලා තිබෙනවා. මිලියන 7,500ක් වෙන් කරගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා කුඩා හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් එක්ක අපේ රටේ වී ටික මිලදී ගැනීම සඳහා, මේ ප්‍රශ්නය යම් ප්‍රමාණයකට නිරාකරණය කර ගැනීම සඳහා මැදිහත්වීමක් තමයි මේ කරලා තිබෙන්නේ.

අපි දන්නවා, 2026 අවුරුද්දට අදාළ අය වැය ඉදිරිපත් කරනකොට වී අලෙවි මණ්ඩලයට වී මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 10,000ක් වෙන් කළ බව. වී අලෙවි මණ්ඩලය පසුගිය 2025-26 යල කන්නයට අදාළව ඒ රුපියල් මිලියන 10,000න්ම වී මිලදී ගත්තා. ඒ වාගේම වී අලෙවි මණ්ඩලයේ සභාපතිතුමා, අපේ ලාල් කාන්ත ඇමතිතුමා සහ නියෝජ්‍ය ඇමතිතුමන්ලා, ජනාධිපතිතුමා එක්ක සාකච්ඡා කරලා වී මිලදී ගැනීම සඳහා අතිරේකව තවත් රුපියල් මිලියන 6,000ක් වෙන් කර ගත්තා. ඊට අමතරව තමයි මේ රුපියල් මිලියන 7,500 වෙන් කරන්නේ, මේ තිබෙන ප්‍රශ්නයට උත්තරයක් විධියට. මේකත් හොඳම සහ සාධාරණම උත්තරය නොවෙයි වෙන්න පුළුවන්. හැබැයි, මේ මොහොතේදී ගොවි ජනතාව මුහුණ දෙන ගැටලුවක් තිබෙනවා. ඒ ගැටලුවට උත්තරයක් විධියට තමයි අපි මේ මිලියන 7,500 වෙන් කර ගන්නේ.

කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියෝ විශාල ප්‍රමාණයක් ණය වෙලා, CRIB එකේ ඉන්නේ කියලා අපි දන්නවා. ඒ වී මෝල් හිමියන්ට ණය ගන්න බැහැ. ඒක පැත්තකින් තියලා තමයි මේ විශේෂ මැදිහත්වීම කරලා තිබෙන්නේ. ඒ ණය ටික ගෙවාගෙන යන ගමන් යම් ධාරිතාවක් - capacity එකක් - තිබෙන මෝල් හිමියන් එක්ක එකතු වෙලා මේ කර්මාන්තය කරගෙන යන්න දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ගොවි ජනතාවට පහසුකම් සපයනවා.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ අස්වැන්නෙන් සියයට 50ක්, 60ක් මේ වෙනකොට නෙළලා ඉවරයි. ඒ වාගේම අනෙකුත් දිස්ත්‍රික්කවල සමහර තැන්වල අස්වැන්න නෙළන්න පටන් අරගෙන තිබෙනවා. මේ වෙනකොට සමහර තැන්වල අස්වැන්න නෙළලා අවසන් කරලාත් තිබෙනවා. වී අලෙවි මණ්ඩලයත් සැලකිය යුතු ප්‍රමාණයකින් වී මිලදී ගැනීමේ යාන්ත්‍රණය ශක්තිමත් කරන වෙලාවක තමයි භාණ්ඩාගාරය මිලියන 7,500ක අතිරේක මූල්‍ය වියදමක් දරලා මේ කටයුත්ත කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට පෙර කථා කළ අපේ විපක්ෂ නායකතුමා කිව්වා, ජාතික ප්‍රතිපත්තියක් ගැන. පසුගිය කාලයේ ආණ්ඩු කළ කට්ටිය ජාතික ප්‍රතිපත්ති හදලා තිබෙන්නේ කොහොමද කියලා අපි දන්නවා. අමාත්‍යාංශ කෑලි කෑලිවලට කඩලා විනාශ කරලා ගොවි ජනතාවගේ ප්‍රශ්න කථා කරන්න තැනත් නැති කරලා තිබුණා. වර්තමාන ආණ්ඩුව ජාතික ප්‍රතිපත්තියක් ගොඩ නැඟීම වෙනුවෙන් තමයි මේ අමාත්‍යාංශ එකට එකතු කරලා, බද්ධ කරලා ගොවි ජනතාවගේ ප්‍රශ්න ටික විසඳන්න පුළුවන් තැනකට කටයුතු කරලා තිබෙන්නේ. ලාල් කාන්ත ඇමතිතුමා ඒකට නිවැරදි නායකත්වය සපයනවා. ඒ වාගේම නියෝජ්‍ය ඇමතිතුමන්ලා ඒ නායකත්වය සපයනවා. ජාතික ප්‍රතිපත්තියක් ගොඩ නැඟීම ඉලක්ක කරගෙන ජාතික අවශ්‍යතාව සම්පූර්ණ කිරීම වෙනුවෙන් අපි ඒ මැදිහත්වීම කරමින් ඉන්නවා.

දැන් මේ අය එනවා, ජාතික ප්‍රතිපත්ති ගැන කථා කරන්න. පසුගිය කාලයේ ආණ්ඩු කරපු, බලයේ හිටපු කට්ටිය මොනවාද මේ කථා කරන්නේ? ඒ හිටපු කාලයේ ජාතික ප්‍රතිපත්ති හදන්න තිබුණා නේ. ඒ කාලයේ ජාතික ප්‍රතිපත්ති හදන්නේ නැතිව දැන් අපට උපදෙස් දෙන්න එනවා. මේ ජාතික ප්‍රතිපත්තිය ගොඩ නඟන්නේ කොහොමද කියලා අපි දන්නවා. මේ වෙනකොට ඒකට ඕනෑ කරන සැලසුම් හදලා, ආරම්භ කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි බලයට ඇවිල්ලා මාස 20යි. එතුමන්ලා අවුරුදු 76ක ඇරියස් දැන් ඉදිරිපත් කරනවා. ඒවාට රෙකෝඩ් දාන්නම්, වීඩියෝ දාන්නම්, අරක කරන්නම්, මෙක කරන්නම් කියනවා.

රටේ හිඟයක් පවතිනකොට සහල් ආනයනය කරන්න ඕනෑ. ඒ අවශ්‍යතාව සම්පූර්ණ කරන්න ඕනෑ. කිරි සම්බාවල හිඟයක් තිබෙනවා. ඒවා අපේ රටට ගෙන්වන්න ඕනෑ. ඒ අඩුපාඩු සපුරන්න ඕනෑ. එහෙම නැතිව හෝටල් කර්මාන්තය නවත්වන එක නොවෙයි, සංචාරක ව්‍යාපාරය නවත්වන එක නොවෙයි කළ යුත්තේ. අපි ප්‍රශ්නය හොඳින් හඳුනාගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ප්‍රශ්නය හඳුනාගෙන අපි මේ වෙනකොට ආණ්ඩුවක් විධියට ප්‍රශ්නයට උත්තර සපයමින් සිටිනවා.

අපේ විපක්ෂ නායකතුමා කිව්වා, රෝහණ විජේවීර සහෝදරයාගේ ප්‍රතිපත්ති නොවෙයිලු, දැන් තිබෙන්නේ. තව දේවල් කථා කරන්න ගියොත්, අපි දන්නා බොහෝ දේවල් තිබෙනවා කියන්න. විජේවීර සහෝදරයා මේ රටට හඳුන්වා දුන් ප්‍රතිපත්ති ගැන, මේ රටේ දුක් විඳින ජනතාව වෙනුවෙන් කථා කරපුවා ගැන ඔබතුමන්ලාට කථා කරන්න අයිතියක් නැහැ. අපි ඒවා ක්‍රියාත්මක කරමින් යනවා. මේ රටේ දුක් විඳින ජනතාවගේ ප්‍රශ්න ටික විසඳන්න තමයි අපි ආණ්ඩුව ගත්තේ. අපි ඒ ප්‍රශ්න විසඳමින් සිටිනවා, ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමින් සිටිනවාය කියන පණිවුඩයත් මේ මොහොතේ ලබා දෙන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.09]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මේ විවාදයට සම්බන්ධ වෙන්න බලාපොරොත්තු වුණේ පරිපූරක ඇස්තමේන්තුව සම්බන්ධයෙන් කථා කරන්නම නොවෙයි, ජාතික වශයෙන් වැදගත් වෙනත් කාරණා දෙකක් ගැන කථා කරන්නයි.

පළමුවෙනි කරුණ හැටියට අද ගරු කථානායකතුමාත්, අගමැතිතුමියත්, විපක්ෂ නායකතුමාත්, සමස්ත පාර්ලිමේන්තුවත් (ආචාර්ය) නන්දා මාලනී මැතිනියගේ අභාවය පිළිබඳව ජාතියක් විධියට ශෝකය ප්‍රකාශ කළා. අපි ආණ්ඩුව විධියට ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ඊයේ සිට දින තුනක ජාතික ශෝක කාලයක් ප්‍රකාශ කරලා තිබෙනවා. විශේෂයෙන්ම, ගරු අගමැතිතුමියගේ කථාවේත්, ගරු ජනාධිපතිතුමා නිකුත් කරපු නිවේදනයේ සාරාංශයේත් මුළු සාරය ගත්තොත්, ඇය ඇත්තටම එක යුගයක ආත්මය. සාමාන්‍යයෙන් කියනවා, the soul of an époque කියලා. එතුමිය යුගයක ආත්මය නියෝජනය කරපු කෙනෙක්. ඒක හැම පැත්තකින්ම පෙනුණු දෙයක්. ඒක එක පැත්තකට පමණක් බර වෙච්ච එකක් නොවෙයි. ගරු අගමැතිතුමිය ප්‍රකාශ කළා වාගේම අපේ රටේ සංගීතය පැත්තෙනුත් විශාල දියුණුවක්, විශාල මහ පෙන්වීමක් කරන්න ඇය සමත් වුණා. 1948න් පස්සේ තමයි අපේ රටේ සංගීතය දියුණු වුණේ. අපේ සංගීතඥයන් හඳුන්වන, "සිංහල සුභාවිත සංගීතය" කියන කලාව තුළත් ඇත්තටම ඇය සදාතනික සලකුණක් තැබුවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කලාකරුවෙක් කියන්නේ හුදු වචනයකට විතරක් සීමා වෙච්ච කෙනෙක් නොවෙයි. ඒ වාගේම හුදු හඬක් විතරක්ම නොවෙයි. මනුෂ්‍යයකු විධියට ගත්තත් ඇය සැලකිය යුතු කෙනෙක්. කලාකරුවෙකුගේ ජීවන යාත්‍රාව තුළින් ජනතාවට විශාල බලපෑමක් කරන්නේ, ආදර්ශයක් වෙන්නේ කොහොමද කියන කාරණය ඇය තුළින් අපට පැහැදිලි වෙනවා. අපට AI voice එකකට වඩා නන්දා මාලනී මහත්මිය වැදගත් වෙන්නේ ඇයි? ඇය හඬක් පමණක් නොවෙයි, සහමුලින්ම ජනතාවට විශාල ලෙස සදාචාරාත්මක වශයෙන් බලපෑමක් ඇති කරපු කෙනෙක්. ඒ පැත්තෙනුත් අපට ඇගයීමක් තිබෙනවා. ඒ වාගේම එතුමියගේ සංගීත ක්ෂේත්‍රය විවිධ පැතිවලට, හැම පැත්තටම විහිදුණා. උදාහරණයක් ගත්තොත්, ළමයින් ගැන වාගේම හැම දෙයක් ගැනම. එතුමිය ඉතා විශිෂ්ට CD එකක් කළා. විශේෂයෙන්ම අපේ රටේ සිටින ඉතාම වැදගත් කවියන්ගේ කවි එකතු කරගෙන ඇය "කලා කිඳුරියකගේ විලාපය" කියලා නිර්මාණයක් කළා. ඒ නිර්මාණය ගත්තොත්, ඒක ඇත්තටම ඉතා විශේෂ දෙයක්. මම හිතන විධියට දස දහස් ගුණයක් මිනිස්සු ඒ කවිවලින් ඉගෙන ගත්තා. කවියාගේ අදහස් සංගීතය එක්ක මුසු කරලා එතුමියගේ රන් ස්වරණයෙන් ගායනා කළාට පස්සේ ඒ නිර්මාණ ඉතා විශාල වශයෙන් ජනගත වුණා. ඇය කිසිම දෙයකට යට වෙන්නේ නැතිව ගැහැනියක විධියට පෙන්වපු මහා දැවැන්ත පෞරුෂයක් එහි තිබෙනවා කියලා මම හිතනවා. අද එතුමිය මේ විධියට අගය කළාට, මීට අවුරුදු 40කට, 50කට, 60කට කලින් මේ ඇගයීම එලෙසම තිබුණා කියලා මම හිතන්නේ නැහැ.

එතුමිය ගැහැනියක විධියට, අම්මා කෙනෙකු විධියට පෙන්වපු මහා දැවැන්ත පෞරුෂයක් තිබුණා. ඒ ගැනත් මේ ගරු සභාවේ දී කරුණු මතු කරන්න ඕනෑ කියලා මම හිතනවා. එතුමිය ජන අරගළයේ "ජන රාවය" වෙන්නේ කොහොමද? එතුමියගේ "සත්‍යයේ ගීතය" ගත්තත්, "හේමන්තය" ගත්තත් එවැනි කලා නිර්මාණ තුළින් සමාජය අවදි කළා. ඊට පසුව තමයි "පවන" කලා නිර්මාණය ආවේ. ඒ හැම දෙයකම ලොකු සමාජයීය පණිවුඩයක් තිබෙනවා. ඊට ගොඩක් කලින් ඉඳලා "උඩඟු ලියන් ගොතා බඳින" වාගේ ගීත අසද්දී ඇත්තටම අපේ පරම්පරාවට ඇය මාලිමාවක්ය කියලා මට හිතෙනවා. අපි ජනතා විමුක්ති පෙරමුණ හොයා ගෙන එන්න කලින් අපට සමාජ විමුක්තිය, සමාජ සාධාරණත්වය සහ යහපත මොකක්ද කියලා කියා දුන්නේ එතුමියයි. "සිහල ගිනි දණ්ඩේ දමිළ වෙඩි උණ්ඩේ දාගෙන, ගෝත්‍රවාදී ඉලක්ක බල බල, සිහලුනේ යමව් යාපා පටුනට - දමිළනි වරෙව් රුහුණට" කියලා එදා එතුමිය තමයි කිව්වේ. මේ ජාතිවාදී තැන් කොහේද තිබෙන්නේ කියලා සිංහල, දෙමළ ඔක්කෝම එකතු වෙලා හොයන්න ඕනෑ. ඊට පස්සේ එතුමිය ගැයූ "තල් කොළයයි, පොල් කොළයයි එකට වැටුණු දා" වැනි නිර්මාණ හරහා ඒ සහජීවනය මතු කළා. මම හිතන විධියට, ඒක ප්‍රවීණ රචක ජයවඩු විතානයන්ගේ රචනාවක්. මම කියන්නේ අපි ජවිපෙ වැනි සමාජ සාධාරණත්වය වෙනුවෙන් සටන් කරන දේශපාලන ව්‍යාපාරවලට එකතු වෙන්නත් කලින් අපට අපේ අම්මලා ගෙනැල්ලා දුන්න පොත් පත්වලින් අපි යම්කිසි සමාජ විමුක්තියක්, සාධාරණත්වයක් ගැන කල්පනා කරමින් හිටපු වෙලාවක එතුමියගේ "සත්‍යයේ ගීතය" වැනි නිර්මාණ අපේ හිත්වලට ඇතුළු වුණා. ඒ වෙනකොට අපි කුඩා ශිෂ්‍යයන් වෙන්න පුළුවන්. නමුත්, අපි දැක්ක දේ තමයි, අපේ මුළු පරම්පරාවටම සමාජ දේශපාලන විමුක්තියේ - liberation politicsවල - ආත්මය දුන්නේ එතුමිය තමයි කියන එක. ඒ liberation politics කියන එක පක්ෂයක් එක්කම තිබෙන දෙයක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමිය විසින් පාදපු උල්පත් ප්‍රමාණයේ තිබෙන්නේ සංගීතය පමණක් නොවෙයි. එතුමිය විසින් පාදපු මහා උල්පත් ප්‍රමාණය අතිවිශාලයි. මම ඒකයි කිව්වේ, එතුමිය "යුගයක රාවය" කියලා.

එතුමියට සම කරන්න පුළුවන්, එවැනි ගායකයන් විශාල ප්‍රමාණයක් ලෝකයේ නැහැ. අපි ගනිමු, ඇමෙරිකාවේ Bob Dylan වාගේ කෙනෙක්. Civil rights movement එක ඇතුළේ ඒ හඬ තිබෙනවා. එතැන art එක තිබෙනවා. ඒ, art ඔක්කෝම ආයෙත් වරක් මිනිස්සුන්ගේ සමාජ විමුක්තිය සඳහා ඉතාම මනරම්ව එකතු කරපු කෙනෙක්. Bob Dylan ගත්තොත්, යුගයක රාවය නියෝජනය වනවා; යුගයක ආත්මය, හැම දෙයක්ම එතැන තිබෙනවා. ඒ වාගේම ගන්න පුළුවන්, Miriam Makeba - Mama Africa - වාගේ අය. මට එවැනි ගොඩක් දේවල් කථා කරන්න වෙලාව නැහැ. මම හිතනවා, ඒ අනුව අපට අහිමි වන්නේ දැවැන්ත සංගීතඥයෙක් විතරක් නොවෙයි, අපේ යුගයේ ආත්මය වාගේ අපේ හඬ බවට පත් වෙච්ච විශිෂ්ට සංගීතඥයෙක් කියලා. ඒ වාගේම අපි සාධාරණ දෙයක් කරපු මිනිස්සු, අපි සමාජයට වැරදි නොකරපු මිනිස්සු කියලා ජීවිතයේ අන්තිම මොහොතේදී හිත හදාගන්න පුළුවන් ජීවිතයක් අපි ගත කරමින් ඉන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපට අම්මා තාත්තාගෙන් පස්සේ මේ පක්ෂය මුණගැහෙනතුරුත්, ඊට පස්සේ වුණත්, ඒකට අදාළ පාර හොඳින්ම පෙන්වපු, එතුමියගේ ගීත, සුනිල් ආරියරත්න මැතිතුමාගේ රචනා ආදී සියල්ලටම ගරු කරන්න අපි මේක අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම මම කියන්න ඕනෑ, රඹුකන සිද්ධාර්ථ ස්වාමීන් වහන්සේ ගැනත්. ඒත් ඉතාම විශිෂ්ට සංගීතඥයෙක්. අද උන්වහන්සේගේ අවසන් කටයුතු සිදු කෙරෙනවා. උන්වහන්සේත් අතිවිශිෂ්ට ගීත රාශියක් රචනා කරපු යතිවරයාණන් වහන්සේනමක්. උන්වහන්සේ සිල් සුවඳයි, මිනිස් සුවඳයි ඔක්කෝම කැටි කරලා ඉතාම හොඳින් ඒ ගීත රචනාකොට තිබෙනවා. මම හිතනවා, අඩු ගණනේ ඒවා තව අවුරුදු සියයක්වත් ලංකාවේ සදාතනිකව, යුග යුග ගණනාවක් තිබෙයි කියලා. දැන් අමරදේව ශූරීන් නැති වුණාට, ඒ ගීත පවතිනවා නේ. මේ කවුරුත් එහෙමයි. එහෙම තමයි වෙන්නේ. ඒක තමයි මට විශේෂයෙන්ම කියන්න ඕනෑකම තිබුණේ.

මම තවත් වෙලාව ගන්න එක සාධාරණ නැති නිසා මගේ කථාව අවසන් කරනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
විනාඩි කීයද මට ලැබෙන්නේ?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට විනාඩි 4යි ලැබෙන්නේ. විනාඩි දහසයහමාරක් ගත්තා, ගරු විපක්ෂ නායකතුමා.

[பி.ப. 12.17]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த நாட்டின் புகழ்பெற்ற சிங்களப் பாடகியான காலஞ்சென்ற நந்தா மாலினி எமது யுகத்தின் மிகச் சிறந்த பாடகி மாத்திரமல்ல, தன்னுடைய திறமையினால் அரசியல் பழிவாங்கல்களுக்கு மத்தியிலும் நிலைத்து நின்ற ஒருவர். அவருடைய மறைவையிட்டு எங்களுடைய அனுதாபங் களையும் இந்தச் சபையில் நாம் பகிர்ந்துகொள்கிறோம்.

விவசாயிகளிடமிருந்து உத்தரவாத விலைக்கு நெல்லைக் கொள்வனவு செய்வதற்கான அரசாங்கத்தின் நிதி ஒதுக்கீட்டுக்கு, மேலதிகமாக 7,500 மில்லியன் ரூபாயை வழங்குகின்ற இந்தச் செயற்பாட்டை நாங்கள் பாராட்டுகின்ற அதேவேளை, இந்த நெல் கொள்வனவு சம்பந்தமான விவகாரத்திலே இருக்கின்ற பல்வேறு பிரச்சினைகளுக்கு மத்தியில், சிறிய மற்றும் நடுத்தர அரிசி ஆலை உரிமையாளர்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகளுக்கும் மட்டுப்படுத்தப்பட்ட ஒரு தீர்வாக இந்த முயற்சியை அரசாங்கம் செய்திருப்பது வரவேற்கத்தக்கதாகும். குறிப்பாக, ஏற்கனவே சித்தாண்டி, கரடியனாறு, புலிபாஞ்சான்கல், வாழைச்சேனை, கள்ளியங்காடு போன்ற இடங்களில் நெல் களஞ்சியப் படுத்துவதற்கான இடங்கள் தாராளமாக இருப்பதை நாங்கள் இங்கு சுட்டிக்காட்ட வேண்டும். இருந்தபோதிலும்கூட, கிழக்கு மாகாணத்தில் இருக்கின்ற பல களஞ்சியசாலைகள் சம்பந்தமான சரியான விபரங்கள் அறியப்படாமையால் அங்கு களஞ்சியப்படுத்தலிலும் சில பிரச்சினைகள் இருப்பதாக அறிகிறேன்.

அண்மையில் நான் பொத்தானைக்குப் போயிருந்தபோது, அங்குள்ள ரிதீதென்ன என்னும் பிரதேசத்தில் வாகனேரி குளத்தை அண்மித்த ஒரு பகுதியில் நெல் கொள்வனவு தாராளமாக நடந்துகொண்டிருந்தது. தனியார் கம்பனிகளின் உரிமையாளர்கள் லொறிகளைக் கொண்டுவந்து நெல்லை ஏற்றிக்கொண்டு இருந்தார்கள். அங்குள்ள விவசாயிகளிடத்தில் கேட்டபோது, ஒரு கிலோகிராம் நெல்லை 100 ரூபாய்க்கு உட்பட்ட விலைக்கே தம்மிடமிருந்து கொள்வனவு செய்யும் நிலை இருப்பதாகக் கூறினார்கள். ஆகவே, இந்த ஒதுக்கீட்டின் மூலம் முழுமையாக இந்தப் பிரச்சினைக்கு நிரந்தரத் தீர்வு கிடைக்குமா என்பது சந்தேகம்தான். ஏனென்றால், எவ்வளவுதான் அரச தலையீடு இருந்தாலும் மொத்த நெல் உற்பத்தியில் மூன்று அல்லது ஐந்து சதவீதத்தையே அதனால் கொள்வனவு செய்ய முடியும். இருந்தாலும், இங்கு அமைச்சர் அவர்கள் ஏற்கனவே சொன்னதுபோல, நெல் உற்பத்தி குறைந்த பிரதேசங்களில் உற்பத்தியை அதிகரிப்பதற்கான நவீன முறைகளையும் அதற்கேற்ற வசதிகளையும் ஏற்பாடு செய்வதுதான் பிரதானமானது என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகிறேன்.

මම මෙතැනදී පොඩි කාරණාවක් කියන්න කැමැතියි. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හෙද සහායකයන්ගේ නිල ඇඳුම පිළිබඳව මේ සතිය පුරාම මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක්ම ප්‍රශ්න ඇහුවාම, ගරු ඇමතිතුමා සන්සුන්ව එම ප්‍රශ්නයට ඇහුම්කන් දුන්නා. ඒකට පිළියමක් යොදන්න උත්සාහ කරනවා කිව්වාට, ඊයේ කථා කරද්දී එතුමා පොඩ්ඩක් කලබල වුණා වාගේ අපට පෙනුණා. මොකද, අකුණු සැර වදිනකොට යකඩ කැල්ලක් එළියට දමනවා වාගේ හැම විටම විපක්ෂයට දොස් පවරන්න එතුමා උත්සාහ කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

විශේෂයෙන්ම දොස්තර නිහාල් අබේසිංහ මන්ත්‍රීතුමා වැනි කෙනෙක් සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති හැටියට ඉන්නවා. එතුමාට පුළුවන්, මේ පිළිබඳව සාකච්ඡාවක් ආරම්භ කරන්න. මේ ප්‍රශ්නය පිළිබඳව, විශේෂයෙන්ම මුස්ලිම් කාන්තාවන්ට තමන්ගේ ආගමික සිරිත් විරිත්වලට අනුකූලව, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන අවශ්‍යතාවලට අවහිර වන්නේ නැති ආකාරයට සෞඛ්‍ය අමාත්‍යාංශයේ තිබෙන නිල ඇඳුමේ යම් වෙනස්කමක් කිරීම සඳහා එතුමාට මැදිහත් වන්න පුළුවන් කියලා අපි හිතනවා. එතුමා ඒ සඳහා මැදිහත් වෙයි කියන බලාපොරොත්තුවෙන් මා නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.22]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පළමුවෙන්ම නන්දා මාලනී මහත්මියගේ අභාවය වෙනුවෙන් අපේ කම්පනය, ශෝකය ප්‍රකාශ කරනවා. අපේ ළමා කාලයේ, අපේ තරුණ අවධියේ, අපේ විශ්වවිද්‍යාල සටන් බිම්වල ඇය වීරවරියක් වෙලා හිටියා. මහාචාර්ය සුනිල් ආරියරත්න මැතිතුමා මගේ ගුරුවරයෙක්. එම නිසා ඒ කාලයේ අපි ඉතාම ළඟින් එතුමන්ලා ඇසුරු කළා. මේ වෙලාවේ ඒ කාරණයත් සිහිපත් කරමින් මගේ කථාව ආරම්භ කරනවා.

විශේෂයෙන්ම මේ වෙලාවේ මෙතැන සාකච්ඡා කරපු වී මිලදී ගැනීමට අදාළ කාරණා අතරින් කිහිපයක් නිවැරදි කරන්නත් ඕනෑකම තිබෙනවා. විපක්ෂ නායකතුමා මතු කළා, මේ වසර තුළ සහල් මෙට්‍රික් ටොන් තුන්ලක්ෂ ගාණක් ගෙනැත් තිබෙනවා කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ රජය බලයට ආවාට පස්සේ.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ඔව්, බලයට ආවාට පස්සේ. ඒක හරි. අපි මේ වසර තුළ කීරි සම්බාවලට ආදේශකයක් විධියට යම් කිසි සහල් ප්‍රමාණයක් ගෙනාවා. අපි මේ වනකොට ඒ කටයුත්ත කළමනාකරණය කරමින් ඉන්නවා. අපි මේ වනකොට කීරි සම්බාවල අස්වැන්න වැඩි කරගෙන තිබෙනවා. ඒක එකක්.

ඊළඟට මතු කරන්න ඕනෑ වීවල නිෂ්පාදන පිරිවැය ගණන් බැලීම කියන කාරණය. විපක්ෂ නායකතුමා මේ කාරණය මීට කලිනුත් මතක් කළා. මමත් මීට කලින් මේ කාරණය මතක් කරලා තිබෙනවා. පොහොර ආනයනය තහනම් කරපු කාලයේ වී නිෂ්පාදනය සියයට 35කින් අඩු වුණා කිව්වා. ඒක ඇත්ත, සියයට 35කින් අඩු වුණා. ඇත්තටම ඊටත් වඩා අඩු වෙලා තිබෙනවා, හරියට ගණන් බැලුවොත්. උදාහරණයකට ගත්තොත්, පොහොර ආනයනය තහනම් කළාට පස්සේ 2022 අවුරුද්දේ අපේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 1,654,798යි. අපි සාමාන්‍යයෙන් 2020 -2021 කාලයේ වී මෙට්‍රික් ටොන් ලක්ෂ 51 ඉක්මවා අරගෙන තිබෙනවා. 2025දීත් අපි වී මෙට්‍රික් ටොන් ලක්ෂ 50 ඉක්මවා අරගෙන තිබෙනවා. අනෙක් හැම අවුරුද්දකම අපි මෙට්‍රික් ටොන් ලක්ෂ 45 ඉක්ම වූ වී නිෂ්පාදනයක් අරගෙන තිබෙනවා. එහෙම නම් මෙතැනදී අපි ලක්ෂ 45 කියන එක ගත්තොත්, ඒ ප්‍රමාණය ලක්ෂ 16ට අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, තුන්ගුණයකට ආසන්න ප්‍රමාණයකින් නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා.

ඊළඟට හෙක්ටෙයාරයකින් ගන්න වී ප්‍රමාණය ගත්තොත්, 2022දී - පොහොර තහනම් කළ පසු - හෙක්ටෙයාරයක වී නිෂ්පාදනයේ average එක කිලෝග්‍රෑම් 1,300යි. ඊට කලින් හෙක්ටෙයාරයකින් කිලෝග්‍රෑම් 4,000 ඉක්මවා අරගෙන තිබෙනවා. 2023 අවුරුද්දේ ඉඳන් ටිකක් පහළට එනකොට මේ ප්‍රමාණය කිලෝග්‍රෑම් 3,800 වාගේ මට්ටම්වලට අඩු වුණා. නමුත්, දැන් නැවත අර මට්ටමට - කිලෝග්‍රෑම් 4,000න් එහා මට්ටමට - ඇවිල්ලා තිබෙනවා. එහෙම නම් හෙක්ටෙයාරයකින් ගන්න අස්වැන්න කිලෝග්‍රෑම් 1,300 නම්, රටේම මුළු අස්වැන්න ලෙස මෙට්‍රික් ටොන් ලක්ෂ 45න් එහා ගත්ත එක ලක්ෂ 16කට අඩු වෙලා නම්, ඒකත් එක්ක නිෂ්පාදන පිරිවැය ගණන් හැදුවාට පස්සේ වී කිලෝග්‍රෑම් එකේ නිෂ්පාදන පිරිවැය රුපියල් 150 ඉක්මවනවා. දැන් phone එක අරගෙන calculator එකේ ගහලා ගණන් හදලා බලන්න.

සාමාන්‍යයෙන් නාඩු වී අක්කරයක නිෂ්පාදන වියදම රුපියල් 175,000යි. නමුත්, එදා නිෂ්පාදන වියදම රුපියල් 175,000 නොවෙයි, රුපියල් ලක්ෂ 2කට ආසන්න ප්‍රමාණයක්. එතකොට ගොවියා රුපියල් ලක්ෂ 2කට වැඩි ප්‍රමාණයක් වියදම් කරනවා. නමුත්, ගොවියා අස්වැන්න ගන්නේ හෙක්ටෙයාරයකින් කිලෝග්‍රෑම් 1,300යි. ඒකත් එක්ක තමයි ඔය රුපියල් 150 කථාව ආවේ.

ඒ වෙලාවේ ප්‍රධාන වශයෙන් අපේ සටන් පාඨ දෙකක් තිබුණා. ඒ, "පොහොර තහනම ඉවත් කරන්න" සහ "ගොවියාට මේ කරපු අපරාධයට වන්දි ගෙවන්න" කියන සටන් පාඨ. එහෙම නැතිව නිෂ්පාදන වියදමට සරිලන විධියට වීවලට මිලක් අපි ඉල්ලුවේ නැහැ. කොතැනකවත් එහෙම එකක් ඉල්ලුවේ නැහැ. ප්‍රධාන වශයෙන් අපේ සටන් පාඨ දෙකක් තිබුණා. ගොවියාට කළා මහ අපරාධයක්, ඒ අපරාධයට වන්දි ගෙවන්න, පොහොර තහනම ඉවත් කරන්න කියලා අපි කිව්වා. වී කිලෝග්‍රෑම් එකේ නිෂ්පාදන වියදම රුපියල් 150 ඉක්මවා තිබෙනවා කියන එක තමයි අපි එදා කිව්වේ. එහෙම නම් ඒ තත්ත්වයත් එක්ක අපි වී අලෙවි මණ්ඩලය භාර ගන්නකොට තිබුණු තත්ත්වය පිළිබඳව අපි මෙතැනදී සාකච්ඡා කරලා තිබෙනවා.

අපි බලයට එනකොට වී කිලෝවක් සඳහා රුපියල් 105ක් තමයි ආණ්ඩුව නියම කරලා තිබුණේ. හැබැයි, ගබඩා වහලා තිබුණේ. ඒ නිසා වී මිලදී ගත්තේ නැහැ. ඒ තත්ත්වයත් එක්ක අපි වී කිලෝවක් සඳහා රුපියල් 120, රුපියල් 130 සහ රුපියල් 140 වාගේ මිලක් ගොවියාට ලබා දුන්නා. ගබඩාත් විවෘත කළා. ප්‍රශ්නයක් ආවේ නැහැ. කන්න තුනක් පහු වුණා. මේ කන්නයේ තමයි ගැටලුවක් ආවේ. මේ ගැටලුවත් ඇති වෙන්නේ නැහැ, මැද පෙරදිග යුද්ධය ආවේ නැත්නම්. මේ වෙලාවේදීත් අපි ඒ වෙනුවෙන් විශේෂ මැදිහත් වීමක් කරලා තිබෙනවා. වී ගබඩා ටික විවෘත කරලා තිබෙනවා. රජයේ ගබඩාවලට වී ගන්නවා. ඔඩපණ ණය විධියට රුපියල් මිලියන 10,000ක් වෙන් කළා, සියයට 4 පොලියට ණය අරගෙන මෝල් හිමියන්ට වී මිලදී ගන්න. එතැනින් එහාට තවත් පියවරක් ඉදිරියට තබා රුපියල් ලක්ෂ 75,000ක් - රුපියල් මිලියන 7,500ක් - දැන් වෙන් කරලා තිබෙනවා. දිසාපතිවරු හරහා මෝල් හිමියන්ට, සමුපකාරවලට කිසිදු පොලියකින් තොරව ඒ මුදල් ලබා ගන්න පුළුවන්. මාස අටකින් තමයි ඒ මුදල ගෙවන්න තිබෙන්නේ. අන්න ඒ මුදල් පාවිච්චි කරලා මෝල් හිමියන්ට වාගේම වී මිලදී ගන්න අයට වී මිල දී ගන්න පුළුවන්. ඒක ගොවි ජනතාවට ලොකු සහනයක්. රජය නියම කරපු මිලක් තිබෙනවා. අන්න ඒ මිලට රජයේ මුදල් පාවිච්චි කරලා වී මිලදී ගන්න හැම කෙනෙක්ම කටයුතු කරන්න ඕනෑ. ඔවුන් වී මිලදී ගන්න බැඳිලා ඉන්නවා. ඒගොල්ලන් එතැන බැනර් එකක් දාන්න ඕනෑ. එතැනට ගෙනැත් දෙන වී අදාළ මිලට මිලදී ගන්න ඕනෑ.

අපි ගොවි ජනතාවගෙනුත් මේ වෙලාවේදී ඉල්ලීමක් කරනවා. විශාල මුදල් ප්‍රමාණයක් මේ වෙලාවේ රජය වෙන් කරලා තිබෙනවා. ඒක නිසා ඔබේ වී රජයේ ගබඩාවටම ගිහින් දෙන්න ඕනෑ කියලා නියමයක් නැහැ. ඔබේ වී ඔබට ළඟම පෞද්ගලික අංශයටත් දෙන්න පුළුවන්කම තිබෙනවා. අන්න ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගන්න කියන කාරණය අපි මේ වෙලාවේ ගොවි ජනතාවටත් මතක් කරනවා. ඉදිරි දවස් කිහිපය ඇතුළත දිසාපතිවරු හරහා මෝල් හිමියන්ට, සමුපකාරවලට, වී මිලදී ගන්නා අයට ඒ මුදල් ලබා ගන්න පුළුවන් වෙයි. මීට කලින් මෙවැනි තීන්දුවක් අරගෙන නැහැ. ගොවියා ආරක්ෂා කර ගැනීම සඳහා අපි ගත්ත තීන්දුවක්, මේක. ඔන්න ඔය තත්ත්වය තුළ මේ වනවිට වී අස්වැන්නත් වැඩි කරලා තිබෙනවා.

ඇත්තටම කීරි සම්බා ගත්තොත්, "යාය" ජාතික වැඩසටහන යටතේ පොළොන්නරුවේ ගොවියා ඔප්පු කරලා පෙන්වා තිබෙනවා, විශාල අස්වැන්නක් ගන්න පුළුවන් කියලා. ඔවුන් ලොකු අස්වැන්නක් - කිලෝග්‍රෑම් 11,000 පැනපු අස්වැන්නක් - අරගෙන තිබෙනවා. දෙහිඅත්තකණ්ඩියේත් එහෙමයි. වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. දෙහිඅත්තකණ්ඩියේත් ඒ ප්‍රමාණය ගත්තා. සාමාන්‍යයෙන් අඩුම අස්වැන්නක් ලැබෙන්නේ කීරි සම්බාවලින්. රතු නාඩුවලින් තමයි වැඩිම අස්වැන්නක් ලැබෙන්නේ. ඊළඟට, සුදු නාඩු සහ සම්බා. අඩුම අස්වැන්නක් ලැබෙන්නේ කීරි සම්බාවලින්. මේ තත්ත්වය තුළ අපි තාක්ෂණිකව ගොවියා ඉදිරියට මෙහෙයවමින් ඉන්නවා; අස්වැන්න වැඩි කරගෙන තිබෙනවා. ඒ තත්ත්වයත් එක්ක අපි නිකම් අඳුරේ අතපත ගාමින් ඉන්නවා නොවෙයි. අපි ඉලක්කසහගතව, වැඩ පිළිවෙළක් සහිතව, විද්‍යානුකූලව කෘෂි කර්මාන්තය ඉදිරියට අරගෙන යනවා. ඒ තුළ වෙළෙඳ පොළ

[ගරු නාමල් කරුණාරත්න මහතා]

ප්‍රශ්නය අනිවාර්යයෙන්ම නිර්මාණය වෙනවා. ඒ වෙළෙඳ පොළ ප්‍රශ්නයත් අපි ක්‍රමානුකූලව විසඳනවා. ඒ සඳහා අගය එකතු කරන්න ඕනෑකම තිබෙනවා. ඔන්න ඔය තත්ත්වයත් එක්ක අපි ගොවි ජනතාවට මේ වෙලාවේදී විශේෂයෙන්ම මතක් කර සිටිනවා, ඔබේ වී රුපියල් 90 ගණන්වලට, 100ට විකුණන්න එපා, ප්‍රමිතිගත වී විකිණීම සඳහා ඔබට ස්ථාන නිර්මාණය වෙනවා, අන්න එයින් උපරිම ප්‍රයෝජනය ගන්න කියලා. ඒ ඉල්ලීම ගොවි ජනතාව වෙත ඉදිරිපත් කරමින්, මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒ අනුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 යථා පරිදි සම්මත වූ බව ප්‍රකාශ කරමි.

දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
සභාව කල් තැබීම, ගරු උපාලි පන්නිලගේ ඇමතිතුමා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු අජිත් අගලකඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

## රටේ ඇතැම් ප්‍රදේශවල පවතින නියඟ තත්ත්වය
## நாட்டின் சில பிரதேசங்களில் நிலவும் வரட்சி நிலைமை
## PREVAILING DROUGHT SITUATION IN CERTAIN AREAS OF THE COUNTRY

[අ.භා. 1.00]

**ගරු අජිත් අගලකඩ මහතා**
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පැසිෆික් සාගර කලාපයේ උණුසුම ඉහළ යාමත් සමඟ ඇති වූ දේශගුණ විපර්යාසයේ බලපෑම ශ්‍රී ලංකාවට මෙන්ම ලෝකයේ බොහෝ රටවලට බලපා ඇති අතර එම හේතුවෙන් අප රටේ බොහෝ ප්‍රදේශ දැඩි නියඟයකට ලක්වීමේ අවදානමක් ඇත.
>
> මෙම තත්ත්වය පිළිබඳව ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අනෙකුත් රටවල් සහ ලෝක කාලගුණ විද්‍යා සංවිධානය -WMO- සමඟ දත්ත සහ තොරතුරු ලබා ගනිමින් අප රටට ඇති විය හැකි බලපෑම නිවැරදිව පුරෝකථනය කරමින්, අවදානම සඳහා පෙර සූදානම ඇති කර ගැනීම සඳහා තාක්ෂණික සහාය ලබා දෙමින් පවතී. විශේෂයෙන්ම මෙහි දරුණු බලපෑමක් ඇති විය හැකි බවට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අනතුරු ඇඟවීම් සිදු කර ඇති අතර ඔවුන්ගේ තාක්ෂණික සහාය මත පදනම්ව රාජ්‍ය යන්ත්‍රණය සැලසුම් සකස් කරමින් සහ ක්‍රියාත්මක කරමින් පවතී.
>
> මෙහි බලපෑම හේතුවෙන් දැනටමත් අම්පාර, මොනරාගල, පොළොන්නරුව ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවක දරුණු නියඟයක් ඇති වෙමින් තිබේ. ඒ හේතුවෙන් උග්‍ර පානීය ජල හිඟයක් නිර්මාණය වෙමින් පවතින අතර වගාවන්ට ද දැවැන්ත හානියක් සිදුවීමේ අවදානමක් ද තිබේ. එමෙන්ම, යාල ඇතුළු අභයභූමි ආශ්‍රිතව වනසතුන්ගේ පානීය ජල අවශ්‍යතාව ද අතිශය සැලකිල්ලෙන් බැලිය යුතු තත්ත්වයකට පත්ව ඇත.
>
> මෙම අර්බුදයට පිළියම් ලෙස ඉදිරි මාස් කන්නය ඉක්මන් කිරීම ඇතුළු පියවරයන් කෙරෙහි රජය දැනටමත් අවධානය යොමු කරමින් කටයුතු කිරීම අගය කරන අතර, එම ක්‍රියාමාර්ග තවදුරටත් ශක්තිමත් කරමින් වේගවත් කිරීම අත්‍යවශ්‍ය වේ.
>
> එබැවින්, පීඩාවට පත් ජනතාවට පානීය ජලය සැපයීම, වගා හානි වෙනුවෙන් සහන සැලසීම සහ වනසතුන් උදෙසා ජල මූලාශ්‍ර පවත්වාගෙන යාම ඇතුළු සියලු ක්‍රියාමාර්ග ගනිමින් ජනතාව සහ සම්පත් ආරක්ෂා කර ගැනීමට ගනු ලබන පියවරයන් සඳහා පක්ෂ විපක්ෂ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහාය ලබා දිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ පෘථිවි ගෝලය මත තිබෙන සාගර කලාපවල සුළං හමන්නේ නිශ්චිත දිශාවලට. නැඟෙනහිර සිට බටහිරට, බටහිර සිට නැඟෙනහිරට, උතුර සිට දකුණට ආදී වශයෙන් එක් එක් සාගර කලාපයන්ට ආවේණික නිශ්චිත දිශාවන් තිබෙනවා. පැසිෆික් සාගර කලාපය ගත්තාම, නැඟෙනහිර ඉඳලා බටහිරට තමයි සාමාන්‍යයෙන් සුළං හමන්නේ. නමුත්, මේ කලාපය තුළ අවුරුදු 2ත්, 7ත් අතර කාලය තුළදී චක්‍රීයව සිදු වන ක්‍රියාවලියක් තිබෙනවා. සමකයට ආසන්න සාගර කලාපයේ සාගර ජලයේ මතුපිට උෂ්ණත්වය අසීමිත ලෙස ඉහළ යනවා. මේ ඉහළ යාමත් එක්ක සුළං හමන දිශාවන් වෙනස් වෙනවා.

ආදි කාලයේ රුවල් නැව් පාවිච්චි කරලා වෙළෙඳාමේ ගිය නාවිකයන් මේ සුළංවල දිශාවත් එක්ක තමයි ඒගොල්ලන්ගේ ගමනාගමන කටයුතුවල යෙදුණේ. ඒ නිසා මේවාට කියන්නේ, tradewinds කියලා. පැසිෆික් සාගර කලාපයේ තිබුණු tradewinds

සාගර ජලයේ මතුපිට උෂ්ණත්වය වැඩිවීමත් එක්ක, ගමන් කරන දිශාව වෙනස් වෙනවා. නැඟෙනහිර ඉඳලා බටහිරට ගමන් කරන සුළං බටහිර ඉඳලා නැඟෙනහිරට ගමන් කරන්න පටන් ගන්නවා. සාමාන්‍ය කාලවලදී නැඟෙනහිර ඉඳලා බටහිරට සුළං හමනකොට ඒ උෂ්ණත්වය සහිත ජලය ගලාගෙන ඇවිල්ලා ඕස්ට්‍රේලියාව, දකුණු ආසියාව, අප්‍රිකාව, ඉන්දුනීසියාව ආසන්න කලාපයට හොඳ වර්ෂාපතනයක් ලැබිලා මත්ස්‍ය සම්පත බහුල වීමේ තත්ත්වයක් තිබෙනවා. හැබැයි, මුහුදු ජලය අධික ලෙස රත්වීම නිසා මේ තත්ත්වය කණපිට හැරුණාම ලෝකයේ සියලු වායුගෝලීය සංසරණ තත්ත්වයන් වෙනස් වෙලා කාලගුණ විපර්යාසවලට ලක් වනවා. අධික උෂ්ණත්වයත් එක්ක වන විපර්යාස නිසා එල් නිනෝ තත්ත්වය හට ගන්නවා. සාගර ජලයේ මතුපිට උෂ්ණත්වය අධික ලෙස ඉහළ යාමෙන් වායුගෝලයට අධික තාපයක් විමෝචනය වන නිසා වායුගෝලයේ පීඩනය වෙනස් වෙනවා. මේකත් එක්ක බටහිර ඉඳලා නැඟෙහිරට සුළං හමන නිසා සාමාන්‍යයෙන් වියළි කාලගුණයක් තිබෙන දකුණු ඇමෙරිකාවේ බටහිර පැත්තටත්, ඇමෙරිකා එක්සත් ජනපදයේ දකුණු ප්‍රදේශයටත් අධික වර්ෂාවක් ලැබෙන නිසා ගංවතුර තත්ත්වයක් හට ගන්නවා. ඒ වාගේම සුළං හමන දිශාව වෙනස් වෙච්ච නිසා ඉන්දුනීසියාව, ඕස්ට්‍රේලියාව, දකුණු ආසියාව, දකුණු අප්‍රිකාව වාගේ රටවලට නියං තත්ත්වයක් හට ගැනීමට පටන් ගන්නවා. මේ තත්ත්වය අපි එල් නිනෝ කියලා කියනවා.

මේ තත්ත්වය ඇති වීමට සිද්ධි දෙකක් බලපානවා. එකක් තමයි, සාගර ජලයේ මතුපිට උෂ්ණත්වය ඉහළ යාම. ඒක තමයි එල් නිනෝ තත්ත්වය. අනෙක තමයි, ඒ හේතුවෙන් වායුගෝලීය පීඩනයේ සිදුවන වෙනස් වීම. මෙන්න මේ දෙකම එකතු කරලා කාලගුණ විද්‍යාඥයන් මේක හඳුන්වනවා, "එල් නිනෝ සංසිද්ධිය" කියලා. මෙවැනි එල් නිනෝ සංසිද්ධි මේ වෙනකොට ලෝකයේ 16 වතාවක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ 16 වතාවෙන් වාර තුනක් ලෝකයට අධික විපත් එක් කරලා තිබෙනවා. ඒකෙන් පළමුවැනි එක තමයි 1982-1983 වර්ෂවල ඇති වූ ප්‍රබල එල් නිනෝ තත්ත්වය. එහිදී ඇමරිකාවට දැඩි ගංවතුර තත්ත්වයකුත්, ඕස්ට්‍රේලියාවට දැඩි නියඟයකුත් ඇති වෙලා ලැව් ගිනිවලින් දේපළ හා ජීවිත හානි සිද්ධ වුණා.

ඊළඟට, 1997-1998 වර්ෂවල ප්‍රබල එල් නිනෝ තත්ත්වයක් වාර්තා වුණා. එහිදී අධික උෂ්ණත්වය දරා ගැනීමට නොහැකිවත්, ගංවතුර තත්වයන්ට මුහුණ දීමෙනුත් ලෝක ජනගහනයෙන් 20,000කට අධික ප්‍රමාණයකගේ ජීවිත නැති වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2015-2016 වර්ෂවල ආපු එල් නිනෝ තත්ත්වය නිසා ගෝලීය උෂ්ණත්වය ඉහළ ගිහිල්ලා ආර්ථිකයට විශාල බලපෑමක් වුණා වාගේම දැඩි පරිසර හානියකුත් සිදු වුණා කියා වාර්තා වනවා. එම එල් නිනෝ තත්ත්වයෙන් විශේෂයෙන් ඕස්ට්‍රේලියාවේ මහා බාධක කොරල්පරය ඇතුළු ස්වාභාවික සම්පත් විශාල ප්‍රමාණයකට ලොකු හානියක් ගෙන දුන්නා.

දැන් අපි මේ 2026-2027 එල් නිනෝ තත්ත්වයට මුහුණ දෙන්න සූදානම් වෙනවා. ලෝකයේ පරිසර විද්‍යාඥයන් බොහෝ කාලයක සිට මේ තත්ත්වය ගැන අනතුරු ඇඟෙව්වා. මේ වතාවේ එන තත්ත්වය හමුවේ ජූනි මාසයේ මැද වන විට සාගර ජලයේ උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 1.7කින් ඉහළ ගිහිල්ලා තිබුණා. මේක සෙන්ටිග්‍රේඩ් අංශක 2ක් දක්වා ඉහළ යනවා කියන එක තහවුරු කරලා තිබෙනවා. එසේ සිදුවීමට ඇති සම්භාවිතාව සියයට 63ක් කියනවා. එහෙම වුණොත්, අවුරුදු 75කට පස්සේ අපි මුහුණ දෙන ප්‍රබලම එල් නිනෝ තත්ත්වයට මුහුණ දෙන්න සිදු වෙයි කියන පුරෝකථනය මේ වන විට කාලගුණ විද්‍යාඥයන් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ කාලගුණික තත්ත්වය, මේ එල් නිනෝ තත්ත්වය මාර්තු සහ ජූනි මාසය දක්වා කාලයේ ආරම්භ වෙලා, නොවැම්බර් සිට 2027 වසරේ පෙබරවාරි දක්වා වූ කාලය තුළ උච්චත්වයට පැමිණිලා, 2027 පළමුවැනි කාර්තුව අවසාන වෙනකම් පවතීවි කියන එක තමයි අනුමාන කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ එල් නිනෝ තත්ත්වය නිසා ලෝකයේ ආහාර අනාරක්ෂිතතාවට මිලියන 49ක ජනතාවක් මුහුණ දෙයි කියලා පුරෝකථනය කර තිබෙනවා. මේ සුපර් එල් නිනෝ තත්ත්වය ඇති වුණොත් ලෝකයේ රටවල් 45කට අදාළ මිලියන 274ක් පමණ ජනතාව අවදානමට ලක් වෙන්න පුළුවන් කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලෝකයේ තත්ත්වය එහෙම වුණාට, ලෝකයට මේක බලපාන ආකාරය ඒ විධියට පුරෝකථනය කළාට, ලංකාවේ තත්ත්වයට ඒක ඒ විධියටම ගන්න බැහැ. මොකද, ලංකාව පරිසර පද්ධති කිහිපයක බලපෑමට යටත් වෙලා තිබෙන දේශගුණික කලාපයක පිහිටා තිබෙන රටක් නිසා. අපේ රට ඉන්දියානු සාගරයේ පිහිටා තිබෙන රටක්. අනෙක, අපේ රට දූපතක්. ඒ වාගේම, මෝසම් දෙකක බලපෑමට අපේ රට හසුවෙලා තිබෙනවා. ඒ වාගේම, ඉන්දියානු සාගර ඩයිපෝලය කියන පරිසර තත්ත්වයත් ක්‍රියාත්මක වෙනවා. එම නිසා ඒ එල් නිනෝ තත්ත්වය අපේ රටට බලපාන්නේ වෙනස් විධියකටයි කියන එක තමයි අපට පුරෝකථනය කරගන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ තත්ත්ව යටතේ නිරිත දිග මෝසම් වැසි සැලකිය යුතු ප්‍රමාණයකින් අපට අඩු වෙනවා. එම නිසා දිවයිනේ බටහිර, දකුණ, මධ්‍යම යන පළාත්වල වියළි කාලගුණික තත්ත්වයක් තමයි හටගන්නේ. පසුගිය දවස්වල අපට එම තත්ත්වයට මුහුණ දෙන්න සිද්ධ වුණා. පසුගිය දවස්වල අක්කර 6,000ක විතර වගා බිම් ප්‍රමාණයක් හානි වුණා කියලා දැනට කෘෂි රක්ෂණ මණ්ඩලයට වාර්තා වෙලා තිබෙනවා. මොනරාගල දිස්ත්‍රික්කය ගත්තොත්, බිබිල, මැදගම ආදී ප්‍රදේශවල ගම්මිරිස්, රඹුටන් ආදි වගාවනුත්, වී ගොවිතැන සහ එළවලු වගාවත් විනාශයට පත්වන තැනට කටයුතු යෙදෙමින් තිබෙනවා කියන කාරණය වාර්තා වෙමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ දිස්ත්‍රික්ක 7ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22ක, පවුල් 25,562ක් මේ වන විට මේකෙන් බලපෑමට ලක්වෙලා තිබෙනවා. ප්‍රබල වශයෙන්ම මේ බලපෑමට ලක්වුණු දිස්ත්‍රික්කයක් තමයි මොනරාගල දිස්ත්‍රික්කය. මොනරාගල දිස්ත්‍රික්කයේ විශාල ජනතාවක් මේ වන විට පානීය ජල හිඟයකටත් මුහුණ දෙමින් තිබෙනවා. ජල සම්පත් මණ්ඩලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය සභාව මැදිහත් වෙලා ඒ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ඉමහත් වෙහෙසක් දරමින් කටයුතු කරනවා.

මේ තත්ත්වය බලපා ඇති දිස්ත්‍රික්ක හතේම තිබෙන අදාළ සංවිධාන කැඳවමින් මේ වන විට මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරමින් සිටිනවා. රජයක් විධියට අපි මේ එල් නිනෝ තත්ත්වය කළමනාකරණය කර ගැනීම සඳහා ජූනි මාසයේ 10වැනි දා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේදී අදාළ ආයතන සියල්ලම කැඳවා සාකච්ඡා කරලා මේකට මුහුණ දෙන ආකාරය පිළිබඳව තීන්දු තීරණ ගත්තා. ඒ වාගේම, ජූනි මාසයේ 30වැනි දා අපේ ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ව්‍යසන කළමනාකරණ ජාතික සභාව කැඳවලා අදාළ ආයතන සඳහා, ක්ෂේත්‍රවලට වෙන වෙනම උපදෙස් දීලා කටයුතු කරලා තිබෙනවා මේ එල් නිනෝ තත්ත්වයට අපි මුහුණ දෙන ආකාරය පිළිබඳව. ඒ වාගේම, ජූලි මාසයේ 20වැනි දා විශේෂ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් සහ නිලධාරි කමිටුවක් පත් කරලා, මේ වන විට තුන්වරක් ඒක රැස් කරලා, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ උපදෙස් මත අපි කොහොමද මේ තත්ත්වයට මුහුණ දෙන්නේ

[ගරු අජිත් අගලකඩ මහතා]

කියන එක සාකච්ඡා කර තිබෙනවා. අපි කෘෂි කර්මාන්තය පවත්වාගෙන යෑම පිළිබඳව, පානීය ජලය ජනතාවට අඛණ්ඩව ලබාදීම පිළිබඳව, අපේ පරිසර පද්ධතියේ සිටින වනජීවීන් රැක ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව එහිදී උපදෙස් දීලා තිබෙනවා. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මේ කටයුතු සඳහා මුදල් වෙන් කරමින් මැදිහත් වෙමින් සිටිනවා. මේ සම්බන්ධයෙන් සියලු දිස්ත්‍රික් ලේකම්වරු දැනුවත් කර තිබෙනවා. දිස්ත්‍රික් ලේකම්වරුන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටු කැඳවමින් මේ වන විට ප්‍රාදේශීය මට්ටමින් අවශ්‍ය උපදෙස් ලබා දෙමින් සියලු තත්ත්වයන්ට මුහුණ දෙමින් සිටිනවා. මේක ලෝකයේ හැමෝටම පොදුවේ මුහුණ දෙන්න සිදු වන තත්ත්වයක්. ඒ නිසා මේ ගරු සභාවේ සිටින සියලු මන්ත්‍රීවරුන්ට අපි යෝජනා කරනවා, මේ පොදු තත්ත්වයට මුහුණ දීම සඳහා හැම දෙනාගේම දායකත්වය ලබා දෙන්න කියලා. එසේ ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

යෝජනාව ස්ථිර කිරීම, ගරු දීප්ති වාසලගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.11]

**ගරු දීප්ති වාසලගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே)
(The Hon. (Mrs.) Deepthi Wasalage)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම යෝජනාව ස්ථිර කිරීමට පෙර කාරණාවක් කියන්න ඕනෑ. අද මුළු මහත් ශ්‍රී ලාංකීය ජනතාවට ඉතාම ශෝචනීය දිනයක්. අප පාසල් ගිය අවධියේ සමාජ අසාධාරණයට එරෙහිව හඬක් නඟන ලද, අපේ පෙර ගමන්කරු විධියට අප හඳුනා ගත් ඒ අසහාය ගායිකාව (ආචාර්ය) නන්දා මාලනී මැතිනියගේ අභාවය අපේ රටට ඉමහත් පාඩුවක්. යහපත් සමාජ පරිවර්තනයක් වෙනුවෙන් දේශපාලනයේ නියැළුණු ජනතා විමුක්ති පෙරමුණේ සහ ජාතික ජන බලවේගයේ සියලු දේශපාලන ක්‍රියාකාරී සහෝදරියන් වෙනුවෙන් මේ ගරු සභාව තුළ මගේ ගෞරවනීය ආචාරය එතුමියට පුද කරන අතරම, එතුමියට නිවන් සුව ලැබේවා කියාත් ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලෝකයේ ස්වාභාවික සංසිද්ධියක් ඇසුරින් ඇති වී තිබෙන එල් නිනෝ ආවරණය නිසා අපේ රටට අත් විය හැකි බලපෑම අවම කිරීම සඳහා ක්‍රියාත්මක වීම වෙනුවෙන් අද දින මෙම ගරු සභාවට මොනරාගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් අගලකඩ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරමින් මගේ කථාව ආරම්භ කරනවා.

අපේ ගරු මන්ත්‍රීතුමා ඉතාම පැහැදිලිව කිව්වා, එල් නිනෝ ආවරණය කියන්නේ මොකක්ද, ඒක ඇති වෙන්නේ කොහොමද සහ එහි තත්ත්ව පිළිබඳව. මේ ඇති වෙලා තිබෙන එල් නිනෝ තත්ත්වය, දරුණු එල් නිනෝ - Super El Niño - තත්ත්වයක් කියලා තමයි ලෝක දේශගුණික අනාවැකි පළ කරන මධ්‍යස්ථාන ප්‍රකාශ කරන්නේ. මෙහි බලපෑම නිසා ලෝක ජනගහනයෙන් මිලියන 49කට ආසන්න පිරිසකට උග්‍ර ආහාර අනාරක්ෂිතතාවක් ඇති වෙනවා වාගේම රටවල් 45ක් මෙහි බලපෑමට ලක් වෙනවා කියා තොරතුරු එක් රැස් කර තිබෙනවා. ඒ වාගේම ලෝක ජනගහනයෙන් පුද්ගලයන් මිලියන 274ක් එහි බලපෑමට ලක් වෙනවා කියලාත් සඳහන්ව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ජනතාවාදී ආණ්ඩුවක් තමයි සකස් කරලා තිබෙන්නේ. ඒ නිසා, "අවදානමට පෙර සූදානම" කියන සංකල්පය පෙරදැරි කර ගනිමින් මේ තත්ත්වය නිසා අපේ රටට ඇති විය හැකි ආපදාව කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක පිළිබඳව ආණ්ඩුව වශයෙන් අපි මේ වන විටත් අවධානය යොමු කරමින් සිටිනවා; සැලසුම් සකස් කරමින් සිටිනවා. අපේ ගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් අප සියලුදෙනාම ආණ්ඩුවක් වශයෙන් එම කටයුතු කරමින් ඉන්නවා. අපි දන්නවා, 2025දී අපේ රටට ඇති වූ විශාල ආපදා තත්ත්වය ගැන. "දිට්වා" ආපදා තත්ත්වය සහ ලෝක යුද්ධය නිසා අපේ රට තුළ ඇති වූ අර්බුද ගරු ජනාධිපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ අප විසින් ඉතාම හොඳින් සහ මැනවින් කළමනාකරණය කරනු ලැබුවා. ඒ අයුරින්ම මේ ආවරණ තත්ත්වය ඇති වන බවට ලෝකය විසින් දැනුම් දුන් විගසම ජුනි මස 11වන දින අපේ ගරු ජනාධිපතිතුමා, මෙරට ආහාර සුරක්ෂිතතාව, පානීය ජලය සහ බලශක්ති යන ක්ෂේත්‍රවලට ඇති විය හැකි බලපෑම, එකී ක්ෂේත්‍ර කළමනාකරණය කර ගැනීමට ගත හැකි කඩිනම් පියවර පිළිබඳව සාකච්ඡා කරමින් ඊට අදාළ ක්‍රියාකාරී සැලසුම් සාදන ලෙසට නිලධාරින්ට උපදෙස් දී තිබෙනවා. ඒ වාගේම, විශේෂ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කරමින්, වරින් වර එය රැස් කරමින්, මාධ්‍ය සාකච්ඡා පවත්වමින්, අපි ජාතියක් වශයෙන් ඉදිරියේදී මේ ආපදාවට මුහුණ දෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් අපේ රටේ ජනතාව දැනුවත් කර තිබෙනවා. ආණ්ඩුව වශයෙන් අපි ඒ ආකාරයට ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

අගෝස්තු මස 19වන දා දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ Zoom සාකච්ඡාවක් පවත්වා, ඒ ඒ දිස්ත්‍රික්කවල ඇති වී තිබෙන ආපදා තත්ත්ව අවම කර ගැනීම සඳහා දත්ත ඒක රාශි කරමින් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීමට සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට උපදෙස් ලබා දී තිබෙනවා. ඒ වාගේම එල් නිනෝ තත්ත්වය නිසා නියඟය ඇති වූ ප්‍රදේශවල පානීය ජලය බෙදා දීම සඳහා ජලය අවශ්‍ය ප්‍රදේශ පිළිබඳ දත්ත ඒක රාශි කරගෙන ඒවාට බවුසර් මඟින් ජලය බෙදා දීමේ කටයුතුත් අපි මේ වන විටත් ආරම්භ කර තිබෙනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මීට මාස දෙකකට පෙර දත්ත වාර්තාවක් ලබා ගනිමින්, ජල බවුසර් නඩත්තු කරමින් අලුතින් මිල දී ගැනීමට අවශ්‍ය ඒවා මිල දී ගනිමින් ක්‍රියාකාරී වෙමින් තිබෙනවා. ඒ වාගේම, අපට අවශ්‍ය නම් පාවිච්චි කිරීමට භූගත ජලය යොදා ගැනීම පිළිබඳවත්, දැනට භාවිත නොකරන ළිං නැවත පිළිසකර කිරීම ආරම්භ කිරීම පිළිබඳවත් අවධානය යොමු කර තිබෙනවා. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වාරි පද්ධතිවල තිබෙන ජල ධාරිතාව ගණනය කරමින් ඉදිරියේදී ඇති වන වර්ෂාව සහ වර්ෂාව අඩු වීම අනුව කෘෂි කර්මාන්තය සඳහා ජලය බෙදා හැරීම පිළිබඳ අවධානය යොමු කරමින් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. පානීය ජලය, ආහාර සුරක්ෂිතතාව මෙන්ම අපේ වනාන්තර පද්ධතිය පිළිබඳවත් අපි අවධානය යොමු කර තිබෙනවා. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වනාන්තර ආරක්ෂා කර ගැනීමට ක්‍රියාකාරී සැලසුම් සකස් කරමින් තිබෙනවා. ඉදිරියේදී වර්ෂාව අඩු වී නියං තත්ත්වයක් ඇති වුවහොත් අපේ වනාන්තර ලැව්ගිනිවලට හසු වෙනවා. මා හිතන විධියට, ලංකාවේ ලැව්ගිනි හරි අඩුයි. නමුත් මේ සුපර් එල් නිනෝ තත්ත්වය යටතේ අපේ වනාන්තර ලැව්ගිනි කියන තත්ත්වයට භාජන වුවහොත් අපි ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියන එක පිළිබඳවත් සැලසුම් සකස් කරමින් තිබෙනවා. ග්‍රාමීය කමිටු සකස් කරමින්, ඒ වාගේම ගිනි පටි සකස් කරමින් යටි වගා පාලනය කරන්නේ කොහොමද කියන එක පිළිබඳ අවධානය යොමු කර තිබෙනවා.

කඳුකර ප්‍රදේශවල සතුන් දඩයම් කිරීම නිසාත් අපේ වනාන්තර පද්ධතිවල ගිනි ඇති වෙනවා කියා අපි දන්නවා. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඒවා අවම කර ගැනීමට ඒ අදාළ ප්‍රදේශ හඳුනා ගනිමින් ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

ඒ වාගේම, වියළි දේශගුණික කලාපයක පිහිටන අපේ යාල අභය භූමිය සහ වන ජීවීන් ආරක්ෂා කර ගන්නේ කොහොමද කියන එක ගැනත් අපි අවධානය යොමු කර තිබෙනවා. මේ වන විටත් යාල අභය භූමිය තුළ ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව අවධානය යොමු කර අභය භූමිය තුළ ජලය රඳවා තබන ස්ථාන 50කට ආසන්න ප්‍රමාණයක් හඳුනාගෙන තිබෙනවා. අවශ්‍යතාවක් ඇති වුණොත්, සතුන්ට ජලය මදි වුණොත් බවුසර්වලින් ජලය බෙදීමේ වැඩ පිළිවෙළ සහ සූර්ය ශක්තිය මඟින් මෝටර් ක්‍රියාත්මක කරවමින් ජලය ලබා දෙන වැඩ පිළිවෙළ සකස් කරමින් තිබෙනවා.

ඒ වාගේම, පසුගිය අගෝස්තු 06වන දින ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ආපදා සහන සේවා මාර්ගෝපදේශයක් නිකුත් කරමින් ජලය බෙදා හැරීම පිළිබඳ සාකච්ඡා කර තිබෙනවා. ඒ සඳහා යොදා ගත හැකි බවුසර්වලට ඉන්ධන ලබා ගැනීමටත්, ස්ථිර රියැදුරන් සහ රිය සහායකයන් සඳහා අතිකාල දීමනා ගෙවීමටත්, ස්ථිර සේවකයන් නොමැති අවස්ථාවලදී කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවා ගැනීමටත්, ජලය බෙදා දීමේදී වැය වන වෙනත් අවශ්‍යතා සඳහාත් වියදම් දැරීමට දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කර තිබෙනවා. මා මුලින් කිව්වා වාගේ, අපි හැම වෙලාවේම "අවදානමට පෙර සූදානම" යන්න මුල් තැන්හි තබා කටයුතු කරනවා. අපේ ජනතාවට අපහසුතාවට ලක් වෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ආණ්ඩුවේ ප්‍රධාන ඉලක්කය තමයි, අපේ රටේ ජනතාවට හොඳ ජීවිතයක් උරුම කර දීම. ඒ නිසා ඇති වන ඕනෑම ආපදාවකදී අපි ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වීමට සූදානමින් සිටිනවා. මෙම ස්වාභාවික දේශගුණික ආවරණීය බලපෑම අවම කිරීම සඳහා කෘෂි කර්මාන්තය වර්ධනය කිරීම, ආහාර සුරක්ෂිතතාව, පානීය ජල අවශ්‍යතාව සැපිරීම, බලශක්ති අවශ්‍යතාව සැපිරීම, හදිසි නායයෑම් සහ ගංවතුර තත්ත්වය නිසා ඇති වන තත්ත්ව අවම කිරීම, වනාන්තර සහ වන සතුන් ආරක්ෂා කිරීම, මෙකී ආපදාව නිසා ඇති වන සෞඛ්‍ය ගැටලු අවම කිරීම යන සියලු අංශ කෙරෙහි අවධානය යොමු කරමින් ආණ්ඩුව වශයෙන් අපි ක්‍රියාත්මක වෙමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මේ අවස්ථාවේදී මුළුමහත් ශ්‍රී ලාංකීය ජනතාවගෙන් ඉල්ලා සිටීමට කැමැතියි, අපට ඉදිරියේදී ලොකු ජල ප්‍රශ්නයකට මුහුණ දීමට සිදු විය හැකි බැවින් වර්තමානයේදී ජලය කළමනාකරණය කර ගැනීම පිළිබඳ අවධානය යොමු කරන්න කියලා. ඒ වාගේම, මම සියලුදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, එක ජල බිංදුවක් හෝ අපතේ යවන්න එපා කියලා. ආහාර අපතේ නොයවා, ජලය අපතේ නොයවා ඉදිරියේදී අපේ රටේ ඇති විය හැකි ආපදාවට මුහුණ දීමට, එය කළමනාකරණය කර ගැනීමට ජාතියක් වශයෙන් පක්ෂ, විපක්ෂ සියලුදෙනාම එකතු වෙලා කටයුතු කරමු කියලා. මෙම එල් නිනෝ ආපදාවට මුහුණ දීමට මේ රටේ ජනතාවට ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.19]

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු අජිත් අගලකඩ මන්ත්‍රීවරයා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් හරහා මේ එල් නිනෝ තත්ත්වය පිළිබඳව පාර්ලිමේන්තුවේ අවධානය යොමු කර තිබෙනවා. විශේෂයෙන්ම එතුමාගේ මේ යෝජනාවේ සඳහන් කර තිබෙනවා, "මෙහි බලපෑම හේතුවෙන් දැනටත් අම්පාර, මොනරාගල, පොළොන්නරුව ඇතුළු දිස්ත්‍රික්ක..." කියලා. මම එතුමාට මතක් කරන්න ඕනෑ, අනුරාධපුර දිස්ත්‍රික්කයටත් දැන් ඒ බලපෑම ඇතිවෙලා තිබෙන බව. ඒ වාගේම එතුමා එහි සඳහන් කර තිබෙනවා, "ඒ හේතුවෙන් උග්‍ර පානීය ජල හිඟයක් නිර්මාණය වෙමින් පවතින අතර..." කියලා. මම එතුමාට මතක් කරන්න ඕනෑ, නිර්මාණය වෙමින් පවතින අතර නොවෙයි, දැන් නිර්මාණය වෙලායි තිබෙන්නේ කියලා. ඒ බලපෑම විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රදේශ ගණනාවකට ඇතිවෙලා තිබෙනවා. පසුගිය සති දෙක පුරාවටම මාධ්‍යයෙන් දිගින් දිගටම පෙන්නුවා මිහින්තලය ආදී ප්‍රදේශවල වැව් ටික ක්‍රම ක්‍රමයෙන් හිඳීගෙන යනවා, සතුන්ට බොන්නවත් වතුර නැතිවෙලා තිබෙනවා කියලා. ඒ වාගේම, ජනතාව විශාල පානීය ජල අර්බුදයක ඉන්නවා.

ගරු මන්ත්‍රීතුමා දැන් මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරවනවා වාගේම, මේ පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා විසින් අප්‍රේල් 07වැනි දා සිට පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා දේශගුණය පිළිබඳ පාර්ලිමේන්තු සංසදය දැනුවත් කර තිබෙනවා. එතුමා සම සභාපතිත්වය දරන මේ පාර්ලිමේන්තු සංසදය අප්‍රේල් 07වැනි දා සිට සෑම සිකුරාදා දිනයකම කැඳවමින්, මේ කාරණයට දිගින් දිගටම අවධානය යොමු කරමින්, තොරතුරු ඒක රාශි කරමින් අදාළ වගකිවයුතු අය ගෙන්වා සාකච්ඡා කරමින්, "අවදානමට පෙර සූදානම" වෙනුවෙන් අවධානය යොමු කළාය කියන කාරණය මම මතක් කරන්න ඕනෑ. දැන් ආණ්ඩුවට තිබෙන්නේ ක්‍රියාත්මක වෙන්නයි. අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නයි දැන් තිබෙන්නේ. මේ වෙද්දී ජනතාවට වතුර නැහැ, සතුන්ට වතුර නැහැ. වගා බිම් විශාල වශයෙන් විනාශ වෙමින් යන බව මාධ්‍යයෙන් තමුන්නාන්සේලා දකින්නට ඇති. ඔබතුමන්ලා ඇවිල්ලා පාර්ලිමේන්තුවේ මේ ගැන කියනවා, මේවාට විසඳුම් යෝජනා කරනවා. හැබැයි ප්‍රායෝගිකව ඒවා බිමේ ක්‍රියාත්මක වන තත්ත්වයක් නම් අපට පෙනෙන්නට නැහැ. මම ඉස්සරවෙලා සඳහන් කළ පරිදි ගරු විපක්ෂ නායකතුමා විසින් ඒ පාර්ලිමේන්තු සංසදයේදී ඒ තොරතුරු සහ අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කර තිබෙනවා. තමුන්නාන්සේලාට දැන් තිබෙන්නේ ඒවා ගැන ක්‍රියාත්මක වෙන්නයි. මේ ගැන පාර්ලිමේන්තුවට යෝජනා ගෙනෙන එක හොඳයි. හැබැයි, ආණ්ඩුවට මේවාට තිබෙන විසඳුම් මොනවාද, දැන් බිමට ගිහින් ඒ විසඳුම් ලබාදෙන්න කියන කාරණය තමයි අපට විශේෂයෙන් මතක් කරන්න තිබෙන්නේ. මොකද, පාර්ලිමේන්තුවේ විවිධ කථා, සුරංගනා කථා ගොඩක් කිව්වාට බිමේ ඉන්න මිනිස්සුන්ට ඒවා එකක්වත් ක්‍රියාත්මක වන බවක් නම් අපට පෙනෙන්න නැහැ කියන කාරණය මතක් කරන්නට ඕනෑ.

අද උදේ, ගොවි ජනතාවගේ වී මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 7,500ක පරිපූරක ඇස්තමේන්තුවක් වෙන් කිරීම සම්බන්ධ යෝජනාව ඉදිරිපත් වුණා. මම ඒ සම්බන්ධවත් මතක් කරන්නට ඕනෑ. මොකද, අර ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වාගේ දෙයක් තමයි දැන් ගොවි ජනතාවට සිද්ධ වෙලා තිබෙන්නේ. මේ වෙද්දී ලංකාවේ ලක්ෂ 50කට ආසන්න ගොවි පවුල්වල ආර්ථිකය සම්පූර්ණයෙන්ම බිඳ වැටීමේ අවදානමකට ලක්වෙලා තිබෙන්නේ. අද උදේ රුපියල් මිලියන 7,500ක

[ගරු සුරංග රත්නායක මහතා]

පරිපූරක ඇස්තමේන්තුවක් ගෙනැල්ලා, "ගොවීන්ගේ වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය තුළ දැන් කිසි ප්‍රශ්නයක් නැහැ, ඒක හොඳටම සිද්ධ වෙනවා, දැන් ගොවීන්ගේ වී ටිකට නිසි මිලක් ලැබී තිබෙනවා" වාගේ කථාවක් මේ අමාත්‍යවරු කිව්වා. නමුත් මේ වෙන් කළ රුපියල් මිලියන 7,500නුත්, මීට කලින් ඔබතුමන්ලා වෙන් කරපු රුපියල් මිලියන 6,000නුත් මිලදී ගන්න පුළුවන් වී ප්‍රමාණය ගත්තොත්, උපරිම වශයෙන් මිලදී ගත හැක්කේ වී මෙට්‍රික් ටොන් ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් පමණයි. හැබැයි, මේ කන්නයේ ගොවීන්ගේ අස්වැන්න විධියට ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය විසින්ම තක්සේරු කර තිබෙන අපේක්ෂිත ප්‍රමාණයක් තිබෙනවා. ඒ අනුව, වී මෙට්‍රික් ටොන් ලක්ෂ 18ක් පමණ ගොවීන්ගේ අස්වැන්න විධියට ලැබීමට නියමිත තත්ත්වයක් තිබෙනවා. වී මෙට්‍රික් ටොන් ලක්ෂ 18ක අස්වැන්නක් ලැබීමට නියමිතව තිබෙද්දී ඔබතුමන්ලා වී මෙට්‍රික් ටොන් 100,000ක් ගන්න පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. හැබැයි, ඒක කොහෙත්ම ප්‍රමාණවත් නැති බව මතක් කරන්න ඕනෑ. රජය විසින් සහතික මිලක් කියලා වී කිලෝවකට රුපියල් 120ක මිලක් යෝජනා කර තිබෙනවා. හැබැයි, වී අළෙවි කරන ගොවි ජනතාවට රුපියල් 120ක සහතික මිල පෞද්ගලික වී මෝල් හිමියන්ගෙන් සහ කිසිම සහල් ව්‍යාපාරිකයෙක්ගෙන් ලැබෙන්නේ නැහැ.

වී අලෙවි මණ්ඩලයේ ගබඩා 283ක් තිබෙනවා. මේ වෙද්දිත් ඒ ගබඩා 283 තුළ ගිය කන්නයේ ලබා ගත් විශාල අස්වනු ප්‍රමාණයක් තිබෙනවා. ඒ ගබඩාවල වී මෙට්‍රික් ටොන් 100,000ක් වාගේ තිබෙනවා. මේ වෙද්දිත් ඒ ගබඩා හිස් වෙලා නැහැ. ගිය කන්නයේ අස්වැන්නෙන් ගොවීන් සතුව තව වී මෙට්‍රික් ටොන් ලක්ෂ පහක් පමණ තිබෙනවා. ඒ අස්වනු ප්‍රමාණයත් ගොවීන් සතුව තිබෙනවා. ඒ වාගේම මේ කන්නයේත් විශාල අස්වැන්නක් ලැබිලා තිබෙනවා. කෙසේ වෙතත්, රුපියල් 154ක නිෂ්පාදන මිලක් ලැබෙන්න ඕනෑය කියලා පහුගිය කාලයේ එතුමා ප්‍රකාශ කළේ නැහැ කියලා තමයි ඇමතිවරයා දැන් කියන්නේ. එතුමාගෙන් අද හොඳ ප්‍රකාශයක් ආවා. ගොවි ජනතාව මේක අහගෙන ඉන්නවා ඇති. එතුමා එහෙම නම් පසුගිය කාලයේ සටන් කරලා තිබෙන්නේ වීවලට රුපියල් 154ක සහතික මිලක් ඕනෑ කියලා නොවෙයි, වෙන කාරණාවලට තමයි සටන් කරලා තිබෙන්නේ. එහෙම නම් එතුමා දැන් කියන පරිදි එදා වී කිලෝවකට රුපියල් 154ක නිෂ්පාදන වියදමක් යනවා. නමුත් අද වෙද්දි එහෙම නිෂ්පාදන වියදමක් යන්නේ නැහැ. අද නිෂ්පාදන වියදම අඩු වෙලා තිබෙනවා. මම එතුමාට මතක් කරන්නට ඕනෑ. නිෂ්පාදන යෙදවුම් ගත්තාම එදාට වඩා අඩු වෙලා තිබෙන්නේ පොහොර මිල පමණයි. කම්කරු කුලිය ඇතුළු අනෙක් යෙදවුම් සියල්ලේම මිල වැඩි වෙලා. එදා, 2022දී ඔබතුමන්ලා පාරට බැහැලා වීවලට රුපියල් 150ක් ඕනෑ කියලා සටන් කරද්දී තිබුණු මිලට වඩා - පොහොර හැර - අනෙක් සියල්ලේම මිල වැඩි වෙලා තිබෙනවා. එදා සමස්ත ලංකා ගොවිජන සංගමය, අර සංගමය, මේ සංගමය කියලා සංගම් පිහිටුවාගෙන ගොවීන් ගාවට ගිහිල්ලා ගොවීන් කුපිත කරලා, වෙල්වලට ගිහිල්ලා ගොවීන්ගේ ඔළු වෙනස් කරලා එදා සටන් කළා, වී කිලෝවකට රුපියල් 154ක් ඕනෑ කියලා. අද වෙනස මේකයි. අද එතුමා ආණ්ඩුවේ ඇමති කෙනෙක් බවට පත් වෙලා ශීත කාමරයේ ඉඳගෙන ඉන්න නිසා ගොවීන්ගේ ප්‍රශ්න, අනම්මනම් කිසි දෙයක් වැඩක් නැහැ. අද එතුමාට වී කිලෝවකට රුපියල් 154ක මිලක් අවශ්‍ය නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ගොවි පවුල් ලක්ෂ 50ක ආර්ථිකය බිඳ වැටිලා තිබෙන්නේ. ඊළඟ කන්නයේ ගොවිතැන් ටික කර ගන්න බැරි තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ. එම නිසා වී මිලදී ගැනීමේ ක්‍රියාවලියට ඔබතුමන්ලා මේ දීලා තිබෙන සිල්ලර විසඳුම් හරියන්නේ නැහැ. සිල්ලර විසඳුම් නොවෙයි, හරි විසඳුමක් දෙන්න කටයුතු කරන්න. කරුණාකරලා ගොවීන්ගේ අස්වැන්නට සාධාරණ මිලක් ලබා දෙන්න. ඔබතුමන්ලා කියනවා රුපියල් 120ට වී කිලෝවක් ගන්නවා කියලා. අපි කියනවා, කිසිම තැනක රුපියල් 120ට ගන්නේ නැහැ කියලා. ඔබතුමා පුළුවන් නම් පෞද්ගලික වී මෝල් හිමියන් රුපියල් 120ට වී කිලෝවක් මිලදී ගන්නවා ද කියලා සහතික කර ගන්න.

මට කාලය ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි අමාත්‍යතුමා. ඔබතුමා විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.28]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එල් නිනෝ කියන සංසිද්ධිය නිසා මේ මොහොතේ අපේ රට ඇතුළු ලෝකයටම බලපා ඇති දේශගුණික තත්ත්වය පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේ මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම වෙනුවෙන් ගරු අජිත් අගලකඩ මන්ත්‍රීතුමාටත්, යෝජනාව ස්ථිර කිරීම වෙනුවෙන් ගරු දීප්ති වාසලගේ මන්ත්‍රීතුමියටත් මා පළමුවෙන්ම ස්තුතිවන්ත වනවා.

මේ වසරේ අප්‍රේල් මාසයේ 20වැනි දා පමණ සිට තමයි මේ එල් නිනෝ තත්ත්වය ගැන ලෝකයේ සාකච්ඡා පටන් ගැනුණේ. ලෝකයේ එල් නිනෝ තත්ත්වයක් වර්ධනය වෙමින් තිබෙන බවට පුරෝකථනය වුණා. ඒ අනුව අවශ්‍ය සූදානම් කිරීම් සඳහා පුරෝකථන ලෝකය පුරා සාකච්ඡාවට ලක් වුණා. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අපිත් මැදිහත් වුණා. ශ්‍රී ලංකාවට මේ එල් නිනෝ තත්ත්වය කවරාකාරයෙන් බලපායිද කියන එක සම්බන්ධයෙන් විවිධ තොරතුරු, දත්ත ලබාගෙන අපි ඒ පිළිබඳව සාකච්ඡා කළා. අපි රජයක් හැටියට මේ පිළිබඳව සැලකිලිමත් වුණා. විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමා විසින් ජූනි මාසයේ 22වැනි දා අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් දැනුම් දුන්නා, එල් නිනෝ දේශගුණික බලපෑමට මුහුණ දීම සඳහා විශේෂ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් සහ නිලධාරි කමිටුවක් පත් කරන බව. එම කමිටුව ජූනි මාසයේ 30වැනි දා පළමුවරට රැස් වුණා. අපේ රටට මේ එල් නිනෝ තත්ත්වය කවරාකාරයෙන් බලපායිද කියන එක පිළිබඳවත්, එය වර්ධනය විය හැකි ආකාරය පිළිබඳවත්, ඒ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳවත් එහිදී සාකච්ඡාවට ගනු ලැබුවා. මේ වන විට එල් නිනෝ කමිටුව හතර වතාවක් රැස් වෙලා තිබෙනවා. ඒ එක් එක් රැස්වීමේදී අපි ගන්නා තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමට සියලු ආයතන සම්බන්ධ කරගන්නවා.

විශේෂයෙන්ම මේ එල් නිනෝ තත්ත්වයට අදාළව ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළකුත් අපි ආරම්භ කර තිබෙනවා. එල් නිනෝ කමිටුව හැටියටත් අපි මේ පිළිබඳව ජනතාව දැනුවත් කළා. ඊට අමතරව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි ආයතන පැත්තෙනුත් අවශ්‍ය දැනුවත් කිරීම් කරමින්, ඉදිරියේදී ඇති විය හැකි තත්ත්වයට සූදානම් කිරීම මේ වන විටත් සිදු කරමින්

පවතිනවා. ඒ නිසා රජයක් හැටියට අපි ක්‍රියාකාරී නැහැ, කථා කරමින් පමණක් ඉන්නවා කියලා කවුරු හරි කියනවා නම්, එවැනි ප්‍රකාශ කරන අය කොහේද හිටියේ කියලා අපි දැනගන්න කැමැතියි. මෙය ස්වාභාවික ආපදා තත්ත්වයක්; ස්වාභාවික සංසිද්ධියක්. ඒ නිසා මේක දේශපාලනීකරණය කරමින් අනවශ්‍ය ගැටලු ඇති කරන පැත්තට මේ සාකච්ඡාව ගෙන යන්න එපා කියලා අපි කාරුණිකව ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම මෙය ජනතාව අපහසුතාවට පත්වන ස්වාභාවික සංසිද්ධියක් නිසා. එවැනි අවස්ථාවලදී පත්වන අපහසුතාවෙන්, පීඩාවෙන් ජනතාව මුදා ගැනීම සඳහා සාමූහික ක්‍රියාමාර්ග ගැනීමට තරම් අපි සදාචාරවත් විය යුතුයි. ඒ නිසා අපි රජයක් ලෙස මේ සම්බන්ධයෙන් වගකීම් සහගතව කටයුතු කරනවා. ගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීමෙන් මේ සඳහා ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. ගරු ජනාධිපතිතුමා විසින් මේ එල් නිනෝ තත්ත්වය සම්බන්ධයෙන් පත් කරපු අමාත්‍ය මණ්ඩල අනුකමිටුව සහ නිලධාරි කමිටුව අද උදෑසනත් කැඳවලා අවශ්‍ය මඟ පෙන්වීම් සහ උපදෙස් ලබා දීම සිදු කළා.

එල් නිනෝ තත්ත්වය ගැන ලෝකයේ පොදු මතයක් පවතිනවා. විශේෂයෙන්ම ලෝක කාලගුණ විද්‍යා සංවිධානය මඟින් මේ ගැන වරින් වර පුරෝකථන ඉදිරිපත් කරනවා. මේ පුරෝකථන අපේ රටට කොයි ආකාරයෙන් බලපානවාද කියන එක අපි සාකච්ඡා කළ යුතුයි. එහිදී ලෝකය සම්බන්ධයෙන් දීලා තිබෙන පුරෝකථනය අපේ රටට ඒ ආකාරයෙන්ම බලපානවාද, එහෙම නැත්නම් අපේ රටට එය බලපාන්නේ කිසියම් වෙනස්කම් සහිතවද කියන එක සාකච්ඡා කිරීම වැදගත් වෙනවා. මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ තිබෙන දත්ත සහ තොරතුරු ලබාගෙන ඒවා පිළිබඳව සාකච්ඡා කරලා අපේ රටට අදාළ පුරෝකථනයක් තමයි පසුගිය කාලයේ අප ඉදිරිපත් කළේ.

විශේෂයෙන්ම අපේ රටට මේ එල් නිනෝ සංසිද්ධිය බලපාද්දී, හුදු එල් නිනෝ සංසිද්ධිය විතරක්ම නොවෙයි අපට බලපාන්නේ. මේ කලාපය තුළ සිදුවෙන තවත් දේශගුණික, කාලගුණික සංසිද්ධි එක්ක එකට වෙළිලා තමයි එල් නිනෝ තත්ත්වය අපේ රටට බලපාන්නේ. විශේෂයෙන් Indian Ocean Dipole කියන තත්ත්වය මේ වෙනකොට අපේ රටට ධනාත්මකව - positive ලෙස - බලපා තිබෙනවා. මෙන්න මේ තත්ත්ව එක්ක තමයි අපි අපේ රට තුළ දේශගුණික, කාලගුණික පුරෝකථනය සිදුකරගත යුතු වන්නේ. අපි මේ වෙනකොට රජයක් හැටියට මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා සියලු ක්ෂේත්‍ර ඒකාබද්ධ කරමින් වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. මේ එල් නිනෝ තත්ත්වය වර්ධනය වුණොත් එක් එක් අමාත්‍යාංශ, එක් එක් දෙපාර්තමේන්තු මොන ආකාරයටද ක්‍රියා කරන්නේ කියන එක සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලසුමක් හදලා ඒ සැලැස්ම ගැන පුළුල් ලෙස සාකච්ඡා කරලා ඒ අනුව ක්‍රියා කරමින් ඉන්නවා.

අපේ වාසලගේ මන්ත්‍රීතුමිය කිව්වා වාගේ, අපි පසුගිය 19වැනි දා රාත්‍රියේ Zoom තාක්ෂණය මඟින් සියලු දිස්ත්‍රික් ලේකම්වරුන් සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් සමඟ සාකච්ඡා කළා. මේ වෙනකොට තිබෙන තත්ත්වය නිශ්චිතවම අපි වාර්තාගත කර ගත්තා. ඊට අමතරව, දැනට නියඟ තත්ත්වයක් තිබෙනවා නම්, අස්වනු හානි තිබෙනවා නම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තුළ, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු තුළ ඒවා ගැන සාකච්ඡා කරලා නිශ්චිත වාර්තාවක් අරගෙන ඒ සඳහා මැදිහත් වෙන්නය කියලා අපි දැනුම් දීලා තිබෙනවා.

ඒ වාගේම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටු ඉක්මනින් රැස්කරමින්, මේ සම්බන්ධයෙන් නිරන්තර සොයා බැලීම් සිදුකිරීමටත් අපි මේ වෙනකොට සාකච්ඡා කර තිබෙනවා. දැනටමත් ඒ සාකච්ඡා අනුව ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා. මේ සම්බන්ධයෙන් අදහස් පළ කරද්දී, "ජලය නැතිව වන සතුන් විශාල වශයෙන් විනාශ වෙනවා, දැඩි නියඟය නිසා පානීය ජල ගැටලු ඇති වෙලා තිබෙනවා, අස්වනු විශාල වශයෙන් විනාශ වෙනවා" කියමින් අතිශයෝක්තියෙන් කරුණු හුවා දැක්වීමේ උත්සාහයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඉල්ලීමක් කරනවා. මෙය ආපදා අවස්ථාවක්, මෙය දේශගුණික තත්ත්වයක් නිසා, ස්වභාවික තත්ත්වයක් නිසා සිදුවන දෙයක්. ඒ නිසා ජනතාව තුළ අනවශ්‍ය කලබලයක්, අනවශ්‍ය බියක්, සැකයක් මතු කරන එක වැරැදියි කියලා අපි විශ්වාස කරනවා. 19වැනි දා පැවැති දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සාකච්ඡාවේදී අපි නිශ්චිත වශයෙන් එම සංඛ්‍යාලේඛන ලබා ගත්තා. එම සංඛ්‍යාලේඛන අනුව මේ වනවිට නියඟය නිසා පානීය ජලය සම්පාදනය කිරීමේ අවශ්‍යතා මතු වෙලා තිබෙන්නේ දිස්ත්‍රික්ක 7ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22ක, පවුල් 25,563ක් වාගේ ප්‍රමාණයකටයි. අපි එම ප්‍රදේශ හඳුනාගෙන තිබෙනවා. ඒ තුළ පුද්ගලයන් 81,605ක් ඉන්නවා. මේ ප්‍රමාණයෙන් පවුල් 25,563ක් මේ වෙනකොට පානීය ජල හිඟයකින් පෙළෙනවා. එයින් පවුල් 22,983කට මේ වෙනකොට ජල සම්පාදන මණ්ඩලය, ප්‍රජා ජල ඒකක මැදිහත් වෙලා අවශ්‍ය ජල සම්පාදන කටයුතු ආරම්භ කරලා තිබෙනවා. පුද්ගලයන් 81,605කින් 71,893කටම අපි මේ වෙනකොට ජලය සම්පාදනය කරලා ඔවුන්ගේ ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීමට මැදිහත් වෙලා තිබෙනවා.

මීට කලින් පැවැති රජයන් තුළ මෙවැනි නියඟයක් ඇති වුණු අවස්ථාවල එක් පුද්ගලයෙකු වෙනුවෙන් සම්පාදනය කළ යුතු ජල ප්‍රමාණය පිළිබඳ අදහසක් තිබුණා. ලීටර් හයක වාගේ සීමාවක් ඇතිව තමයි ජල සම්පාදනය සඳහා අවසර දීලා තිබුණේ. මේ රජය විසින් එම ප්‍රමාණය ලීටර් 15 දක්වා වැඩි කරලා තිබෙනවා. හුදෙක් පානීය ජල අවශ්‍යතාව පමණක් නොවෙයි, ඔවුන්ගේ අනෙකුත් දෛනික ජල අවශ්‍යතාත් සම්පූර්ණ කරගත හැකි අන්දමේ ජල ප්‍රමාණයක් සම්පාදනය කිරීම සඳහා අපි දැන් මැදිහත් වෙලා ඉන්නවා. ඒ නිසා නිශ්චිතව, ඒ කියන්නේ කොයි ප්‍රමාණයකටද සැබෑ ලෙසම මේ දේශගුණික තත්ත්වය බලපා තිබෙන්නේ කියන කාරණය ගැන අතිශයෝක්තියෙන් කරුණු දක්වන්නේ නැතුව සැබෑ සංඛ්‍යාලේඛනම ඉදිරිපත් කළා නම් හොඳයි කියන අදහස තමයි අපට තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරෝකථන අනුව මේ මොහොත වන විට අපේ රටේ විශේෂයෙන්ම වියළි කලාපය තුළ වියළි කාලගුණයක් වාර්තා වනවා. දිස්ත්‍රික්ක 7ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22ක වාගේ තමයි පානීය ජල ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ. මේ කාලය තුළදී උතුරු පළාත, නැඟෙනහිර පළාත, උතුරු මැද පළාත, ඌව පළාතේ මොනරාගල සහ දකුණු පළාතේ හම්බන්තොට වාගේ දිස්ත්‍රික්කවල වියළි කාලගුණික තත්ත්වයක් පවතිනවා. අපි බලාපොරොත්තු වනවා, පොදුවේ ගත්තාම මේ වියළි කාලගුණ තත්ත්වය සැප්තැම්බර් මාසයේ අග - තුන්වැනි සතිය - දක්වා පවතීවි කියලා. ඉන් පසුව අපි නැවත වර්ෂාව සහිත කාලයක් බලාපොරොත්තු වනවා. වර්ෂාව සහිත ඒ කාලය දෙසැම්බර් මාසය දක්වා පවතීවි කියන විශ්වාසය තමයි අපට තිබෙන්නේ.

විශේෂයෙන්ම මෙන්න මේ දෙවන අන්තර් මෝසම් කාලය ලෙස හඳුනා ගන්නා ඔක්තෝබර්, නොවැම්බර් කියන කාලය තුළ වෙනදාට වඩා වැඩි වර්ෂාපතනයක් අපි බලාපොරොත්තු වනවා. ඒ නිසාම මේ වන විට අපි මේ සම්බන්ධයෙන් ගොවීන්ට අවශ්‍ය උපදෙස් ලබා දීලා තිබෙනවා. දැනටමත් ඒ සඳහා අවශ්‍ය දැනුවත් කිරීම් ආරම්භ කර තිබෙනවා; සූදානම් කිරීම් ආරම්භ කර තිබෙනවා. මෙවර කන්නයේ වගා කටයුතු ඔක්තෝබර් 01වැනි දා

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

සිට 15වැනි දා දක්වා වන කාලය තුළ ආරම්භ කරන්න කියා අපි ගොවීන්ගෙන් ඉල්ලා තිබෙනවා. අපි පුරෝකථනය කර තිබෙන්නේ ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් කාලවල ඇති වන අධික වර්ෂාපතනයට මුහුණ දීමටත්, වගා හානි සිදු නොවන ආකාරයට කටයුතු කරගන්නත් අපට පුළුවන් වෙයි කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පුරෝකථනය කර තිබෙන ආකාරයට, 2026 දෙසැම්බර් මාසයෙන් පසු 2027 ජනවාරි, පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් කියන කාලය තුළ අපි නියඟ තත්ත්වයක් බලාපොරොත්තු වනවා. ඊට කලින් අධික වර්ෂාව ඇති වන කාලය තුළදී අපි හැකි උපරිමයෙන් ජලය එක්රැස් කරගෙන ජනවාරි, පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් මාස දක්වා ඇති විය හැකි නියඟයට මුහුණ දීමට අවශ්‍ය කටයුතු සූදානම් කරනවා. ඒ අනුව වැසි කාලයට කලින් වැව්වල ජලය අඩු කර සූදානම් කර තබා ගැනීම කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු ඇමතිතුමනි.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න. මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

වියළි කාලගුණයක් පවතින කාලය තුළ ඉක්මනින්ම වැව් ප්‍රතිසංස්කරණය කරලා ඒ වැව්වල ධාරිතාව වැඩි වන විධියට ඒවා සකස් කරගන්න ගරු ජනාධිපතිතුමා ලබා දුන් උපදෙස් පරිදි අපි දැනටමත් කටයුතු කරමින් පවතිනවා. ඒ නිසා අපි මේ කටයුතු රජයක් හැටියට අත්හැර දමා නැති බව මා කියන්න කැමැතියි. මේ සම්බන්ධයෙන් සියලුදෙනා සාකච්ඡා කරන එක, අවධානය යොමු කරන එක හොඳයි. ඒක අප කාගේත් වගකීම. අප සියලුදෙනාටම ආරාධනා කරනවා, මේ සම්බන්ධයෙන් වන හොඳ සාකච්ඡාවක් කරමු කියා. මොකද, අප සියලුදෙනාටම මේ තත්ත්වයට මුහුණ දෙන්න සිදු වනවා. ඒ නිසා මෙවැනි තීව්‍ර දේශගුණික වටපිටාවක් තුළ, ස්වාභාවික ආපදාවක් තුළ ජනතාවට ඇති වන අපහසුතා, පීඩන හැකි උපරිමයෙන් මඟ හරවා ගැනීම සඳහා අප කටයුතු කළ යුතුයි. ජනතාව තවදුරටත් අපහසුතාවට පත් නොකර, ඔවුන් තුළ අනියත බියක්, අනියත සැකයක් සෑදීම වළක්වමින්, නියඟයක් වේවා, ගංවතුර තත්ත්වයක් වේවා එසේ ඇති විය හැකි ඕනෑම ආපදාවකට මුහුණ දීමට අවශ්‍ය ධෛර්යය සහ විශ්වාසය ඔවුන් තුළ සෑදීම තමයි අපේ වගකීම. රජයක් හැටියට අප සියලු පාර්ශ්වයන්ගෙන් ඉල්ලා සිටිනවා, අන්න ඒ ධෛර්යය, විශ්වාසය හැදෙන විධියට මෙවැනි අවස්ථාවලදී කටයුතු කරමු කියලා.

සියලු ආයතන ඒකාබද්ධ කර ඒ ඇති වන තත්ත්ව පිළිබඳ සැබෑ විද්‍යාත්මක සහ යථාර්ථවාදී පුරෝකථන ඉදිරිපත් කිරීමට රජයක් හැටියට අපි සූදානම්. ඒ වාගේම නිශ්චිත සංඛ්‍යාලේඛන සහ දත්ත පදනම් කර ගනිමින් මේ සඳහා මැදිහත් වෙන්නත් අපි සූදානම්. රජයක් හැටියට ඒ සඳහා අපට හොඳ සූදානමක් තිබෙනවා.

මෙහිදී අපි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මේ කටයුතුවලට මැදිහත් වෙලා සිටින ආයතනවල නිලධාරීන් පිළිබඳව. මොකද, ඔවුන් ඉතා විශිෂ්ට කාර්යභාරයක් කරනවා. ඔවුන් මේ සම්බන්ධයෙන් නිරන්තර විමසිල්ලෙන් ඉන්නවා, දැනුවත් කිරීම් කරනවා, මේ තත්ත්වය පරාජය කිරීම සඳහා ජනතාවත් එක්ක මැදිහත් වෙමින් ඉන්නවා. ඔවුන්ටත් මේ අවස්ථාවේදී අපගේ ස්තුතිය පුද කරමින් මම කථාව අවසන් කරනවා.

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.45]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, யாழ்ப்பாண மாவட்டத்தில், மிக முக்கியமாக செம்மணியில் நடைபெற்ற மனித அவலங்கள் தொடர்பில், அங்கு மனிதப் புதைகுழிகளைத் தோண்டும் வேலைத்திட்டம் இன்றோடு நிறுத்தப்பட்டிருக்கின்ற சூழ்நிலையில், அவை தொடர்பான சில விடயங்களை இங்கு பதிவுசெய்துகொள்ள விரும்புகின்றேன்.

மிக முக்கியமாக, யாழ்ப்பாண மாவட்டத்தின் செம்மணி, சிந்துபாத்தி இந்து மயானத்தில் இதுவரை காலமும் செய்யப்பட்ட ஆய்வுகளின் பிரகாரம் அங்கே 584 வரையிலான மனித எலும்புக்கூடுகள் அடையாளம் காணப்பட்டிருக்கின்றன. அவ்வாறு அடையாளம் காணப்பட்ட குறித்த மனித எலும்புக்கூடுகள் தொடர்ந்து ஆய்வுக்குட்படுத்தப்படுமா, இல்லையா என்பது தொடர்பாக இந்த அரசாங்கத்தினால் இன்னும் உறுதியாகக் கூறப்படாத நிலையில், இதுவோர் இழுபறியான விவகாரமாகவே காணப்படுகின்றது. அரசாங்கத்திடம் இருக்கின்ற நீதிமன்றக் கட்டளையின் பிரகாரம் அதற்கான பண உதவிகளைச் செய்வதற்கோ அல்லது அவற்றை மேற்கொண்டு செல்வதற்கோ அரசாங்கம் இன்னும் முழு முயற்சியை மேற்கொள்ளவில்லை என்பதைத்தான் அண்மைய நாட்களில் இடம்பெறும் விடயங்கள் முன்வைக்கின்றன.

நான் நினைக்கின்றேன், இந்த உயர்ந்த சபையிலே இதற்கு முன்னரும் பல தடவை இவ்வாறான விடயங்கள் முன்கொண்டுவரப்பட்டது; அரசாங்கத்துடன் சேர்ந்து இயங்குகின்ற இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவும் இந்த விடயத்தைக் கையிலே எடுத்திருந்தது. இந்த விடயம் தொடர்பாக 2003ஆம் ஆண்டில் அவர்கள் ஏற்கனவே ஓர் ஆய்வை மேற்கொண்டிருந்தார்கள். ஆய்வு செய்யப்பட்ட அந்த விடயங்களை அரசாங்கம் சரியான முறையில் மக்களிடம் கொண்டுசெல்லவோ அல்லது அதனைக் கையாளவோ இல்லை. குறிப்பாக, அது 2003ஆம் ஆண்டு ஒக்ரோபர் மாதத்திலே Report of the Committee on Disappearances in the Jaffna Region by the Human Rights Commission of Sri Lanka மூலம் அந்த விடயங்கள் வெளியிடப்பட்டிருந்ன. குறித்த குழுவானது, அந்த நேரத்திலேயிருந்த அரசாங்க அதிபர் Dr. தேவநேசன் நேசையா அவர்களைத் தலைவராகக்கொண்டு Mr. K.H Camillus Fernando, Ms. Jezima Ismail, M.C.M Iqbal, National

Coordinator of the Capacity-building Project and Secretary to the Committee on Disappearances ஆகியவர்களை உறுப்பினர்களாகக்கொண்டு அமைக்கப் பட்டிருந்து. இவர்கள் நால்வரும் இணைந்து யாழ்ப்பாண மண்ணிலே 1995 - 1998களில் பல ஆய்வுகளை மேற்கொண்டிருந்ததுடன், காணாமல் ஆக்கப்பட்டோர் பற்றிய 327 முறைப்பாடுகளை ஆய்வுசெய்து, 281 பேருக்கு மேற்பட்டவர்களின் விபரங்களைச் செம்மணியோடு தொடர்பு படுத்தி வெளிக்கொண்டு வந்திருந்தார்கள். அந்த அறிக்கை இப்பொழுதும் கிடப்பிலே போடப்பட்டிருக்கிறது. குறிப்பாக, அரசாங்கம் அதுபற்றி சரியான, நேர்த்தியான விடயங்களைக் கையாளவில்லை என்ற சந்தேகம் இப்பொழுதும் மக்களிடம் இருக்கின்றது.

தொடர்ச்சியாகச் செம்மணியில் நடைபெற்ற ஆய்வுகளின் படி இதுவரை 584க்கும் மேற்பட்ட மனித எலும்புக்கூட்டுத் தொகுதிகள் அடையாளம் காணப்பட்டிருக்கின்றது; அவை யாருடையது என்று இனங்காணப்படவில்லை. ஆனால், முழுமையாக அவை பெறப்பட்டிருக்கின்றன. அதேநேரம், அந்த மனித எலும்புக்கூட்டுத் தொகுதிகளுக்கு அப்பால், 57க்கும் மேற்பட்ட, கூட்டாகக் கண்டெடுக்கப்பட்ட எலும்புக் கூட்டுத் தொகுதிகளும் உண்டு. இவ்வாறு கிட்டத்தட்ட 600க்கும் மேற்பட்டவர்களுடைய மரணங்களை மையமாக வைத்து இந்த எலும்புக்கூட்டுத் தொகுதிகள் அடையாளம் காணப்பட்டிருந்தாலும்கூட, அவை தொடர்பான உண்மைத் தன்மை இதுவரை வெளிக்கொணரப்படவில்லை; காரணங்கள் சரியாகச் சொல்லப்படவுமில்லை.

குறிப்பாக, இந்த மனிதப் புதைகுழி அகழ்வின் 3ஆவது கட்ட ஆய்வுகள் நீதிமன்றக் கட்டளையோடு கடந்த 19ஆம் திகதி நிறைவுக்கு வந்திருக்கிறது. நான் நினைக்கிறேன், வருகிற செம்ரெம்பர் 30ஆம் திகதி களனிப் பல்கலைக் கழகத்தின் மூத்த தொல்பொருளியல் பேராசிரியர் ராஜ் சோமதேவா அவர்களிடம் அங்கு எடுக்கப்பட்ட சில தடயப் பொருட்கள் தொடர்பான அறிக்கையைத் தருமாறு கேட்டிருக்கிறார்கள் என்று. அதேநேரம் வருகின்ற ஒக்ரோபர் 14ஆம் திகதி திறந்த நீதிமன்றத்திலே இது தொடர்பான வழக்கு விசாரணைக்கு எடுக்கப்படவும் இருக்கிறது. முதலாவது கட்டமாக 9 நாட்களும், இரண்டாவது கட்டமாக 45 நாட்களும், மூன்றாவது கட்டமாக 56 நாட்களுமாக, 110 நாட்கள் செம்மணியிலே இந்த ஆய்வு மேற்கொள்ளப்பட்டது. இவ்வாறு செம்மணியிலே மேற்கொள்ளப்பட்ட இந்த ஆய்வுகளின் பிரகாரம்தான் 583 முழுமையான மனித எலும்புக்கூட்டுத் தொகுதிகளும், குவியல்களாக 57 எலும்புக்கூட்டுத் தொகுதி களும் அங்கு கண்டெடுக்கப்பட்டிருக்கின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மனித எலும்புக் கூடுகள் தவிர்ந்த, 170 பிற சான்றுப் பொருட்களும் அங்கே கண்டெடுக்கப்பட்டிருக்கின்றன. அவை தொடர்பாகத்தான் பேராசிரியர் ராஜ் சோமதேவா அவர்களும் அவருடைய குழுவினரும் ஆய்வுகளை மேற்கொள்கின்றார்கள்.

இந்த இடத்தைச் சென்று பார்ப்பதற்கு அண்மையிலே ஐரோப்பிய யூனியன் பிரதிநிதிகளுக்கு அரசாங்கம் அனுமதி வழங்கியிருந்தது. ஆனால், சென்ற வாரம் கனடாவினுடைய தூதுவரும் அவர் சார்ந்த குழுவினரும் சென்று அதனைப் பார்வையிடுவதற்கு அரசாங்கம் மறுத்திருக்கிறது. அதுபோல், அவுஸ்திரேலியாவைச் சேர்ந்தவர்கள் சென்று பார்ப்பதற்குக் கேட்டபொழுதும் இலங்கையினுடைய வெளிநாட்டலுவல்கள் அமைச்சினால் அனுமதி மறுக்கப்பட்டிருக்கிறது. சர்வதேச சமூகத்தைச் சேர்ந்த பிரதிநிதிகள், இராஜதந்திரிகள் அதனைச் சென்று பார்ப்பதை நீங்கள் எதற்காகத் தடுக்கிறீர்கள்? என்பது எங்களுக்குச் சந்தேகத்தை ஏற்படுத்தியிருக்கிறது.

குறிப்பாக, வெளிநாட்டலுவல்கள் அமைச்சிடம் - Foreign Affairs Ministryயிடம் - அவுஸ்திரேலியா மற்றும் கனடா ஆகிய நாடுகள் ஒருமாதத்துக்கு முன்னரே அனுமதி கோரி விண்ணப்பித்ததன் அடிப்படையில்தான் இந்த விடயத்தைக் கையாண்டிருந்தன. ஆனாலும் அனுமதி வழங்கப்படவில்லை. அதேநேரம், அங்கு கண்டெடுக்கப்பட்ட 583 மனித எலும்புக்கூட்டுத் தொகுதிகளைத் தவிர, அந்த செம்மணி சிந்துபாத்தி மயானப் பிரதேசத்துக்கு அப்பாற்பட்டதாக, அதன் எல்லை மதிலைக் கடந்து வெளிப்பகுதிகளிலும் மனிதர்கள் அடித்துக் கொல்லப்பட்டுப் புதைக்கப்பட்டார்கள் என்று இப்பொழுது சிறையிலே இருக்கின்ற இராணுவ லான்ஸ் கோப்ரல் சோமரத்ன ராஜபக்ஷ அவர்கள் மிகத் தெளிவாகக் குறிப்பிட்டிருக்கின்றார். ஆனால், அவருடைய சாட்சியங் களைப் பெற்றுப் பதிவுசெய்து, அவரை அங்கே அழைத்துச் சென்று அந்த இடங்களை அடையாளப்படுத்த முயற்சிப்பதில் அரசாங்கம் பின்னடிப்பதாகவே எங்களுக்குத் தெரிகிறது.

குறிப்பாக, ஒரு பாரிய மனிதப் பேரவலம் அங்கே நடந்திருக் கின்றது; மனிதர்கள் அடித்துக் கொல்லப்பட்டிருக்கிறார்கள்; அவர்களுடைய எலும்புகள் நொருக்கப்பட்டு கூட்டங் கூட்டமாக அவர்கள் புதைக்கப்பட்டிருக்கிறார்கள். இறந்த வர்களை அடக்கம் செய்வதில் இந்துக்களுக்கு என்று ஒரு நடைமுறை இருப்பது உங்களுக்குத் தெரிந்திருக்கும். இறந்தவர்களை அவர்கள் உடுப்பில்லாமல் புதைக்க மாட்டமார்கள். அத்துடன், புதைக்கும்போது அதற்கென்று ஒரு திசை இருக்கிறது. இறந்தவருடைய தலையைத் தெற்குத் திசை நோக்கி வைத்து, அந்த இடத்திலே அந்தத் திசை நோக்கித் தங்களுடைய வணக்க முறையை செய்துதான் அவர்கள் இறந்த உறவினரின் உடலத்தை அடக்கம் செய்வார்கள். நீதிமன்றக் கட்டளையின் பிரகாரம் இரண்டு தடவை செம்மணி சிந்துபாத்தி இந்து மயானத்தை நான் சென்று பார்த்தபொழுது, அங்கே வெவ்வேறு திசைகளில் - அது வடக்காக இருக்கலாம், கிழக்காக இருக்கலாம் அல்லது மேற்காக இருக்கலாம் - கூட்டங்கூட்டமாகக் கும்பலாகப் பல இடங்களிலே மனிதர்கள் அடித்துத் தாக்கப்பட்டு, எலும்புகள் உடைக்கப்பட்டுப் புதைக்கப்பட்டிருப்பதைக் காணமுடிந்தது.

குறிப்பாக, அங்கே முழுமையாகக் கண்டெடுக்கப்பட்ட எலும்புக்கூட்டுத் தொகுதிகள் 583; அதைவிட ஐம்பதிற்கும் மேற்பட்ட குவியலிலே அடையாளம் காணப்பட்ட எலும்புக் கூட்டுத் தொகுதிகளில் 50 சதவீதத்திற்கும் மேலானவை 12 வயதுக்குட்பட்ட சிறுவர்களுடையது. இந்தச் சிறுவர்களுக்கு என்ன நடந்தது? கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அவர்கள் இந்த நாட்டில் யுத்தம் செய்தார்களா, ஆயுதம் தூக்கினார்களா? ஏன் அவர்களை இவ்வாறு அடித்து நொறுக்கி, எலும்புத் துண்டங்களாகப் புதைத்திருக்கின் றார்கள்? ஆகவே, இதுவொரு மிக மோசமான சம்பவம். இதே மாதிரித்தான் பல இடங்களில் நடந்திருக்கின்றன. குறிப்பாக, கொக்கிளாயில், மன்னார் 'சதொச' கட்டிடப் பகுதியில், மன்னார் திருக்கேதீஸ்வரம் பகுதியில், கிளிநொச்சி கணேசபுரத்தில் எல்லாம் மனித எலும்புக்கூட்டுத் தொகுதிகள் கண்டெடுக்கப்பட்டிருக்கின்றன. ஆனால், அவை இன்னும் சரியாக அடையாளப்படுத்தப்படவில்லை. உதாரணமாக, முல்லைத்தீவு மாவட்டத்தினுடைய கொக்கிளாயிலே கண்டுடெடுக்கப்பட்ட நாற்பதுக்கும் மேற்பட்ட மனித எலும்புக்கூட்டுத் தொகுதிகளில் பல மனித எலும்புக்கூடுகளின் மண்டையோடுகள் வாய்கள் பிளந்தபடியே - வாய்கள் 'ஆ' வென்றபடி - இருப்பதைக் காட்டும் படங்கள் வெளிவந்ததை இந்த நாட்டில் பலரும் அறிவார்கள். அதற்குக் காரணம், அவர்கள் குற்றுயிரோடு அல்லது துடிக்கத் துடிக்கத்

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

தாக்கப்பட்டிருக்கிறார்கள் என்பதுதான். அதில் கூடுதலான வர்கள் பெண் போராளிகள்தான் என்று சொல்லப்படுகிறது. தாக்கப்பட்ட நிலையில் வாய்கள் திறப்பது என்பது, ஒரு மனிதனுடைய உடல் உணர்வோடு இருக்கும்போதுதான் அப்படி நடக்கும். வாய் திறந்தபடியே அவர்கள் தாக்கப்பட்டு இருக்கிறார்கள். ஆனால், இவற்றுக்கான சரியான ஆய்வுகள் இன்னும் செய்யப்படவில்லை. இதற்கான நிதியை வழங்கு வதற்கு அரசாங்கம் ஏன் இன்னும் தயங்குகிறது என்று எனக்கு விளங்கவில்லை.

மூன்றாவது கட்டமாகவும் மேற்கொள்ளப்பட்ட செம்மணி, சிந்துபாத்தி இந்து மயானத்தின் ஆய்வுகள் 110 நாட்கள் நடைபெற்று முடிந்திருக்கின்ற நிலையில் அங்கே இன்னுமிருக் கின்ற புதைகுழிகள் பற்றி ஆய்வுகள் மேற்கொள்ளப்பட வேண்டுமானால், நீதிமன்றத்தில் எடுக்கப்படும் முடிவுகளுக் கமைய அரசாங்கம் அதற்கான நிதியை வழங்க வேண்டும். நான் இந்த உயர்ந்த சபையினூடாக அரசாங்கத்திடம் கேட்கிறேன், அரசாங்கத்திடம் நிதி இல்லை என்றால், இந்தியா, அமெரிக்கா போன்ற வெளிநாடுகளிடமும் ஐரோப்பிய ஒன்றிய நாடுகளிடமும் மனித உரிமை அமைப்புக் களிடமும் அதனைக் கோர வேண்டும். உங்களுக்கு அது கடினமாக இருந்தால், நான் இந்த உயர்ந்த சபையினூடாக அமெரிக்கா, இந்தியா, கனடா போன்ற உலக நாடுகளிடமும் ஐரோப்பிய ஒன்றியத்திடமும் நான் மிகவும் விநயமாக இந்தக் கோரிக்கையை முன்வைக்கிறேன். தோண்டி எடுக்கப்பட்ட மனித எலும்புக்கூடுகளைத் தொடர்ந்தும் ஆய்வுசெய்து, நடந்தது என்ன? என்ற உண்மை கண்டறியப்பட வேண்டும். தென்னாபிரிக்கா, யப்பான் போன்ற நாடுகள் இதிலே அதிக கரிசனை கொண்டிருக்கின்றன. ஆகவே, அரசாங்கம் அந்த நாடுகளுடைய உதவியைப்பெற்று இந்த ஆய்வைத் தொடர்ந்தும் மேற்கொள்வதற்கான முயற்சிகளை மேற்கொள்ள வேண்டும் என்பதை நான் இந்த இடத்திலே வலியுறுத்துகின்றேன்.

குறிப்பாக, குழந்தைகளுடைய எலும்புக்கூடுகளை ஆய்வு செய்து, அவர்களுக்கு நடந்தது என்ன? அதுவும் யுத்த காலத்திலே அவர்கள் எவ்வாறு கொல்லப்பட்டார்கள்? என்பதை அறிய வேண்டும். இதனைத்தான் 1995ஆம் ஆண்டிலிருந்து 2003ஆம் ஆண்டுவரை ஆய்வுசெய்து, 2003ஆம் ஆண்டு ஒக்ரோபர் 28ஆம் திகதி தேவநேசன் நேசையா தலைமையிலான குழு அந்த Reportஐச் சமர்ப்பித்திருந்தது. அந்த அறிக்கையானது மிக முக்கியத்துவம் வாய்ந்தது. ஆனால், இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு இதனைத் தொடர்ந்து முன்னெடுத்துச் செல்ல முயற்சிக்க வில்லை. நான் Dr. தேவநேசன் நேசையா தலைமையிலான குழு சமர்ப்பித்திருந்த குறித்த அறிக்கையின் பிரதியை இந்தச் சபாபீடத்தில் ***சமர்ப்பிக்கின்றேன்**.

அதேபோல இன்னுமோர் அறிக்கையையும் அவர்கள் வெளியிட்டிருந்தார்கள். குறிப்பாக மனித உரிமைகள் ஆணைக்குழு திரும்பவும் கோப்ரல் ஆர்.டி. சோமரத்தின ராஜபக்ஷ, லெப்டினன் துடுகல மற்றும் கப்டன் லலித்ஹேவா உட்பட 19 இராணுவ மற்றும் பொலிஸைச் சேர்ந்தவர்களை விசாரணைக்கு உட்படுத்தியிருந்தார்கள். அவர்களிடம் மேற்கொள்ளப்பட்ட விசாரணை அறிக்கைகளுடைய விபரங்களும் இங்கே இருக்கின்றன. யார் யாரை, எப்போது மனித உரிமைகள் ஆணைக்குழு விசாரணை செய்தது என்ற விபரம் திகதி வாரியாக இருக்கின்றது. ஏன், இவை வெளியிலே கொண்டுவரப்படவில்லை? இவற்றுக்கான நீதி ஏன் கிடைக்கப் பெறவில்லை? இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு ஏன் இவற்றைச் சரியான முறையிலே முன்வைக்கவில்லை? அவ்வாறு விசாரணை செய்யப்பட்டவர்களின் பெயர்ப் பட்டியலின் பிரதியையும் நான் இந்தச் சபையிலே ***சமர்ப்பிக்கின்றேன்**.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அரசாங்கம் இதய சுத்தியோடு இந்த விடயங்களின் உண்மைத் தன்மையைக் கண்டுபிடிக்க முன்வர வேண்டும். அதாவது, அதனைச் செய்வதற்கு உங்களிடம் ஓர் உளத் திருப்தி இருக்க வேண்டும்; மனிதாபிமானம் இருக்க வேண்டும். நடந்த உண்மையை வெளிக்கொணர்வதற்குச் சரியான ஒரு தெளிவு நிலையை அரசு முன்வைக்க வேண்டும். ஆனால், அரசிடம் அந்த எண்ணம் குறைவாக இருப்பதாகவே நான் நினைக்கிறேன். இதுவரையும் நாங்கள் அவதானித்த அளவிலே அரசாங்கம் அதைச் சரியாகக் கடைப்பிடிக்கத் தவறியிருக்கிறது.

குறிப்பாக, செம்மணி சிந்துபாத்தி மயானத்திலே ஏற்கெனவே அடையாளம் காணப்பட்ட இடங்களைத் தவிர, எழுமாற்றாக 12 இடங்களில் பரிசோதனைக் குழிகள் தோண்டப்பட்டன. அதிலே 3 - 4 குழிகளிலிருந்து புதிதாக எலும்புக்கூடுகள் கண்டெடுக்கப்பட்டு இருக்கின்றது. ஆகவே, குறிப்பிட்ட அந்த இடத்தைத் தவிர, அதாவது அந்த மயானத்தின் மதிலைத் தாண்டி வெளியிலுள்ள இன்னும் பல இடங்களிலும் மனித எலும்புக்கூடுகள் இருக்கக்கூடிய சந்தர்ப்பம் அதிகமாகவே இருக்கிறது. சோமரத்ன ராஜபக்ஷவின் மனைவியால் ஜனாதிபதிக்குச் சமர்ப்பிக்கப் பட்ட கடிதத்திலே, செம்மணியில் ஏற்கனவே அடையாளம் காணப்பட்ட அந்த இடத்தைத் தவிர, அங்குள்ள கோயிலுக்கு முன்னால் உள்ள இன்னும் பல வயல்வெளிகளில் கொலைசெய்து புதைக்கப்பட்டவர்களின் தடயங்களைத் தன்னால் அடையாளம் காட்ட முடியும் என்று சோமரத்ன ராஜபக்ஷ எழுதியிருக்கிறார். ஆகவே, உண்மைகளை வெளியிலே கொண்டுவர, நீதியை நிலைநாட்ட, நீதிமன்றக் கட்டளையோடு அவரை அழைத்துச் சென்று, அவர் அடையாளம் காட்டுகின்ற இடங்களையும் ஆய்வுக்கு உட்படுத்த வேண்டும் என்பதைத்தான் நான் இந்த இடத்திலே குறிப்பிடுகின்றேன்.

குறிப்பாக, அந்த இடத்திலே ஆய்வுகளை மேற் கொள்வதிலே, யாழ்ப்பாண மாவட்டத்தினுடைய நீதியரசர்கள், யாழ்ப்பாண மாவட்டத்தினுடைய நீதித் துறையோடு சார்ந்தவர்கள், அங்கு வேலைசெய்த பல்வேறு நிபுணர்கள், அவர்களோடு இணைந்திருக்கின்ற பல பல்கலைக்கழக மாணவர்கள் மற்றும் அங்கிருக்கின்ற பேராசிரியர் ராஜ் சோமதேவா உட்படப் பலர் மழை, வெயில் பார்க்காமல் பல நெருக்கடிகளுக்கு மத்தியில் இதற்கான பணிகளைத் தொடர்ந்து இவ்வளவு காலமும் செய்துவந்திருக்கிறார்கள். நீதிவான் உட்பட அவர்கள் அத்தனைபேருடைய பணியையும் நாங்கள் இந்த இடத்திலே நன்றியோடு பார்க்கிறோம்.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

நான் அரசாங்கத்திடம் ஒரு கோரிக்கையை முன்வைக்கின்றேன். எலும்புக்கூடுகள் மற்றும் எச்சங்களின் sampleஇனை எடுத்து அமெரிக்காவுக்கு அனுப்பி, C-14 என்ற முறையின் மூலம்தான் அடையாளம் காணமுடியும் என்றொரு விளக்கத்தையும் அங்கிருக்கின்றவர்கள் குறிப்பிடுகின்றார்கள். ஏற்கெனவே மன்னார் 'சதொச' போன்ற இடங்களில் இவ்வாறு கண்டெடுக்கப்பட்டு அனுப்பப்பட்ட sample - மாதிரிகள் தொடர்பில் இதுவரையும் எந்த முடிவும் சொல்லப்படவில்லை. ஆனால், 583 எலும்புக்கூடுகள் கண்டெடுக்கப்பட்டு இருக்கின்ற இடத்தில், ஐந்து - ஆறு மாதிரிகளை மாத்திரம் ஆய்வுக்கு அனுப்பினால், உண்மை வெளியிலே வராது! குறைந்தது எடுக்கப்பட்ட 583 எலும்புக்கூட்டுத் தொகுதிகளில் 100க்கும் மேற்பட்ட மாதிரிகளாவது ஆய்வுக்காக அனுப்பப்பட வேண்டும்; அதற்கான நிதியை அரசாங்கம் வழங்க வேண்டும். அரசாங்கத்திடம் நிதி இல்லையென்றால், வேறு நாடுகளிட மாவது அந்த நிதியைப் பெற்று வழங்குவதன்மூலம்தான் உண்மையை வெளிக்கொண்டுவர முடியும். இந்த அரசாங்கத் திடம் நீதி இருக்கிறது, இந்த அரசாங்கம் உண்மைகளைக் கண்டறிந்து, நீதியை நிலைநாட்ட நினைக்கின்றது என்றால், கண்டிப்பாக 110 நாட்களாக செம்மணியிலே மேற்கொள்ளப் பட்ட ஆய்வுகளின் பிரகாரம், மிகவும் மோசமாக அடித்துத் தாக்கிக் கொல்லப்பட்ட தமிழ் மக்களுடைய உடல்களைப் புதைத்த இடங்களை அடையாளம் கண்டு வெளியிலே எடுக்கப்பட்ட எலும்புக்கூட்டுத் தொகுதிகளின் கால நிர்ணயத்தைத் தீர்மானிக்கக்கூடிய, விஞ்ஞான மயப்படுத்தப் பட்ட மாதிரிகளை அல்லது அதிகளவு மாதிரிகளை ஆய்வுக்காக அனுப்பி, விஞ்ஞானபூர்வமாக இதன் உண்மைத்தன்மை வெளிக்கொணரப்பட வேண்டும். அப்போதுதான், இதன் உண்மைகள் சரியான முறையிலே மக்களைச் சென்றடையும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டிலே பாதிக்கப்பட்டவர்கள் தமிழர்கள்; அவர்கள் கொல்லப்பட்டிருக்கிறார்கள். கொல்லப்பட்ட தமிழர்களுடைய உடலங்கள் மற்றும் எலும்புக்கூடுகள் பல இடங்களில் கண்டெடுக்கப்படுகின்றது. ஆகவே, இதற்கான நீதியை வழங்கவேண்டியது அரசாங்கத்தினுடைய கடமை. அதனைச் செய்வதற்கு நீங்கள் தயாராகுங்கள்! நீங்கள் அதற்கான நிதியைத் தேடுங்கள்!

இதனைவிட, 20 ஆண்டுகளுக்கு முதல் யாழ்ப்பாணம், அல்லைப்பிட்டியிலே யுத்தம் காரணமாக மக்கள் கொல்லப் பட்ட காலகட்டத்தில் அந்த இடத்திலே பங்குத் தந்தையாகப் பணியாற்றிய அருட்தந்தை ஜிம் பிறவுண் அடிகளார் பண்ணையிலே இருந்த இராணுவக் காவலரணைக் கடந்து அல்லைப்பிட்டிக்குச் சென்று கொண்டிருந்தபொழுது, அல்லைப்பிட்டியிலே இருந்த இராணுவ முகாமில் உள்ளவர்களாலும் அவர்களோடு இருந்த ஒட்டுக்குழுவின ராலும் கைது செய்யப்பட்டார். அவர் கொல்லப்பட்டாரா அல்லது காணாமல் ஆக்கப்பட்டாரா என்பது தெரியாது. ஆனால், நேற்றைய தினம் யாழ்ப்பாணம், அல்லைப்பிட்டி மண்ணிலே அவருக்காகக் கத்தோலிக்கத் தந்தையர் மற்றும் கத்தோலிக்க அருட்சகோதரிகள் இணைந்து ஒரு போராட்டத்தை முன்னெடுத்திருக்கிறார்கள்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

அவர்களால் சர்வதேச சமூகத்துக்கும் அரசாங்கத்துக்கும் வழங்கப்பட்ட கடிதத்தின் பிரதியை நான் இந்தச் சபாபீடத் துக்குச் ***சமர்ப்பிக்கின்றேன்**.

ஆகவே, இந்த மரணங்களுக்கான நீதி கிடைக்கத் தயவுசெய்து தொடர்ந்தும் நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டும்; அரசாங்கம் இதை நீதியோடு அணுக வேண்டும் என்பதை நான் மிகவும் விநயமாக வலியுறுத்துகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. R.M. Jayawardhana. You have ten minutes.

[අ.භා. 2.03]

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මේ අවස්ථාවේ අපේ ගරු අජිත් අගලකඩ මන්ත්‍රීතුමා සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, ඉදිරියේදී බලපාන එල් නිනෝ තත්ත්වය යටතේ ඇති වන දේශගුණික සහ කාලගුණික වෙනස්කම් ලංකාවට කොහොමද බලපාන්නේ, ඒ තත්ත්වය මත පදනම් වෙලා ජනතාවට ඇති වන පීඩාව දුරු කිරීම වෙනුවෙන් රජයක් හැටියට අපි මැදිහත් වෙන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව සාකච්ඡා කරන්නට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ එල් නිනෝ තත්ත්වය පිළිබඳව මීට මාස කිහිපයකට කලින් ලෝකයේ විවිධ පරිසර සංවිධාන, කාලගුණ විද්‍යාඥයන් ඒ වාගේම කාලගුණ මධ්‍යස්ථාන විසින් නිවේදන නිකුත් කළා. අනාගතයේදී, නැත්නම් ඉදිරි කෙටි කාලයක් තුළ ලෝකයේ බොහෝ රටවලට එල් නිනෝ තත්ත්වය බලපාලා, ඒ තුළින් සමාජයට, නැත්නම් ජන ජීවිතයට, සතුන්ට සහ පරිසරයට හානියක් වෙනවා කියන එක කිව්වා. ඒ අනුව ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුරෝපාකරයේ ඇති වෙච්ච ඒ වෙනස්කම් නිසා මිනිස් ජීවිත විශාල ප්‍රමාණයක් අහිමි වුණා;

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

ප්‍රංශයේ විතරක් මිනිස් ජීවිත 2,000කට වැඩි ප්‍රමාණයක් නැති වුණා අපි දැක්කා. මේ සියලු දේවල් පිළිබඳව කාලගුණ විද්‍යාඥයන් ඉදිරිපත් කරන අදහස් පිළිබඳව වාගේම අපේ රට ඇතුළේ ඇති වෙමින් තිබෙන කාලගුණික විපර්යාස පිළිබඳව ආණ්ඩුව හැටියට අපි අධ්‍යයනය කරනවා, සොයා බලනවා. ඒ සොයා බැලීම විසින් අපට හරියට පුරෝකථනය කර ගන්න ඕනෑකම තිබුණා, මේ තුළින් සමාජයට, නැත්නම් මහජනතාවට ඇති වන පීඩාව මොකක්ද කියලා. ඒ අනුව මේ ඇති වන තත්ත්වය පිළිබඳ තොරතුරු පදනම් කරගෙන රජයක් හැටියට කොහොමද මේකට මුහුණ දෙන්නේ කියන ප්‍රශ්නය පිළිබඳව කථා කරන්න අවශ්‍ය සාකච්ඡා මේසයක් ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කළා සහ ඒ ගැන කථා කළා. අපි ඒ ආරම්භ කරපු පළමුවෙනි අදියරේම එක පැත්තකින් ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජූලි මාසයේදී වැඩ කටයුතු ආරම්භ කරලා, ඊළඟට දිස්ත්‍රික්කවලට අදාළව දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම් කැඳෙව්වා. ඒ රැස්වීම්වලදී, විශේෂයෙන් මේ ඇතිවන කාලගුණික විපර්යාස හරහා මහජනතාවට ඇති වන ජල හිඟය, කෘෂිකර්මාන්තයට වන බලපෑම, පානීය ජල ප්‍රශ්නය ආදියට කොහොමද මුහුණ දෙන්නේ කියන එක පිළිබඳව සාකච්ඡා කරලා වැඩ පිළිවෙළක් සකස් කරන්න තීන්දුවක් ගත්තා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැක්කා, සමහර අය එල් නිනෝ එනවා කියනකොට එල් නිනෝ එකටත් එහා ගිහිල්ලා, මේ ආණ්ඩුව මේකට මොකක්ද කරන්නේ කියලා ප්‍රශ්න කරන්න ගත්තා. මේ සභාව ඇතුළෙත් සමහර අය ප්‍රශ්න කළා, මේ එන තත්ත්වය පිළිබඳව. ගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් ජූලි මාසයේ 20වෙනි දා ඒ අදාළ කමිටුව කැඳවලා, ඒ කමිටුව ගත්ත තීන්දු තීරණ, නැත්නම් කමිටුව හඳුනාගත්ත සමහර කාරණා පිළිබඳව මාධ්‍ය හරහා සමාජය දැනුවත් කළා, අපි මේකට මුහුණ දෙන විධිය පිළිබඳව. ඊළඟට, නැවත වතාවක් අගෝස්තු මාසයේ 17වැනි දා කමිටුව රැස්වෙලා, 18වැනි දා ප්‍රකාශයට පත් කළා කොහොමද එල් නිනෝ තත්ත්වයට මුහුණ දෙන්නේ කියලා. නැවත කමිටුව රැස් වෙන්න යොදාගෙන තිබෙනවා අගෝස්තු මාසයේ 31වැනි දා.

මා දන්නා තරමින් සහ තොරතුරු මත පදනම්ව ගත්තොත්, මොනරාගල දිස්ත්‍රික්කයේ තමයි එල් නිනෝ තත්ත්වය නිසා ඇති වෙලා තිබෙන දේශගුණික බලපෑමෙන් මේ වෙනකොට දැවැන්ත ලෙස පීඩාවට පත් වෙච්ච වැඩිම ජනතාවක් ඉන්නේ. එම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණනාවක, ග්‍රාම නිලධාරි වසම් 56කට ආසන්න සංඛ්‍යාවක් යම් විධියකට මේ තත්ත්වයට මුහුණ දීලා තිබෙනවා. මඩුල්ලේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයක්, තණමල්විල 3ක්, මොනරාගල 10ක්, බඩල්කුඹුර 6ක්, සියඹලාණ්ඩුව 15ක්, බුත්තල 1ක්, මැදගම 19ක්, බිබිලේ 1ක් වශයෙන් ග්‍රාම නිලධාරි වසම් 56ක් මේ තත්ත්වයට මුහුණ දීලා තිබෙනවා. ජනගහනය අතින් ගත්තොත් 33,000කට අධික ප්‍රමාණයක් මේ ප්‍රශ්නයට මුහුණ දීලා සිටිනවා. ඒ වාගේම පවුල් හැටියට ගත්තොත් දහදහස් ගාණකට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න වෙලා තිබෙනවා.

අපි මැදිහත් වෙලා පසුගිය ජූලි මාසයේ 31වැනි දා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ විශේෂ රැස්වීමක් කැඳවලා මේ ජනතාව වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කළා, දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන්. ඊට සතියකට කලිනුත් දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් කැඳෙව්වා. ඊට පස්සේ අපි, දේශපාලන අධිකාරියත් මැදිහත් වෙලා 31වැනි දා රැස්වීමක් කැඳෙව්වා. එහිදී අපි වැඩ පිළිවෙළක් හැදුවා. ඒ වැඩ පිළිවෙළ ඇතුළේ සියලු ප්‍රාදේශීය සභා සම්බන්ධ කර ගත්තා, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සම්බන්ධ කර ගත්තා. ඒ වාගේම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වාගේ ආයතන සියල්ල ඒකාබද්ධ කරලා, මේ අර්බුදයට මුහුණ දීලා සිටින ජනතාවගේ ගැටලු විසඳන්න, විශේෂයෙන් පානීය ජල ප්‍රශ්නය විසඳන්න වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. ඒ සකස් කළ වැඩ පිළිවෙළ තුළ මේ වෙනකොට මොනරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රාජ්‍ය ආයතනවලට ජලය සැපයීම ප්‍රාදේශීය සභා මඟින් කරනවා. ග්‍රාමීය මට්ටමින් ජනතාවට ජලය ලබා දීම ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් වෙනම කරනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙනම ජල සැපයීම කරනවා. ඊට අමතරව ප්‍රාදේශීය සභා සියල්ලම තමන් සතු බවුසර් 28කින් මේ වෙනකොට වතුර බෙදන්න පටන් අරගෙන තිබෙනවා; බවුසර් 28ක් වැඩ කරනවා. ඒ බවුසර් 28න් වතුර බෙදන්න ජල මූලාශ්‍ර ඕනෑ. කුඩා වැව් විශාල වශයෙන් සිඳී ගිහින් තිබෙනවා. අපට වතුර ගන්න පුළුවන් ප්‍රධාන වැව් තිබෙන්නේ කුඩා ප්‍රමාණයක්. ඒ අනුව අපි ජල මූලාශ්‍ර අලුතින් හඳුනා ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කළා. එකක් හැටියට  දැනට අත්හැරලා තිබෙන නළ ළිං ප්‍රතිසංස්කරණය කරන්න යෝජනාවක් ගෙනාවා. ඒ අනුව දැනට සැලසුම් කරලා තිබෙනවා සෑම එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම අවම වශයෙන් පාවිච්චි කළ හැකි, එහෙත් දැනට පාවිච්චි කරන්නේ නැතිව අත්හැරලා තිබෙන, නැත්නම් යම් විධියට අකර්මණ්‍ය වෙලා තිබෙන නළ ළිං 10 බැගින් ප්‍රතිසංස්කරණය කරලා වතුර ගන්න පුළුවන්ද කියලා බලන්න.

ඊළඟට, දැනට අත් හැරලා තිබෙන පොදු ළිං ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන වැඩ පිළිවෙළක් සාකච්ඡා කළා. ඒ අනුව දැන් මොනරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සැලකිය යුතු ළිං ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කරලා, පිරිසිදු කරලා පානීය ජලය ගන්න පුළුවන් මට්ටමට හදලා තිබෙනවා. අනෙක් කටයුතු පිළිබඳවත් සාකච්ඡා කරලා වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒ අනුව අපේ ආණ්ඩුව එල් නිනෝ තත්ත්වයට මුහුණ දීම සඳහා අපේ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි මුළු රටේම දිස්ත්‍රික්ක 9ක විතර සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විපක්ෂයේ සමහර අය අවස්ථා ගණනාවකදීම කියනවා මම දැක්කා, "එල් නිනෝ තත්ත්වයෙන් ඇති වෙන බලපෑම පිළිබඳව ආණ්ඩුවට සූදානමක් නැහැ, ආණ්ඩුවට වැඩ පිළිවෙළක් නැහැ, ඒක කලින් දකින්නේ නැහැ, වැඩේ වුණාට පස්සේද මේකට උත්තර සොයන්නේ?" ආදී වශයෙන්. ඒ අයට අපි කියන්න ඕනෑ ආණ්ඩුව මේක කලින් දැක්කා, ලෝකයේ අලුතින් එන අදහස් මතවාද ඒකට එකතු කර ගත්තාය කියන එක. ලෝකයේ දත්ත මත පදනම්ව ගරු ජනාධිපතිතුමා විශේෂ අවධානය යොමු කරලා, ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය, පරිසර අංශය වාගේ හැම ක්ෂේත්‍රයකම ඇමතිවරු එකතු කරලා අමාත්‍ය අනුකමිටුවක් හැදුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අමාත්‍ය අනුකමිටුවට අමතරව, එල් නිනෝ තත්ත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීමට විශේෂ කමිටුවක් පත් කරලා, දිස්ත්‍රික් සංවර්ධන කමිටු කැඳවලා හදිසි තත්ත්වයක්  තුළ ගත යුතු ක්‍රියාමාර්ග සාකච්ඡා කර තිබෙනවා. ඒ වාගේම මෙමඟින් කෘෂි කර්මාන්තයට වන බලපෑම සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය එක්ක සාකච්ඡා කරලා, අවශ්‍ය වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. මේ අනුව පෙනෙනවා, ආණ්ඩුව නිශ්චිත වශයෙන්ම මේ තත්ත්වයට මුහුණ දෙන්නේ කොහොමද කියන වැඩ පිළිවෙළ සමග ඉදිරියට යන බව.

ඒ විතරක් නොවෙයි, අපි විශ්වාස කරනවා මෙයට මුහුණ දීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගන්න කොට අපට අභියෝග එන්න පුළුවන් බව. මේ ව්‍යසනයෙන් පීඩාවට පත් වන ජනතාවට සහන දෙන්නේ කොහොමද, ඒ සහන දීම පිළිබඳ යම් යම් සාකච්ඡා ඇති කර ගෙන ප්‍රතිපාදන වෙන් කරන්නේ කොහොමද යන්න පිළිබඳ

විධිමත් සාකච්ඡාවක්, විධිමත් වැඩ පිළිවෙළක් නිශ්චිත වශයෙන් සකස් කරමින් තිබෙන වෙලාවක තමයි අප මේ යෝජනාව අද ඉදිරිපත් කරන්නේ. ඒකට හේතුවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි දන්නවා මේ තිබෙන තත්ත්වය ක්‍රමානුකූලව වර්ධනය වෙලා මුල් කාලයේදී මාස එකහමාරක් විතර ඒ ආකාරයෙන් පවතින බව. ලබන පෙබරවාරියේ ඉඳලා මාස තුනක විතර කාලයක් මෙම එල් නිනෝ තත්ත්වයෙන් යම් ප්‍රබල බලපෑමක් එන්න පුළුවන් කියන අදහසක් විශේෂයෙන්ම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරනු ලබනවා. ඒ නිසාම අපි ඒකට ගැළපෙන විධියටයි සියලු සැලසුම් සකස් කර ගනිමින් තිබෙන්නේ.

ආණ්ඩුවක මූලික වගකීම, ආණ්ඩුවක මූලික කාර්යභාරය නිශ්චිත වශයෙන් ඉෂ්ට කරන්න පුළුවන් වාගේම, ඉෂ්ට කරන ආණ්ඩුවක් දැන් කටයුතු කරමින් තිබෙනවා. කවුරු හරි කියනවා නම් මේ ආණ්ඩුව කලින් සූදානම් වන්නේ නැහැ, කලින් ලැහැස්ති වෙන්නේ නැහැ කියලා, එසේ කියන අයට අපි කියන්න ඕනෑ, මේ ආණ්ඩුව කලින් දැකලා, කලින් සැලසුම් කරලා, කලින් හඳුනා ගත්තු වැඩ පිළිවෙළක් තුළ ජනතාව පීඩාවට පත් නොවන ආකාරයට වැඩ කරන්නේ කොහොමද කියලා තීන්දු තීරණ ගන්නා ආණ්ඩුවක් වන බව. අපි දැන් ඒ විධියට සියලු කටයුතු සූදානම් කර තිබෙනවා. ඒ බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Bhagya Sri Herath. You have five minutes.

[අ.භා. 2.13]

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්තුතිවන්ත වෙනවා මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව.

පෙරේදා මේ ගරු සභාවේදී ගරු විපක්ෂ නායකතුමා විසින් කාරණයක් මතු කරනු ලැබුවා. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සඳහා පාර්ලිමේන්තුව තුළ නීතිඥ සංගමයේ දේශනයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බව දන්වූ එතුමා එම වැඩසටහනට සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනාවක් කළා. ඉන් අනතුරුව, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට දැනුවත්භාවයක් ලබා දීම සඳහා වැඩසටහනක් කිරීමට නීතිඥ සංගමයට පවතින හැකියාව මේ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට බඳුන් වුණා. ඒ අනුව ගරු සභානායකතුමා පැහැදිලි කළා, කිසිදු අවස්ථාවක එවැනි ආකාරයේ ඉල්ලීමක් නීතිඥ සංගමය විසින් ගරු කථානායකතුමා වෙත හෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය වෙත සිදු කර නැති බව. ඒ වාගේම මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් එකතු කරලා ඒ ආකාරයේ දේශන පැවැත්වීම සඳහා නීතිඥ සංගමයට කිසිදු අයිතියක් නොමැති බව පවතින තත්ත්වය අනුව, පවතින නීතිමය තත්ත්වය සහ කාර්ය පටිපාටි අනුව පැහැදිලි කළා. ඉන් අනතුරුව ඒ පිළිබඳව පාර්ලිමේන්තුව තුළ යම් සංවාදයක් ගොඩනැඟුණා.

ඊට පසුව, ඊයේ නැවත සංවාදයක් මතු වුණා. මොකද, නීතිඥ සංගමයේ සභාපතිතුමා විසින් විපක්ෂ නායකතුමා වෙත ලිපියක් නිකුත් කර තිබෙනවා. ඒ ලිපියේ සඳහන් වෙනවා, තර්ජනයක් - "threat" එකක් - සිද්ධ වුණා, එම නිසා එම දේශනය සඳහා පැමිණෙන්නේ නැති බව. කෙසේ වෙතත්, මාධ්‍ය විසින් විමසීමේදී එය "threat" වෙන්නත් පුළුවන්, "thereat" වෙන්නත් පුළුවන් කියලා එම වචනය ගැන නැවත ප්‍රශ්නයක් පවතින බව සඳහන් කළා. ඉන් අනතුරුව, නැවත එය "threat" ම තමයි කිව්වා. ඒ කියන්නේ, මේ පාර්ලිමේන්තුව ඇතුළේදී තර්ජනයක් සිදු කළා කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මමත් නීතිඥවරයෙකු විධියට නීතිඥ සංගමය නියෝජනය කරනවා. මමත් ඒ නීතිඥ සංගමයේ සාමාජිකයෙක්. මගේත් සභාපති ඔහුයි. අපි මේ පාර්ලිමේන්තුවේ පෙරේදාත් හිටියා, ඊයේත් හිටියා. මේ පාර්ලිමේන්තුව තුළදී ප්‍රශ්න කෙරුණේ, සංවාදයට බඳුන් වුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දේශනයක් දීම සඳහා හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කැඳවා එක තැනක තියාගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා නීතිඥ සංගමයට හෝ වෙනත් කුමන ආකාරයේ සංගමයකට පවතින අයිතිය හෝ ඒ සඳහා පවතින ඉඩ ප්‍රස්ථාව කුමක්ද කියන කාරණය ගැනයි. එහි කිසිදු ආකාරයක තර්ජනාත්මක ස්වරූපයක් තිබුණේ නැහැ. පවතින නීතිමය තත්ත්වය අනුව ඒ සඳහා තිබෙන අයිතිවාසිකම් සම්බන්ධයෙන් සහ නීතිය සම්බන්ධයෙන් තමයි සාකච්ඡාවට බඳුන් වුණේ.

නමුත්, වර්තමානයේ ඇති වෙලා තිබෙන තත්ත්වය තමයි, තර්ජනයක් නිසා පාර්ලිමේන්තුවට නොපැමිණි බවට නීතිඥ සංගමයේ සභාපතිවරයා විසින් ලිපියකින් සඳහන් කරලා තිබීම. ඒ අනුව ඉහත කී "වචනය" ප්‍රශ්නයක් වෙලා, අවසානයේදී එය තර්ජනයක් බව සඳහන් කරනවා. නීතිඥවරයෙකු වන මගෙන් දැන් අනෙක් නීතිඥවරු විමසනවා, මේ පාර්ලිමේන්තුවේදී එවැනි තර්ජනයක් වුණාද කියලා. සාමාන්‍ය ජනතාවත් එය විමසනවා. නීතිඥ සංගමයත් ජනතාවට වග කියන, ජනතාවටම බැඳුණු සමාජයේම පවතින එක කොටසක්. එයට තර්ජනයක් සිද්ධ වුණාද කියලා මහ ජනයාත් විමසනවා. ඒ මොහොතේ මේ පාර්ලිමේන්තුවේ අපි හිටියා. කිසිදු ආකාරයක එවැනි තර්ජනයක් සිදු වුණේ නැහැ. දැන් අපි නීතිඥ සංගමයේ සභාපතිතුමාගෙන් විමසීමක් කරන්න කැමැතියි. මොකද, එතුමාට මේ පාර්ලිමේන්තුවට එන්න බැහැ කියලා ලිපියකින් විපක්ෂ නායකතුමා දැනුවත් කරන්න තරම්, මේ පාර්ලිමේන්තුව තුළදී ප්‍රබලව තර්ජනයක් වුණාය කියන නිසා. විශේෂයෙන්ම විපක්ෂයත් කියනවා, තර්ජනයක් සිද්ධ වුණා කියලා. ඒ තර්ජනය වුණේ කොහොමද, මොන ආකාරයෙන්ද වුණේ, කුමන වචනවලින්ද සිද්ධ වුණේ කියන එක මේ සමාජයට, මේ රටට දැනුවත් කිරීමේ වගකීමක් නීතිඥ සංගමයේ සභාපතිතුමාට තිබෙනවා. එතුමාගේ ලියුම ලියලා දැන් පැය 24ක් ගත වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් මිනිස්සු විමසනවා. ඒ කියන්නේ, රටේ ජනතාව බලාපොරොත්තුවෙන් ඉන්නවා, මේ පාර්ලිමේන්තුව තුළ නීතිඥ සංගමයට එරෙහිව සිද්ධ වෙච්ච තර්ජනය කුමක්ද කියා දැන ගන්න. ඒ නිසා අපි එතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඒ ගැන නීතිඥ සංගමය පැත්තෙන් පිළිතුරක් ලබා දෙන්න කියලා. ඒ වාගේම පිළිතුරක් ලැබෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ ගරු අග්‍ර විනිශ්චයකාරතුමා පදනම් කරගෙන විපක්ෂයේ මන්ත්‍රීවරියක් ප්‍රශ්නයක් මතු කළා. Website එකක තිබෙන තොරතුරු යැයි සඳහන් කරමින්, එකතු කර ගත් තොරතුරු ටිකක් ඉදිරිපත් කරලා, ගරු අග්‍ර විනිශ්චයකාරතුමාට දැඩි ලෙස වාග් ප්‍රහාරයක් එල්ල කළා. ඒ ගැන ආණ්ඩු පක්ෂයෙන් විමසීමක් කළා, මේ කරන අගෞරවය සම්බන්ධයෙන් නීතිඥ සංගමයේ ස්ථාවරය මොකක්ද කියලා. අපි ඒ ගැනත් දැන ගන්න කැමැතියි. මොකද, අග්‍ර විනිශ්චයකාරතුමෙක් කිසිදු දවසක මේ පාර්ලිමේන්තුව ඇතුළේ

[ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා]

මේ විධියට අපහාසයට ලක් වෙලා නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් නීතිඥ සංගමයේ ස්ථාවරයත්, නීතිඥ සංගමයට වුණාය කියන තර්ජනය මේ පාර්ලිමේන්තුව තුළ මොන විධියටද වුණේ, එය කාගෙන්ද වුණේ, මොන වචනවලින්ද වුණේ කියන එකත් මේ රටේ මිනිසුන්ට දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන්න කියා මම ඉතාම ගෞරවයෙන් දැනුම් දෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you get an extra two minutes.

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊයේ විපක්ෂයේ ඒ මන්ත්‍රීතුමිය විසින් පදනම් විරහිතව, කිසිදු ආකාරයකට කරුණු තහවුරු කර ගැනීමකින් තොරව, ඒ වාගේම ඉතාම අපහාසාත්මකව එම ප්‍රකාශය මේ පාර්ලිමේන්තුව තුළ සිදු කරනු ලැබුවා. ඒ ප්‍රකාශය තුළ තිබෙන්නේ, සම්පූර්ණයෙන්ම අධිකරණ පද්ධතියට කරන අභියෝගයක්. එය මේ පාර්ලිමේන්තුව තුළ සිද්ධ වෙන්නේ, පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට මුවා වෙලා. හැබැයි, වරප්‍රසාදවලින් ලද අයිතියක් තිබෙන නිසාය කියලා ඕනෑම දෙයක් කියන්න අයිතියක් නැහැ. ඒ වාගේම තමයි, විපක්ෂ නායකතුමාගේ පැත්තෙනුත් අදහසක් එන්න ඕනෑ. මේ වාගේ ප්‍රකාශයක් අග්‍ර විනිශ්චයකාරතුමාට එරෙහිව කරන කොට එතුමාත් මේ ගැන දැනුවත් වෙන්න ඕනෑ. මොකද, එතුමිය එතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරියක්. මේ වාගේ ප්‍රකාශයක් ඉදිරිපත් කරන කොට ජනතාව බලාගෙන ඉන්නවා. මොකද, මේ අධිකරණ පද්ධතිය කෙරෙහි ලංකාවේ ජනතාව ඉතාම ඉහළින් විශ්වාසය තබා තිබෙනවා. ඒ වාගේම අපට පෙනෙනවා, අධිකරණ ක්‍රියාවලිය පිළිබඳව. අපි අධිකරණය ඇතුළේ සිද්ධ වන ක්‍රියාවලිය ඉතාම හොඳින් අධ්‍යයනය කරනවා; නිරීක්ෂණය කරනවා. මේ රටේ මිනිසුන්ට අධිකරණ ක්‍රියාවලිය පිළිබඳව විශ්වාසයක් තිබෙනවා. එකී විශ්වාසය කඩ වන පරිදි මෙවැනි ප්‍රකාශ පදනම් විරහිතව කරද්දී, ඒ ප්‍රකාශ සම්බන්ධයෙන් නීතිඥ සංගමයටත් අදහසක් තිබෙන්න ඕනෑ. නීතිඥ සංගමය මේ මොහොතේ පෙනී ඉන්නේම අධිකරණ ක්ෂේත්‍රයේ ස්වාධීනතාව වෙනුවෙන්. ඒ අය අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් තමයි පෙනී සිටින්නේ. අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන්ම පෙනී සිටිනවා නම්, අධිකරණයේ ස්වාධීනත්වයට එරෙහිව කරන මේ ප්‍රකාශ සම්බන්ධයෙන් නීතිඥ සංගමය පැත්තෙන් අදහසක් එන්න ඕනෑ කියලායි මා හිතන්නේ. ඒ නිසා මම නැවත මතක් කරනවා, මේ උත්තරීතර සභාව ඇතුළේ කවුරු හරි කෙනෙකුට තර්ජනයක් වුණාද කියන එක දැන ගන්න මේ රටේ මිනිස්සු බලාගෙන ඉන්න බව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පවතින ස්ථාවර නියෝග සහ පවතින නීතිමය තත්ත්වය සහ සම්ප්‍රදායයන් විමසීම, ප්‍රශ්න කිරීම තර්ජනයක් ලෙස දකිනවා නම් ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා පෙරේදා මේ උත්තරීතර සභාව ඇතුළේ නීතිඥ සංගමයට එරෙහිව කරපු තර්ජනය කුමන ආකාරයේ, කුමන වචනවලින්, කවුරුන් විසින් කළාද කියන එක නීතිඥ සංගමය විසින් මේ රට හමුවට ඉදිරිපත් කරයි කියන බලාපොරොත්තුව අපට තිබෙනවා. ඒ අනුව අපි විශ්වාස කරනවා, ඔවුන් එය ඉදිරිපත් කරයි කියලා. මට මේ කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.20]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මට මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දෙමළ ජාතික සන්ධානයේ ගරු මන්ත්‍රීතුමා කථා කරද්දී කිව්වා චෙම්මනි මිනී වළවල් ගැන. ඇත්තටම මේ රටේ කාගේ හෝ මනුස්සයෙකුගේ ජීවිතයක් අහිමි වුණා නම් ඒ හැම ජීවිතයකටම වගවීමක්, වගකීමක් ඇතිව ඒ හැම ජීවිතයක් පිළිබඳවම කරුණු සොයා බැලීමක් කරන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ හැමදාම චෙම්මනි මිනී වළවල් ගැන කථා කරනවා. හැබැයි, තිස් වසරක කුරිරු ත්‍රස්තවාදය නිසා දමිළ වෙන්න පුළුවන්, මුස්ලිම් වෙන්න පුළුවන්, සිංහල වෙන්න පුළුවන් ජීවිත විශාල ප්‍රමාණයක් මේ රටට අහිමි වුණා. ඒ වාගේම ඉස්ලාම්, කතෝලික, බෞද්ධ වෙන්න පුළුවන්, කුමන ආගමක වුවත් ජනතාව සමූලඝාතනය වුණා. සමූලඝාතනය වෙච්ච ඒ ජනතාව පිළිබඳවත් පරීක්ෂණ කරන්න ඕනෑ, ඒ ජනතාව වෙනුවෙනුත් සාධාරණය ඉෂ්ට කරන්න ඕනෑය කියන කාරණය මම මේ මොහොතේ කියන්න ඕනෑ. ඒ හැම කරුණක් පිළිබඳවම හොයනවා වාගේම චෙම්මනි මිනී වළවල් ගැනත් හොයන්න ඕනෑ.

ඒ වාගේම අපට අමතක කරන්න බැහැ, මේ රටේ විශිෂ්ට මානුෂික මෙහෙවරක් කරපු, මානුෂික මෙහෙයුමක් කරපු අපේ ගෞරවනීය ත්‍රිවිධ හමුදාව. ඔවුන් අවසන් සටනේදී ඒ ජනතාව බේරා ගත්තු ආකාරය අමතක කරමින් අපට කථා කරන්න බැහැ කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

ඒ වාගේම මේ මොහොත අපි සියලුදෙනාම ඉතා ශෝකයට පත් වෙච්ච වෙලාවක්. ගී පද රචක අපේ රඹුකන සිද්ධාර්ථ නායක ස්වාමීන් වහන්සේ අප අතරින් සමු ගත්තා. උන් වහන්සේට නිවන් සුවය ප්‍රාර්ථනා කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම මේ රටේ විශිෂ්ට ගායන ශිල්පිනියක විධියට කටයුතු කරපු, දශක ගණනාවක් තිස්සේ අපේ සිත්සතන් ගීතයෙන් අමානන්දයට පත් කරපු, නිහතමානි සරල දිවි පෙවතක් ගත කරපු අපේ නන්දා මාලනී මහත්මියටත් නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නියඟය කියන්නේ ස්වාභාවික උපද්‍රවයක් කියන කාරණය ඔබත් මමත් අපි සියලුදෙනාම පිළිගන්නා කාරණයක්. හැබැයි නියඟය ස්වාභාවික සංසිද්ධියක් වුණත්, ඒ නිසා ජනතාවට විඳවන්න නොදී කටයුතු කිරීම ආණ්ඩුවේ වගකීමක් කියන කාරණය මම මේ මොහොතේ

සිහිපත් කරන්න ඕනෑ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව එල්නිනෝ තත්ත්වයක් පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම් කරද්දිත්, ආණ්ඩුව ආපදා පූර්ව සූදානම සහිතව අවශ්‍ය විකල්පවලට ඇවිල්ලා නැහැ කියන එකයි අපට පෙනෙන්නේ. අපට තවම පෙනෙන්නේ නැහැ, ආණ්ඩුව ඒ සඳහා ලොකු සූදානමක් වෙන බවක්. ආණ්ඩුව විනිශ්චයකාර මහත්ම මහත්මීන්ගේ සේවා කාලය දික් කරන්න ගන්න වෙහෙස, වෑයම, ඒ දරන උත්සාහය, ඉතාම නුදුරේදී මේ රටට විශාල විපතක් බවට පත් වෙන එල්නිනෝ තත්ත්වයෙන් මිදෙන්න කටයුතු කරන ආකාරය තුළ අපි දකින්නේ නැහැ. එම නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, ඔබ අධිකරණය වෙනුවෙන් ගන්න ඒ උත්සාහය, මේ රටේ මිනිස්සු ජීවත් කරවන්න, මේ රටේ මිනිස්සු අනාගතයේදී මුහුණ දෙන මහා කටුක අත්දැකීමෙන් ගලවා ගන්න කටයුතු කිරීම සඳහා යොදා ගන්න කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තර්කානුකූලව බැලුවොත් මේ අර්බුදයේ ප්‍රධාන අංග කිහිපයක් තිබෙනවා. එකක් තමයි, පානීය ජල අර්බුදය. දෙක තමයි, කෘෂිකාර්මික අවදානම සහ ආහාර සුරක්ෂිතභාවය. ඒ වාගේම පාංශු සම්පත් සහ වන ජීවී අංශය, දේපළ හා සත්ව විනාශය. ආණ්ඩුව මීට වඩා ඇස් ඇරලා මේවා කෙරෙහි අවධානය යොමු කරන්න කියලා අපි ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. විපක්ෂයක් විධියට අපි ඔබත් සමඟ මේ කටයුත්තේදී එකට හිට ගෙන ජනතාව මුදා ගන්න අපට කරන්න පුළුවන් ඉහළම කාර්යභාරය කරනවාය කියන කාරණයත් සිහිපත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අර්බුදය අස්සේ යුද්ධ හමුදා මූලස්ථානයේ උපකරණ මාස්ටර් ජනරාල් ශාඛාවෙන් 2026 අප්‍රේල් 23 දිනැති ලිපිය නිකුත් කරමින් සෑම හමුදා කඳවුරකටම නියෝගයක් නිකුත් කර තිබෙනවා, දවසට පැය දෙකක් අනිවාර්යයෙන්ම විදුලිය විසන්ධි කරන්න කියලා. ඒ ලිපියෙන් නියෝග කර තිබෙන විධියට වියළි කාලගුණික තත්ත්වයක් හමුවේ උතුරු නැඟෙනහිර සහ වියළි කලාපයේ උෂ්ණත්වය අංශක 35ට, 40ට නඟින වෙලාවේ දවල් දෙක, තුන කාලයේ විදුලිය කැපුවාම ඒ කඳවුරුවල ඉන්න රණවිරුවන් කොච්චර පීඩාවට පත් වෙනවාද කියන කාරණය අපි අහන්න කැමැතියි. රාත්‍රී කාලයේ හමුදා කඳවුරුවල විදුලිය විසන්ධි කළාම කඳවුරුවල ආරක්ෂාවට වෙන තර්ජනය ගැන ආරක්ෂාව භාරව ඉන්න ඇමතිවරයාට වෙනම අමුතුවෙන් පැහැදිලි කරන්න අවශ්‍ය නැහැ. එම නිසා බලශක්තිය පිටින් දාලා උතුරේ හමුදා කඳවුරුවල ආරක්ෂාව බිඳ හෙළන්න එපා කියලාත් අපි මේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පොඩි වෙලාවක් අරගෙන මේ කරුණත් පැහැදිලි කරන්න උත්සාහ ගන්නවා. විශේෂයෙන්ම කොරියානු රටට යන්න බලාපොරොත්තු වෙන අපේ රටේ තරුණ තරුණියන් විශාල අර්බුදයකට මුහුණ දී සිටිනවා. අපි දිගින් දිගටම මේ කාරණය මේ පාර්ලිමේන්තුවේදී කථා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඔවුන්ගේ සියලු බලාපොරොත්තු බිඳ හෙළමින් තිබෙනවා. ආණ්ඩුවක් විධියට ඒ සඳහා ඔබ කරන කාර්යභාරය තවම කරලා නැහැ. විශේෂයෙන් 2023 අවුරුද්දේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් කොරියානු රැකියා සඳහා සේවා 1 සහ සේවා 2 ලෙස ලංකාවේ ප්‍රථම වතාවට අංශ දෙකකින් අයදුම්පත් කැඳෙව්වා. මේ සඳහා මේ රටේ තරුණ තරුණියන් 5,900ක් ඉල්ලුම් කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වෙනුවෙන් 2024 මාර්තු මාසයේ තරග විභාගයක් පැවැත්වුවා. ඒ තරග විභාගයෙන් 2,568දෙනෙක් සමත් වුණා. ඒ 2,568දෙනාම විභාගය සමත් වෙලා, වෛද්‍ය පරීක්ෂණ කරලා, සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වෙලා, නිපුණතා පරීක්ෂණයෙන් සමත් වෙලා, පොලිස් වාර්තා සියල්ල ලබා දීලා අද ඔවුන් සියලුදෙනාගේම නම් වෙබ් එකේ තිබෙනවා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වන විට කෙමෙන් කෙමෙන් මේ තත්ත්වය ඉතාම කනගාටුදායක තත්ත්වයට පත් වෙලා තිබෙනවා. 2026 වසරේ මේ වෙනකොටත් කොරියානු රැකියා සඳහා විභාගය සමත් වෙච්ච 2,568දෙනාගෙන් විදේශගත වෙන්න අවස්ථාව ලැබිලා තිබෙන්නේ 38දෙනාටයි. අවුරුදු තුනක් ගතවෙලාත් 38දෙනාටයි ඒ අවස්ථාව ලැබිලා තිබෙන්නේ. ඉතුරු තරුණ තරුණියන්ගේ ගිවිසුම් කාලය අවසන් වෙමින් අද ඔවුන් විශාල ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන තිබෙන බරපතළම ප්‍රශ්නය මෙයයි. සේවා අංශයේ රැකියා ඇබෑර්තු නැත්නම් ඇයි විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඔවුන් සේවා 1 සහ සේවා 2 ලෙස පළමු කණ්ඩායමට තරග විභාග තියලා මේ විධියට අත්හදා බැලීම් කරන්නේ? මේ තරුණයන් එක්ක සෙල්ලම් කරනවාද කියලා අපි අහන්න කැමැතියි. එවැනි අත්හදා බැලීම් කරන්න එපා කියලා අපි කියා සිටිනවා. ඔවුන්ට අවස්ථාව ලබා දෙන්න ඕනෑ. රැකියා ගිවිසුම් ලබා දෙන්න බැරි නම්, අහිංසක තරුණ තරුණියන්ගේ මුදලුයි, වසර ගණනාවක කාලයයි, ශ්‍රමයයි සලකා බලා කටයුතු කරන්න ඕනෑ. ඔවුන් කරපු රස්සාවලින් අයින් වුණා. අද ඔවුන්ගේ ජීවිත ඉතා පල්ලෙහා තත්ත්වයට පත් වෙලා, ඔවුන්ට අද රස්සා නැති නිසා. අද ඔවුන් බලාපොරොත්තුවෙන් ඉන්නවා කොරියානු රටට යන්න. අද ඔවුන් විශාල ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙමින් තිබෙනවා. මේ අසරණ තරුණ තරුණියන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ගිහින් විමසන හැම වෙලාවකම ඒ කාර්යාංශය මඟ හරිනවා. රාජ්‍ය අංශයකට එහෙම කටයුතු කරන්න පුළුවන්ද? තොරතුරු දැන ගැනීමේ පනතින් අහලාත් තවම ඒ තරුණ තරුණියන්ට තොරතුරු දීලා නැහැ. මේ ළමයින්ගෙන් බහුතරයක් නැවත කොරියානු රැකියාවලට අයදුම්පත් දාන්න බැරි වයස් සීමාවට ඇවිල්ලා. ඒ අය බොහෝ දෙනෙකුට විදේශ රැකියාවකින් තොරව වෙනත් රැකියාවකට යන්න අවස්ථාව නැති වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔවුන්ට නැවත වතාවක් විභාගයට මුහුණ දෙන්න අවස්ථාව ලැබුණත් ඔවුන්ගේ වයස් සීමාව ඉක්මවලා තිබෙනවා. තමන්ගේ මුළු අනාගතයම ඒ වෙනුවෙන් කැප කරපු ඒ තරුණ පරපුර අද දැඩි මානසික ඇද වැටීමකට ලක් වෙලා ඉන්නේ. එහෙම වෙලාවක ආණ්ඩුවක් විධියට මේ ගැන වසර එකහමාරක් තිස්සේ සොයා බලන්නේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නය අපි හැමෝටම තිබෙනවා. ඒ සඳහා ඇයි තානාපති සේවා සක්‍රිය කරන්නේ නැත්තේ කියන කාරණය අපට ගැටලුවක්. මේ අර්බුදය විසඳන්නේ කොහොමද කියන එක ගැන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට කිසිම උත්තරයක් නැත්තේ ඇයි කියන කාරණය අපි අහන්න කැමැතියි. මේක දේශපාලන විධියට ගන්න එපා. මනුෂ්‍යත්වයේ නාමයෙන් මේ කටයුත්ත ගැන අවධානය යොමු කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chanaka Madugoda, your time is up.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පසුගිය කාලයේ පැවති අර්බුදය සහ සේවා අංශයේ පැවති ගැටලුව සලකා බලලා දැනට වෙබ් අඩවියේ සිටින මේ පිරිසගේ කාලය දීර්ඝ කරලා දෙන්න මැදිහත් වෙන්න කියලා ඉතාම

[ගරු චානක මාදුගොඩ මහතා]

ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම අනෙක් කාරණය මේකයි. ඔවුන්ට සේවා 2 අංශයේ රැකියා ලබා දීමට අපහසුවක් තිබෙනවා නම් ඒකට විකල්පයක් ලෙස මේ පිරිස නිෂ්පාදන, ධීවර හෝ E-8 Visa category එක යටතේ තිබෙන කෘෂි කර්මාන්තය වැනි දැනට ඇබෑර්තු පවතින වෙනත් අංශවලට මාරු කරලා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම මේ ආණ්ඩුවෙන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා. නැවත විභාගය ලියන විට ඔවුන්ට වයස් සීමාව බාධාවක්ව තිබෙනවා. ඒක නිසා ඔවුන්ට නැවත විභාගයක් ලියන්න බැහැ. මේක ඔවුන්ගේ අවසාන අවස්ථාව. ඒ නිසා කොරියානු රැකියාවලට යන්න බලාපොරොත්තුවෙන් ඉන්න මේ තරුණ තරුණියන්ගේ ගැටලුව ගැන සංවේදී වෙන්න. ආණ්ඩුවක් විධියට ඒ ගැන බලන්න. ඒ තරුණ තරුණියන්ගේ ඒ බලාපොරොත්තුව ඉෂ්ට කරන්න මැදිහත් වෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ගෞරවනීය ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sunil Rathnasiri. You have nine minutes.

[අ.භා. 2.31]

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1950 මැයි මාසයේ 22වැනි දා මෙලොව උපත ලද පූජ්‍ය රඹුකන සිද්ධාර්ථ හිමියන් අදින් දින කීපයකට පෙරාතුව අප අතරින් වියෝ වෙලා අද දවසේ උන්වහන්සේගේ අවසාන කටයුතු සිදු වෙනවා. මුළුමහත් සංඝ රත්නයට අමිල සේවයක් සිදු කළ රඹුකන සිද්ධාර්ථ හිමියන්ට රටක් විධියට අපේ ගෞරව ප්‍රණාමය පුද කර සිටිනවා.

1943 අගෝස්තු 23වැනි දා මෙලොව උපත ලද "නන්දා මාලනිය" නම් "දේශයේ යශෝරාවය" ඊයේ නිහඬ වුණා. විශේෂයෙන්ම ජීවිතයේ විවිධ දුක් ගැහැටවලට, දුක්ඛ දෝමනස්සවලට ලක්වුණත් කිසි දවසක තමන් වෙනුවෙන් යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට කරන ලෙස ඉල්ලා නොසිටි ඇය අපේ රටේ විවිධ අවස්ථාවල විවිධ පීඩාවලට ලක් වුණු ජනී ජනයා වෙනුවෙන් එතුමියගේ උදාර හඬ අවදි කළා. එක් අවස්ථාවක පාලකයන්ගේ රුදුරු භීෂණය මුළුරටම වෙළාගෙන සිටියදීත්, ඝාතකයන් ඇයට පිටුපසින් අවි අමෝරාගෙන නැඟී සිටියදීත්, ඇය නොබියව දේශය වෙනුවෙන් මෙසේ ගීත ගායනා කළා.

"සඟ වෙද ගුරු ගොවි කම්කරුවන්, නීතිවේදියන් ලේඛකයන්, එඩිතර අංකුර නායකයන්, දරු දැරියන් නව යෞවනයන්, බිලිගත් ඝාතකයා කවුරුද කියා දියත් ලංකා ඉතිහාසයේ... "

එවැනි ඝාතන සංස්කෘතියක් අපේ රට පුරාම නිර්මාණය වෙලා තියෙද්දි ඒ ඝාතකයන්ට එරෙහිව මෙවැනි ගීත ගායනා කරන්නට හැමෝටම බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකට අප්‍රමාණ ශක්තියක්, තමන්ට වඩා අනෙකා පිළිබඳව සෙනෙහසක්, ආදරයක් තිබෙන හදවතක් තිබෙන්නට ඕනෑ.

ඒ වාගේම, මෑත කාලීනව පාස්කු ප්‍රහාරය සිද්ධ වෙලා අහිංසක, අසරණ, නිරායුධ ජනතාව 300කට ආසන්න ප්‍රමාණයක් මිය ගිහිල්ලා 500කට ආසන්න ප්‍රමාණයක් සදාකාලිකව ආබාධිත වෙද්දි ඇය ඔවුන් වෙනුවෙනුත් මේ අයුරින් ගීත ගායනා කළා.

"සුසානය මැද සොහොන් කොත් මත වැලපෙද්දී
ස්වාමිවරු සිය බිරිඳ දරුවන් අහිමි වූ
කුරිරු ඝාතක රැළම නිදහස් සුව විඳී
නොලැබ දඬුවම් රටට පිටුපා සිනාසී
කොහිද යුක්තිය, කොහිද ධර්මය කොහිද නීතිය විමසනු"

නන්දා මාලනිය වෙනුවෙන් ඉටු කරන්නට පුළුවන් යුක්තිය, සාධාරණය තමයි මේ රටේ අයුක්තියට, අසාධාරණයට ලක් වුණු ජනී ජනයා වෙනුවෙන් තමන්ට කළ හැකි උපරිමයෙන් යුක්තිය, සාධාරණය ඉෂ්ට කරන එක කියලා විපක්ෂයටත්, අපේ රටේ සමස්ත ජනතාවටත් අපි කියනවා. ඒක තමයි නන්දා මාලනිය වෙනුවෙන් කරන්නට පුළුවන් උපරිම ගෞරවය. ඒ වාගේම, ජීවත් වෙලා හිටපු වික්ටර් හාරාට වැඩිය, ජීවත් වෙලා හිටපු බොබ් මාලේට වැඩිය, ජීවත් වෙලා හිටපු මැක්සිම් ගෝර්කිට වැඩිය මිය ගිය බොබ් මාලේ, මිය ගිය වික්ටර් හාරා, මිය ගිය මැක්සිම් ගෝර්කි ප්‍රබල වුණු බව අපි මතක් කරන්නට ඕනෑ. ඒ වාගේම තමයි, මිය ගිය නන්දා මාලනිය ජීවත් වෙලා හිටපු නන්දා මාලනියට වැඩිය අතිශයින්ම ප්‍රබලයි කියලා අපි සපථ කර කියනවා.

අවසාන වශයෙන් එතුමියට ගෞරව පූර්වක ප්‍රණාමය සිදු කරමින් කියන්නට තිබෙන්නේ මෙයයි.

"සොඳුරු ගී බන්දා
සතුරු බල බින්දා
නමින් ඇ නන්දා
දේශයම ඒ නමට වැන්දා"

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එල් නිනෝ තත්ත්වය පිළිබඳව තමයි මේ අවස්ථාවේ අපි කථා කරන්නේ. විශේෂයෙන්ම විපක්ෂ නායකතුමා අද ඉතාම දරුණු ගණයේ ප්‍රකාශ දෙකක් කළා. ඉන් එකක් තමයි, කීරි සම්බාවලට මිලක් නියම කරලා කටයුතු කරන්නේ නැත්තේ මේ ආණ්ඩුවට ධන කුවේරයන් සමඟ සම්බන්ධයක් තිබෙන නිසාය කියපු එක. පොළොන්නරුවට ඇවිල්ලා ධන කුවේරයන් එක්ක, මහ මෝල් හිමියන් එක්ක ඩීල් දාගත්තේ කවුද කියලා ඇවිල්ලා බලන්න කියලා මම එතුමාට ආරාධනා කරනවා. ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රී ධුරය දෙන්නම් කියලා, කෘෂිකර්ම ඇමතිකම දෙන්නම් කියලා රුපියල් කෝටි 50ක් අරගෙන අඩුම ගණනේ මන්ත්‍රී ධුරයවත් නොදී හිටියේ කවුද කියලා පොළොන්නරුවේ ජනතාව දන්නවා. ඒ නිසා ඒගොල්ලන්ට තමයි එවැනි ගනුදෙනු තිබුණේ. ඒ වාගේම විපක්ෂ නායකතුමා කියනවා, මේ ආණ්ඩුව ගොවි ජනයාගේ ජීවිතයට ආර්ථික සංහාරයක් කරලා තිබෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ කාරණයත් මතක් කර දෙන්න ඕනෑ. ආණ්ඩුව, මේ රටේ ගොවි ජනතාවගේ වී මිලදී ගන්න, ගොවි ජනතාවගේ ජීවිතය යහපත් කරන්න, ඔවුන්ගේ දරුවන්ට සහන දෙන්න සුබසාධනය වෙනුවෙන් ලංකා ඉතිහාසයේ වෙන් කළ වැඩිම මුදල මේ යල කන්නයේ වෙන් කළා. ගොවි ජනතාවගේ වී මිලදී ගන්නත්, ඔවුන්ගේ සුබසාධනය සඳහාත් රුපියල් මිලියන 46,006ක් වෙන් කරලා තිබෙනවා. ඒ රුපියල් මිලියන 46,006න් සහතික මිලට වී ලබා ගන්න වී අලෙවි මණ්ඩලයට රුපියල් මිලියන 6,000ක් ලබා දුන්නා. ඒ වාගේම අඩු පොලියට සහතික මිලට වී ලබා ගන්න පෞද්ගලික අංශයට රුපියල් මිලියන 10,000ක් ලබා දුන්නා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බලයට එනකොට පොහොර සහනාධාරය තිබුණේ හෙක්ටෙයාරයකට රුපියල් 15,000යි. නමුත්, අපි බලයට ඇවිල්ලා හෙක්ටෙයාරයකට රුපියල් 25,000 දක්වා පොහොර සහනාධාරය වැඩි කළා. මැදපෙරදිග යුද තත්ත්වය නිසා නැවත රුපියල් 5,000ක් වැඩි කළා. ඒ අනුව අපි පොහොර සහනාධාරය රුපියල් 30,000ක් දක්වා වැඩි කළා. පොහොර සහනාධාරය සඳහා රුපියල් මිලියන 13,492ක් වෙන් කළා. මැදපෙරදිග අර්බුදය නිසා ඩොලර් 400ට තිබුණු පොහොර මෙට්‍රික් ටොන් එක ඩොලර් 800 ඉක්ම වූ අගයකට ගියා. රුපියල් 17,000කට පොහොර මිටිය අරගෙන රුපියල් 10,200ට ගොවියාට ලබා දුන්නා. අපි රුපියල් මිලියන 1,840ක් ඒ වෙනුවෙන් වෙන් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බලයට එන්න කලින් හෙක්ටෙයාරයකට රුපියල් 40,000යි වගා වන්දිය ගෙව්වේ. නමුත්, අපි බලයට ඇවිල්ලා හෙක්ටෙයාරයකට රුපියල් 150,000ක් වගා වන්දිය ගෙව්වා. ඒ වෙනුවෙන් අපි රුපියල් මිලියන 8,886ක් වෙන් කළා. ඒ විතරක් නොවෙයි, "දිට්වා" සුළි කුණාටුව නිසා සුළු වාරි පද්ධති විනාශ වුණා. අපි ඒ සඳහා රුපියල් මිලියන 5,586ක් වෙන් කළා. මේ විධියට ගොවීන්ගේ වී මිලදී ගන්න ඇතුළුව ගොවීන්ගේ සුබසාධනය සඳහා රුපියල් මිලියන 46,006ක ලංකා ඉතිහාසයේ වැඩිම මුදලක් වෙන් කළේ මේ ආණ්ඩුවෙන්. එතැනින් නතර නොවී ගොවීන්ගේ වී සහතික මිලට ගන්න රුපියල් මිලියන 7,500ක පරිපූරක ඇස්තමේන්තුවක් අද ඉදිරිපත් කර තිබෙනවා.

විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමා මැදිහත් වෙලා, සුළු පරිමාණ මෝල් හිමියන්, මහා පරිමාණ මෝල් හිමියන් කැඳවලා, සාකච්ඡා කරලා නාඩු වී කිලෝවකට රුපියල් 120ක සහතික මිලක් ලබා දුන්නා. වී මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 7,500ක මුදලක් වෙන් කරලා, ලංකා ඉතිහාසයේ පළමුවෙනි වතාවට කුඩා පරිමාණයේ මෝල් හිමියන්ට රුපියල් මිලියන 25ක ණයක් ලබා දෙනවා, සත පහක පොලියක් ගන්නේ නැතිව. මාස 8ක කාලයකට පස්සේ තමයි මේ ලක්ෂ 250 නැවත ගෙවන්නට තිබෙන්නේ. ඒ නිසා අපි ගොවීන්ට ලබා දෙන්නට පුළුවන් උපරිම සහන සාධාරණව ලබා දීලා තිබෙනවා.

හැබැයි, විපක්ෂ නායකතුමා කියන්නේ අපි ගොවීන් සමූල ඝාතනය කරලා තිබෙනවා කියලායි. ඒ නිසා අපි එතුමාට මේ කාරණය මතක් කර දෙන්නට ඕනෑ. 2019 එතුමන්ලා බලයේ සිටි කාලයේ නාඩු වී කිලෝවකට රුපියල් 38යි, සම්බා වී කිලෝවකට රුපියල් 41යි, කීරි සම්බා වී කිලෝවකට රුපියල් 41යි දුන්නේ. 2022දී නාඩු වී කිලෝවකට රුපියල් 90යි, සම්බා වී කිලෝවකට රුපියල් 92යි, කීරි සම්බා වී කිලෝවකට රුපියල් 95යි දුන්නේ. අපේ රටේ ගොවි ජනතාවට තවත් සහන දෙන්න ඕනෑ, ගොවි ජනයා නඟා සිටුවන්න ඕනෑ කියලා අපි කියනවා. තව තවත් සහන දීලා ගොවියාත්, ගොවියාගේ දරු පරපුරත් රැක බලා ගැනීම මාලිමාව ආණ්ඩුවේ වගකීම වෙනවා. ඇයි? ගොවියා අප කෙරෙහි මහත් වූ විශ්වාසයක් තබා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ වැඩිම බිම් ප්‍රමාණයක් වගා කරපු අවුරුද්ද තමයි, 2026 වර්ෂය. මෙම වර්ෂයේ හෙක්ටෙයාර 1,400,00කට අධික බිම් ප්‍රමාණයක් වගා කරලා තිබෙනවා. එය මෙතෙක් ලංකා ඉතිහාසයේ වැඩිම බිම් ප්‍රමාණයක් වගා කරපු වර්ෂය බවට පත් වෙලා තිබෙනවා. එම නිසා ගොවි ජනතාව රැක බලා ගැනීම ආණ්ඩුවේ වගකීමක්. ඒ වාගේම අපේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තබලා හෙක්ටෙයාර 1,400,00කට අධික බිම් ප්‍රමාණයක් වගා කිරීම සම්බන්ධයෙන් ගොවි ජනතාවට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) M.L.A.M. Hizbullah. You have eight minutes.

[பி.ப. 2.41]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நாட்டின் சில பிரதேசங்களில் நிலவும் வரட்சி நிலைமை தொடர்பான இன்றைய விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மிகவும் சந்தோசமடைகின்றேன். இன்றைய விவாதத் தலைப்புக்கு அப்பாற் சென்று, முஸ்லிம் சமூகத்தின் முக்கியமான சில விடயங்கள் தொடர்பாக இந்தச் சபையில் பேசலாமென நினைக்கின்றேன்.

1947ஆம் ஆண்டு அமரர் டி.எஸ். சேனாநாயக்க அவர்களின் தலைமையில் அமைந்த 14 அமைச்சர்களைக் கொண்ட முதலாவது அமைச்சரவையில் மர்ஹூம் கலாநிதி ரீ.பீ. ஜாயா அவர்கள் அங்கம்வகித்து, முதலாவது முஸ்லிம் அமைச்சராக இருந்தார். அதனைத் தொடர்ந்து, 1952ஆம் ஆண்டு அமரர் டட்லி சேனாநாயக்க அவர்களுடைய தலைமையில் அமைந்த அமைச்சரவையில் மர்ஹூம் டாக்டர் எம்.ஸீ.எம். கலீல் அவர்கள் அமைச்சராக இருந்தார். அதனைத் தொடர்ந்து, 1956ஆம் ஆண்டு எஸ்.டபிள்யூ.ஆர்.டி. பண்டாரநாயக்கா அவர்களுடைய ஆட்சியில் மர்ஹூம் சி.ஏ.எஸ். மரைக்கார் அவர்கள் முக்கியமானதொரு Cabinet Ministerஆக இருந்தார். அதனைத் தொடர்ந்து, 1970ஆம் ஆண்டு சிறிமாவோ பண்டாரநாயக்கா அம்மையாருடைய ஆட்சியில் மர்ஹூம் கலாநிதி பதியுத்தீன் மஹ்மூத் அவர்கள் அமைச்சராக இருந்தார். இப்படி கிட்டத்தட்ட 80 ஆண்டுகளாக அதாவது, 1947ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரை இருந்த ஒவ்வோர் அமைச்சரவையிலும் முஸ்லிம் ஒருவர் அல்லது இருவர் சில சந்தர்ப்பங்களில் ஐந்து பேர்கூட அமைச்சர்களாக இருந்திருக்கிறார்கள். ஆனால், அநுர குமார திஸாநாயக்க அவர்கள் சனாதிபதியாகப் பதவியேற்ற பின்னர் அமைக்கப்பட்ட அமைச்சரவையில் ஒரு முஸ்லிம்கூட அமைச்சராக நியமிக்கப்படவில்லை. இந்த விடயம் பற்றி நாங்கள் கேட்டபோது, எங்களுக்குச் சொல்லப்பட்ட பதில்தான், முஸ்லிம்களில் அனுபவமுள்ளவர்கள் அல்லது தகுதியானவர்கள் இருக்கவில்லை என்பது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தற்பொழுது இந்தச் சபைக்குத் தலைமைதாங்கிக்கொண்டு இருக்கின்ற நீங்கள் ஒரு MBBS Doctor. மிகச் சிறந்த ஒரு வைத்திய நிபுணர். அரசியல் பின்னணியைக் கொண்ட நீங்கள் நீண்ட காலமாக JVPஇல் அங்கத்தவராக இருக்கின்றீர்கள். அதேபோன்று, பொறியியலாளர் அர்கம் இல்யாஸ் அவர்கள் மொறட்டுவை பல்கலைக்கழகத்தில் BSc Engineer பட்டம் பெற்றவர்; நல்ல அனுபவமுள்ள ஒருவர். அதேபோன்று, எங்களுடைய பிரதி அமைச்சரான கௌரவ முனீர் முலாபர் அவர்கள் ஒரு BA பட்டதாரி. அதேபோன்று, எங்களுடைய அபூபக்கர் ஆதம்பாவா அவர்கள் B.Sc பட்டம் பெற்ற ஒரு Science graduate teacher. அதேபோன்று, கௌரவ எம்.கே.எம். அஸ்லம் அவர்களும் ஒரு பட்டதாரி ஆசிரியர். ஆளும் கட்சியிலுள்ள அநேகமான முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் மூன்று மொழிகளிலும் பேசக்கூடிய ஆற்றல் உள்ளவர்கள்.

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

அதுமாத்திரமல்ல, அவர்கள் சோமவன்ச அவர்களுடைய காலத்திலிருந்தே JVPஇல் இருக்கின்றவர்கள். இவர்களைவிட தகுதி குறைந்தவர்கள் உங்களுடைய அமைச்சரவையில் இருக்கிறார்கள். O/Level வரை படிக்காத, பாடசாலைக்குச் செல்லாதவர்கள்கூட உங்களுடைய அமைச்சரவையில் இருக்கிறார்கள். அதுமாத்திரமல்ல, A/Level பரீட்சை எழுதாத வர்கள் பலர் இருக்கிறார்கள். அதேபோன்று, டிப்ளோமா கற்கைநெறியை முடித்த பலர் இருக்கிறார்கள்.

ஆளும் தரப்பிலுள்ள முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் படித்தவர்கள்; மூன்று பாஷைகளிலும் பேசக் கூடியவர்கள்; பட்டங்களைப் பெற்றவர்கள். இவர்களை அமைச்சர்களாக நியமிப்பதில் எந்தப் பிரச்சினையும் இருக்க முடியாது. கடந்த 80 வருடங்களாக நாங்கள் அனுபவித்து வருகின்ற ஓர் உரிமைதான், இந்த நாட்டில் மிக முக்கியமான தீர்மானங்களை எடுக்கின்ற அமைச்சரவையில் முஸ்லிம் ஒருவர் உறுப்பினராக இருப்பது. இன்று அந்த உரிமை மறுக்கப்பட்டு இருக்கிறது.

இந்த அரசாங்க காலத்தில் பல குழுக்கள் மற்றும் ஆணைக்குழுக்கள் நியமிக்கப்பட்டுள்ளன. குறிப்பாக, கல்வி அமைச்சில் பல நியமனங்கள் இடம்பெற்று இருக்கின்றன. எனினும், அநேகமான குழுக்களில் முஸ்லிம்கள் உறுப்பினர் களாக நியமிக்கப்படாமை மிகவும் கவலையளிக்கிறது. கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அண்மையில் எல்லை நிர்ணய ஆணைக்குழு அமைக்கப்பட்டது. இந்த ஆணைக்குழு என்பது முக்கியமானதோர் ஆணைக்குழு ஆகும். இது இந்த நாட்டில் தேர்தல் மாவட்டங்களின் எல்லைகளை வரையறுப் பதற்காக சனாதிபதி அவர்களால் சட்டத்தின் பிரகாரம் நியமிக்கப்படும் ஓர் ஆணைக்குழு ஆகும்.

மூன்று பேரைக் கொண்டமைந்த இந்த ஆணைக்குழுவில், சுதந்திரம் கிடைத்த நாள் முதல் 2025ஆம் ஆண்டு வரை முஸ்லிம் ஒருவர் தொடர்ச்சியாக இருந்திருக்கிறார். 1959ஆம் ஆண்டு Governor Generalஆல் நியமிக்கப்பட்ட எல்லை நிர்ணய ஆணைக்குழுவில் எம்.ஏ. ஸத்தார் மரிக்கார் இடம்பெற்றிருந்தார். 1974ஆம் ஆண்டு அப்போதைய சனாதிபதியால் நியமிக்கப்பட்ட எல்லை நிர்ணய ஆணைக் குழுவில் ஷாஹுல் ஹமீத் மொஹமட் ஸுபைர் பாரூக் என்பவர் இடம்பெற்றிருந்தார். 1988ஆம் ஆண்டு நியமிக்கப் பட்ட எல்லை நிர்ணய ஆணைக்குழுவில் அப்துல் மஜீத் மொஹமட் சஹாப்தீன் அவர்கள் இருந்தார். கடைசியாக இருந்த இந்த ஆணைக்குழுவில் முன்னாள் செயலாளர் அஷ்ஷெய்க் அமீர் அவர்கள் இருந்தார். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த விடயம் தொடர்பான தகவல்கள் அடங்கிய ஆவணங்களை நான் சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்.**

இவ்வாறு எல்லை நிர்ணய ஆணைக்குழுவில் முஸ்லிம் ஒருவர் தொடர்ச்சியாக நியமிக்கப்பட்டு வந்திருக்கிறார். ஆனால், இந்த ஆட்சியில் மாண்புமிகு சனாதிபதி அவர்கள், மூன்று பேர் அடங்கிய அந்த ஆணைக்குழுவுக்கு இரண்டு சிங்கள சகோதரர்களையும் ஒரு தமிழ் சகோதரரையும் நியமித்திருக்கிறார். முதல் தடவையாக முஸ்லிம் ஒருவர் நியமிக்கப்படாமல், வேறு இனத்தைச் சேர்ந்த ஒருவர் அந்த இடத்துக்கு நியமிக்கப்பட்டு இருக்கிறார். இது தொடர்பில் நான் நேற்று முன்தினம் பாராளுமன்றத்தில் கேள்வி எழுப்பியபோது, கௌரவ பிரதம அமைச்சர் அவர்கள், "qualified persons இல்லை; அதனால்தான் நாங்கள் நியமிக்கவில்லை" என்பதாகக் கூறினார்.

அவர் இவ்வாறு கூறியது எங்களுக்கு மிகவும் கவலையாக இருக்கின்றது. "எல்லை நிர்ணய ஆணைக்குழுவில் இருப்ப தற்கு முஸ்லிம்களுக்குத் தகுதியில்லை" என்ற பிழையான செய்தியை இது வெளியில் உள்ளவர்களுக்குக் கொடுக்கும். தேர்தல் திணைக்களத்தில் சிரேஷ்ட உத்தியோகத்தர்களாகப் பணியாற்றிய முஸ்லிம்கள் இருக்கிறார்கள். அதேபோன்று, புவியியல் துறையில் சிறந்து விளங்குகின்ற முஸ்லிம்கள் இருக்கிறார்கள். ஏனெனில், புவியியல் துறையில் நிபுணத்துவம் பெற்ற ஒருவர் நியமிக்கப்பட வேண்டும். இப்பொழுது நியமிக்கப்பட்டுள்ளவரை விடவும், அனுபவமுள்ள ஒருவராக பேராதனை பல்கலைக்கழகத்தில் பேராசிரியராகக் கடமை யாற்றிய நவ்பல் அவர்கள் இருக்கிறார். அவர் இலங்கையில் mappingஇல் one of the experts; digital mapping செய்தவர். நிருவாக சேவை உத்தியோகத்தர்கள் என்று வருகின்றபோது, விஞ்ஞான தொழில்நுட்ப அமைச்சின் செயலாளராகக் கடமையாற்றிய அஷ்ஷெய்க் நவவி அவர்கள் இருக்கிறார். முன்னர் இந்த ஆணைக்குழுவில் கடமையாற்றிய அமீர் அவர்கள் இருக்கிறார். இப்படிப் பலர் இருக்கிறார்கள். மூன்று பாஷையும் தெரிந்த, தகுதியானவர்கள் இருக்கின்றபொழுது, பிழையான காரணங்களைச் சொல்லக் கூடாது.

இது எங்களுடைய உரிமை! கிட்டத்தட்ட 80 வருடங்களாக எங்களுடைய சமுதாயம் அனுபவித்து வருகின்ற உரிமை! இதை நாங்கள் எக்காரணம் கொண்டும் விட்டுக்கொடுக்க முடியாது. கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நாங்கள் இந்த விடயங்கள் பற்றி பேசினால், இனவாதிகள் என்றும் இனவாதம் பேசுகிறார்கள் என்றும் எங்களைப் பார்த்துச் சொல்கின்றார்கள். நாங்கள் இனவாதம் பேசவில்லை! ஓர் இனத்துக்கு இருக்கின்ற உரிமையை மறுக்கின்றபோது, அது பற்றி பேசவேண்டியது எங்களுடைய கடமை! ஏனெனில், எனக்கு வாக்களித்த மக்கள் என்னிடம் சொன்னதெல்லாம், "எங்களுடைய சமூகத்துக்காக நீ பேசு! முடியுமான அளவு எங்களுடைய சமூகத்தின் உரிமைகளைப் பெற்றுக்கொள்வதற்காக நீ போராடு!" என்றுதான்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அரசாங்கத்தில் இருக்கின்ற முஸ்லிம் உறுப்பினர்களே, இன்று நீங்கள் ஆட்சியில் இருக்கிறீர்கள்; நாங்கள் கடந்த காலங்களில் ஆட்சியில் இருந்தோம்; நாளை இன்னும் சிலர் வருவார்கள். இன்று நீங்கள் இவ்வாறான ஆணைக்குழுக்களிலும் அமைச்சரவையிலும் எங்களுடைய உரிமைகளை விட்டுக் கொடுத்து, அவற்றில் முஸ்லிம்களின் பிரதிநிதித்துவம் தேவையில்லை, யார் இருந்தாலும் பரவாயில்லை என்று தீர்மானித்துவிட்டால், அடுத்து வருகின்ற அரசாங்கங்களுக்கு முஸ்லிம்களை முற்றுமுழுதாக இந்த ஆணைக்குழுக்களில் இருந்தும் அமைச்சரவையில் இருந்தும் நீக்கிவிட்டு, தனியாகத் தீர்மானங்களை எடுப்பதற்கான சந்தர்ப்பத்தையே வழங்கு கின்றீர்கள். நீங்கள் எல்லோரும் அல்லாஹ்வுக்கு மறுமொழி சொல்லியாக வேண்டும். எங்களுடைய சமூகத்துக்குக் கிடைக்க வேண்டிய உரிமைகளைப் பெற்றுக்கொடுக்க வேண்டிய மிகப் பெரிய கடமை உங்களுக்கு இருக்கின்றது. இவை எங்களுடைய மூதாதையர்களான அறிஞர் சித்திலெப்பை, ரீ.பி. ஜாயா, டாக்டர் எம்.சீ.எம். கலீல்,

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

கலாநிதி பதியுத்தீன் மஹ்மூத், சேர் ராஸிக் பரீத், Advocate - எம்.சி. அப்துல் காதர் போன்றவர்கள் போராடிப் பெற்றுத்தந்த உரிமைகள்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Hizbullah, your time is up.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
முடிக்கிறேன்.

துருக்கித் தொப்பி அணிந்துகொண்டு நீதிமன்றத்துக்குச் சென்றபோது, துருக்கித்தொப்பி அணிந்து courtக்குள் வரக்கூடாதெனச் சொன்னபோது, Advocate - எம்.சி. அப்துல் காதர் அவர்கள் மிகப் பெரிய போராட்டத்தைச் செய்து, தொப்பி அணிந்து செல்லக்கூடிய உரிமையை எங்களுக்குப் பெற்றுத்தந்தார். எனவே, இந்த விடயத்தில் கௌரவ முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் கவனம் செலுத்த வேண்டும். இந்த நாட்டை யாரும் ஆட்சி செய்யலாம். ஆனால், எங்களுடைய பிரதிநிதித்துவத்தையும் உரிமைகளையும் பாதுகாக்க வேண்டியது எங்களுடைய கடமையாகும். நாங்கள் இனவாதம் பேசவில்லை. பிரதேச சபையில்கூட பிரதிநிதித் துவம் பெறமுடியாத சில சில்லறைகள் எங்களைப் பார்த்து 'இனவாதிகள்' என்று சொல்கிறார்கள். எங்களுடைய சமூகத்தின் பிரச்சினைகள் பற்றியும் உரிமைகள் பற்றியும் பேச வேண்டியது எங்களுடைய கடமை! அந்த அடிப்படையில்தான் நாங்கள் பேசுகின்றோம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, முஸ்லிம் பாராளுன்ற உறுப்பினர்கள் குறிப்பாக அரசாங்கத்தில் இருக்கின்ற முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் மாண்புமிகு சனாதிபதியோடும் மாண்புமிகு பிரதமரோடும் பேசி, எங்களுடைய உரிமைகளை நிலைநாட்ட வேண்டுமே ஒழிய, எந்தவொரு சூழ்நிலையிலும் எந்தக் காரணத்துக்காகவும் எங்களுக்கு வழங்கப்பட்ட உரிமைகளை இல்லாமலாக்கு வதற்கு உதவி செய்யக்கூடாதெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வஸ்ஸலாம்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Wasantha Piyathissa. You have ten minutes.

[අ.භා. 2.52]

**ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම මම මේ කාරණය කියන්න කැමතියි. මීට පෙර කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා පසුගිය මැතිවරණයේදී කිව්වේ, "ජාතික ජන බලවේගයට ඡන්දය දෙන්න එපා. පල්ලි යන්න බැරි වෙයි. රැවුල කපයි, කිසිම ආගමික නිදහසක් ලබා දෙන්නේ නැති අනාගාමික ජාතියක්" කියලායි. හැබැයි, අද වනකොට ඉතිහාසයේ පළමුවන වතාවට මේ රටේ සිංහල ජනතාව, දමිළ ජනතාව සහ මුස්ලිම් ජනතාව තමන්ගේ ආගම අදහමින්, තමන්ගේ සංස්කෘතික අනන්‍යතාව අනුව ජීවත් වෙමින් ශ්‍රී ලාංකික ජාතියක් විධියට ගොඩනැඟෙමින් සිටිනවා. ඒ අතරතුර, තමන්ගේ දේශපාලන බංකොලොත්භාවය වසා ගැනීම සඳහා අපි හීනෙකින්වත් හිතන්නේ නැති, අපේ අරමුණක්වත් නැති දේවල් උලුප්පා දමමින් ඉදිරිපත් කරන මේ අදහස් පිළිබඳව අප ඉතාම කනගාටු වෙනවා. අපි මේ රටේ සමස්ත ජනතාවට සහතික වෙනවා, ඒ අයගේ අයිතිවාසිකම් අප ආරක්ෂා කරනවා කියලා. දෙමළ ජනතාවගේ, සිංහල ජනතාවගේ සහ මුස්ලිම් ජනතාවගේත් අයිතිවාසිකම් අද වනවිට අහිමි වෙලා නැති බව අපට පෙනෙනවා. අද ඒ අයිතිවාසිකම් අහිමි වෙලා තිබෙන්නේ මුස්ලිම් ජනතාවගේ නොවෙයි. මුස්ලිම් ජනතාවත් එක්ක දේශපාලනය කරන, ඒ හරහා තමන්ගේ බලය නැවත වතාවක් අත්පත් කරගන්න වුවමනාවක් තිබෙන යම් පිරිසක් විසින් ඒ ජාතිවාදය අවුළුවා දමන්න උත්සාහ කරනවා, තමන්ගේ අයිතිවාසිකම් ටික නැති වෙලා යන නිසා. එහෙම නැතිව මේ රටේ කිසිදු මුස්ලිම් පුරවැසියෙකුගේ අයිතිවාසිකම් එදාට වඩා එක බින්දුවකින්වත් අද වනකොට අඩු වෙලා නැහැ. ඒ නිදහස තිබුණාට වඩා සිය දහස් ගුණයකින් අද වනකොට වර්ධනය වෙලා තිබෙනවාය කියන එක මම පළමුවෙන්ම මතක් කරන්න ඕනෑ.

අද විශේෂයෙන්ම මේ සභාව කල් තැබීමේ යෝජනාවේදී ඉදිරිපත් වෙන්නේ පැසිෆික් සාගර කලාපයේ උණුසුම ඉහළ යැමත් සමඟ ඇති වූ දේශගුණික විපර්යාස පිළිබඳවයි. ඇත්තටම මේ පිළිබඳව අදහස් දැක්වීම් විශාල ප්‍රමාණයක් සිද්ධ වුණා. ඇත්තටම මෙයින් කියැවෙන දේ මොකක්ද? ඒ පිළිබඳව ඉතා කෙටියෙන් මම කියන්නම්. විටෙක අධික පැවිල්ල, එහෙම නැත්නම් නියඟයත්, ඒ එක්කම එන අධික වර්ෂාපතනයත්, ඒ එක්කම නැවත වතාවක් විශාල නියඟයක් කෙටි කාලීනව දරුණු ලෙස එනවා කියන එක තමයි කාලගුණික ක්ෂේත්‍රයට අදාළ විද්‍යාඥයන්, උගතුන්, බුද්ධිමතුන් සහ විද්වතුන් කියන්නේ. ඒ අනුව එය අපේ කෘෂි කර්මාන්තයට, ආහාරපාන කෙරෙහි, ජන ජීවිතවලට, පානීය ජල අවශ්‍යතාවට බලපාන බව තමයි වර්තමාන ලෝකයේ මේ වනවිට පවතින සාකච්ඡාව. ඇත්තටම රජයක් විධියට, ආණ්ඩුවක් විධියට මෙය කල් තියාම අපි දැන ගත්තා. ඒ පිළිබඳව දැනුවත් වූ මොහොතේ සිට ගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් සහ මූලිකත්වයෙන් අදාළ අමාත්‍යවරුත්, අදාළ නිලධාරිනුත් සම්බන්ධ වෙලා ඒ සාකච්ඡා තුළදී විවිධ තීන්දු තීරණ ගත්තා. ඒ අනුව අද වනවිට ඒ සඳහා පූර්ව සූදානමක් සහ මැදිහත්වීමක් සහිතව අපි කටයුතු කරමින් ඉන්නවා. යම් දිස්ත්‍රික්කයක යම් ගම්මානයකට, යම් ප්‍රදේශයක පවුල් ප්‍රමාණයකට පානීය ජල හිඟයක් තිබෙනවා නම්, ඒ ජනතාව සඳහා කඩිනමින් සහ අඛණ්ඩව පානීය ජලය බෙදා හැරීම මේ වනවිට සිදු කරමින් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම කුමන ජාතික වනෝද්‍යානය සහ යාල අභය භූමිය වාගේ ප්‍රදේශවල සිටින සතුන් වෙනුවෙන් කුඩා පොකුණු හදලා තිබෙනවා. ඒ පොකුණුවලට මේ වනවිට ජලය සැපයීම සිදු කරනවා, සතුන්ගේ ආරක්ෂාව, පානීය ජල අවශ්‍යතාව සහ ඒ සතුන්ගේ ජීවිත රැක දීම සඳහා.

ඒ වාගේම මාදුරු ඔය ප්‍රදේශයේ ජලාශවල දැනට ජලය පවතිනවා. නමුත් අපි සූදානමින් ඉන්නවා, ඒ අවට සිටින සතුන් සඳහාත් අවශ්‍ය ජලය සැපයීමේ කටයුතු කරන්න. ඒ වාගේම ගල්ඔය ජාතික වනෝද්‍යානයට අදාළවත් ඒ කටයුත්ත කරන්න අපි බලාපොරොත්තු වනවා. මිනිසුන්ට විතරක් නොවෙයි සතා සිවුපාවන්ටත් ජලය අවශ්‍ය නම් ඒ වෙනුවෙනුත් කටයුතු කරන්න අපි මැදිහත් වෙමින් ඉන්නවා. මේ වනකොට දිස්ත්‍රික්ක ගණනාවකටම මේ නියං තත්ත්වය බලපා තිබෙනවා කියන එක අපි කවුරුත් දන්නවා.

[ගරු වසන්ත පියතිස්ස මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට, තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට, නවිදන්වැලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට සහ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මේ නියං තත්ත්වය යම් ප්‍රමාණයකට මේ වනවිට බලපා තිබෙනවා. විශේෂයෙන්ම පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පානීය ජල අවශ්‍යතාව තිබෙන පවුල් 2,010ක් අපි මේ වනකොට හඳුනාගෙන තිබෙනවා. අපි ඊයේ වනකොට පුද්ගලයන් 6,192කට පානීය ජලය අඛණ්ඩව සපයනු ලැබුවා. මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ජල අවශ්‍යතා තිබෙන පවුල් 794ක් අපි හඳුනාගෙන තිබෙනවා. ඒ වාගේම නවිදන්වැලි සහ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලත් එවැනි පානීය ජල අවශ්‍යතාව තිබෙන පවුල් ප්‍රමාණයක් අපි හඳුනාගෙන තිබෙනවා. මේ වනවිට මතු වෙලා තිබෙන නව තත්ත්වය සහ ඉදිරි සති කිහිපය - හෙට, අනිද්දා - තුළ ඇති විය හැකි තත්ත්වය පිළිබඳව සමාලෝචනය කරලා, ජල පෝෂක ප්‍රදේශ සහ ජල මූලාශ්‍ර හඳුනා ගනිමින් අත්‍යවශ්‍ය සියලුදෙනාට මීට වඩා කඩිනමින් සහ කාර්යක්ෂමව පානීය ජලය ලබා දීමට අපේ අවධානය යොමු කර තිබෙන බවත් මේ වෙලාවේදී මම මතක් කරන්න ඕනෑ.

ලංකාවේ තිබෙන විශාලතම ජලාශය තමයි, සේනානායක සමුද්‍රය. මේ වනකොට ඒකෙත් ජලය විශාල ලෙස අඩු වෙලා තිබෙනවා. ඒකට බලපාන එක් හේතුවක් තිබෙනවා. ඒ සොරොව් බැරලයේ තිබෙන යම් දෙදරීමක් නිසා උපරිම ජල ධාරිතාවක් පවත්වාගෙන යන්න වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හැකියාවක් නැහැ. ඒ වුණත් අපට මේ වනකොට අක්කර අඩි 144,000ක පමණ ජල ධාරිතාවක් තිබෙනවා. ලබන මහ කන්නයේ මූලික වැඩකටයුතුවලට අවශ්‍ය වන්නේ අක්කර අඩි 125,000ක පමණ ජල ධාරිතාවක් පමණයි. නමුත් පානීය ජලය සඳහාත් අපට සැලකිය යුතු ධාරිතාවක් අවශ්‍යයි. ඒ ප්‍රමාණය මේ වනකොට පවතිනවා. අපි විශ්වාස කරනවා, ඔක්තෝබර් මාසය වෙද්දී නැවත වර්ෂාව ලැබීමත් එක්ක ගල්ඔය ව්‍යාපාරය සම්බන්ධයෙන් කිසිදු ප්‍රශ්නයක් ඇති නොවෙයි කියලා. නමුත් ඒ අවට තිබෙන කුඩා වැව් අමුණුවල ජලය හිඳ වීම නිසා යම් ගැටලුවක් ඇති විය හැකියි. ඒ ප්‍රශ්නය විසඳීම සඳහාත් අපි සූදානමින් ඉන්නවා.

ඒ එක්කම මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ. මහඔය, දමන, මොනරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව, සූරියවැව ප්‍රදේශයේත්, පොළොන්නරුව සහ අනුරාධපුර ප්‍රදේශවලත් සාමාන්‍යයෙන් අප්‍රේල් මාසයේ ඇති වන වැහි කිහිපයත් එක්ක ඉතාම කෙටි කාලීනව කව්පි, මුංඇට, බඩ ඉරිඟු අතුරු භෝග ලෙස වගා කරනවා. නමුත්, මේ වනවිට පවතින නියං තත්ත්වයත් එක්ක ඒ කටයුත්ත කරගන්න බැරි වුණු පවුල් විශාල ප්‍රමාණයක් ඉන්නවා. නියං තත්ත්වය නිසා ඒ පවුල්වලට ලැබුණු අමතර ආදායම මේ වනවිට අහිමි වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් රජයේ අවධානය මේ වනවිට යොමු වෙලා තිබෙනවා. නියඟය නිසා යම් පවුලකට කෘෂි කර්මාන්තයට අදාළ ආදායම් අහිමිවීමක් සිදු වෙලා තිබෙනවා නම් ඒ පවුල්වලට ඉදිරියේදී සහන සපයන්නේ කොහොමද කියන එක පිළිබඳවත් අපි මේ වනවිට සාකච්ඡා කරමින් ඉන්නවා. පොදුවේ ගත්තොත්, මේ අර්බුදය කළමනාකරණය කිරීම සඳහා රජයක් විධියට, ආණ්ඩුවක් විධියට ගත යුතු සියලු ක්‍රියාමාර්ග අපි ගනිමින් ඉන්නවාය කියන එක මේ මොහොතේදී මම මතක් කරන්න කැමැතියි.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Imran Maharoof. You have nine minutes.

[பி.ப. 3.01]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே!

இந்த வாரம் தொடர்ச்சியாகப் பாராளுமன்றத்தில் பேசப்பட்டு வருகின்ற, கல்முனை வடக்கு ஆதார வைத்தியசாலைக்குப் புதிதாக நியமனம் பெற்றுக் கடமைக்குச் சென்ற 9 முஸ்லிம் பெண் சுகாதார உதவியாளர்களின் ஆடை தொடர்பாக ஏற்பட்டுள்ள பாரதூரமான நிலைமை குறித்து நானும் இந்தச் சபையில் சில விடயங்களை முன்வைக்கலாமென நினைக்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று எழுந்துள்ள இந்தப் பிரச்சினை முஸ்லிம் சமூகத்தினுடையதா அல்லது இந்த நாட்டினுடையதா என்ற விடயத்தைத் தீர்மானிக்க வேண்டிதொரு பொறுப்பில் நாம் இருக்கின்றோம். குறிப்பாக, இந்தச் சபையில் இந்த வாரம் முழுவதும் நடைபெற்ற எல்லா விவாதங்களிலும் இவ்விடயம் தொடர்பாகப் பேசப்பட்டிருக் கின்றது. இதுகுறித்துப் பாராளுமன்ற உறுப்பினர்கள் ஒவ்வொருவரும் வெவ்வேறு கருத்துகளை முன்வைத்திருந் தாலும், அரசாங்கம் எந்த நிலைப்பாட்டில் இருக்கின்றது என்பதை நாங்கள் இப்போது விளங்கிக்கொள்ள வேண்டிய தொரு நிலையில் இருந்துகொண்டிருக்கின்றோம். இதுபற்றி கௌரவ சுகாதார அமைச்சர் அளிக்கின்ற பதில் ஏற்றுக் கொள்ளக்கூடியதாகக் காணப்படுகின்றதா? என்பதுதான் இன்று எமது சமூகத்திடம் மாத்திரமல்ல, இந்த நாட்டின் எல்லா இன மக்களிடமும் எழுகின்ற கேள்வியாகக் காணப்படுகின்றது.

இங்கு பேசுகின்ற ஆளுந்தரப்பு உறுப்பினர்கள் - அவர்கள் தமிழர்களாக இருக்கலாம், சிங்களவர்களாக இருக்கலாம், முஸ்லிம்களாக இருக்கலாம் - ஒவ்வொருவரும் பேசுகின்ற விடயம் என்னவென்றால், "எங்களுடைய அரசாங்கம் இன, மத வேறுபாடுகளையும் தாண்டி இந்த நாட்டின் ஐக்கியத்திற்காகவும் அபிவிருத்திக்காகவும் நாட்டில் ஒரு புதிய மாற்றத்தை ஏற்படுத்த வேண்டும் என்பதற்காகவும் உருவாக்கப்பட்ட ஒன்று" என்பதேயாகும். ஆனால், அது பேச்சளவிலேதான் இருக்கின்றது. அடிப்படைவாதங்களைத் தூண்டுகின்றவர்கள், இனவாதங்களைத் தூண்டுகின்றவர்கள் அல்லது இவ்வாறான பிரச்சினைகளைத் தூண்டுகின்றவர் களுக்கு இந்த அரசாங்கம் எவ்வாறான தண்டனையை அல்லது எவ்வாறான பதிலை அளிக்கப்போகிறது என்பதுதான் இங்கிருக்கும் ஒரு கேள்வி!

குறிப்பாக, கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் நடைபெற்ற இந்த விடயத்துக்கான அரசாங்கத்தின் பதிலளிப்பை ஒரு பக்கச்சார்பான செயற்பாடாகவே நாங்கள் பார்க்க வேண்டும். ஏனென்றால், பலமிக்க ஓர் அரசாங்கம் ஒரு circularஐ மாத்திரம் விடையாகக் கருதிச் சொல்லிக்கொண்டு, இன்று இவ்வாறான ஒரு தீர்மானத்தை எடுத்திருப்பது தனிப்பட்ட ரீதியில் முஸ்லிம் சமூகத்தை அல்லது ஓர் இனத்தைப் பழிவாங்குகின்ற செயற்பாடாகவே காணப்படு கின்றது. இன்று 159 பாராளுமன்ற உறுப்பினர்களைக் கொண்ட இந்த அரசாங்கம் இவ்வாறான ஒரு பிரச்சினை ஏற்படுகின்றபோது, அதில் தலையிட்டு உரிய அதிகாரிகளுடனும் குறித்த பணியாளர்களுடனும் கலந்துரையாடிச் சரியான ஒரு தீர்வைப் பெறமுடியாமல், பக்கச்சார்பான ஒரு முடிவை எடுக்குமாகவிருந்தால், இது வரலாற்றிலே எவ்வாறான ஓர் எடுத்துக்காட்டாக இருக்கப் போகின்றது என்று இந்த இடத்திலே நாங்கள் கேட்கின்றோம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எங்களுடைய நாட்டிலே முஸ்லிம் பாடசாலைகள், சிங்களப் பாடசாலைகள், தமிழ்ப் பாடசாலைகள் என்ற பிரிவினையை ஏற்படுத்தியிருக்கிறார்கள். அதேபோன்ற ஒரு நிலையை இன்று சுகாதாரத் துறையிலும் ஆரம்பித்து வைத்திருக்கிறார்கள். இன்று முஸ்லிம் தாதிமார் கடமையாற்றுவதாக இருந்தால் முஸ்லிம் வைத்தியசாலைக்குச் செல்ல வேண்டும்; முஸ்லிம்கள் சிகிச்சை பெறுவதானால் முஸ்லிம் வைத்தியசாலைக்குச் செல்ல வேண்டும் என்ற நிலையை ஏற்படுத்துவதைப்போன்ற ஒரு விடயம் இப்போது முன்னெடுக்கப்பட்டிருக்கின்றது. இது வேதனைக்குரிய ஒரு விடயமாகக் காணப்படுகின்றது.

2025ஆம் ஆண்டு 9ஆம் மாதம் இதேபோன்ற ஒரு பிரச்சினை எங்களுடைய திருகோணமலை மாவட்டத்திலே ஏற்பட்டது. அவ்வேளை நான் இந்தப் பாராளுமன்றத்திலே அந்த விடயம் சம்பந்தமாகக் குறிப்பிட்டபோது, அதாவது, திருகோணமலை மாவட்டத்தில் உள்ள MOHsஇன்கீழ் வேலைசெய்கின்றவர்களுக்கு இவ்வாறான ஒரு பிரச்சினை இருக்கின்றது என்பதைச் சொன்னபோது, அந்த நேரத்திலே ஆளுந்தரப்பிலே இருந்த முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள், நாங்கள் இனவாதத்தை ஏற்படுத்துவதாகவும் பிழையான தகவல்களை இந்தப் பாராளுமன்றத்திலே சொல்வதாகவும் கூறினார்கள். நாங்கள் இனவாதத்தை ஏற்படுத்துவதற்காகச் சொல்லவில்லை. அந்தப் பிரச்சினைக்குப் பிறகு ஆளுந்தரப்பில் இருந்த முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் அரசாங்கத்துடன் பேச்சுவார்த்தையொன்றை நடத்தியிருந்தார்கள். அந்த இடத்திலே, "முஸ்லிம் தாதியர்கள் தமது கலாசார ஆடையை அணியக்கூடாது என்று எந்தச் சட்டமோ, சுற்றறிக்கையோ இல்லை; அப்படி ஏதாவது நடந்தால் எங்களுக்குச் சொல்லுங்கள்!" என்று ஓர் அமைச்சர் சொல்லியிருந்தார். அந்த அமைச்சர் இவ்வாறு கருத்தைச் சொல்லும்பொழுது, இப்பொழுது கௌரவ சுகாதார அமைச்சர் இன்னுமொரு கருத்தைச் சொல்வதாக இருந்தால், Cabinetஇல் எவ்வாறு தீர்மானங்களைச் சரியாக எடுக்கின்றீர்கள்? என்ற ஒரு கேள்வியை நாங்கள் கேட்க விரும்புகின்றோம். "Cabinetஇல் முஸ்லிம் அமைச்சர் ஒருவர் இல்லை" என்று நாங்கள் சொன்னால், உடனே அதை நீங்கள் இனவாதமாக எடுக்கின்றீர்கள். இவ்வாறான பிரச்சினைகள் நடைபெறுகின்றபொழுது, "எங்களுடைய சமூகத்துக்காக, எங்களுடைய இனத்துக்காக, எங்களுடைய மதத்துக்காக, எங்களுடைய மக்களுக்காகப் பேசுவதற்கான இடத்தை நீங்கள் வழங்கவில்லை" என்று நாங்கள் சொன்னால், அதை நீங்கள் இனவாதமாகப் பார்க்கின்றீர்கள்.

நேற்றுப் பேசிய ஆளுந் தரப்புப் பாராளுமன்ற உறுப்பினர் ஒருவர், "உங்களுடைய காலங்களில் - சென்ற காலங்களில் ஸ்ரீ சண்முகா இந்து மகளிர் கல்லூரியில் இவ்வாறான ஒரு நிகழ்வு நடைபெறவில்லையா?" என்று கேட்டிருந்தார். நடைபெற்றதுதான். அன்று அவ்வாறான செயற்பாடு நடந்ததன் காரணமாகத்தான் இன்று மக்கள் உங்களுக்கு ஆட்சியை வழங்கி இருக்கின்றார்கள். அன்று அப்பாடசாலையில் முஸ்லிம்களுக்கு ஏற்பட்ட அவ்வாறான பிரச்சினைக்கு யார் காரணம் என்று இன்று எல்லோருக்குமே தெரியும்! ஆனால், இப்பொழுது ஆட்சி - அரசாங்கம் - உங்களுக்கு வழங்கப்பட்டு இருக்கின்றது. உங்களுடைய அரசாங்கத்திடம் இருந்து மக்கள் பெரிதாக எதிர்பார்க்கின்றார்கள். எனவே, இவ்வாறு கதைக்கின்ற அரசாங்கத்தில் இருக்கின்ற அமைச்சர்கள், பாராளுமன்ற உறுப்பினர்களிடம் நாங்கள் கேட்கின்றோம், உங்களுடைய அரசாங்கத்தில் 'ஈஸ்டர்' தாக்குதல் போன்ற ஒன்று இப்பொழுது ஏற்படுவதை நீங்கள் தடுப்பீர்களா? இல்லை, கடந்த அரசாங்கத்தில் 'ஈஸ்டர்' தாக்குதல் நடைபெற்றதுதானே, அதுபோலத்தான் எங்களுடைய அரசாங்கக் காலத்திலும் நடைபெற்று இருக்கின்றது என்று அதனை ஏற்றுக்கொள்வீர்களா? என்பதைத்தான்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று இந்த அரசாங்கம் 159 பாராளுமன்ற உறுப்பினர்களைக் கொண்டிருக்கின்றது; ஒரு தனிக்கட்சியாக முழு அதிகாரமும் உங்களுக்கு வழங்கப்பட்டிருக்கின்றது. இதற்கு முன்னர் எந்தவொரு அரசாங்கமும் ஒரு தனிக் கட்சியாக 159 பாராளுமன்ற உறுப்பினர்களைக் கொண்டிருக்கவில்லை. கடந்த கால அரசாங்கங்கள் பல சவால்களை எதிர்கொண்டுதான் பாராளுமன்றத்தில் சில சட்டமூலங்களைக் கொண்டுவந்து, அங்கீகரித்து, அமுல்படுத்த வேண்டிய நிலை காணப்பட்டது. ஆனால், இன்று நீங்கள் ஒரு தனிக் கட்சியாக முழுமையான அதிகாரத்துடன் இருந்துகொண்டும் இன்னும் circular என்ற ஒரு விடயத்தை வைத்துக்கொண்டு இவ்வாறான விடயங்களை முன்னெடுக்க அனுமதிப்பீர்களாக இருந்தால், இனவாதத்தைத் தூண்டுகின்றவர்கள் அதில் கருத்து வேறுபாடுகளை ஏற்படுத்தி, அதனை வேறொரு திசையை நோக்கிக் கொண்டுசெல்வதற்கு வாய்ப்பாக அமைந்துவிடும். இன்று தமிழ்ச் சகோதரர்களும் முஸ்லிம் சகோதரர்களும் social media ஊடாக மோதிக்கொள்வதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. ஆகையால், இது ஓர் இனத்தினுடைய பிரச்சினை மாத்திரமல்ல. எங்களுடைய நாட்டில் மீண்டும் வன்முறைக் கலாசாரத்தை ஏற்படுத்திவிடக் கூடாது என்ற அடிப்படையில் செயற்பட வேண்டிய பொறுப்பு எங்களிடம் இருக்கிறது.

இந்த அரசாங்கத்தை எடுத்துக்கொண்டால், சில விடயங்களில் மிக வேகமாகச் செயற்படுகின்றார்கள். பாராளுமன்ற உறுப்பினர்களுடைய ஓய்வூதியத்தை நிறுத்துவதிலே மிகவும் வேகமாக இயங்கியவர்கள் - அது நல்லதா, கெட்டதா? என்பதை ஒருபக்கம் வைப்போம் - இவ்வாறான பிரச்சினைகளைத் தீர்ப்பதற்கான சட்டமூலங்களையும் விரைவாக ஏற்படுத்த வேண்டும். அதில் சில கால தாமதங்கள் ஏற்படும்போது, அதைச் சுமுகமாகப்பேசி அதற்கான தீர்வை வழங்குவதற்கான தெளிவான நடவடிக்கைகளை எடுக்க வேண்டும். இன்று இவ்வாறான இனவாதப் பிரச்சினைகள் ஏற்படுகின்றபொழுது, பலர் அதற்காகக் குரல் கொடுப்பதைப்போல மக்கள் மத்தியில் பல விம்பங்களைக் காட்டிக்கொண்டு இருக்கிறார்கள். கடந்த காலத்தில் 20ஆம் அரசியல் அமைப்புத் திருத்தத்திற்குச் சார்பாக வாக்களித்து, கோட்டாபய ராஜபக்ஷவின் ஆட்சியைப் பலப்படுத்திய சில முஸ்லிம் பிரதிநிதிகள், இன்று இந்த விடயத்தைப் பேசுவது உண்மையில் வேடிக்கையானதாகக் காணப்படுகிறது. அன்று முஸ்லிம்களின் ஜனாசாக்களை எரிப்பதற்கான அதிகாரத்தை மேலும் கூட்டி வழங்கியவர்கள், இன்று இவ்வாறான விஷயங்கள் தொடர்பில் - சமூக வலைத்தளங்களில் - social media - உலாவிக் கொண்டிருப்பதுகூட வேடிக்கையான ஒரு விடயமாகக் காணப்படுகிறது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தாதியரின் சீருடை பற்றிய இந்த விடயம் பல வழிகளிலும் பேசப்பட்டு இருக்கிறது. எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களான நாங்கள்கூட சென்ற செவ்வாய்க்கிழமை கௌரவ அமைச்சர் அவர்களைச் சந்தித்து, இது சம்பந்தமாக முழுமையாகத் தெளிவுபடுத்தினோம். "இந்த விடயத்துக்கான தீர்வாக மேற்கொள்ளப்பட்ட இடமாற்றம் என்பது ஏற்றுக்கொள்ளப்பட முடியாத ஒரு விடயமாகக் காணப்படுகிறது. ஆகையால்,

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

தயவுசெய்து இந்த விடயத்தில் கவனஞ்செலுத்தி, அதற்கு நிரந்தரமான ஒரு தீர்வை உடனடியாகப் பெற்றுத் தாருங்கள்" என்று சொன்னோம். ஆனால், இன்று அவர்களுடைய கருத்துகளைப் பார்க்கின்றபொழுது, வழமையாக எதிர்க்கட்சியைச் சாடிப் பேசுகின்ற அல்லது எதிர்க்கட்சிதான் இதற்குக் காரணம் என்று சொல்கின்ற விடயத்தையே இவர்கள் முன்னிலைப்படுத்தி செல்வதாகத் தோன்றுகிறது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
ஆம். முடிக்கிறேன்.

மூவின மக்களும் வாழுகின்ற ஒரு பிரதேசமான கிழக்கு மாகாணத்தில் இவ்வாறான பிரச்சினைகளுக்கு நாங்கள் இடம் கொடுப்போமாக இருந்தால், இன்னும் பல பிரச்சினைகளை உருவாக்குகின்ற வகையிலான நடவடிக்கைகளை எடுப்பதற்குத் தயாராக இருக்கின்றவர்களுக்கு அது வாய்ப்பாக அமைந்துவிடும். ஆகையால், ஒரு பலமிக்க அரசாங்கமாக இருக்கின்ற நீங்கள் இதற்கு உடனடியான தீர்வுகளைக் காணவேண்டிய பொறுப்பில் இருக்கின்றீர்கள். அவ்வாறான தீர்வை மிக விரைவாக எட்ட வேண்டும். இங்கு நடந்திருக்கின்ற இந்தச் சீருடை தொடர்பான அநீதிக்கான தீர்வை நீங்கள் உடனடியாக வழங்க வேண்டும். இனிவரும் காலங்களிலே இவ்வாறான பிரச்சினைகள் ஏற்படாமல், எல்லா இனங்களும் தங்களுடைய மதத்தை மதிக்கின்ற, தங்களுடைய கலாசாரத்தை, தங்களுடைய உடையை மதிக்கின்ற வகையில் ஒரு புதிய, சிறந்த திட்டத்தை உருவாக்குவதற்கு ஒன்றுபட வேண்டும் என்பதை இந்த இடத்திலே கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Sellaththamby Thilaganathan. You have eight minutes.

[பி.ப. 3.11]

**ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, காலநிலை மாற்றம் தொடர்பான இன்றைய சபை ஒத்திவைப்புப் பிரேரணை பற்றிய விவாதத்திலே கலந்துகொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். இந்தக் காலநிலை மாற்றத்தினால் கடந்த காலத்திலே இலங்கையில் மாத்திரமல்ல, பல்வேறு நாடுகளிலும் பல்வேறுபட்ட அழிவுகள் ஏற்பட்டன. குறிப்பிட்டுச் சொல்லப்போனால், கடந்த வருடம் ஏற்பட்ட 'தித்வா' புயலினால் இலங்கையினுடைய பெருமளவு சொத்துக்களுக்கு இழப்பு ஏற்பட்டது. அதேபோல, எதிர்வரும் காலத்திலே 'எல்-நினோ' எனப்படுகின்ற காலநிலை மாற்றத்தினால் பெரும் இழப்புகள் ஏற்படாதிருப்பதற்கு எமது அரசாங்கம் பல்வேறுபட்ட நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றது. உண்மையிலேயே 'எல்-நினோ' எனப்படுவது, பசுபிக் சமுத்திரத்தினுடைய மத்திய மற்றும் கிழக்குப் பூமத்திய ரேகைப் பகுதியில் கடல் மேற்பரப்பு நீர் வழக்கத்துக்கு மாறாக வெப்பமடைகின்ற காலநிலை மாற்ற நிகழ்வாகும். இதனால் பல்வேறுபட்ட காலநிலை மாற்றங்கள் ஏற்படும் சாத்தியம் காணப்படுவதாகச் சொல்லப்படுகின்றது. குறிப்பிட்டுச் சொல்லப்போனால், காற்றினுடைய திசை, வெப்பநிலை மற்றும் வானிலை தொடர்பான ஏனைய பல்வேறுபட்ட நிகழ்வுகள் மாற்றமடைகின்றன.

இந்த 'எல்-நினோ' நிகழ்வினால் எதிர்வரும் காலத்திலே எமது நாட்டிலும் பல்வேறுபட்ட மாற்றங்கள் ஏற்படுவதற்கான சாத்தியக்கூறுகள் காணப்படுகின்றன. கடந்த காலத்திலே பல்வேறுபட்ட சந்தர்ப்பங்களிலே இலங்கையில் பல்வேறு வகையிலும் பெருமளவு இழப்புக்கள் ஏற்பட்டன. நான் முதலில் குறிப்பிட்டதுபோன்று கடந்த வருடம் ஏற்பட்ட 'தித்வா' புயலினால் பல பில்லியன் ரூபாய் பெறுமதியான சொத்திழப்புகளும் உயிரிழப்புகளும் ஏற்பட்டன. எதிர்காலத்தில் அவ்வாறான உயிரிழப்புகள் ஏற்படாத வண்ணம் எமது அரசாங்கம் தற்போது பல்வேறுபட்ட நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றது. மாவட்டந்தோறும் பல்வேறு குழுக்களை - மாவட்ட அபிவிருத்திக் குழு, பிரதேச அபிவிருத்திக் குழு போன்ற குழுக்களை - நியமித்து, அவற்றினூடாக மக்களுக்கு விழிப்புணர்வு ஏற்படுத்திக்கொண்டு வருகின்றோம். தற்போது எமது நாட்டிலே வன விலங்குகள் கிராமங்களை நோக்கி நகர்கின்றன. இந்த 'எல்-நினோ' தாக்கத்தினால் காட்டுப் பகுதிகளிலே குடிநீருக்குத் தட்டுப்பாடு ஏற்படுவதனால், நீரைத் தேடி அலையும் வன விலங்குகள் கிராமத்திற்குள் புகுந்து விடுகின்றன.

கடந்த வாரம்கூட, வவுனியா மாவட்டத்திலே குளவிசுட்டான் எனும் கிராமத்திலே ஒருவர் யானை தாக்கி இறந்துள்ளார். இதற்குச் சில வாரங்களுக்கு முன்னரும் ஒருவர் புதுக்குடியிருப்புப் பிரதேசத்திலே யானை தாக்கி உயிரிழந்தார். இவற்றுக்கெல்லாம் மேற்படி காலநிலை மாற்றங்கள்தான் காரணமாகக் காணப்படுகின்றது. உண்மையிலே, கடந்த வருடம் எமது நாட்டிலே வடக்கு மாகாணத்திலே கால்நடைப் பண்ணையாளர்கள் பெருமளவு இழப்புகளைச் சந்தித்தார்கள். இதற்காக எமது அரசாங்கம் பல்வேறுபட்ட நடவடிக்கைகளை மேற்கொண்டு, அந்தக் கால்நடைப் பண்ணையாளர்களுக்கு இழப்பீடுகளை வழங்கியது. ஆனால், இவ்வாறான இழப்புகள் எதிர்வரும் காலத்திலே ஏற்படாதவண்ணம், கால்நடைப் பண்ணையாளர்கள் முன்னெச்சரிக்கை நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். அதாவது, தங்களுடைய பண்ணைகளைப் பதிவுசெய்து, கால்நடைகளுக்குக் காப்புறுதி செய்வதன்மூலம், அவற்றினால் ஏற்படுகின்ற இழப்புக்களைத் தவிர்த்துக்கொள்ள வேண்டும்.

இலங்கையிலே இருபது இலட்சம் ஏக்கர் நிலமானது நெற் பயிர்ச்செய்கைக்காகப் பயன்படுத்தப்பட்டு வருகின்றது. இதில் பெருமளவு வயல் நிலங்கள் கடந்த 'தித்வா' புயலின்போது அழிவுற்றன. இதற்காக எமது அரசாங்கம் பெருமளவு நிதியை நட்டஈடாக வழங்கியிருந்தது. எதிர்வரும் காலத்தில் அதாவது, 2027ஆம் ஆண்டு ஜனவரி மாதம் முதல் சித்திரை மாதம் வரையிலே கடும் வரட்சி நிலவும் என வானிலையாளர்கள் குறிப்பிட்டுள்ளார்கள். இந்தப் பாதிப்பிலிருந்து மீண்டு கொள்வதற்கு நாம் முன்னெச்சரிக்கையாக எமது நெற்செய்கையை முன்கூட்டியே செய்வதன்மூலம் கடந்த காலத்தில் ஏற்பட்டது போன்ற இழப்புகளைத் தவிர்த்துக் கொள்ளக் கூடியதாக இருக்கும். தற்போது எதிர்வரும்

பெரும்போக பயிர்ச் செய்கையை இரண்டு கிழமை முன்கூட்டியே - வழமையாகப் பயிர் செய்கின்ற ஒக்ரோபர் மாத காலத்திலிருந்து இரண்டு கிழமை முன்கூட்டியே - செய்வதன்மூலம், அவ்வாறான இழப்பை ஓரளவு தவிர்த்துக் கொள்ளலாம்.

அதேபோன்று, எமது அரசாங்கம் தற்பொழுது கைவிடப்பட்ட பல குளங்களைப் புனரமைத்து, அவற்றின் நீர்க் கொள்ளளவை அதிகரிப்பதற்குப் பல்வேறுபட்ட நடவடிக்கைகளை மேற்கொண்டுள்ளது. 2026ஆம் ஆண்டான இந்த வருடத்தில் வன்னி பிரதேசத்தில் உள்ள பெருமளவான குளங்கள் புனருத்தாரணம் செய்யப்பட்டுள்ளது. மேலும் பல குளங்களின் திருத்த வேலைகளும் தற்போது இடம்பெற்றுக்கொண்டு இருக்கின்றன. இவ்வாறு திருத்த வேலையைச் செய்வதனால் நீர் கொள்ளளவை அதிகரித்து, எதிர்வரும் காலத்தில் எமது பிரதேசத்தில் ஏற்படப்போகும் நீர்ப் பற்றாக்குறையை நிவர்த்தி செய்யக்கூடியதாக இருக்கும். அதேபோல, எதிர்வரும் செப்ரெம்பர், ஒக்ரோபர், நவம்பர், டிசம்பர் மாதங்களிலே கடந்த காலத்தைப்போல பெருமளவு வெள்ளப்பெருக்கு ஏற்படுவதற்கான அபாயம் காணப்படு கின்றது. அதற்கான முன்னெச்சரிக்கை நடவடிக்கையாக குளங்களிலுள்ள நீரின் அளவைக் குறைத்து, குளக்கட்டுக்கள் உடைந்து வெள்ளப்பெருக்கு ஏற்படாதவாறு நீர் முகாமைத்துவச் செயற்பாட்டைப் பொறியியலாளர்கள்மூலம் எமது அரசாங்கம் மேற்கொண்டு வருகின்றது.

அடுத்து, எமது பிரதேசத்தில் வெப்பநிலை காரணமாகப் பயிர்களினுடைய விளைச்சலானது குறைந்த மட்டத்திலேயே காணப்படுகின்றது. இவ்வாறு இலங்கையில் மழைவீழ்ச்சி குறையும்போது நீர் மின் உற்பத்தியும் குறைவதற்கான சாத்திக்கூறுகள் காணப்படுகின்றன. இதனால் மீள் புதுப்பிக்கத்தக்க நீர் மின் உற்பத்தி நிலையங்களை உருவாக்கி அதன்மூலம் மின்சாரத் தட்டுப்பாட்டை நீக்குவதும் எமது அரசாங்கத்தினுடைய ஒரு குறிக்கோளாகக் காணப்படு கின்றது.

அதேபோல, வெப்பநிலை அதிகரிப்பதனால் துருவப் பிரதேசங்களிலே கடல் மட்டமானது உயர்வடையக்கூடிய சாத்தியக்கூறு காணப்படுகின்றது. இதனால் உவர் நீரானது நிலப்பகுதிகளுக்குள் செல்வதனால், நிலத்தடி நீரின் தன்மை மாற்றமடையக்கூடிய சாத்தியக்கூறும் காணப்படுகின்றது. இவ்வாறான சூழ்நிலைகள் காரணமாக நாங்கள் மழைநீரைச் சேகரித்து முறையாகப் பயன்படுத்துவதன்மூலம் எதிர்வரும் காலத்திலே நீரினால் ஏற்படுகின்ற பிரச்சினைகளை நீக்கிக்கொள்ள முடியும் என்று இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்ள விரும்புகிறேன்.

எதிர்வரும் காலத்திலே ஏற்பட இருக்கும் வரட்சிக்கு முகங்கொடுக்கும் நடவடிக்கையாக எமது அரசாங்கமானது பல நீர் விநியோக 'பவுசர்'களைத் தயார் நிலையிலே வைத்திருக்கின்றது. எமது முப்படையினரும் அனர்த்த நிலைமையிலிருந்து மக்களை மீட்பதற்காக ஒவ்வொரு பிரதேசத்திலும் தயார்நிலையில் வைக்கப்பட்டுள்ளார்கள். ஏனென்றால், கடந்த காலத்திலே ஏற்பட்ட அனுபத்தைக் கொண்டு எதிர்வரும் காலத்தில் இவ்வாறான இழப்புகள் ஏற்படுவதிலிருந்து இந்த நாட்டைப் பாதுகாப்பதற்காக எமது ஜனாதிபதி அவர்களின் பணிப்பின்கீழ் நாங்கள் பல்வேறு வகையிலும் பல்வேறு நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றோம் என்று கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Dayasiri Jayasekara. The Floor is yours and you have nine minutes.

[අ.භා. 3.19]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයටම බලපා ඇති එල් නිනෝ තත්ත්වය පිළිබඳව අද දිනයේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙන ඒම ගැන ආණ්ඩු පක්ෂයේ ගරු අජිත් අගලකඩ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා.

එල් නිනෝ තත්ත්වය පිළිබඳව අපේ ගරු විපක්ෂ නායකතුමා මීට මාස ගණනාවකට කලින් මූලික කරුණු ගණනාවක් පෙන්වා දුන්නා. ආණ්ඩුව අද වනකොට ඒ සඳහා අවශ්‍ය කටයුතු ටික කිරීම ගැන අපි සතුටු වනවා. මේ රටේ ඉන්න සියලු ජනතාව වෙනුවෙන් වැඩ කරන දේශපාලනඥයන් විධියට අපට ඉල්ලන්න තිබෙන්නේ, මේ අරගෙන තිබෙන පියවර තවත් ශක්තිමත් කරන්න කියලායි. එල් නිනෝ තත්ත්වය නිසා මූලික වශයෙන් මොනරාගල, පොළොන්නරුව, හම්බන්තොට, අම්පාර හා අනුරාධපුර කියන දිස්ත්‍රික්ක පහට නියඟය ඇති වෙලා තිබෙනවා. මේ නියඟය නිසා ගොවීන් 4,707දෙනෙක් සම්පූර්ණයෙන් අනාථභාවයට පත් වෙලා තිබෙනවා. 73,000කට අධික ප්‍රමාණයකට බොන්න වතුර නැති තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම මේ වනකොට දිස්ත්‍රික්ක ගණනාවක කුඹුරු ඉඩම් අක්කර ගණනාවක් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. ඇත්තවශයෙන්ම ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල සහ ලබන පෙබරවාරි, මාර්තු හා අප්‍රේල් මාසවල වර්ෂාව ලැබෙයි කියා තිබුණත් ඒකත් අර්බුදයකට යයි ද කියන කාරණය ගැන අපි මෙහිදී කල්පනාකාරී වෙන්න ඕනෑ කියලා මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි.

එල් නිනෝ තත්ත්වයත් එක්ක අද ලෝකයේ ආහාරවල මිල ගණන් විශාල වශයෙන් වැඩි වෙන තත්ත්වයක් තමයි තිබෙන්නේ. හාල්, සීනි සහ ආනයනික පරිප්පු ඇතුළු සියලු භාණ්ඩවල මිල විශාල ලෙස ඉහළ යන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඉන්දියානු වෙළෙඳ පොළේ ලූනු කිලෝවක මිල ඉන්දියානු රුපියල් 27කින් වැඩි වෙලා තිබෙනවා. මේ තත්ත්වයත් එක්ක ලෝකයේම සහල් අස්වැන්න මෙට්‍රික් ටොන් ලක්ෂ 90කින් විතර අඩු වෙයි කියලා තමයි ප්‍රකාශ කරන්නේ. ඉන්දියාවේ සහල් මෙට්‍රික් ටොන් එකක් ඇමෙරිකානු ඩොලර් 358ත්, 364ත් අතර ප්‍රමාණයකින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඉන්දියාවේ තොග වෙළෙඳ පොළේ සීනි මෙට්‍රික් ටොන් එකක මිල ඉන්දියන් රුපියල් 4,000කින් පමණ ඉහළ ගිහින් තිබෙනවා. ඒ සියල්ලම විශාල වශයෙන් අපේ රටට බලපානවා. එම නිසා අපි ආණ්ඩුවෙන් විශේෂයෙන් ඉල්ලනවා, මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ටික කරන්න කියලා. එතැනදී අපට දෙන්න පුළුවන් සහයෝගය සහ ශක්තිය අපි ලබා දෙනවා. මොකද, ආණ්ඩුව කරන හැම එකකටම විරුද්ධ වෙලා වැඩ කරන වැඩ පිළිවෙළක් අප ළඟ නැහැයි කියන කාරණය බොහොම පැහැදිලිව අපි පෙන්වා දී තිබෙන නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගෞරවණීය පූජ්‍ය රඹුකන සිද්ධාර්ථ හිමියන්ගේ අපවත් වීම අපට මේ අවස්ථාවේ විශාල කනගාටුවක්. යතිවරයෙකු විධියට සහ ගීත රචකයෙකු විධියට උන් වහන්සේ මේ රටට විශාල සේවයක් කළා. උන් වහන්සේ රචනා කළ ගීත විශාල ප්‍රමාණයක් මේ රටේ ජනප්‍රිය වුණා. පූජ්‍ය රඹුකන සිද්ධාර්ථ හිමියන්ගේ අපවත් වීම අපේ රටට විශාල පාඩුවක්.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ඒ වාගේම මේ රටේ හඬ බව පත් වෙලා තිබුණු නන්දා මාලනී ගායිකාවත් අභාවප්‍රාප්ත වෙලා තිබෙනවා. විශේෂයෙන්ම තරුණ පරපුර අතර එතුමියගේ ගීත ඉතා ජනප්‍රියයි. අපි විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් විධියට හිටපු කාලයේ අපේ සියලු සටන්වලදී අපි භාවිත කළේ අපේ ආදරණීය ගායිකාව, නන්දා මාලනියන්ගේ ගීත පමණයි. මේ රටේ ජීවන හුස්ම විධියට මා මේ අවස්ථාවේ එතුමිය ආදරයෙන් මතක් කරනවා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් විධියට පමණක් නොවෙයි, සෑම සටන් භූමියකම එතුමිය විසින් ගායනා කළ ගීත තමයි අපි වාදනය කළේ. එතුමියගේ හඬ පෞරුෂය කවදාවත් නොමියන හඬ පෞරුෂයක්. මහාචාර්ය සුනිල් ආරියරත්නයන් විසින් රචනා කළ ගීත විශාල සංඛ්‍යාවක් එතුමියගේ හඬින් ගායනා කෙරුණා. එතුමිය මිය ගියත් එතුමියගේ හඬ අනාගතයේත් මේ රටේ පවතීවි. එතුමියගේ නම මේ රටේ තව අවුරුදු 100ක්, 200ක් පවතීවි කියන විශ්වාසය අප අතර තිබෙනවා. එතුමියට මගේ ගෞරවනීය ආචාරය පිරිනමමින්, එතුමියට නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ කාරණයත්. අපි දන්නවා, මේ වෙනකොට අධිකරණය පිළිබඳව ලංකාවේ ඇතිවෙලා තිබෙන තත්ත්වය. අද මටත් හැකියාව ලැබුණා ගිහිල්ලා විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සම්බන්ධ අලුත් petition එකක් file කරන්න. එහිදී අපි බොහොම පැහැදිලිව කරුණු ගණනාවක් මතු කර තිබෙනවා. මේ රටේ අධිකරණය පිළිබඳව වැඩියෙන්ම කථා වෙන කාලය බවට මේ කාලය පත්වෙලා තිබෙනවා. අපි දන්නවා, මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරලා එදා ශිරානි බණ්ඩාරනායක මැතිනියව ඉවත් කළ බව. ඒකට විරුද්ධව අපි විශාල හඬක් නැඟුවා. මා ළඟ තිබෙනවා ඒ කාලයේ මෙතැන කථා කරපු ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්ගේ කථා. එදා අපි ඔක්කොම එකට එකතු වෙලා තමයි ඒකට විරුද්ධ වුණේ. ඒ වාගේම,- *[බාධා කිරීමක්]* කරුණාකරලා සද්ද නැතුව ඉන්නවාද? *[බාධා කිරීමක්]* මොකක්ද? කොහේද මම අත ඉස්සුවේ? *[බාධා කිරීමක්]* යන්න මහත්තයෝ දන්නේ නැති

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කථා කරන්නේ නැතිව. ඔයා එතකොට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීමක්]* කොහේද අත ඉස්සුවේ? යනවා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

බොරු කියන්නේ නැතිව. *[බාධා කිරීමක්]*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඔය වාගේම තමයි බොරු කියන්නේ. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න දෙන්න කියන්න. *[බාධා කිරීමක්]* ඔබතුමා සංවිධායක කෙනෙක් නේද? ලජ්ජා නැහැ ඔබතුමාට. *[බාධා කිරීමක්]* කරුණාකරලා මට කථා කරන්න දෙන්න. හරි අමාරුයි ඒවා කියනකොට. ඇයි, දැන් ඒකේ අනික් පැත්ත නේ කරන්නේ. එදා ශිරානි බණ්ඩාරනායක එළියට දමනකොට අපි මෙතැන ඉඳලා කථා කෙරුවා. ඔයාලාගේ කට්ටියත් ඔක්කොම එකතු වෙලා කථා කෙරුවා. හරිද? ශිරානි බණ්ඩාරනායක මැතිනිය ආපසු ගෙනැල්ලා ඉන්දවනකොට තමුන්නාන්සේලා ඒ ගැන කථා කෙරුවේ නැහැ. ඒ අයින් කරපු එකත් වැරදියි. ඊළඟට හිටපු අග්‍ර විනිශ්චයකාරවරයාට ගෙදර යන්න කිව්වා, මොකක්වත් නැතිව, කිසිම දෙයක් නැතිව. එහෙමයි මිනිස්සු ගෙදර යැව්වේ. මතක තියාගන්න. අද මේ තමුන්නාන්සේලා එකතු වෙලා කරන්න හදන්නේ මොකක්ද?

අද දැවැන්ත හොරකම් ගණනාවක් සිද්ධ වෙනවා. එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ වන්දිය විධියට ඩොලර් බිලියන 6,400ක ඇස්තමේන්තු සකස් කර තිබුණු වෙලාවේ තමයි ඒ ගැන පස්දෙනෙකුගෙන් යුත් විනිශ්චය සභාවක් පත් කළේ. ඒකට වැරදිකරුවන් නම් කරලා US Dollars 1 billion - කෝටි 33,000ක් - මේ රටේ තැන්පත් කරන්න කියලා තිබියදී, මේ රටේ අග්‍ර විනිශ්චයකාරතුමා -අලුතින් පත් වුණු සූරසේන මැතිතුමා-, ඊළඟට හිටපු ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරතුමා වූ යසන්ත කෝදාගොඩ මැතිතුමා අයින් කරලා ඊට පහළින් හිටපු තුන්දෙනෙක් ඒ සභාවට පත් කෙරුවා. ඒගොල්ලන් ලවා අද මේක terminate කරලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, you have only two minutes left.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
I do not think so, Sir. I think I have been given nine minutes.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Of the nine minutes, only two minutes are left now.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේ ක්‍රියාවලිය තුළ දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් තමුන්නාන්සේලා කයිය ගහනවා මෙතැන. මොකක්ද ඊළඟට වුණේ? මේ ගැන ජනාධිපතිතුමාට ලිපි එව්වා, දිගටම. මොකක්ද අන්තිමට කළේ? දැන් ජනාධිපතිතුමා committee එකක් පත් කර තිබෙනවා, අර සල්ලි ගෙවන්න හිටපු මිනිස්සුන්ගේ ලිපිවලට අවශ්‍ය කරන negotiations කරන්න කියලා. එතකොට කවුද මේ නඩුව නැවැත්තුවේ? පස්දෙනාගෙන් යුක්ත කමිටුවේ නඩුව නවත්වලා, ඒක terminate කරලා, ඊට පස්සේ committee එකක් දාලා දැන් කියනවා renegotiate කරන්න කියලා. කාගේ වුවමනාවටද මේ? මේ companiesවල වුවමනාවටද? මේවා කරන්න ඕනෑ මේ රටේ මිනිස්සුන්ගේ වුවමනාවට නොවෙයිද?

විශේෂයෙන් අද අපි දකින අනික් කාරණය මේකයි. විනිශ්චයකාරවරු දෙදෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කරන්න ඉන්නවා. එතුමන්ලා සිංහල, බෞද්ධ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු විධියට එතැනට යන්න හිටපු අය. ධම්මික ගනේපොල මැතිතුමා සිංහල බෞද්ධයෙක්. එතුමාට මොකක්ද තිබුණු ප්‍රශ්නය? එතුමාට හොරකමක්, මංකොල්ලකෑමක්, වංචාවක් තිබුණාද? නැහැ. ඊළඟට, ගුරුසිංහ විනිශ්චයකාරතුමා සැප්තැම්බර් 02වැනි දා විශ්‍රාම යෑමට නියමිතයි. එතුමාත් දැන් ශ්‍රේෂ්ඨාධිකරණයට යවන්නේ නැතිව ගෙදර යවනවා. මේ රටේ සිංහල, බෞද්ධයන්ට විරුද්ධවද මේ ප්‍රශ්නය තිබෙන්නේ? මම කිසි දවසක මේ රටේ ජාතිවාදය වෙනුවෙන් අතක් ඔසවලා නැහැ,

බොහොම පැහැදිලිව. දෙමළ ජාතිවාදය, සිංහල ජාතිවාදය, මුස්ලිම් ජාතිවාදය කියන මේ සියල්ලටම විරුද්ධව අපි කථා කරලා තිබෙනවා. ඒ වාගේම තමයි ආගම්වාදය. හැම කෙනෙකුටම ආගමක් අදහන්න තිබෙන අයිතියට අපි ගරු කරනවා. හැබැයි, මේ රටේ කවුරුහරි පුද්ගලයෙක් හෝ දෙන්නෙක් එකතු වෙලා කිසියම් ආගමක් වෙනුවෙන් කථා කරනවා නම්, ඒකට විරුද්ධව අපි කථා කරනවා. මොකද හේතුව? බෞද්ධයන් විධියට අපටත් අයිතියක් තිබෙනවා අපේ මිනිස්සු පිළිබඳව කථා කරන්න. ඒ වාගේම, දමිළ මිනිස්සුන්ටත් ඒ අයිතිය තිබෙනවා. මුස්ලිම් ජනතාවටත් ඒ අයිතිය තිබෙනවා. කතෝලික ජනතාවටත් ඒ අයිතිය තිබෙනවා. අද මේක එතැනට තල්ලු වෙලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Dayasiri Jayasekara, you have been given three minutes out of the time allotted to Hon. Hesha Withanage Ankumbura Arachchi.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Thank you, Sir.

අද අධිකරණය එතැනට තල්ලු වෙලා තිබෙන්නේ. එදා මම ශ්‍රේෂ්ඨාධිකරණයේ 225වැනි සැමරුමට ගියා. අන්තිමට කථා කළා අපේ අග්‍ර විනිශ්චයකාරතුමා. මමත් හිටියා එතැන. තව මහාචාර්යවරු සිටියා. කොළඹ අවට ඉන්න සියලු විනිශ්චයකාරවරු සිටියා. එතුමා හොඳ කථාවක් කරලා අවසානයේ මොකක්ද කිව්වේ? "Let us pray together" කිව්වා. ඉතින්, අපි ඔක්කොම නැඟිටලා යාඥා කරන්න ඕනෑ! ඒකද දැන් මේ කියන්නේ? මේ රටේ අග්‍ර විනිශ්චයකාරතුමා යාඥා කරන පාදිලිතුමෙක් - පාස්ටර්කෙනෙක් - වෙන්න ඕනෑ නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක නේ අපි කියන්නේ. මෙතැනට ඇවිල්ලා මවුලවිතුමෙක් කිව්වොත් "අල්ලාහ් අක්බර්" කියලා, අපි ගරු කරනවා. ගරු කරලා නැඟිටිනවා. හැබැයි, ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරතුමා කථාව කරලා "අල්ලාහ් අක්බර්" කියනවා නම්, එහෙම නැත්නම් ස්වාමීන් වහන්සේ කෙනෙක් වාගේ, "බුද්ධං සරණං ගච්ඡාමි" කියලා පන්සිල් දෙනවා නම්, මොකක්ද ඒ? ඒ නිසා ආගම් විධියට මේක කරන්න එපා. පාදිලි උන්නාන්සේ කෙනෙක් රටේ අග්‍ර විනිශ්චයකාර කරන්න ඕනෑ නම් ඒගොල්ලන්ට ඒක කරගන්න කියන්න. අද මෙතැනට තල්ලු වෙලා තිබෙනවා. මෙය අද අපේ සිංහල බෞද්ධ ව්‍යාපාරය විනාශ කරන වැඩ පිළිවෙළක් බවට පත් වෙලා තිබෙනවා. නිරාගමික ආණ්ඩුවක් ආවයි කියලා නේ දැන් කියන්නේ. පෙරහැර නැති වෙයි කිව්වාලු. ඔව්, දැන් පෙරහැර නැතිවෙන තත්ත්වයට ගෙනෙනවා. සත්ව සුබසාධන පනත අරගෙන කියවන්න. ඒකේ බොහොම පැහැදිලිව තිබෙනවා, අලියෙකුට දම්වැල් දාන්නත් බැහැ, ලණුවකින් ගැට ගහන්නත් බැහැ කියලා. අලියෙක් දම්වැල්වලින් ගැට ගහන්නේ නැතුව, ලණුවකින්වත් ගැට ගහන්නේ නැතුව පෙරහැර කරන්නේ කොහොමද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම කළොත් ඒ අලියා අයිති පන්සලේ හාමුදුරුවන් මාස හයක් හිරේ යනවා. එතකොට පෙරහැර නවත්තන්නේ නැහැ, පෙරහැරේ යන අලියා නවත්තනවා. එතකොට පෙරහැර නවතිනවා. එහෙම නේ වෙන්නේ. එම ගැසට් පත්‍රය පළ කර තිබෙනවා, 2026.07.20 දින. තවම ඒක සාකච්ඡාවට ආවේ නැහැ. ඒක සාකච්ඡාවට එයි. අපි එතකොට කථා කරමු.

මතක තියාගන්න, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තමුන්නාන්සේලා ගෙනෙන්නේ වෙන මොකකටවත් නොවෙයි. ඒක හරියට අජාසත්තයි, දේවදත්තයි වාගේ. අජාසත්තට රජ වෙන්න ඕනෑ වුණා. දේවදත්තට බුදුහාමුදුරුවන් පරාජය කරලා බුදුවෙන්න ඕනෑ වුණා. ඉතින්, අජාසත්තට කිව්වා තාත්තා මරලා රජකම ගන්න, මම බුදුහාමුදුරුවන් මරලා බුදු වෙන්නම් කියලා. ඒ වාගේ තමයි. අරයාට කියනවා, "විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා දෙන්නම්, ඔයා තව අවුරුදු දෙකක් ඉන්න. ඔයා ඒක කරගෙන යන්න, මට මගේ බලය ආරක්ෂා කර දෙන්න" කියලා. ඒ වාගේ තැනකට තමයි මේක තල්ලු වෙලා තිබෙන්නේ. තමුනාන්සේලා මතක තියාගන්න, මේ ක්‍රියාවලිය තවදුරටත් ඉස්සරහට යනවා නම්, it will not end up. අද අපට මේ ක්‍රියාවලිය ගැන කථා කරන්න පුළුවන්. මේ සිද්ධ වුණු සියලු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අපි අපේ ආණ්ඩුවක් තුළ අනිවාර්යයෙන් ජනාධිපති කොමිසමක් පත් කරනවා. ඒ වාගේම විශේෂ කාරක සභාවක් පත් කරනවා. සමහර වෙලාවට ඒ විනිශ්චයකාරතුමන්ලා backdate කරන්න සිද්ධ වේවි. ඒ අයට ගෙවලා තිබෙන මුදල් ආපහු ගෙවන්න වෙයි. ඒ, මේ රටේ ගෞරවනීය විනිශ්චයකාරතුමන්ලා. ඒ අයට රුපියල් ලක්ෂ 10ක විතර පඩියක් හම්බ වෙනවා. දුන්නු නඩු තීන්දු පිළිබඳව නැවත සංශෝධනයක් කරන, නැවත විමසා බැලීමක් කරන තැනකට මේ පාර්ලිමේන්තුව ගෙනෙන්න පුළුවන්. ඒ නිසා තමයි අපි කියන්නේ මේ වැරදි වැඩේට අත ගහන්න එපා කියලා. කවුරු කළත් මේක වැරදියි. මේ ආණ්ඩුව කළත් වැරදියි. *[බාධා කිරීම්]* මේ, නිකම්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වාගේ කථා කරන්නේ නැතුව ඉන්න. *[බාධා කිරීමක්]* ඔය

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමයි කථා කරන්නේ. ඒ නිසා මේ ක්‍රියාවලිය, - *[බාධා කිරීමක්]* ජේනවා නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජේනවා නේ. මේ නිසා තමයි ඒ කාලයේ එපා කියලා කිව්වේ. දැන් අපට කථා කරන්න දෙන්නේ නැහැ. ඕක තමයි තත්ත්වය. ජේනවා නේ. වෙන දා කිව්වේ මොකක්ද? බාධා කරන්න එපා, මේක කෝලම් මඩුවක් කරගන්න එපා කිව්වා. කවුද ඒවා කරන්නේ? කථා කරන්න දෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* කෑ ගහන්න එපා, ඉන්න. ඔබතුමන්ලා කථා කරන වෙලාවට මම බාධා කරන්නේ නැහැ නේ. කරුණාකර දැන්වත් ඉගෙන ගන්න. මේ අය කිව්වේ, "පාර්ලිමේන්තුව විනාශ වෙලා තිබෙනවා, ඒක හදන්න තමයි අපි ආවේ" කියලා. දැන් මම කථා කරනකොට මොකද කරන්නේ?

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ජාතිවාදය අවුස්සනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

අපි ජාතිවාදය ඇවිස්සුවේ නැහැ. තමුන්නාන්සේලා තමයි ජාතිවාදය ඇවිස්සුවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, your time is up. You have to wind up now.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ජාතිවාදය අවුස්සලා තමයි අසූ ගණන්වල මිනිස්සු මැරුවේ. අපි නොවෙයි ජාතිවාදය ඇවිස්සුවේ. 2001දී Sri Lanka Freedom Party එකට විරුද්ධව ගිහිල්ලා පාරවල් දිගේ උද්ඝෝෂණය කළේ, අපි නොවෙයි. අපි කථා කරලා උදවු කළා. තමුන්නාන්සේලා තමයි ඒවාට විරුද්ධ වුණේ. එදා ජාතිවාදය කරපින්නා ගෙන ගිය මිනිස්සු අද කල්පනා කරනවා, ජාතිවාදය කොහෙන්ද ආවේ කියලා. තමන්ගේ නැට්ටේ ඉඳලාම ජාතිවාදය තමයි තිබෙන්නේ. අපි ළඟ ජාතිවාදයක් නැහැ. මතක තියාගන්න, අපි එදාත් බලය බෙදීම වෙනුවෙන් පෙනී සිටියා; සුදු නෙළුම් ව්‍යාපාරය වෙනුවෙන් පෙනී සිටියා. අපි තමයි ඒ ක්‍රියාවලිය ඉදිරියට ගෙනාවේ. ඒ වෙනුවෙන් අනාගතයේත් අපි පෙනී ඉන්නවා. මේ රටේ සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර් කියන හැම කෙනෙකුටම සාධාරණය ඉෂ්ට කරන්න අපි අනිවාර්යයෙන් ක්‍රියා කරනවා. ඒ වාගේම අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් අපට ගන්න පුළුවන් උපරිම පියවර අපි ගන්නවා කියන එකත් මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Aboobucker Athambawa. You have eight minutes.

[பி.ப. 3.34]

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று நாங்கள் இந்தப் பாராளுமன்றத்தில் எல் நினோ தாக்கத்தால் ஏற்படும் வரட்சியால் ஏற்படப்போகும் நீர் விநியோக பாதிப்பு, நீர் நிலைகள் வற்றுதல், விவசாயம் பாதிப்புறல், உற்பத்தி வீழ்ச்சியடைதல் என்பன தொடர்பில் விவாதித்துக்கொண்டு இருக்கின்ற சந்தர்ப்பத்தில், குறிப்பாக, 'தித்வா' புயல் போன்ற இன்னுமோர் அனர்த்தம் இந்த நாட்டில் ஏற்பட்டுவிடக் கூடாதென விவாதித்துக்கொண்டு இருக்கின்ற சந்தர்ப்பத்தில், எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் இதனைக் கருத்திலே கொள்ளாது தலைப்புக்கு மாறாக இனவாதம் பேசுகின்றவர் களாக இருந்துகொண்டு இருக்கின்றார்கள். இந்த அரசாங்க மானது 20 மாதங்களைத் தாண்டிப் பயணிக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில், தேசிய மக்கள் சக்திமூலம் இந்தப் பாராளுமன்றத்துக்கு வந்திருக்கின்ற முஸ்லிம் உறுப்பினர் களாகிய நாம், கொள்கை அடிப்படையில் எமது கட்சி எமக்குக் கற்றுத்தந்தவற்றைக் கருத்திலேகொண்டு, நாட்டு மக்களுக்காக இரவு பகலாக உழைத்துக்கொண்டு இருக்கின்றோம்.

இன்று இந்தப் பாராளுமன்றத்தில் திருகோணமலை மாவட்டத்தைச் சேர்ந்த ஒரு பாராளுமன்ற உறுப்பினரும் மட்டக்களப்பு மாவட்டத்தைச் சேர்ந்த இன்னுமொரு பாராளு மன்ற உறுப்பினரும் பல கருத்துகளை முன்வைத்தார்கள். மட்டக்களப்பு மாவட்ட பாராளுமன்ற உறுப்பினர் முஸ்லிம் களுக்கு அமைச்சுப் பதவி கொடுக்கவில்லையென்ற கருத்தை முன்வைத்ததோடு, கடந்த கால வரலாற்றைக் கூறி, எல்லை நிர்ணய ஆணைக்குழுவுக்கு முஸ்லிம் ஒருவர் நியமிக்கப் படவில்லையென்ற கருத்தையும் முன்வைத்தார். திருகோணமலை மாவட்ட பாராளுமன்ற உறுப்பினர் கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் இடம்பெற்ற முஸ்லிம் பெண் பணியாளர்களின் கலாசார ஆடை சம்பந்தமான விடயம் தொடர்பில் அரசாங்கம் என்ன நடவடிக்கை எடுத்திருக்கிறதெனக் கேட்டிருந்தார். அவர்தான் இந்தப் பாராளுமன்றத்தில் குறித்த பிரச்சினை தொடர்பாக இறுதியாக உரையாற்றிய பாராளுமன்ற உறுப்பினரென நான் நினைக்கின்றேன். ஏனெனில், "எல்லோரும் பேசிவிட்டார்கள். நானும் இது பற்றி பேச வேண்டும்" என்று கூறிவிட்டே அவர் பேசினார்.

இவர்கள் பாராளுமன்றம் வந்து தொடர்ச்சியாக பிரதேசவாத, இனவாத, மதவாத அடிப்படையிலான அரசியலைச் செய்வதற்கே முயன்றுகொண்டு இருக்கிறார்கள். பாராளுமன்றத்தில் பேசுகின்ற விடயங்களை இனரீதியாக முஸ்லிம்களுக்காகப் பேசுகின்றோம் என்று பேசி, அதனை முகநூலில் பதிவிடுவதன்மூலம் தாங்கள் இழந்த அரசியல் செல்வாக்கை மீண்டும் பெற்றுக்கொள்ள இவர்கள் முயற்சிக் கிறார்கள். அவ்வாறே நாங்கள் இதனைப் பார்க்கின்றோம். முகநூலைத் திறந்தால் இவர்களுடைய சந்தர்ப்பவாத அரசியலை எங்களால் தெளிவாகப் புரிந்துகொள்ளக்கூடியதாக இருக்கின்றது.

கடந்த காலங்களில் இவர்கள் பாராளுமன்றத்துக்கு வருகின்ற தங்களது அநேகமான உறுப்பினர்களை Cabinet அமைச்சர்களாக, பிரதி அமைச்சர்களாக நியமித்துக் கொள்வார்கள். இவர்கள், தங்களுடைய வாகன permitக்காக 3 -4 கோடி ரூபாய் வரை மக்களுடைய வரிப் பணத்தைச் சுருட்டியவர்கள்; நவீன வாகனங்களைப் பாவித்தவர்கள்; ஆடம்பரமான வாழ்க்கையைக் கொழும்பில் நடத்தியவர்கள். அதுமாத்திரமல்ல, இவர்களுடைய பிள்ளைகள் வெளிநாடு களிலே கல்வி கற்றார்கள். அன்று இவர்கள் அனுபவித்ததை நாங்கள் நன்கு அறிவோம். இவர்கள் அமைச்சர்களாக இருந்தபொழுது செய்யாத விடயங்களை நாங்கள் இன்று இந்த அரசாங்கத்தில் செய்துகொண்டு இருக்கின்றோம். அமைச்சர்கள், பிரதி அமைச்சர்கள் எங்களோடு மிகவும் நெருக்கமாகப் பழகுகின்றார்கள். அவர்கள் மூலமாக நாங்கள் அவற்றைச் செய்துகொண்டு இருக்கின்றோம்.

இவர்கள் அமைச்சர்களாக இருந்த காலத்தில் இந்த நாட்டில் பல நிகழ்வுகள் நடைபெற்றிருக்கின்றன. குறிப்பாக, இன்று இங்கு பேசிய பாராளுமன்ற உறுப்பினர் கடந்த சனாதிபதித் தேர்தலின்போது பல விடயங்களை இந்த நாட்டு மக்களுக்குச் சொன்னார். அதாவது, "அநுர குமார திஸாநாயக்க தலைமையிலான தேசிய மக்கள் சக்தி இந்த நாட்டில் ஆட்சிக்கு வந்தால், முஸ்லிம்களாகிய நாங்கள் ஹஜ்ஜுக்குச் செல்ல முடியாது; உம்ரா கடமையை நிறைவேற்ற முடியாது; தாடி வளர்க்க முடியாது; பள்ளிவாசல் கட்ட முடியாது; தமிழர்கள் கோயில் கட்ட முடியாது; முழு கிழக்கு மாகாணத்தையும் விபச்சார விடுதிகளாக மாற்றி விடுவார்கள்" என்று கூறினார். அவ்வாறு கூறியவர்கள் இன்று பாராளுமன்றத்துக்கு வந்து முஸ்லிம்களுக்கு அமைச்சுப் பதவி கொடுக்கப்படவில்லையென கூக்குரல் இடுகின்றார்கள். நாங்கள் அமைச்சர்களின் எண்ணிக்கையைக் குறைத்திருக் கின்றோம். அதன்மூலம் வீண்விரயங்களைத் தவிர்த்திருக் கின்றோம்; வீழ்ச்சியடைந்திருந்த பொருளாதாரத்தைக் கட்டியெழுப்பி இருக்கின்றோம். இன்று நாட்டில் மக்கள் நிம்மதியாக வாழ்கின்ற நிலைமையை நாங்கள் பார்க்கின்றோம்.

கடந்த காலங்களில் இவர்கள் அமைச்சரவை அமைச்சர்களாக, பிரதி அமைச்சர்களாக இருந்தபோது, இந்த நாட்டில் அல்-குர்ஆன் பிரதிகள் சம்பந்தமான பிரச்சினை

ஏற்பட்டது. அதாவது, அதற்கு endnote போடுவதா அல்லது footnote போடுவதா என்ற பிரச்சினை ஏற்பட்டது. அது மாத்திரமல்ல, அப்போது சுகாதார ஊழியர்களின் பிரச்சினையும் ஏற்பட்டது. எனினும், இவர்கள் எந்தவிதமான நடவடிக்கையும் எடுக்கவில்லை. இவர்கள் ஆட்சியில் இருந்தபோதுதான் பல சுற்றுநிருபங்கள் வெளியாகின. அப்போது அவை பற்றி என்னவென்று கேட்காதவர்கள் இன்று இங்கு வந்து கூக்குரல் இடுவதைப் பார்க்கின்றோம்.

அதுமாத்திரமல்ல, நுரைச்சோலை சுனாமி வீட்டுத்திட்டப் பிரச்சினையும் இருக்கிறது. இது இவர்களுடைய காலத்தில் ஏற்பட்ட பிரச்சினையாகும். இந்த சுனாமி வீட்டுத்திட்டத்தை முஸ்லிம் மக்களுக்குப் பெற்றுக்கொடுக்க முடியுமா என்பது தொடர்பில் இன்றுகூட நாங்கள் கலந்துரையாட இருக்கிறோம். மேலும், முஸ்லிம்களுடைய காணிப் பிரச்சினையும் இருக்கின்றது. இவர்களுடைய ஆட்சிக் காலத்தில் முஸ்லிம்களின் காணிகள் நிறைய கையகப் படுத்தப்பட்டு இருக்கின்றன. இதனால் அம்மக்கள் இன்றும் அந்தக் காணிகளுக்குள் செல்ல முடியாமல் இருக்கிறார்கள். அதுமாத்திரமல்ல, புத்தளத்தின் நுரைச்சோலையிலும் பிரச்சினை இருக்கிறது; மஹர பள்ளிவாசல் சம்பந்தமான பிரச்சினையும் இருக்கிறது.

இவர்களுடைய காலத்தில் ஏற்பட்ட இந்தப் பிரச்சினைகளைக் கருத்திற்கொண்டு, நாங்கள் இந்த ஆட்சியில் அமைச்சர்களாக, பிரதி அமைச்சர்களாக இல்லாதபோதிலும் கூட, மக்களின் உரிமைகளைப் பெற்றுக் கொடுப்பதற்காகத் தொடர்ச்சியாகப் போராட வேண்டிய நிலையில் இருந்து கொண்டு இருக்கின்றோம். இங்கு இவர்கள் எல்லை நிர்ணய ஆணைக்குழு தொடர்பாகப் பேசினார்கள். அதற்கான பதிலை எங்களுடைய கௌரவ பிரதமர் அவர்கள் இந்தச் சபையில் மிகத் தெளிவாக வழங்கினார்.

இவர்களுக்கு இப்பொழுது தேவை என்னவெனில், கடந்த காலங்களில் தாங்கள் இழந்த அரசியல் செல்வாக்கை மீளவும் பெற்றுக்கொள்வதுதான். கடந்த காலங்களில் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸும் ஏனைய முஸ்லிம் கட்சிகளும் இழந்த அரசியல் செல்வாக்கை மீண்டும் பெற்றுக்கொள்வதற்காக இவர்கள் போடுகின்ற கபட நாடகமாகவே நாங்கள் இதனைப் பார்க்கின்றோம். இந்த நாட்டில் வடக்கு, கிழக்கிலும் வடக்கு, கிழக்குக்கு வெளியேயும் வாழ்கின்ற முஸ்லிம் மக்கள் இந்த ஆட்சிமீது நம்பிக்கை வைத்தவர்களாகக் காணப்படுகின் றார்கள். ஒரு தேர்தல் நடந்தால் இவர்களுக்குப் புரியும். முகப்புத்தகத்தில் பதிவுகளை இடுகின்றவர்கள் தொடர்ச்சி யாகப் பதிவுகளை இட்டுக்கொண்டு இருக்கின்றார்கள். இதன்மூலம் தேசிய மக்கள் சக்திக்கு வாக்களித்த மக்களை ஒருபோதும் தங்களது பக்கம் மீட்டுவிட முடியாது. அம்பாறை மாவட்டத்தின் கரையோரப் பிரதேசங்களில் கடந்த காலங்களில் செல்வாக்குச் செலுத்திய இந்தக் கட்சிகள், இன்று செல்வாக்கு இழந்து காணப்படுகின்றன. தேசிய மக்கள் சக்தியானது அம்பாறை மாவட்டத்தின் கரையோரப் பகுதிகளில் மாத்திரமல்ல, இந்த நாட்டின் அனைத்துப் பிரதேசங்களிலும் இருக்கின்ற முஸ்லிம்களின் நன்மதிப்பைப் பெற்றிருக்கின்றது. எனவே, இந்த நாட்டில் இருக்கின்ற முஸ்லிம் மக்கள் தொடர்ந்தும் தேசிய மக்கள் சக்தியின்பால் பயணிப்பார்கள் என்பதை இந்தச் சந்தர்ப்பத்தில் கூறிக் கொள்கின்றேன்.

அடுத்து, எல்நினோ தாக்கத்தால் நாட்டில் இருக்கின்ற ஏழு மாவட்டங்களிலுள்ள 22 பிரதேச செயலாளர் பிரிவுகளில் வறட்சி நிலைமை ஏற்பட்டு இருக்கின்றது. அம்பாறை மாவட்டத்தின் திருக்கோவில், பொத்துவில், நாவிதன்வெளி, பதியத்தலாவை, லகுகல போன்ற பிரதேசங்களில் இந்த நிலைமை ஏற்பட்டு இருக்கின்றது. மாண்புமிகு சனாதிபதி அவர்களின் தலைமையில் கூடிய பல குழுக்கள் இதற்குரிய வேலைகளை முன்னெடுத்து வருகின்றன. குறிப்பாக, மாவட்ட மற்றும் பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களிலும், அங்கிருக்கின்ற அனர்த்த முகாமைத்துவக் குழுக்களுடனும் பேசி செயற்பட்டு வருகின்றன. இப்பொழுது இந்த நாட்டில் ஏற்பட்டிருக்கின்ற வறட்சி நிலைமைக்கு முகங்கொடுக்கும் வகையில், நீர்ப்பாசனத் திணைக்களம், தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபை என்பன மும்முரமாகச் செயற்பட்டு வருகின்றன. இந்த வறட்சி நிலைமையிலிருந்து மக்களைப் பாதுகாப்பதற்கு அரசாங்கம் தன்னால் முடிந்த அனைத்து முன்னேற்பாடுகளையும் செய்திருக்கின்றது எனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. (Dr.) Susil Ranasinghe. You have 13 minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. (Prof.) Sena Nanayakkara to the Chair?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
Sir, I propose that the Hon. (Prof.) Sena Nanayakkara do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 3.44]

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආගමික අන්තවාදය පතුරුවන්න, ජාතිවාදය පතුරුවන්න අපි කවදාවත් අත උස්සලා නැහැ කියලා හොඳටම කට උස්සලා ගියා. මම අහන්නේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධ වෙන්න ආගමික වෛරය වපුරන එක, ආගම්වාදය හදන එක කොච්චර කැතද කියලායි. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ඕනෑ තරම් විද්වත්, විදග්ධ විවේචන, අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි ඒකට ආගම ගාවගන්න එක

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

කොච්චර කැතද? මේ පාර්ලිමේන්තුවේදී රටටම ඇහෙන්න මෙවැනි ප්‍රකාශ කරන්න තරම් මේ මන්ත්‍රීවරු බංකොලොත් වීම ගැන අපි කනගාටු වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම රාජ්‍ය ධනය අවභාවිත කිරීම සම්බන්ධ චෝදනා තිබෙන පුද්ගලයන් අධිකරණය විධිමත් කරන්න ගෙනෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරන එකත් සදාචාරාත්මක නැහැ කියලායි මම හිතන්නේ. මධ්‍යස්ථ මතධාරීන්, නීතිය කඩපු නැති පුද්ගලයන්, නීතියට අවනත වෙලා නීතියට ගරු කරපු මිනිස්සු මේ ගැන කථා කරනවා නම් ඒක සාධාරණයි. ඒ හඬට රට ඇහුම්කන් දෙනවා. නමුත් මේ චෝදනා තිබෙන පුද්ගලයෝ රෙදි නැතිව මෙතැන කෑ ගහන එක කොච්චර සදාචාරසම්පන්නද කියලා අසමින්, එල් නිනෝ තත්ත්වය සම්බන්ධයෙන් පැවැත්වෙන විවාදයට ප්‍රවේශ වන්න මම කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1950න් පසුව එල් නිනෝ තත්ත්ව 18කට අපි රටක් හැටියට මුහුණ දීලා තිබෙනවා. ඉන් තුනක් ප්‍රබල එල් නිනෝ තත්ත්ව කියලා තමයි සඳහන් වන්නේ. දැනුත් අපි එල් නිනෝ තත්ත්වයකට මුහුණ දෙමින් ඉන්නවා. ඒක ප්‍රබල තත්ත්වයකට පත් වෙයි කියලා කාලගුණ විද්‍යා අංශ අදහස් දක්වනවා; පුරෝකථනය කරනවා. මේ එල් නිනෝ තත්ත්වය සම්බන්ධයෙන් පළ වන වාර්තා, කථා කරන සමහර කරුණු සම්බන්ධයෙන් බැලුවාම, මේක පොඩ්ඩක් අතිශයෝක්තියෙන් අරගෙන තිබෙනවා කියලාත් පෙනෙන්න තිබෙනවා. නමුත් මේක අතිශයෝක්තියෙන් ගන්න අවශ්‍ය නැහැ. මේක භයානක තත්ත්වයක් විධියටත් අර්ථ දක්වන්න අවශ්‍ය නැහැ. හැබැයි, අවතක්සේරු කරන්නත් නරකයි. අපි මේක මඟ හැර යන්නත් නරකයි. මේ පුරෝකථනත් එක්ක ප්‍රායෝගිකව කොච්චර බලපෑමක් එනවාද, ඒකට මුහුණ දෙන්න සකස් කරන්න ඕනෑ වැඩ පිළිවෙළ මොකක්ද කියන එක සම්බන්ධයෙන් තමයි රජයක් විධියට අපි කටයුතු කරමින් ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෑතකදී - මාස නවයකට කලින් - අපි "දිට්වා" සුළි කුණාටුවෙන් බැට කෑවා. අපි විවිධ දේශගුණික විපර්යාසවලටත් මුහුණ දෙමින් ඉන්නවා. ඒ අත්දැකීම් නිසාම, දේශගුණික විපර්යාස නිසා අපට තවදුරටත් බලපෑමක් එන්න ඉඩ තිබෙනවාය කියනකොට අපි කලබල වනවා. ඒ කලබල වීමත් සාධාරණයි. නමුත් අපි කලබල නොවී යථාර්ථයට මුහුණ දෙමින්, නිවැරදි දත්ත සහ තොරතුරු මත පදනම් වෙලා යම් වැඩ පිළිවෙළකට යන්න ඕනෑය කියන අදහසින් තමයි ක්‍රියාත්මක වෙමින් ඉන්නේ.

එල් නිනෝ තත්ත්වය ගැන පුරෝකථනය කළාට පස්සේ ජනාධිපතිතුමා මැදිහත් වෙලා ව්‍යසන කළමනාකරණ ජාතික සභාව කැඳෙව්වා. ගතයුතු යම් යම් තීන්දු තීරණ සහ ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් එතැනදී සාකච්ඡා කළා. ඊට පස්සේ ජූලි මාසයේදීම කැබිනට් මණ්ඩලය අනුමත කරලා අමාත්‍ය අනුකමිටුවක් පත් කළා, මේ එල් නිනෝ තත්ත්වයට මුහුණ දීමටත්, එල් නිනෝ තත්ත්වයේ බලපෑම් අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත්. ඇමතිවරුන් විතරක් නොවෙයි, අදාළ හැම ආයතනයකම ප්‍රධානීන් එකතු වෙලා තමයි ඒ කටයුතු කරන්නේ, තිබෙන තත්ත්වය සමාලෝචනය කරන්නේ. මේ වනකොටත් අපි තුන් වතාවක් රැස්වෙලා තිබෙන තත්ත්වය සමාලෝචනය කරලා ක්‍රියාමාර්ග කිහිපයක් අරගෙන, ඒ ඔස්සේ ගමන් කරමින් තිබෙනවා.

මේ එල් නිනෝ තත්ත්වයට මුහුණ දීම සඳහා පත් කරපු කමිටුව අද උදේත් රැස් වුණා. ජනාධිපතිතුමාත් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළා. ආපදාවක් ඇති වන වෙලාවේ ක්‍රියාත්මක වන යන්ත්‍රණය තමයි, ආපදා කළමනාකරණ යන්ත්‍රණය. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ආපදා සහන සේවා මධ්‍යස්ථානය තිබෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේයි. ආරක්ෂක අමාත්‍යවරයා විධියට ජනාධිපතිතුමා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. මෙම එල් නිනෝ තත්ත්වයට මුහුණ දීම සඳහා වූ යන්ත්‍රණය සකස් වී තිබෙන්නේ මේ විධියටයි. කැබිනට් මණ්ඩලයේ අනුකමිටුවක් තිබෙනවා. කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා විධියට ජනාධිපතිතුමා එය අධීක්ෂණය කරනවා. ඒ වාගේම ආපදා කළමනාකරණ යන්ත්‍රණය තිබෙනවා. ඒ යන්ත්‍රණයත් සෘජුව ජනාධිපතිතුමා මෙහෙයවන අමාත්‍යාංශයක් යටතේ තමයි තිබෙන්නේ.

මේ වනකොට පානීය ජලය සම්බන්ධයෙන් තිබෙන දත්ත ගැන මම විශේෂයෙන්ම සාකච්ඡා කරන්න කැමැතියි. අපි දන්නවා, අපේ රටේ පානීය ජල සම්පාදනය සම්බන්ධයෙන් පවතින දැවැන්තම ආයතනය වන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - National Water Supply and Drainage Board - බව. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ජල යෝජනා ක්‍රම සඳහා භාවිත කරන ජල මූලාශ්‍ර වැඩිම ප්‍රමාණයක් තිබෙන්නේ ගංගා ආශ්‍රිතවයි. විශේෂයෙන්ම කැලණි ගඟ, කළු ගඟ ආදී ගංගා ආශ්‍රිතව තමයි වැඩිම ජල මූලාශ්‍ර ප්‍රමාණයක් තිබෙන්නේ. ඒ වාගේම භූගත ජලය ලබා ගන්නා මූලාශ්‍ර 59ක් තිබෙනවා. මේ ජලාශවලින් - ස්ථාන 58කින් - දවසකට ඝන මීටර් 716,580ක්, දළ වශයෙන් ඝන මීටර් 700,000ක් ජල සම්පාදන කටයුතු සඳහා ලබා ගන්නවා. මුහුදු ජලය පාවිච්චි කරන තැන් තුනක් තිබෙනවා. ඒ වාගේම දිය ඇළි සහ වෙනත් ජල මූලාශ්‍ර පාවිච්චි කරන තැන් තිබෙනවා.

දැනට තිබෙන මේ එල් නිනෝ තත්ත්වය නිසා අපට ප්‍රධාන වශයෙන්ම ගැටලුවකට මුහුණ දීමට සිද්ධ වෙන්නේ භූගත ජලය පාවිච්චි කරන තැන් සම්බන්ධවයි. හැම තැනම නොවෙයි, තැන් කිහිපයක් පිළිබඳව තමයි ගැටලුවක් තිබෙන්නේ. දැනට ගංගා ආශ්‍රිත ජල මට්ටම සම්බන්ධයෙන් ලොකු ගැටලුවක් නැහැ. ඉදිරියේදීත් ගැටලුවක් ඇති නොවේ යැයි කියා අපි පුරෝකථනය කරනවා. දැනට තිබෙන පුරෝකථනය අනුව අගෝස්තු මාසය සහ සැප්තැම්බර් මාසය අවසන් වෙනකම් තමයි මේ වියළි කාලගුණ තත්ත්වය පවතියි කියලා හිතන්නේ. සැප්තැම්බර් මාසය අන්තිම වනවිට වැසි වැටෙයි කියලා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පුරෝකථනය කරනවා. එතකොට අද ඉඳලා ගත්තාම, මේ අවුරුද්දේ දළ වශයෙන් මාසයක වාගේ කාලයක් තමයි අපට මේ එල් නිනෝ තත්ත්වයට - අසීරුම කාලයට - මුහුණ දෙන්න වෙන්නේ. ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල වහිනවා, ජනවාරි මාසයේදීත් වහිනවා කියලා තමයි කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පුරෝකථනය කරන්නේ. පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් කියන මාස තුන තුළ අපි අපේක්ෂා කරනවාට වඩා වැඩි වියළි කාලගුණයක් පවතී කියලා තමයි පුරෝකථනය කරන්නේ. ඒ කාලය තුළ වැස්ස අඩු වෙයි. ඒ නිසා එම කාලය තුළ වියළි කාලගුණයක් තමයි පවතින්නේ. ඒ අනුව අද ඉඳලා සැප්තැම්බර් මාසය අවසන් වනතුරු සහ නැවත පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් කාලය තුළ ජල මූලාශ්‍ර සිඳී යෑම නිසා ජල ගැටලුව ඇති වෙන්න පුළුවන්. ඒ නිසා අපි අමාත්‍යාංශය විධියටත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විධියටත්, ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව විධියටත්, රජය විධියටත් මේ කාල දෙකටම මැදිහත් වීමට සූදානම් වෙමින් ඉන්නේ. ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල වැස්ස වැඩියි. ඒ නිසා ගංවතුර ගලන මට්ටමට වර්ෂාව වැඩි වෙයි කියලා පුරෝකථනය කර තිබෙනවා. ඒ අනුව වර්ෂා කාලය සහ වියළි කාලගුණය කියන මේ කාල වකවානු දෙකට මුහුණ දීම සඳහා තමයි අපි සූදානම් වෙමින් ඉන්නේ.

දැනට තිබෙන තත්ත්වය අනුව අපේ ප්‍රධාන ජලාශ තිබෙන්නේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් කළමනාකරණය කරන පද්ධතිය තුළයි. ඒ වාගේම වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ කළමනාකරණය කරන ජලාශ 73ක් තිබෙනවා. ඒවා තමයි අපේ රටේ තිබෙන ප්‍රධාන ජලාශ. ඒ ජලාශවලින් - ස්ථාන 58කින් - තමයි ජල සම්පාදන මණ්ඩලය පිරිපහදු කටයුතු සඳහා ජලය ලබා ගන්නේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය කියන විධියට අද වනකොට මේ ප්‍රධාන ජලාශවල ජල මට්ටම සියයට 50ක සාමාන්‍ය අගයක තිබෙනවා. සියයට 50ක් කිව්වාට, හැම ජලාශයකම සියයට 50ක ජල මට්ටමක් නැහැ. සමහර ජලාශවල සියයට 25ක් වාගේ ජල මට්ටමක් පවතින්නේ. ඒ වාගේම සමහර ජලාශවල සියයට 30ක වාගේ ජල මට්ටමක් තමයි පවතින්නේ. කඳුකර ප්‍රදේශයේ සමහර ජලාශවල සියයට 60ක්, 70ක් වාගේ ජල මට්ටමක් තිබෙනවා. ඒ නිසා අපට මේ පද්ධතිය තුළ ජල කළමනාකරණයක් කර ගන්න පුළුවන්.

දැනට තිබෙන පුරෝකථන අනුව සහ දැනට මේ ජලාශවල තිබෙන ජල මට්ටම් අනුව තව මාසයකට - සැප්තැම්බර් මාසය අවසාන වෙනකම් - මේ ජලාශවලින් ජලය ලබා ගන්න පුළුවන්. ඒ අනුව ජලය පිරිපහදු කර බෙදා හරින පද්ධතියට කිසිදු ගැටලුවක් ඇති වෙන්නේ නැහැ කියා තමයි වාරිමාර්ග දෙපාර්තමේන්තුවත්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියත් පුරෝකථනය කරන්නේ. ඒ නිසා ජල සම්පාදන මණ්ඩලය දවසකට දළ වශයෙන් පවුල් ලක්ෂ 14කට, 15කට විතර ජලය ලබා දෙන්න පාවිච්චි කරනු ලබන ජලාශවල ගැටලුවක් ඇති නොවෙයි කියා හිතාගෙන තමයි අපි කටයුතු කරන්නේ. ගංගා ආශ්‍රිතව ගත්තොත්, දළ වශයෙන් දවසකට පවුල් ලක්ෂ 40කට විතර අවශ්‍ය වන ජල ප්‍රමාණයක් ගංගාවලින් ගන්නවා. දැනට ගංගාවල පවතින ජල තත්ත්වය සම්බන්ධයෙන් ගැටලුවක් නැහැ. ඉදිරි මාසයේදීත් ගැටලුවක් ඇති වේ යැයි කියලා දැනට අපි හිතන්නේ නැහැ. නමුත් අපි ඒ ගැන විමසිල්ලෙන් ඉන්නවා. අපට ගැටලුවක් එන්නේ භූගත ජලය පාවිච්චි කරන හැම තැනම සම්බන්ධයෙන් නොවෙයි, තැන් කිහිපයක් සම්බන්ධයෙන්. විශේෂයෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ, මොනරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනට ගැටලුවක් ඇති වෙලා තිබෙනවා, ජල සම්පාදන මණ්ඩලය භූගත ජලය ගන්නා ස්ථානයක. ඒ නිසා බවුසර් මඟින් ජල සම්පාදන කටයුතු කිරීම ආරම්භ කරලා තිබෙනවා. ඒ සඳහා පූර්ව සූදානමක හිටියා, ජල සම්පාදන මණ්ඩලය. ඇත්තටම අපි මීට මාස දෙක තුනකට කලින් එකතු වෙලා ජල සම්පාදන මණ්ඩලය පූර්ව සූදානමක් සහිතව කරන්න ඕනෑ වැඩ මොනවාද කියලා බලලා, වැඩසටහනක් හදාගෙන ඒ සඳහා මුහුණ දෙන්න සූදානම් වුණා. මීට මාස දෙක තුනකට ඉස්සෙල්ලා තමයි අපි මේ තත්ත්වයට මුහුණ දීම සඳහා ජල සම්පාදන මණ්ඩලයේ තිබුණු බවුසර් පවා සර්විස් කළේ. එහෙම සූදානමක් සහිතව ඒ කටයුතු අපි කරගෙන යනවා. නමුත් අපි දන්නවා, ගෙදර ටැප් එකෙන් වතුර එන්නේ නැතුව බවුසරයකින් වතුර දීලා පිරිමහන්න බැහැ කියන එක. ඒක අපහසුතාවක්. ඒ තත්ත්වය අවම කිරීම සඳහාත්, ජනතාවට උපරිම සහනයක් සැලසීම සඳහාත් අපි මැදිහත් වෙමින් ඉන්නවා.

ආපදා කළමනාකරණ යාන්ත්‍රණය හරහා ජල සම්පාදනය කරනකොට කලින් චක්‍රලේඛවල තිබුණේ එක පුද්ගලයෙකුට දවසකට ලීටර් 5ක් ජලය සම්පාදනය කරන්න ඕනෑ කියායි. ඒ කියන්නේ, බීමට ගන්න ජලය ප්‍රමාණය විතරයි දෙන්නේ. ඒකෙන් සෑහීමකට පත් වෙන්න බැහැ. අපි දන්නවා, ජල මූලාශ්‍ර හිඳෙනවා කියන්නේ ඒ පැත්තේ පවතින්නෙත් වියළි කාලගුණයක් බව. වෙනත් කටයුතු සඳහා ජලය ගන්නත් නැහැ. අපි දවසකට එක්කෙනෙකුට ජලය ලීටර් 5ක් දුන්නාට මදි. ඒ නිසා එම චක්‍රලේඛ වෙනස් කරලා, බවුසර් මඟින් ජලය සම්පාදනය කරද්දී එක පුද්ගලයෙකුට ලීටර් 15ක්වත් දෙන්න කියන ඒ තීරණය අනුකම්පාව හැටියට අපි ගත්තා. එතකොට එක පවුලකට යම් මට්ටමකට සෑහෙන ප්‍රමාණයක් බවුසර් මඟින් ජලය දෙන්න පුළුවන්. නමුත් අපි අද තීරණය කළා, තවදුරටත් ජල සම්පාදන කටයුතුවලට විතරක් නොවෙයි, ඔවුන්ගේ ජල මූලාශ්‍ර සම්බන්ධයෙනුත් මැදිහත් වෙන්න.

අපි හිතමු, ළිඳක් තිබෙනවාය කියලා. එහෙනම් ඒ ළිඳ සුද්ද කර ගන්න ඕනෑ. ඒ වාගේම නළ ළිඳක් තිබෙනවාය කියලා අපි හිතමු. නමුත් ඒක පාවිච්චියට ගන්න බැහැ. හැබැයි, ඒක සුද්ද කරලා මොනයම් හරි කටයුත්තකට පාවිච්චියට ගන්න පුළුවන්. එවැනි දේවල් තිබෙනවා නම් ඒ ගැන සොයා බලා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හරහා ඒවාට මැදිහත් වෙමින් ක්‍රියාත්මක වෙන්නත් අපි තීරණය කළා.

රට පුරාම නළ ළිං ගොඩක් තිබෙනවා. ඒ නළ ළිං සම්බන්ධයෙන් සහ ජල මූලාශ්‍ර සම්බන්ධයෙන් ප්‍රාදේශීය ආපදා කළමනාකරණ කමිටුවෙන් තීරණ ගන්න පුළුවන්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් මූලික කරගෙන. එතැන ප්‍රාදේශීය සභාව තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තිබෙනවා. අවශ්‍ය නම් එතැනට National Water Supply and Drainage Board එකේ නිලධාරීන් වාගේම ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගෙන්වා ගන්න පුළුවන්. එතකොට මේ සියලුදෙනාට එකතු වෙලා ඒ ප්‍රදේශයේ තිබෙන ජල මූලාශ්‍රවල තත්ත්වය සම්බන්ධයෙන් අපට වාර්තා කරන්න, යෝජනා ඉදිරිපත් කරන්න වාගේම අවශ්‍ය දේ ඉල්ලන්න පුළුවන්. ඒ ඉල්ලන ඒවා සම්පාදනය කරන්න ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ආපදා සහන සේවා බලකාය හරහා ක්‍රියාත්මක වෙමු කියන තීරණය අපි අරගෙන තිබෙනවා. ඒ නිසා ප්‍රාදේශීය ආපදා කළමනාකරණ කමිටුව රැස් වෙලා පූර්ව සූදානමක් සහිතව දැන් ආපදාවට ලක් වෙලා ඉන්න ජනතාවට සහන සැලසීම සඳහා ක්‍රියාත්මක වෙන්න පුළුවන්. අපි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හරහා දැනටමත් ගණන් බලා තිබෙනවා, ඒ ඒ ප්‍රදේශවල කොච්චර බවුසර් තිබෙනවාද කියලා. ඒ වාගේම පෞද්ගලික අංශයේ බවුසර් කොච්චර තිබෙනවාද කියලා හොයා ගන්න කියාත් අපි දැනුම් දීලා තිබෙනවා. එතකොට යම් තැනක ජල මූලාශ්‍රයක් හිඳිලා පානීය ජලය නැති වුණොත් ජල සම්පාදන කටයුතු කරන්න පහසුයි.

ජල සම්පාදන මණ්ඩලයේ තිබෙනවා, භූගත ජල අංශය. ඒ, නළ ළිං හදන, නළ ළිං සර්විස් කරන, නළ ළිං පිළිසකර කරන අංශය. ඒ අංශය අපි කිහිප වතාවක් කැඳෙව්වා. ඒ අනුව ඔවුන්ට අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා දැන් අපි සූදානම් වෙමින් ඉන්නවා. ඔවුන් දැනටමත් බලාපොරොත්තු වෙනවා නළ ළිං කිහිපයක්ම අලුතින් ඉදි කරන්න වාගේම තිබෙන ඒවා සුද්ද පවිත්‍ර කරන්න. ඒ වාගේම තවත් නළ ළිං ප්‍රමාණයක් තිබෙනවා, අලුත්වැඩියා කරලා සේවාව ලබා ගන්න පුළුවන්. එහෙමත් සූදානමක් තිබෙනවා. පානීය ජලය සම්බන්ධයෙන් දැනට තිබෙන තත්ත්වය ගත්තොත්, ජලාශවලින්, ගංගාවලින් ගන්න ජල මූලාශ්‍රවල කිසි ගැටලුවක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඉදිරි සැප්තැම්බර් මාසය අවසාන වෙනකම් අපට ගැටලුවක් නැති වෙයි. භූගත ජලය පාවිච්චි කරන තැන්වල තමයි ගැටලු ඇති වෙන්න පුළුවන්. තැනක දෙකක ගැටලු ඇවිල්លාත් තිබෙනවා. හැම තැනම ගැටලු ඇති වන එකක් නැහැ. නමුත් ගැටලුවක් ආවොත් ඒ ගැටලුව විසඳීම සඳහා අපි සූදානමින් ඉන්නවා. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විධියට අපි මේ සියලු දේවල් සඳහා මුහුණ දෙමින් ඉන්නවා. කිසිදු කෙනෙක් අපහසුතාවට පත් නොකර ඔවුන්ට ජලය සැපයීම සඳහා අපි සූදානමින් ඉන්නවාය කියමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 8ක කාලයක් තිබුණා නේ. මට ඒ විනාඩි 8ම දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන්නේ විනාඩි 6ක් කියලා තමයි සඳහන් වෙන්නේ.

[பி.ப. 3.58]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
හොඳයි.

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு முன்பு உரையாற்றிய ஆளுங்கட்சியைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர் அவர்கள், பழைய பாராளுமன்ற உறுப்பினர்களும் அமைச்சர்களும் வாகன permit எடுத்து 3 கோடி ரூபாய்க்கு விற்பனை செய்ததாகச் சொன்னார். பழையவர்கள் மாத்திரமல்லாமல் எல்லோரும் வாகன permit பெற்றார்கள் என்பது உங்களுக்கும் தெரியும். உங்களுடைய ஜனாதிபதி அவர்கள் பெற்றார்; பிரதம மந்திரி அவர்கள் பெற்றிருக்கிறார்; அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் பெற்றிருக்கிறார்; அமைச்சர் விஜித ஹேரத் அவர்கள் பெற்றிருக்கின்றார். அந்த நேரம் எல்லோருக்கும் வாகன permit கொடுத்தார்கள். அவர்கள் சிலர் அதனை 3 கோடி ரூபாய்க்கு விற்றிருக்கிறார்கள். ஆனால், உங்களுடைய தலைவர்களும் உங்களுடைய கட்சிக்காரர்களும்கூட அதனைப் பெற்றிருக்கிறார்கள் என்பதை மறந்து, நீங்கள் மற்றவர்களைத் தாக்கிக் கொண்டிருப்பது மிகவும் கவலையான விடயம் என்பதைச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்ததாக, இந்த நாட்டிலே climate change ஊடாக பெரும் சூறாவளி ஏற்பட்டு, வெள்ளப்பெருக்கு ஏற்பட்டு, இப்போது நாம் வரட்சியை எதிர்நோக்கிக் கொண்டிருக் கின்றோம். ஆகவே, எங்களுடைய நீர்ப்பாசனத்துக்குப் பொறுப்பான அமைச்சும் நீர் வழங்கலுக்குப் பொறுப்பான அமைச்சும் சேர்ந்து இந்த வரட்சி சம்பந்தமான விடயங்களுக்கு முகங்கொடுக்கும் வகையில் திட்டமிட்டவாறு சில நடவடிக்கைகளைச் செய்யவேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய முஸ்லிம் சமூகம் சம்பந்தமான சில விஷயங்களை நாங்கள் இந்தப் பாராளுமன்றத்திலே பேசுகின்றபோது, ஆளுங்கட்சியைச் சேர்ந்த முஸ்லிம் உறுப்பினர்கள் எங்களை வேறுவிதமான முறையிலே நோக்கி, இனவாதிகள் என்றும், பிரச்சினையை ஏற்படுத்துபவர்கள் என்றும் சொல்கிறார்கள். இவர்கள் ஆட்சிக்கு வந்து 2 வருடங்களாகப் போகின்றது. பழையவர்கள் பிழைகளைச் செய்தார்கள் என்றுதான் மக்கள் உங்களை ஆட்சிக்குத் தெரிவு செய்திருக்கிறார்கள். எனவே, அவர்களுடைய பிழையைச் சொல்லிச் சொல்லியே காலத்தைக் கடத்த வேண்டிய அவசியம் இல்லை. நீங்கள் நல்ல விஷயங்களைச் செய்யுங்கள்; மக்கள் உங்களுக்கு உதவி செய்வார்கள். எதிர்க்கட்சியினராகிய நாங்களும் உங்களுடைய நல்ல விஷயங்களுக்கு help பண்ணுகின்றோம்; ஒத்துழைப்பு வழங்குகின்றோம். ஆகவே, நீங்கள் நல்ல காரியங்களில் ஈடுபடுமாறு நான் அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

இந்தப் பாராளுமன்றத்திலே ஒரு பாராளுமன்ற உறுப்பினர் - ஒரு கட்சியின் பிரதிநிதி, "அமைச்சரவையிலே ஒரு முஸ்லிம் அமைச்சர்கூட இல்லை" என்று சொன்னால் அவ்வாறு பேசக்கூடாது என்று சொல்கிறார்கள். உங்களுக்கு எதற்கு அமைச்சர் பதவி? என்று கேட்கிறார்கள். அவ்வாறு யார் கேட்கிறார்கள் என்றால், எங்களுடைய முஸ்லிம் சமூகத்தைச் சேர்ந்த சகோதரர்கள்தான் கேட்கிறார்கள். ஆனால், அதன் பெறுமதி அவர்களுக்கு விளங்கவில்லை. அமைச்சரவையில் ஒரு முஸ்லிம் அமைச்சர் இருந்திருந்தால் அவரது ஆலோசனைப்படி ஜித்தாவில் தூதரக அதிகாரி நியமனம் வழங்கப்பட்டிருந்தால் அங்கு நடந்த பிரச்சினை இடம்பெற்றிருக்காது. இப்போது அந்த நியமனத்தை இரத்துச் செய்து வேறொருவரை நியமித்திருக்கிறீர்கள். ஆகவே, அமைச்சரவைப் பிரதிநிதித்துவம் என்பது இந்த நாட்டைப் பொறுத்தவரையில் மிக முக்கியமான ஒரு விடயம். அது சம்பந்தமாக நாங்கள் பேசக்கூடாதென்று எங்களை நீங்கள் தடைசெய்யக் கூடாது. ஏனென்றால், மாண்புமிகு சனாதிபதி அவர்கள் எங்களைப்போல பேசிப்பேசித்தான் நாட்டில் பலமான ஆட்சியை ஏற்படுத்தியிருக்கின்றார். அவருடைய பலமே எதிர்க்கட்சியில் இருந்தபொழுது அவர் பேசிய பேச்சுகள்தான். எனவே, அந்தப் பலத்தைப் பெறுவதற்குத்தான் நாங்கள் பேசிக்கொண்டிருக்கிறோம்; நல்ல விடயங்களுக்கு உங்களுக்கு ஒத்துழைப்பு வழங்கிக் கொண்டிருக்கின்றோம். அந்த வகையில், இன்றைய அமைச்சரவையில் முஸ்லிம் அமைச்சர் ஒருவர் இல்லை என்ற கவலையால் எங்கள் முஸ்லிம் சமூகம் வருந்துகிறது என்பதை நான் இந்தச் சபையில் சொல்ல வேண்டும்.

அதுபோல், உங்களுடைய Clean Sri Lanka திட்டத்திற்கு committee ஒன்றை அமைத்தீர்கள். அதில் இந்த நாட்டில் வாழும் முஸ்லிம்களின் பிரதிநிதி ஒருவர் இல்லை. கல்வி மறுசீரமைப்பு பற்றிய தேசிய வழிநடத்தல் குழுக்களை உருவாக்கினீர்கள்! அதிலும்கூட முஸ்லிம் பிரதிநிதிகள் இல்லை. இவ்வாறு பாராளுமன்றத்தில் உங்களுக்கு நாங்கள் நிறைய விஷயங்களைச் சொல்லலாம். இறுதியாக நாங்கள் ஒன்றைச் சொல்கின்றோம், கோட்டாபய ராஜபக்ஷ அவர்கள் சனாதிபதியாக இருந்த காலத்தில் எரிக்கப்பட்ட முஸ்லிம்களுடைய ஜனாசாக்கள் பற்றிய பெயர்ப் பட்டியலைக்கூட, சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களுடைய ஆட்சியில் நீங்கள் தரவில்லை என்பது எங்களுக்குக் கவலையாக இருக்கின்றது என்பதை உங்களுக்குச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். இவ்வாறு ஒவ்வொரு விடயத்தையும் நீங்கள் பார்க்கலாம்.

அண்மையில் நியமிக்கப்பட்ட தேசிய எல்லை நிர்ணய ஆணைக்குழுவில் எங்களுடைய முஸ்லிம் சமூகத்தைச் சேர்ந்த ஒருவர் இல்லை. நேற்று முன்தினம் இந்தச் சபையில், கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஹிஸ்புல்லாஹ் அவர்களின் வினாவொன்றுக்கு கௌரவ பிரதம மந்திரி அவர்கள் அளித்த பதிலை எங்களால் ஏற்றுக்கொள்ள முடியாமல் இருந்தது.

பிரதம மந்திரி அவர்கள் நாட்டின் இரண்டாவது பிரஜை. எங்கள் சார்பில் ஒரு பிரதிநிதி இல்லாததை ஏற்றுக்கொள்ளக்கூட முடியாமல், வேறு ஒரு பதவிக்கு interview நடத்தினமாதிரி அதற்கான பதில் கிடைத்தது. த

ஆரம்ப காலத்தில் இருந்தே தேசிய எல்லை நிர்ணய ஆணைக்குழுவில் பேராசிரியர் எஸ்.எச். ஹஸ்புல்லாஹ் இருந்திருக்கின்றார். அதேபோல், ஏ.எம். நஹியா இருந்திருக்கின்றார். இவர் புனர்வாழ்வு அதிகாரசபையின் பணிப்பாளராகவும் இருந்திருக்கின்றார். எம்.ஐ. அமீர் ஏற்றுமதி விவசாய இராஜாங்க அமைச்சின் செயலாளராக இருந்திருக்கின்றார். இந்த வரலாறு உண்மையானது என்பது உங்களுக்குத் தெரியும். இவ்வாறு முஸ்லிம்கள் இருந்த இடத்தில் மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களின் ஆட்சியில் முஸ்லிம் பிரதிநிதிகள் இல்லை. நான் முதலில் குறிப்பிட்டதுபோன்று கல்வி மறுசீரமைப்பு தேசிய வழிநடத்தல் குழுவில் இல்லை; Clean Sri Lanka திட்டத்தில் இல்லை; அமைச்சரவையில் இல்லை; தேசிய எல்லை நிர்ணய ஆணைக்குழுவிலும் இல்லை. நீங்கள்தான் சனாதிபதி, நீங்கள்தான் பிரதம மந்திரி, நீங்கள்தான் அரசாங்கம் என்ற வகையில் நாட்டின் மக்களை ஆளவேண்டிய உங்களுக்கு ஒரு கடமை இருக்கின்றது. Interview நடத்துகின்றபொழுது, ஒரு வேலையைச் செய்கின்றபொழுது சமத்துவம் இருக்க வேண்டும். இந்த நாட்டில் வாழும் முஸ்லிம் சமூகத்தைச் சேர்ந்தவர்கள் அமைச்சரவையில் அமைச்சராக நியமிக்கப் படுவதற்குத் தகுதியற்றவர்கள் என்று நீங்கள் சொல்வதுபோல, தேசிய எல்லை நிர்ணய ஆணைக்குழுவில் நியமிப்பதற்கும் முஸ்லிம் சமூகத்தில் ஒருவர் இல்லையா? எனக் கேட்கின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක අමතර කාලයක් ලැබෙනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
Thank you very much.

தேசிய எல்லை நிர்ணய ஆணைக்குழுவின் Interviewக்கு இரண்டு பேர் வந்தார்கள். வந்தவர்கள் சிறியவர்கள் அல்லர். தொழில்நுட்ப அறிவுள்ளவர்கள்; விடயங்கள் தெரிந்தவர்கள். இலங்கை தேர்தல் திணைக்களத்தின் முன்னாள் ஆணையாளர் மொஹமட் என்பவரும், அமைச்சொன்றின் Secretaryஆக இருந்த அமீர் என்பவரும் வந்திருந்தார்கள். இந்த நாட்டினுடைய தலைமைகள் - நீங்கள் எல்லோரும் சேர்ந்து எங்கள் சமூகத்தில் உள்ள தகுதியான யாரை என்றாலும் நியமியுங்கள்! ஆளும் கட்சியில் உள்ள அமைச்சர் ஒருவரை அல்லது யாரையாவது நியமியுங்கள்! தேசிய எல்லை நிர்ணய ஆணைக்குழுவில் நியமிக்கப்படுவதற்குத் தகுதியான எத்தனையோ முஸ்லிம்கள் இந்த நாட்டில் இருக்கின்றார்கள். அவர்களில் யாரை வேண்டுமானாலும் நியமிக்குமாறுதான் சொல்கின்றோம். உங்களுடைய கதைகளின்மூலம் முஸ்லிம்கள் இதற்குத் தகுதியற்றவர்கள் என்ற ஒரு நிலைமையை ஏற்படுத்த முடியாது. ஏனென்றால், சனாதிபதித் தேர்தலிலும் பொதுத் தேர்தலிலும் இந்த நாட்டு முஸ்லிம்களின் பெரும்பான்மையான வாக்குகளைப் பெற்றிருக்கின்றீர்கள்.

இந்த நாட்டின் சனாதிபதியின்மீதும் அரசாங்கத்தின்மீதும் நம்பிக்கை வைத்துத்தான் அவர்கள் வாக்களித்திருக் கின்றார்கள். பழையவர்கள் செய்த பிழையினால்தான் உங்களுக்கு வாக்களித்திருக்கின்றார்கள். எனவே, நீங்கள் தொடர்ச்சியாக முஸ்லிம் சமூகத்தை இரண்டாம் தரத்தில் நடத்திக்கொண்டு போக முடியாது. நாங்கள் ஒருநாளும் ஜாதி பேதம் பார்க்க மாட்டோம். நாங்கள் மௌத்தாகும் மட்டும் அல்லாஹ் எங்களைக் காப்பாற்ற வேண்டும். நாங்கள் எல்லா மக்களுக்காகவும் பேசுவோம். சிங்கள மக்களுக்காகப் பேசுவோம்; தமிழ் மக்களுடைய உரிமைகளைப் பற்றி பேசுவோம். எங்களுடைய உரிமைகளைப் பற்றியும் பேசுவோம். அதனைப் பார்த்து நீங்கள் சொல்லக் கூடாது நாங்கள் இனவாதிகள் என்று.

முஸ்லிம் சமூகம் இவ்வாறு தொடர்ச்சியாகப் புறக்கணிக்கப்பட்டு வருவதனால், முஸ்லிம் சமூகத்தின் தலைமைத்துவத்தை இல்லாமற் செய்வதற்கு ஏதோ ஒரு சக்தி முயற்சித்துக்கொண்டு இருப்பதாகத் தெரிகின்றது. மாண்புமிகு ஜனாதிபதி நல்லவர்! The Hon. Prime Minister நல்லவர்! கௌரவ அமைச்சர்கள் நல்லவர்கள்! அப்படியென்றால், யார் இந்தச் சக்தி? இவ்வாறு தொடர்ச்சியாக எல்லா விடயங்களிலும் முஸ்லிம்களை உள்வாங்கக் கூடாது என்று சொல்லக்கூடிய சக்தியைக் கண்டுபிடியுங்கள்! அவசரப்பட்டு உங்களுடைய ஆட்சியைப் பிடிக்கப்போகின்றோம் என்றோ இல்லாவிட்டால், அமைச்சுப் பதவியைத் தாருங்கள் என்றோ நாங்கள் கேட்கவில்லை. நீங்கள் செய்கின்ற நல்ல வேலைகளுக்கு நாங்கள் உதவி செய்வோம்! நல்ல நிலைமையை ஏற்படுத்துகின்றபோது உங்களை வாழ்த்துவோம்! அவற்றையெல்லாம் நாங்கள் open ஆகச் செய்வோம். ஏனென்றால், உங்களிடம் நல்ல காரியங்கள் இருக்கின்றன. எனவே, இந்தக் குறைகளை நீங்கள் சீர் செய்ய வேண்டும் என்பதே முஸ்லிம் சமூகத்தினுடைய எதிர்பார்ப்பு.

இப்போது கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஒருவர் நுரைச்சோலை வீட்டுத் திட்டம் பற்றி பேசினார். கடந்த அரசாங்கத்திலே இருந்தவர்கள் செய்த பிழை காரணமாகத்தான் அந்த விடயம் நீதிமன்றத்திற்குப் போகவேண்டி ஏற்பட்டது. அந்தக் காரணத்தினாலும்தான் அம்பாறை மாவட்டத்திலே உங்களுடைய இந்த அரசாங்கத்துக்கு 88,000 வாக்குகளை மக்கள் அளித்தார்கள். அங்கு நீங்கள் 4 பாராளுமன்ற உறுப்பினர்களைப் பெற்றிருக்கிறீர்கள்! தேசியப் பட்டியல் உறுப்பினரோடு சேர்த்து 5 பாராளுமன்ற உறுப்பினர்களைப் பெற்றிருக் கிறீர்கள். வழமையாக அம்பாறை மாவட்டத்திலிருந்து ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸிற்கு 3 ஆசனங்கள் கிடைக்கும், சிலவேளை 4 ஆசனங்கள் கிடைக்கும். ஆனால், இந்தமுறை நீங்கள் கிட்டத்தட்ட அந்த மாவட்டத்தையே வென்ற மாதிரி அவ்வளவு முஸ்லிம் மக்களுடைய வாக்குகளும் உங்களுக்குக் கிடைத்திருக்கின்றன.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

මම මේ කාරණය ඔබතුමාට කියන්න ඕනෑ. ජනාධිපතිතුමා ඒ කාලයේ අක්කරෙයිපත්තු meeting එකකට ආවා; ගරු මන්ත්‍රීතුමාත් එතැන හිටියා. මම අහගෙන හිටියා එතුමා කියපු කාරණා. මගේ ගමේ. එතුමා කිව්වා "අපි බලයට ආවා නම් නොරොච්චෝලේ නිවාස ටික මිනිස්සුන්ට බෙදලා දෙනවා" කියලා. ඊට පස්සේ මහ ඡන්දයට ජනාධිපතිතුමා ආවා. ඒ meeting එකේදීත් ජනාධිපතිතුමා කිව්වා "මම ආවා නම් මේ නිවාස ටික බෙදලා දෙනවා" කියලා. අපි දන්නේ නැහැ, කලින් ආණ්ඩුවලින් වැරදි කළ නිසා ඒක නතර කරලා තිබෙනවා, උසාවි තීන්දුවකින්. හැබැයි අපේ අලුත් ජනාධිපතිතුමා මොන ක්‍රමයකින් හරි ඒක දෙන්නම ඕනෑ. ඒක පොරොන්දුවක්. ඡන්දයට එනකොට ඔබතුමන්ලා ඒ පොරොන්දුව දුන්නා. ඔබතුමන්ලාට බලය තිබෙනවා, ඔක්කෝම තිබෙනවා, 159ක් ඉන්නවා. ජනාධිපතිතුමා පොරොන්දු වුණා ඒ නිවාස ටික ලබා දෙන්න. සවුදි තානාපතිතුමා කියනවා ඒ නිවාස බෙදලා දුන්නා නම් තව නිවාස දෙනවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ඒවායේ කැලෑව වැවිලා තිබෙන්නේ. ඒ නිසා කරුණාකරලා ඔබතුමන්ලා ආණ්ඩු පක්ෂයේ බලය පාවිච්චි කරලා ජනාධිපතිතුමා, Prime Minister, ඇමතිවරු ඔක්කෝම එකතු වෙලා ඒ නිවාස ලබා දෙන්න කියන ඉල්ලීම කරමින්, මා නවතිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.07]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සාකච්ඡාවට බඳුන් වෙන්නේ එල් නිනෝ කාලගුණික බලපෑම් සහ ආපදා කළමනාකරණය සබැඳිව පූර්ව සූදානමක් තබා ගන්නේ කොහොමද කියන කාරණාවයි. මෙහිදී මුලින්ම කියන්න ඕනෑ, අපේ රටට දැනට ඇවිල්ලා තිබෙන්නේ නියඟයක් නොවෙයි, වියළි කාලගුණ තත්ත්වයක් බව. තවම නියඟයක් ඇවිල්ලා නැහැ. අපි අනුමාන කරන්නෙත් නැහැ එහෙම දෙයක් වෙනවා කියලා. වියළි කාලගුණ තත්ත්වයක් තමයි දැනට සහ ඉදිරි දින වකවානුවලත් පවතින්නේ.

මේ එල් නිනෝ තත්ත්වය සබැඳිව පූර්ව සූදානමක් සහ ප්‍රතිචාර දැක්වීමේ විශේෂ වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ කියන්නේ, ආණ්ඩුව හැටියට ගරු ජනාධිපතිතුමා මැදිහත්වෙලා, වග කිව යුතු අමාත්‍යාංශ සමඟ, විශේෂයෙන් ආරක්ෂක අමාත්‍යාංශය සමඟ එක්ව හොඳ සැලැස්මක් සකසා තිබෙනවා. පසුගිය ජාතික ආපදා කළමනාකරණ සභාවේදීත් විශේෂයෙන් අවධානය යොමු කළා ඒ සම්බන්ධව කටයුතු කළ යුතු ආකාරය ගැන. ඒ අනුව දැනට තිබෙන වියළි කාලගුණික තත්ත්වය මත පැන නැඟිලා තිබෙන පානීය ජල ගැටලුවට ආරක්ෂක අමාත්‍යාංශය විධියට විශේෂ සැලකිල්ලක්, අවධානයක් යොමු කරලා තිබෙනවා.

ආරක්ෂක අමාත්‍යාංශය විසින් පසුගිය අගෝස්තු 6වෙනි දා විශේෂ චක්‍රලේඛයක් නිකුත් කළා සියලු දිස්ත්‍රික් ලේකම්වරු වෙත. ඒ චක්‍රලේඛයේ ඉතාම දීර්ඝ ලෙස සඳහන් කරනවා මේ වියළි කලගුණ තත්ත්වය බලපාන දිස්ත්‍රික්කවලට ජලය සැපයීම, ජලය සැපයීමට ජල බවුසර් සැපයීම, ජලය සපයන බවුසර්වලට අවශ්‍ය අමතර ඉන්ධන, රියදුරන්ගේ ප්‍රශ්න, සහායකයන්ගේ ප්‍රශ්න, රියදුරන්ට සහ සහායකයන්ට ගෙවන අතිකාල දීමනා වැනි බොහෝ කාරණා සම්බන්ධව. ඒ වාගේම ජලය බෙදා දීමේදී අත්‍යවශ්‍ය වෙනත් වියදම් එනවා දිස්ත්‍රික් ලේකම්වරුන්ට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ ප්‍රාදේශීය සභාවලට. ඒ වියදම් සම්බන්ධව කෙසේ කටයුතු කළ යුතුද කියන එක ගැනත් විශේෂයෙන් ඒ චක්‍රලේඛයේ සඳහන් වෙනවා. මේ කටයුතු සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් දැනටමත් විශාල මුදල් ප්‍රමාණයක් ඒ ඒ දිස්ත්‍රික් ලේකම්වරුන්ට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ඒ මුදල් වියදම් කිරීම සඳහා පැහැදිලි උපදෙස් නිකුත් කරලා තිබෙනවා. මේ තත්ත්වය ඉදිරියේදී තවත් උග්‍ර වුණොත් ඒ ඒ අවශ්‍යතා අනුව, ඒ ඒ තත්ත්වය අනුව ඊටත් වඩා එහාට ගිහින් වියදම් කිරීමට අවශ්‍ය බලයත් ලබා දීලා තිබෙනවා. ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙතින් මේ පිළිබඳව තවත් උපදෙස් ලබා ගන්නත් පුළුවන්.

දැනට පවතින මේ වියළි කාලගුණ තත්ත්වය විශේෂයෙන්ම බලපා තිබෙන්නේ, පොළොන්නරුව, අම්පාර, ත්‍රිකුණාමලය, රත්නපුර, බදුල්ල, මඩකලපුව යන දිස්ත්‍රික්කවලට. එම නිසා ඒවායේ ඇති කුඩා වැව් කෙරෙහි විශේෂ අවධානය යොමු වෙලා තිබෙනවා. ඒවායේ ජල මට්ටමත් බෙහෙවින් අඩු වෙලා තිබෙනවා. ඒ සමහර වැව්වල වතුර නැහැ. නමුත්, ඒ ප්‍රදේශවල පානීය ජලය සම්බන්ධයෙන් ලොකු ගැටලුවක් මතු වෙලා නැහැ කියන එක මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වියළි කාලගුණ තත්ත්වය සම්බන්ධව පෙර දැනුම් දීමක් හැටියට පුරෝකථන අපට ලැබිලා තිබෙනවා. ඒ අනුව ඉදිරි කාලගුණ රටාව කොටස් තුනකට - කාල තුනකට - බෙදිලා යනවා. විශේෂයෙන් ගත්තොත්, ජුලි මාසයේ සිට අගෝස්තු දක්වා වියළි කාලගුණික තත්ත්වයක් පවතිනවා. එය අවසන් වෙගෙන යන කොට සැප්තැම්බර් සිට දෙසැම්බර් කාලය ඇතුළත වැඩි වර්ෂාපතනයක් බලාපොරොත්තු වෙන්න පුළුවන් කියන අනාවැකියත් පළ කරලා තිබෙනවා. ඒ වාගේම ලබන අවුරුද්දේ, එනම් 2027 පෙබරවාරි, මාර්තු, අප්‍රේල් යන මාසවල නැවතත් වියළි කාලගුණික තත්ත්වයක් එන්න පුළුවන් කියන පුරෝකථනය ලබා දීලා තිබෙනවා. ඒවා තමයි අර කියපු කොටස් තුන. එහෙම නම් මෙය කොටස් තුනකින් යුත් මිශ්‍රණයක් හැටියටයි එන්නේ. ඒ කියන්නේ, මුලින්ම වියළි කාලගුණික තත්ත්වයක්, ඉන්පසුව වැසි, ඊළඟට නැවත වියළි කාලගුණික තත්ත්වයක්. අපි එම තත්ත්වය හොඳින් අවබෝධ කරගෙන තමයි ජාතික මට්ටමින් වන ඉදිරි වැඩ පිළිවෙළට අදාළව කටයුතු කරන්නේ. ඒ අනුව පසුගිය ජුනි 22වන දා මේ කටයුතු සඳහා කැබිනට් අනුකමිටුවක් සහ නිලධාරි කමිටුවක් පත් කළා. විශේෂයෙන්ම ගරු පරිසර ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් තමයි එම කැබිනට් අනුකමිටුව පත් වුණේ. අවශ්‍ය අවධානය යොමු කර, අවබෝධය අරගෙන එම ක්‍රියාවලිය මෙහෙයවීම, ඒ ඒ කටයුතු සලසා දීම සඳහා ගරු ජනාධිපතිතුමා සමඟ කිහිප වතාවක්ම ඒ අනුකමිටුවත් රැස් වුණා. අදත් එය රැස් වුණා. ජනාධිපති

කාර්යාලයේ ප්‍රධානි තමයි ඒ නිලධාරි කමිටුවේ ප්‍රධානියා හැටියටත් වැඩ කටයුතු කරන්නේ. එතුමා ඒ සියලු දිස්ත්‍රික් ලේකම්වරු සමඟ, ප්‍රාදේශීය ලේකම්වරු සමඟ, ඒ ඒ ආයතන සමඟ ඒ වැඩ කටයුතු කරනවා. විශේෂයෙන්ම මෙහිදී ආරක්ෂක අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ එක්ව ඒ ඒ ප්‍රාදේශීය මට්ටමේ සියලු ආපදා කළමනාකරණ අනුකමිටු මේ වන විට තුන් සැරයක් කැඳවා තිබෙනවා; නිසි උපදෙස් ද ලබා දීලා තිබෙනවා.

මේ දවස්වල පැවැත්වෙන අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටින දරු දැරියන්ට අවශ්‍ය පානීය ජලය සම්බන්ධවත් විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ඒ අනුව ඒ අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙනවා. එම නිසා මෙය විශේෂ කමිටුවක්. මෙම තත්ත්වය සඳහාම තමයි මෙම විශේෂ කමිටුව පත් කර තිබෙන්නේ. මේ පුරෝකථන අනුව අපි ආණ්ඩුව හැටියට, රජය හැටියට මේ ගැන විශේෂ අවධානය යොමු කරලා ජනතාවට ලොකු බලපෑමක් ඇති නොවෙන්න මේ කටයුතු සම්පාදනය කරගෙන යනවා. ඒ නිසා මේ අවසාන මාස දෙකතුනේ මේ කාලගුණික අවස්ථා දෙකම, එනම් දැඩි වියළි කාලගුණ තත්ත්වයත්, දැඩි වර්ෂාපතනයත් ඇති වෙයි කියන බලාපොරොත්තුවෙන් ඒවාටත් මුහුණ දීම සඳහා තමයි මේ කටයුතු සම්පාදනය කරලා තිබෙන්නේ. ඒ අනුව, ඉහත කී අනුකමිටුව, නිලධාරි කමිටුව සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මේ සම්බන්ධව කටයුතු කරගෙන යද්දී විවිධ ක්ෂේත්‍ර කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරනවා. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුයි, භූගත ජලය සහ පානීය ජලය සම්බන්ධව. පානීය ජලය ඉල්ලුම ඉහළ යෑම සලකා බලා බවුසර් මඟින් ජලය ලබා දීම සඳහා කටයුතු සලස්වා තිබෙනවා. මෙතැනදී විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඉහතින් කී දිස්ත්‍රික්කවලටත්, එතැනින් එහාට අනෙකුත් දිස්ත්‍රික්කවලටත් අදාළව ත්‍රිවිධ හමුදාව අදාළ කටයුතු සම්පාදනය කරනවා, ඒ ඒ දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ. අපේ ත්‍රිවිධ හමුදාවේ ඇති සම්පත්, එනම් බවුසර්, අත්‍යවශ්‍ය මානව සම්පත ආදිය ලබා දීමට කටයුතු සලස්වා තිබෙනවා. අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, හම්බන්තොට, මොනරාගල, පොළොන්නරුව, රත්නපුර සහ බදුල්ල යන දිස්ත්‍රික්කවල පවුල් 25,000කට පමණ, ඒ කියන්නේ පුද්ගලයන් 80,000කට ආසන්න සංඛ්‍යාවකට මෙම තත්ත්වය බලපා තිබෙන බවට තමයි අපට තොරතුරු ලැබිලා තිබෙන්නේ. ඒ අනුව අපි අවශ්‍ය කටයුතු කරනවා. ප්‍රාදේශීය ආපදා කමිටු කැඳවා අවශ්‍ය උපදෙස් ලබා දීලා සම්බන්ධීකරණ කාර්යය කිරීමටත් දැනට කටයුතු කර තිබෙනවා වාගේම කටයුතු කරමින් යනවා.

ඊයේ මේ පිළිබඳ විශේෂ මාධ්‍ය හමුවක් පැවැත්වූවා, ඒ අනුකමිටු සභාපති සහ වග කිව යුතු සියලු ප්‍රධානීන් සමඟ සහ ඒ නිලධාරි කමිටුවේ නිලධාරින් සමඟ. මොකද, මේ තත්ත්වය ගැන විශේෂයෙන් මහජනතාව දැනුවත් කරන්න ඕනෑ. මේ තත්ත්වය විශේෂයෙන් බලපා තිබෙන දිස්ත්‍රික්ක 7 මූලික කරගෙන දැනුවත් කිරීම් කළා, ඉදිරි මාස එකහමාරක වැනි කාලය ගැන සලකා බලා ජලය - විශේෂයෙන් පානීය ජලය - අරපිරිමැස්මෙන් භාවිත කිරීම සහ එහි තිබෙන වටිනාකම ගැන. ඒ වාගේම NBRI එකත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් ඉදිරි සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඇති වෙන්න පුළුවන් දැඩි වර්ෂාපතනයට විශේෂයෙන් අවධානය යොමු කළා, එම මාධ්‍ය සාකච්ඡාවේදී. එහිදී ඒ ආකාරයට විශේෂ දැනුම් දීම් කළා.

ඒ වාගේම, ප්‍රාදේශීය මට්ටමින් සහ දිස්ත්‍රික්ක මට්ටමින් DCCs ඇතුළු සම්බන්ධීකරණ කමිටු රැස් වෙනවා. ඒ කමිටුවලදීත් ඒ කමිටු සභාපතිවරුන්, දිසාපතිවරුන් වාගේම ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ ද මේ විෂය සම්බන්ධව, එහෙම නැත්නම් මේ වියළි කාලගුණික තත්ත්වයෙන් ඇති වෙන්න පුළුවන් බලපෑම් සහ අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම, සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සම්බන්ධව සාකච්ඡා කරනවා. ඒ වාගේම එහි වගකීම් කවර පාර්ශ්ව විසින්ද දැරිය යුත්තේ කියන කාරණය සම්බන්ධවත් ඒ සම්බන්ධීකරණ කමිටු රැස් වෙලා සාකච්ඡා කරනවා. ඒ ආකාරයටත් ඒ කටයුතුවලට විශේෂ අවධානයක් යොමු කරනවා.

මෙහි අනෙක් විශේෂ කාරණය තමයි, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ආරක්ෂක අමාත්‍යාංශය චක්‍රලේඛයක් නිකුත් කරලා, ත්‍රිවිධ හමුදාවේත් සහයෝගය අරගෙන අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම. නමුත්, එතැනින් එහාට ගිය තවත් අමාත්‍යාංශ රාශියක් මෙයට සම්බන්ධ වෙනවා. මොකද, ඒ එක් එක් ක්ෂේත්‍රය සඳහා වග කිව යුතු පාර්ශ්ව ඉන්නවා. ඒ අයුරින් ගත්තාම, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජල කළමනාකරණ ලේකම් කාර්යාලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ඒ වාගේම ජල හා විදුලිබල ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු පාර්ශ්ව මේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් එක්ක එකතු වෙලා කටයුතු කරගෙන යනවා.

අපේ ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන්වූවා, විදුලිය නැහැ, විදුලිය කපලා කියලා, උතුරේ. ඒ විධියේ බොරු කියන්න එපා. සාමාන්‍යයෙන් එවැනි ලියුමක් අරගෙන පෙන්නුවාට ඒක සත්‍යයම නැහැ. විදුලිය අවශ්‍යයි. විදුලිය නැති වුණොත් ඒ ඕනෑම වෙලාවක කටයුතු කරන්න අපේ ත්‍රිවිධ හමුදාව සූදානම් වෙලා ඉන්නවා. ඒකට උදේ ද, දවල් ද, රෑ ද කියලා නැහැ. විදුලිය නැහැ කියලා එතැන ආරක්ෂාව නැති වෙන්නේවත්, ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් වන්නේවත් නැහැ. ඒ ගැන ඉතාම අවබෝධයෙන්, හොඳින් අපේ ත්‍රිවිධ හමුදාවේ වීරෝදාර සාමාජිකයන් කටයුතු කරනවා.

ඊළඟ කාරණය තමයි, ජාතිවාදය කියන එක. ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමාත් ඒ පිළිබඳ අදහස් යොමු කළා. එහෙම කිසිම දෙයක් නැහැ. එහෙම තිබෙනවා නම් ඒවා ඒ පළාත්වල මතු වෙන්න ඕනෑ නේ. එහෙම කිසිම දෙයක් නැහැ. එවැනි තත්ත්වයන් ඇති නොවන පරිදි ආරක්ෂක හමුදාව, පොලීසිය කටයුතු කරනවා. ඒ වාගේම විශේෂයෙන් අපේ ගරු ජනාධිපතිතුමා සති දෙකකට වරක් ජාතික ආරක්ෂක කවුන්සලය කැඳවා අවශ්‍ය කටයුතු සම්පාදනය කරනවා සහ අවශ්‍ය අවධානය යොමු කර තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධ යම්කිසි දෙයක් කියන කොට වගකීමෙන් කියන්න. එහෙම නැත්නම්, එවැනි පණිවුඩ මෙතැනින් මහජනතාවට දුන්නාට පස්සේ ඇති කර ගන්නේ වෙනත් අවබෝධයක්. එවැනි අවබෝධයක් ඇති කරලා වැඩක් නැහැ. එහෙම කරන්න එපා. දේශපාලනයේදී එහෙම කරලා හරියන්නේ නැහැ; එහෙම කරලා බැහැ. එහෙම කළාට තේරුමකුත් නැහැ.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
Sir, I rise to a point of Order.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

Point of Order එකක් අරගෙන, ඒක ආයෙත් සත්‍යයි කිව්වාට තේරුමක් නැහැ. සාමාන්‍යයෙන් දෙයක් කියන කොට සොයා බලන්න ඕනෑ. ඔබතුමන්ලා ඒ ගැන දන්නවා නේ. දේශපාලනය කරන්න ඔහොම බැහැ; ක්‍රිකට් පිට්ටනියේ වාගේ බැහැ. Chance or no chance කියලා ගහන්නේ 12th man. එහෙම කළාට වැඩක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
එතකොට විකට් පොලු තුනේම වැදිලා ඉවරයි. ඒක නිසා ඒ කියන ඒවා තේරුමක් නැහැ. දැන් ඉවරයි; වැදිලා ඉවරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මා සඳහන් කරපු කාරණයක් විකෘති කර ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා. මම එතුමාගෙන් විනාඩි 5කින් උත්තරයක් බලාපොරොත්තු වෙනවා. මම කිව්වේ මේකයි. 2026 අප්‍රේල් 23වන දා ලියුමක් නිකුත් කරලා තිබෙනවා, යුද්ධ හමුදා මූලස්ථානයේ උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවෙන්, උතුරේ හමුදා කඳවුරුවල දවසට පැය දෙකක් විදුලිය කප්පාදු කරන්න කියලා. එතුමා කිව්වේ උතුරේ කියලා. මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් පැහැදිලිව අහන්න කැමැතියි, උතුරේ හමුදා කඳවුරුවල පැය දෙකක් විදුලිය කපන්න කියලා නියෝගයක් යවා තිබේද, නැද්ද කියලා. කෙටි වචනයකින් උත්තර දෙන්න. අර ක්‍රිකට් කථා, ඒවා මේවා ඕනෑ නැහැ. කෙටියෙන් උත්තරයක් දෙන්න.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු මන්ත්‍රීතුමනි, එහෙම එකක් ඊයේ පෙරේදා දීලා නැහැ. අර්බුදය ආපු වෙලාවේ ඒ හැම ආයතනවලම විදුලිය පිරිමැසීමක් හැටියට ක්‍රියාමාර්ග ගත්තා නේ. අර QR code එකක් එහෙමත් ආවේ ඒක නේ. QR code එකෙන් පිට ගිහිල්ලා ඔබතුමා තෙල් ගැහුවාද දන්නේත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, දැන් කථාව අවසන් කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.21]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර විපත් ඇති වෙන්නේ ස්වාභාවිකව. සමහර විපත් ඇති වෙන්නේ මනුෂ්‍යයන්ගේ දායකත්වයෙන්. අපේ රටේ නීතියේ ආධිපත්‍යය පිළිබඳ ඇති වෙලා තිබෙන විපත මනුෂ්‍ය දායකත්වයෙන් ඇති වෙච්ච විපතක්. ඒක ආණ්ඩුව විසින් නිර්මාණය කර ගත් විපතක්. මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ ප්‍රශ්නයක් තිබුණේ නැහැ. නමුත්, අධිකරණයේ කාර්යක්ෂමතාව පිළිබඳ ප්‍රශ්නයක් තිබුණා. අධිකරණයේ කාර්යක්ෂමතාව පිළිබඳ ප්‍රශ්නය පිටින් දාලා අධිකරණයේ ස්වාධීනත්වයට ඇඟිලි ගහලා, අධිකරණය තමන්ගේ බලයට නතු කර ගැනීමට කරන උත්සාහයක ප්‍රතිඵලයක් විධියට එක පැත්තකින් විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනවා. අනෙක් පැත්තෙන්, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත ගෙනෙනවා.

අද බොහෝදෙනෙක් කථා කරන්නේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ඒ නිසා මම කැමැතියි, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කියන්න. මේකෙන් කාරණා දෙකක් බලාපොරොත්තු වෙනවා. පළමුවන එක තමයි, ධුර දරන මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ cadre එකේ අනුමත සංඛ්‍යාව 110 සිට 120 දක්වා වැඩි කරන එක. මේ කාරණය ගැන කථා කරන්න අයිතියක් තිබෙන කෙනෙක්, මම. 2017දී තිබපු ධුර දරන මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව 75යි. ඒ 75 cadre එක 110 දක්වා සංශෝධනය කිරීම සඳහා ඒ පනත රජය වෙනුවෙන් ඉදිරිපත් කරලා තහවුරු කළේ මම. විශේෂයෙන්ම ත්‍රිපුද්ගල මහාධිකරණ සඳහා, වාණිජ මහාධිකරණය සඳහා, පළාත්බද මහාධිකරණ සඳහා වැඩිපුර විනිශ්චයකාරවරුන් සංඛ්‍යාවක් අවශ්‍ය නිසා, ඒ නම්‍යශීලීභාවය ඇති කිරීමට තමයි 75, 110 දක්වා වැඩි කළේ. 35දෙනෙක් වැඩි කළා; සියයට 50කින් වැඩි කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අධිකරණ ඇමතිතුමා කියන විධියට මේ 110න් පත් කරලා තිබෙන්නේ 93දෙනායි. මේ රටේ මහාධිකරණ විනිශ්චයකාරවරු හැටියට 93දෙනෙක් තමයි පත් කරලා තිබෙන්නේ. තව පුරප්පාඩු 17ක් තිබෙනවා.

මේ පාර්ලිමේන්තුවේ කිසිම කමිටුවක්, අධිකරණ අමාත්‍යාංශය තුළ රැස් වෙච්ච කිසිම කමිටුවක්, ජනාධිපති ලේකම් කාර්යාලයේ රැස් වෙච්ච කිසිම කමිටුවක්, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ හෝ වෙනත් ස්වාධීන විද්වත් ආයතනයක් මේ රටේ මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ cadre එක වැඩි කළ යුතුයි කියලා යෝජනා කරලා නැහැ. ඒ අවශ්‍ය වැඩිපුර සංඛ්‍යාව ගණනය කරලා නැහැ. අපි කලින් විනිශ්චයකාරවරු සංඛ්‍යාව වැඩි කළේ පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් විනිශ්චයකාරවරුන් කොපමණ ප්‍රමාණයක් වැඩිපුර අවශ්‍ය වේද කියලා තක්සේරු කළාට පසුව. හැබැයි, මේ සංශෝධනය මඟින් ඒ cadre එකට 10දෙනෙක් වැඩි කරන්න ඉල්ලනවා. ඒ කියන්නේ 110න්, 93ක් පත් කරලා, vacancies 17ක් තිබෙද්දී තව 10ක් පත් කරන්න ඉල්ලනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි කවුරුත් දන්නවා, ඒක කරන්න යන්නේ ඇත්ත වශයෙන්ම ඒ විධියේ අවශ්‍යතාවක් නිසා නොවෙයි කියන එක. මේක ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස වැඩි කිරීම මඟ හරින්න, ඒක camouflage කරන්න කරපු උත්සාහයක්. ඒ නිසා මේකට කිසිම පදනමක් නැහැ. 110න්, 93දෙනායි පත් කරලා තිබෙන්නේ. තව vacancies 17ක් තිබෙනවා. ඒ වාගේම විනිශ්චකාරවරුන් වැඩිපුර සංඛ්‍යාවක් පත් කිරීමේ ක්‍රමයක්, වැඩ පිළිවෙළක්, සැලැස්මක් ලිඛිතව කිසිම තැනක සඳහන් වෙලා නැහැ, ඒ ගැන කිසිම තැනක සාකච්ඡා කරලාත් නැහැ. එම නිසා මේක ව්‍යාජ, අර්ථ ශූන්‍ය වැඩක්. ඒක නරක වැඩක්. අනවශ්‍ය ලෙස cadre එක වැඩි කිරීම තුළ අපේ විනිශ්චයකාර වෘත්තිය තුළ අසමතුලිතභාවයක් ඇති වෙනවා. රාජ්‍ය සේවයේ මොනවා හරි වෘත්තියක් සඳහා cadre එක වැඩි කරනවා නම් ඒක ඉතාම බැරෑරුම්ව සලකා බලා කරන්න ඕනෑ දෙයක්. එසේ කිසිදු සලකා බැලීමක් නැතිව මේ විධියේ පනත් කෙටුම්පතක් අරගෙන එනවා නම්, ඒක මේ රට ගැන හිතලා ගෙනෙන එකක් නොවෙයි, දැඩි ආත්මාර්ථකාමී හා පසුගාමී ක්‍රියාදාමයක්.

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් යෝජනා කරන අනෙක් සංශෝධනය තමයි, මහෙස්ත්‍රාත්වරුන්ගේ සහ දිසා විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 60 සිට 62 කරන එක. කලින් මහෙස්ත්‍රාත්වරුන් සහ දිසා විනිසුරුවරුන් සියලුදෙනාටම අදාළ වුණේ සාමාන්‍ය රජයේ සේවකයන්ට අදාළ, රජයේ සහ අධිකරණ නිලධාරින්ගේ විශ්‍රාම ගැන්වීමේ ආඥාපනත. ඒ ආඥාපනතේ කුමක් සඳහන්ව තිබුණද, මහෙස්ත්‍රාත්වරුන්ගේ සහ දිසා අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 62 කියලා කියන්නේ. මේ රටේ අධිකරණ කටයුතුවල ප්‍රමාදය වැළැක්වීම සඳහා කිසිදු උපකාරයක් මේකෙන් ලැබෙන්නේ නැහැ. ඇයි ලැබෙන්නේ නැත්තේ? මේ රටේ මහෙස්ත්‍රාත්වරයකු වශයෙන් සේවයට බැඳෙන කිසිම කෙනෙක් අවුරුදු 60 වෙනකන් ඉඳලා මහෙස්ත්‍රාත්වරයෙක් වශයෙන් විශ්‍රාම යන්නේ නැහැ. සාමාන්‍යයෙන් අධිකරණ සේවයේ අවුරුදු 17ක්, 20ක් සපුරනකොට එක්කෝ මහාධිකරණයට උසස් වෙලා. එහෙම නැත්නම් වෘත්තියෙන් අයින් වෙලා වෙන රස්සාවකට ගිහිල්ලා. ඒ වාගේම ඉතාම කලාතුරකින් තමයි මහෙස්ත්‍රාත්වරයෙකු වශයෙන් වෘත්තියට බැඳෙන විනිශ්චයකාරවරයෙක් සේවයෙන් ඉවත් වෙලා යන්නේ, දිසා විනිසුරුවරයෙකු විධියට විශ්‍රාම ගන්නේ, එක්කෝ විදේශගත වීමක් නිසා ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය අඩු වූ නිසා, එහෙම නැත්නම් යම් විනය ක්‍රියාමාර්ගයක් මත පමණයි. ඒ නිසා වයස අවුරුදු 60 අවුරුදු 62 කළා කියලා මහෙස්ත්‍රාත් අධිකරණයේ හෝ දිසා අධිකරණයේ විනිශ්චයකාරවරුන්ට කිසිම සහනයක් ලැබෙන්නේ නැහැ. අනෙක් අතට, මේ රටේ මහෙස්ත්‍රාත්වරුන්ගේ අඩුවක් නැහැ, දිසා අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ අඩුවක් නැහැ. බඳවා ගැනීමේ ක්‍රියාමාර්ග විධිමත් කිරීමෙන් ඒ පිළිබඳ ප්‍රශ්න විසඳා ගන්න පුළුවන්. පාර්ලිමේන්තුවේ කිසිම කමිටුවක් මේ පිළිබඳව සලකා බලා නැහැ. අඩුම ගණනේ අධිකරණ අමාත්‍යාංශයේ රැස්වීමක් තියලා තීරණයක් අරගෙනත් නැහැ. අඩුම ගණනේ ජනාධිපති ලේකම් කාර්යාලයේ විධිමත් රැස්වීමක් තියලා, stakeholder රැස්වීමක් තියලා ඒ පිළිබඳ තීරණයක් අරගෙන නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශය මේ රටේ අධිකරණ කටයුතුවල ප්‍රමාදය වැළැක්වීමට අවශ්‍ය වන කරුණු කෙරෙහි අවධානය යොමු කර තිබෙනවා. ඔවුන්ගේ මූලාශ්‍ර, අධිකරණ අමාත්‍යාංශය විසින් 2022, 2023, 2024 අවුරුදුවල ඉදිරිපත් කර තිබෙන වාර්ෂික වාර්තාවල සඳහන් කරුණු මත පදනම් වෙලා තිබෙනවා. මොනවා නිසාද නඩු කටයුතු ප්‍රමාද වෙන්නේ? නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ හිඟය, නීතිපති දෙපාර්තමේන්තුවේ අධිනීතිඥවරුන්ගේ හිඟය, රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ හිඟය සහ තාක්ෂණික පහසුකම් නොමැතිකම සහ විත්තිකරුවන් විසින් අසනීප බව සහ වෙනත් කාරණා කියලා වුවමනාවෙන්ම නඩු මඟ හැරීම කියන කාරණා නිසා. ඒ වාගේම, මහෙස්ත්‍රාත් අධිකරණයේ සහ දිසා අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම සහ අධිකරණ ප්‍රමාණවත් නොවීම කියන කාරණා. අපේ රටේ මිලියනයකට විනිශ්චයකාරවරු 15යි ඉන්නේ. දියුණු රටක මිලියනයකට විනිශ්චයකාරවරු 50යි. එහෙනම්, මහෙස්ත්‍රාත් අධිකරණයේ සහ දිසා අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ cadre එක වැඩි කරන්න ඕනෑ. එහෙම යෝජනාවක් නැහැ. එහෙම නැතිව, වයස අවුරුදු 60 අවුරුදු 62 කරලා හරියන්නේ නැහැ. ඒ වාගේම, පොලිස් පරීක්ෂණවල ප්‍රමාදය සහ දුර්වලතා, හිතාමතා හෝ නොදැනුවත්කමට අධිකරණයට ඉදිරිපත් කරන පොලිස් වාර්තා දෝෂ සහිත වීම, ඇඟිලි සලකුණු දෙපාර්තමේන්තුවේ අඩුපාඩුකම්, සමාජය තුළ තිබෙන වෙනත් සමාජ හේතු නිසා අපරාධ බහුල වීම්. ඒවා තමයි නඩු ප්‍රමාදයට හේතු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණාවලට ප්‍රතිචාර දක්වන්න, උත්තර හොයන්න අපි කටයුතු කළ යුතු වනවා. 2025.06.30වැනි දාට මේ රටේ දිසා අධිකරණවල තිබෙන නඩු සංඛ්‍යාව 260,007යි. මහෙස්ත්‍රාත් අධිකරණවල තිබෙන නඩු සංඛ්‍යාව 818,869යි. සමස්ත නඩු සංඛ්‍යාව 1,134,474යි. මහෙස්ත්‍රාත් අධිකරණයේ සහ දිසා අධිකරණයේ තිබෙන නඩු සංඛ්‍යාව රටේ තිබෙන සම්පූර්ණ නඩු සංඛ්‍යාවෙන් සියයට 95ක්. ඒ නිසා මේ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් ඉදිරිපත් කර තිබෙන යෝජනා එකකින්වත් මේ රටේ යුක්තිය පසිඳලීම සඳහා සිවිල් සහ අපරාධ උසාවිවල තිබෙන ප්‍රශ්නවලට විසඳුමක් ලැබෙන්නේ නැහැ. ඒ කියන්නේ, අසනීපය එකක්. දීලා තිබෙන බෙහෙත තව එකක්. අසනීපයට දීලා තිබෙන බෙහෙත වෙන එකක් වුණොත් ලෙඩා මැරෙනවා. ලෙඩේට ගැළපෙන බෙහෙත දෙන්න ඕනෑ. නමුත් ලෙඩේ හඳුනාගෙනත් නැහැ, බෙහෙත හඳුනාගෙනත් නැහැ. ඒ නිසා මේ වෙන්නේ විනාශයක්.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ රටේ අනාගතය පිළිබඳව කල්පනා කරනවා නම්, මේ රටේ අධිකරණයට සම්පූර්ණයෙන් ඍජුව ඇඟිලි ගසන මේ යෝජිත සංශෝධනය හරහා වර්තමාන අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස වසර දෙකකින් වැඩි කරනවා කියන යෝජනාව තුළ තිබෙන්නේ වර්තමාන අග්‍ර විනිශ්චයකාරතුමා ධුරයේ රඳවා ගැනීමේ අරමුණ පමණයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එම නිසා ඒ අරමුණ වසන්නට තව බොහෝ දේ කරනවා. අවසානයේදී වෙන්නේ මොකක්ද? මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XV වන පරිච්ඡේදයෙන් සනාථ කර තිබෙන, සහතික කර තිබෙන, "අධිකරණයේ ස්වාධීනත්වය" යටතට අදාළ වන 107වන ව්‍යවස්ථාවේ පටන් ඊට අදාළ ඒ සියලු ව්‍යවස්ථා පිළිබඳ මේ කරන මැදිහත්වීම තුළ මේ රටේ ස්වාධීනව තිබුණු අධිකරණ පද්ධතියට බැරෑරුම් හානියක් මේ යෝජනා මාලාවෙන් කරනවා. ඒ නිසා මේ රටේ පුරවැසියන්ට මේ යෝජනාවලින් කිසිවක් ඉෂ්ට වන්නේ නැහැ. මේ රටේ ඒකාධිපති, ප්‍රජාතන්ත්‍ර විරෝධී ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කිරීමට අධිකරණයට මැදිහත් වන අයුතු ක්‍රියාදාමයක මූලික පියවර තමයි මේ. ඒ නිසා මේ රටේ පුරවැසියෝ සියලුදෙනාම, නීතිඥවරු පමණක් නොවෙයි - නීතිඥවරු සියයට 99ක් මේකට විරුද්ධයි - මේ රටේ සියලු විද්වත් වෘත්තිකයන් සහ පුරවැසියන් එකතු වෙලා මේ රාජ්‍ය බලය අත්පත් කර ගැනීමේ ක්‍රියාදාමය තුළ අධිකරණ බලය ද අත්පත් කර ගැනීම සඳහා කරන මේ ව්‍යාජ, කූට උත්සාහය වැළැක්වීම සඳහා පියවර ගත යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.31]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාද වන මාතෘකාවෙන් පිට කරුණු කාරණා ගණනාවක් මෙතැනදී විපක්ෂය විසින් මතු කරපු නිසා, ඒ සමහර කාරණාවලට උත්තර නොදී අද දවසේ මාතෘකාවට එළැඹීමත් ගැටලුවක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ආණ්ඩුව ගැන කථා කරමින්, "ආණ්ඩුව පෙරහැර නවත්වනවා; පෙරහැරට බාධා කරනවා" ආදී වශයෙන් අදහස් ප්‍රකාශ කරමින්, සත්ව සුබසාධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මෙතැන කරුණු ඉදිරිපත් කළා. නමුත් එහෙම කිසිම තීරණයක් අරගෙන නැහැ කියලා අපි කියන්න ඕනෑ. 1958 අංක 29 දරන සත්ව පනත තිබෙනවා. මේ පනතට සංශෝධන කිහිපයක් සිද්ධ වෙනවා. පසුගිය දවස්වල අපි මේ පාර්ලිමේන්තුව තුළ ඒකට අලුත් සංශෝධනයක් ගෙනාවා. එම සංශෝධනය මුළු පාර්ලිමේන්තුවම ඒකමතිකව සම්මත කළා. ඒක තුළ මොකක්වත් ඔය පෙරහැර කතාන්දරයක් නැහැ.

ඒ වාගේම තමයි, සත්ව සුබසාධන පනත් කෙටුම්පත. ඒක යෝජනාවක් විධියට තිබෙනවා. විශේෂයෙන්ම සත්වයන්ට කෲර ලෙස සැලකීම වැළැක්වීමේ ආඥා පනත. මේ පනත 1907දී තමයි එන්නේ. මේක මීට අවුරුදු එකසිය ගණනකට කලින් ආපු ආඥා පනතක්. ඒ තුළ තමයි සතුන්ගේ අයිතිවාසිකම් යම්කිසි ප්‍රමාණයකින් ආරක්ෂා කිරීමට අදාළව විධිවිධාන යොදා තිබෙන්නේ. ඒ විධිවිධාන ඉතාම ප්‍රාථමිකයි. ඒ යටතේ සතුන්ට විශාල වශයෙන් වද දුන්නා. දැන් හරක් වාගේ සතුන්ට හන ගහනවා. හරකුන්ට කෲර ලෙස වද දෙනවා. ඔය වාගේ කටයුතු ඒ කාලයේ සිද්ධ වුණා. මෑතකදී සමාජ මාධ්‍යවලින් දකින්න ඇති, කෑම කකා ඉන්න බල්ලෙකුට පොල්ලකින් ගහලා මරා දමන ආකාරය. මෙන්න මේ විධියට සතුන්ට හිංසා සිද්ධ වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ සතුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අලුත් නීති ගෙනෙන්න ඕනෑ. ඒ අනුව තමයි සත්ව සුබසාධන පනත් කෙටුම්පතක් පිළිබඳව යෝජනා වෙන්නේ. මිනිස්සුන්ගේ අයිතිවාසිකම් වාගේම සතුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙනුත් අපි පෙනී ඉන්නවා. අපි ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනෑකම තිබෙනවා. මෙන්න මේ යෝජනා එනකොට පෙරහැරට අදාළ යම් යම් ගැටලු මතු කර තිබෙනවා. ඒ නිසා නිලමේලා ඇතුළු ඊට අදාළ සියලුදෙනා එක්ක මේ ගැන සාකච්ඡා කරලා තිබෙනවා. ඒ නිසා පෙරහැරවලටවත්, පෙරහැරවලට අලි-ඇතුන් පාවිච්චි කිරීමේදී හෝ කිසිම ආකාරයකින් ගැටලුවක් ඇතිවෙලා නැහැ; ගැටලුවක් ඇති වෙන්න ඉඩ තියන්නෙත් නැහැ. එහෙම පනතක් තවම මේ පාර්ලිමේන්තුවේ සම්මත වෙලාත් නැහැ. ඉදිරියේදී එහෙම එකක් එන්න නියමිතයි. ඒ තුළ පෙරහැරට කිසිම බාධාවක් නැහැ. මේ ආණ්ඩුව ආවාට පස්සේ පෙරහැරත් නැහැ, ඔක්කෝම ඉවරයි කියලා ඒගොල්ලෝ තමයි කිව්වේ. හැබැයි දැන් පෙරහැරත් තිබෙනවා; ඔක්කෝම තිබෙනවා. උදාහරණයක් වශයෙන්, යාපහුව පෙරහැර ගත්තොත්, අවුරුදු ගණනකින් ඒක පැවැත්වුණේ නැහැ. අවුරුදු ගණනකට පස්සේ පළමුවැනි වතාවට ලබන 29වැනි දා අපි යාපහුව පෙරහැර පවත්වනවා. ඒ පිළිබඳව අපට කියන්න තිබෙන්නේ ඒකයි.

විශේෂයෙන්ම මේ එල් නිනෝ තත්ත්වය සම්බන්ධයෙන් වන මාතෘකාව ගැන කථා කරද්දි අපි මේ කරුණු කියන්න ඕනෑ. 2019, 2020 සහ 2021 වැනි වසර කිහිපයකදීම අපට එල් නිනෝ තත්ත්ව ඇවිල්ලා තිබෙනවා. ඒ එල් නිනෝ තත්ත්ව ආපු අවස්ථාවලදී අපි කටයුතු කරපු ආකාරය පිළිබඳ අත්දැකීම් ප්‍රමාණයක් තිබෙනවා. මෙන්න මේ අත්දැකීම් පදනම් කරගෙන කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට අපි විශේෂයෙන්ම ආහාර සුරක්ෂිතතාව පිළිබඳව මේ වෙනකොට තීන්දු තීරණ කිහිපයකටම ඇවිල්ලා තිබෙනවා. ඒකට අපේ සූදානමක් තිබෙනවා. ඇත්තටම එල් නිනෝ තත්ත්වය නිසා මේ වෙනකොට යම් ප්‍රමාණයක බලපෑමක් ඇති වෙලා තිබෙනවා. පාරිසරික උෂ්ණත්වය වැඩි වෙලා තිබෙනවා. වර්ෂාවත් එනවා, වෙලාවකට වැව් පිරිලා යනවා. හැබැයි කලින් අවස්ථාවලට සාපේක්ෂව ගත්තොත්, වතුර වාෂ්ප වෙන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. මේ season එකේ අගෝස්තු මාසය ගත්තොත්, සාමාන්‍යයෙන් වැව් හිඳෙනවා. සාමාන්‍යයෙන් පාරිසරික උෂ්ණත්වය වැඩියි. හැබැයි, ඊට එහා ගිය යම් ප්‍රවණතාවක් මේ තුළ දකින්නට තිබෙනවා. ඔන්න ඔය තත්ත්වය එක්ක ඒ සියල්ල කළමනාකරණය කර ගැනීම සඳහා මේ වෙනකොට අපි රජය විධියට ඒ ඒ අමාත්‍යාංශවලට තිබෙන වගකීම් යටතේ ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

අපි එල් නිනෝ තත්ත්වය පැත්තකින් තියමුකෝ. කෘෂිකර්මාන්තය ගත්තොත්, අපි මේ වෙනකොට අස්වනු වැඩි කරගෙන තිබෙනවා. වී අස්වැන්න වැඩි කරගෙන තිබෙනවා. මේක ප්‍රායෝගිකව අපි කවුරුත් පිළිගන්නා දෙයක්. අපි මේක අත්දැකලා තිබෙනවා. අනෙකුත් භෝගවල අස්වනු ගත්තොත්, ඒවාත් වැඩි කරගෙන තිබෙනවා. අපි ලොකු ලූනු තාක්ෂණිකව වගා කරලා, අස්වැන්න දෙගුණයක් කරගෙන තිබෙනවා. අපි මුං ඇට පිටරටින් ගෙනෙන එක නතර කළා. අපි මුං ඇටවලින් ස්වයංපෝෂිත වුණා. එතැනට අපි ආවා. ඒ වාගේම තමයි අනෙකුත් භෝග ගත්තාමත් තිබුණාට සාපේක්ෂව අපි නිෂ්පාදනය වැඩි කරලා තිබෙනවා. ඔන්න ඔකත් එක්ක වී වගාව යම් ප්‍රමාණයකට අත්හිටුවලා, ගොවීන්ගේ කැමැත්ත අනුව බඩඉරිඟු වගාවටත් යන්න සාකච්ඡා කරන්නේම අතිරික්තයක් තිබෙන නිසායි. එහෙම නම් අපි පියවරෙන් පියවර තාක්ෂණිකව කෘෂිකර්මාන්තය ඉදිරියට ගෙන යෑම තුළ ආහාර සුරක්ෂිතතාව තහවුරු කරගන්න සමත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ ආහාර පිළිබඳව යම් ආකාරයක ගැටලුවක් මතු නොවෙන තැනට කටයුතු කිරීම සඳහා අපි සැලසුම් කර තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, අපි මේ වතාවේ මහ කන්නය සති දෙකකට කලින් පටන් ගන්නවා. සාමාන්‍යයෙන් මීට කලින් එල් නිනෝ තත්ත්ව ආපු අවස්ථාවලදි නොවැම්බර් මාසයේ සිට දෙසැම්බර් දක්වා වගා කටයුතු දීර්ඝ කිරීමක් තමයි කරලා තිබෙන්නේ. අපි ඒ තිබෙන අත්දැකීම් එක්ක මෙවර මහ කන්නයේ වගා කටයුතු සති දෙකක් ඉදිරියට ගන්නවා. ඒ අනුව ලබන ඔක්තෝබර් පළමුවැනි දා සිට ඔක්තෝබර් 15 අතර කාලය තුළ වගා කටයුතු ආරම්භ කරන්න තමයි සැලසුම් කර තිබෙන්නේ. කාලගුණ විද්‍යා දත්ත අනුව මේ කාල පරාසය වෙනකොට වර්ෂාව ලැබෙනවා. අපි වගාව ආරම්භ කරන්න අන්න ඒ වර්ෂාව පාවිච්චි කරනවා. එතකොට අපට ජලාශවල තිබෙන, වැව්වල තිබෙන වතුරවලින් සැලකිය යුතු ප්‍රමාණයක් ඉතුරු කරගන්න පුළුවන්, කළමනාකරණය කරගන්න පුළුවන්. ලබන ජනවාරි මාසයේ මැද විතර වෙනකොට ඒ අස්වනු නෙළන්න පටන් ගන්නවා. නැත්නම් වෙන්නේ පෙබරවාරි මාසයේත් වතුර නිදහස් කරන්න වෙන එක. පෙබරවාරි කියන්නේ පායන කාලය. යල කන්නයේ ආරම්භක කාලය පායන කාලය. ඔන්න ඔය තත්ත්වය තුළ අපි ඒක එහෙම සැලසුම් කරගෙන යනවා.

ඒ වාගේම, මැද කන්නයේ මුං ඇට වගාව ප්‍රචලිත කිරීම සඳහා ගොවි ජනතාව පොළඹවා තිබෙනවා. අපි ඊට අදාළ මැදිහත්වීම් ටික කරගෙන යනවා. ඒ වාගේම ගෙවතු වගා සංකල්පය යටතේ ඒ ක්‍රියාවලට අපි අත ගහලා තිබෙනවා. අපි තිබෙන ආහාර ටික සුරක්ෂිත කර ගැනීම පිළිබඳව පළල් සංවාදයක් හදාගෙන තිබෙනවා. ඒ වාගේම, වගා කළ හැකි සෑම තැනකම වගා කටයුතු කරගෙන යන්නත්, ආහාර සුරක්ෂිතතාව පැත්තෙන් තවත්

ක්‍රියාමාර්ග ප්‍රමාණයක් ගැනීමටත් අපි මේ වෙනකොට සැලසුම් කර තිබෙනවා. ඒවාත් එක්ක අපි විශ්වාස කරනවා, අපට මේ තත්ත්වයට මුහුණ දෙන්න පුළුවන් වෙයි කියලා.

ඒ වාගේම මේ වනකොට හම්බන්තොට, මොනරාගල, පොළොන්නරුව වාගේ දිස්ත්‍රික්ක 4ක විතර වගා කටයුතු සුළු අවදානම් තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. අපි ඒ සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය හරහා මැදිහත් වෙමින් ඉන්නවා. මේකෙන් ගොවි ජනතාවට යම්කිසි පීඩනයක් අත්වනවා නම්, වගාවලට හානි සිද්ධ වනවා නම් ඒවාට වන්දි ලබා දෙන්නත් අපි කටයුතු කරනවා. අපි ආණ්ඩුව ගන්නකොටත් යල කන්නය සඳහා වන්දි ශත පහක්වත් ගෙවලා තිබුණේ නැහැ. අපි ඇවිල්ලා පළමුවෙන්ම කළේ, යල කන්නය සඳහා ගොවීන්ට වන්දි දීපු එකයි. අපි ආණ්ඩුව ගත්තාට පස්සේ පළමුවැනි මහ කන්නයේ අවස්ථා දෙකකදී වගා හානි සිදුවුණා. අපි ඒ අවස්ථා දෙකේදීම කල් යවන්නේ නැතිව ගොවීන්ට වන්දි ගෙව්වා.

ඊට පස්සේ "දිට්වා" සුළි කුණාටුව ආවා. ඒකෙන් මුළු රටටම ලොකු හානියක් වුණා. ඒ සඳහා අතිවිශාල වන්දි ප්‍රමාණයක් ලබා දෙන්නත් ආණ්ඩුවක් විධියට අපි සමත් වුණා. ඒ වාගේම අපි ගොවි ජනතාවට මතක් කරන්න කැමැතියි, මේ තත්ත්වය ඇතුළේ ඔබට යම්කිසි පීඩනයක් අත් වුණොත්, ඒ සඳහාත් යම්කිසි සහනයක් ලබා දෙන්න රජය අනිවාර්යයෙන්ම මැදිහත් වනවා කියලා. මම මේ වෙලාවේ ගොවි ජනතාවට පණිවුඩයක් ලබා දෙන්න කැමැතියි. මේ වෙලාවේ ජලාශවල තිබෙන, වැව්වල තිබෙන වතුර ටික පුළුවන් තරම් පරිස්සම් කරගන්න ඕනෑ, අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්න ඕනෑ. දැන් යල කන්නයේ අස්වනු නෙළීම ඉවරවෙගෙන එනවා. සමහර තැන්වල අස්වනු නෙළා ඉවරයි. ඒ නිසා නියරවල් සුද්ද කරලා, ඇළවල් සුද්ද කරලා වගාවට සූදානම් වෙමු. ඔක්තෝබර් මාසයේ මුල සිට අපි වතුර ලබා දෙනවා, වගාව ආරම්භ කරන්න. ඔක්තෝබර් මාසයේ මැද වන විට වගාව අවසන් කරන්න ඕනෑ. මහ කන්නය සති දෙකක් මෙහාට ගන්න එක ඇතුළේ ගොවි ජනතාවත් ඒකට සූදානම් වෙන්න ඕනෑ. අපි මේ වෙලාවේ ගොවීන්ගෙන් ඉල්ලා සිටිනවා, දැන් තියාම වී වගාවට අදාළ ඉඩම් ටික සකසුරුවම් කරගෙන ඒ සඳහා කඩිනමින් සූදානම් වෙන්න කියලා. ඒ වාගේම පරක්කු වෙලා වගා කටයුතුවලට පෙලඹෙන්න එපා කියන කාරණයත් අපි මේ වෙලාවේ මතක් කරනවා. මේ තත්ත්වය තුළත් අපට යල කන්නයේ වී අස්වනු විශාල ප්‍රමාණයක් ලැබෙමින් තිබෙනවා. ඒ වාගේම ගිය කන්නයෙන් ලැබුණු අස්වැන්නෙන් සැලකිය යුතු ප්‍රමාණයක් - ලොකු stock එකක් - රට තුළ තිබෙනවා. ඒ තත්ත්වය තුළ ඉදිරියේදී හාල් ප්‍රශ්නයකට මුහුණ නොදී කටයුතු කරගෙන යන්න පුළුවන් වෙයි කියලා අපට විශ්වාසයක් තිබෙනවා. මේ සියලු කටයුතු කළමනාකරණය කරමින් රටේ ආහාර සුරක්ෂිතතාව ආරක්ෂා කිරීමට අනිවාර්යයෙන්ම අපි ආණ්ඩුවක් විධියට අදාළ මැදිහත්වීම කරනවා කියන කාරණය මම මේ වෙලාවේදී මේ සභාව ඉදිරියේ මතක් කරන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.42]

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද එල් නිනෝ තත්ත්වය ගැන තමයි කථා කරන්න තිබෙන්නේ. හැබැයි, ලෝකයට එල් නිනෝ එන්න කලින් විපක්ෂයට එල් නිනෝ ඇවිල්ලා ඉවරයි. අද මාතෘකාව වෙලා තිබෙන්නේ, විපක්ෂය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දසවන පාර්ලිමේන්තුව ආරම්භයේදීම විපක්ෂය අපට චෝදනාවක් කළා, රටේ ලුණු නැහැ කියලා. හැබැයි, ඒ ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් දුන්නාට පස්සේ ඒ සටන් පාඨය ඉවර වුණා. ඊට පස්සේ කෑ ගහන්න පටන් ගත්තා, මැද පෙරදිග පවතින යුද්ධයත් එක්ක තෙල් පෝලිම් එයි කියලා. තෙල් පෝලිම් මවන්නත් හැදුවා. හැබැයි, දැන් ඒ ප්‍රශ්නයත් ඉවරයි. තෙල් තිබෙන සමහර රටවල තෙල් පෝලිම් තිබුණා. නමුත් ලංකාවේ තෙල් පෝලිම් නැහැ. එතකොට විපක්ෂයට තිබුණු ඒ සටන් පාඨයත් ඉවරයි. ඒත් එක්කම පොහොර හිඟයක් එයි කියලාත් කිව්වා. හැබැයි, අපි පොහොර ටික වෙලාවට, හරියට බෙදලා ඒ ප්‍රශ්නයත් ඉවර කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පස්සේ "දිට්වා" සුළි කුණාටුව ආවා. එතකොට කිව්වා, මේ රට කඩාගෙන වැටෙයි, නැවත ඔවුන්ට සටන් බිමක් ඇතිවෙයි කියලා. ඔවුන් ඒ ප්‍රාර්ථනය කළා. හැබැයි, දැන් ඒ සටන් පාඨයත් ඉවරයි. අපි රුපියල් කෝටි 50,000ක් මේ රටේ ජනතාවට බෙදුවා විතරක් නොවෙයි, එම ආපදා තත්ත්වය හොඳින්ම කළමනාකරණය කරපු රට බවටත් ශ්‍රී ලංකාව පත් කරලා ඉවරයි.

රාජ්‍ය සේවකයන්ගේ වැටුප් සම්බන්ධයෙන් ගත්තත්, ඒ අයට කියන්න සටන් පාඨයක් ඉතුරු වුණේ නැහැ. ඒ නිසා ඔවුන්ට ඒකට උද්ඝෝෂණ පවත්වන්නත් බැහැ. ඒ නිසා දැන් විපක්ෂය දැඩි නියඟයකට හසුවෙලා තිබෙනවා. ඔවුන්ට දැන් සටන් පාඨ නැතිවෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එල් නිනෝ ගැන දැනට පූර්ව කථනයක් තිබෙනවා, ඒක ආවොත් එක් පැත්තකට වර්ෂාපතනය, අනික් පැත්තට පැවිල්ල කියලා. මේ සඳහා අපේ පූර්ව සූදානමක් නැද්ද? දැන් ඔය පැත්තෙන් චෝදනාවක් ආවා නේ, අපි පූර්ව සූදානමක් වෙලා නැහැ කියලා. නැහැ, අපි හොඳ පූර්ව සූදානමකින් තමයි ඉන්නේ. මම මේකට අදාළව මාතෘකා දෙකක් ගන්නවා. එකක්, කෘෂි කර්මාන්තයට අදාළව. දැන් මේ එල් නිනෝ තත්ත්වය ඇති වුණොත්, කෘෂි කර්මාන්තයට අදාළ අපේ සැලසුම කුමක්ද? මට පෙර කථා කරපු අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ඉතා පැහැදිලිව කිව්වා, ලංකාවේ ජලාශවල ජල මට්ටම් අපි කොහොමද කළමනාකරණය කරගන්නේ කියලා. සමහර වෙලාවට ස්වාභාවික අනතුරක් කළමනාකරණය කරගන්න බැරි සීමාව ඉක්මවන්නත් පුළුවන්. අන්න එතකොට ඔබතුමන්ලාට සටන් බිම හැදෙයි. හැබැයි, ස්වාභාවිකව වන විපතක් දේශපාලන සටන් පාඨයක් කරගන්න තරම් මේ විපක්ෂය බංකොලොත් වෙලාද?

අපේ රටේ කෘෂි කර්මාන්තය තුළ වී ගොවිතැන විශේෂ තැනක් ගන්නවා. අපි අද උදේ කථා කළේ වී ගොවිතැනට අදාළව වී මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 7,500ක් නැවත වෙන් කිරීම පිළිබඳවයි. වී මිලදී ගැනීම සඳහා මීට කලින් අපි රුපියල් මිලියන 10,000ක් - කෝටි 1,000ක් - පෞද්ගලික අංශයට වෙන් කළා. ඊට අමතරව, රාජ්‍ය අංශයට රුපියල් මිලියන 6,000ක් - කෝටි 600ක් - වෙන් කර තිබෙනවා. ඒ අනුව සාමාන්‍යයෙන් ගත්තොත්, වසර 10ක ඉතිහාසයේ පළමු වතාවට වී මිලදී ගැනීම සඳහා රුපියල් කෝටි 2,350ක් වෙන් කර තිබෙනවා. දැන් මේ විපක්ෂයේ මහත්වරුන්ට ලජ්ජා නැද්ද, මොකක්ද මේ සැලසුම කියලා අහන්න?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ලජ්ජා නැහැ, ලජ්ජා නැහැ.

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)

ලජ්ජා නැති බව දන්නවා, හොඳටම. රෙදිත් නැතිව නේ ඉන්නේ. ලජ්ජා නැති බව දන්නවා. අනික් අය වෙනුවෙන් කතින බවත් දන්නවා. පොඩි අවුලක් තිබෙන බවත් දන්නවා. ඒ නිසා කරුණාකර නිහඬව ඉන්න. *[බාධා කිරීමක්]* ලාංකීය ඉතිහාසයේ අවුරුදු 10කට පස්සේ වී ගබඩා ටික සුද්ධ කරලා, වී මෝල් ටික සක්‍රිය කරමින්, වී මිලදී ගැනීම සඳහා ආණ්ඩුව ලෑස්තියි කියන සංඥාව අපි දීලා තිබෙනවා. ඒ නිසා එක් පැත්තකින් අපි ගොවීන්ට මේ කාරණාව කියනවා. සමහර වෙලාවට "බූතයා" මැෂින් එකෙන් ගොයම් කපපු එකට, නැත්නම් කුඹුර හාපු එකට ණය ගෙවන්නත් ඇති. ඒ වෙනුවෙන් යම් වී ප්‍රමාණයක් විකුණන්න. රුපියල් 120ට, 130ට, 140ට වී ගන්නේ නැත්නම් ඒ ගණනට විකුණන්න. හැබැයි ඔබ කුණුකොල්ලෙට වී විකුණන්න යන්න එපා. ඒ වාගේම වී මිලදී ගන්නා අයටත් අපි කියනවා, සහතික කරපු මිලට වී මිලදී ගන්න ඔබ බයවෙන්න එපා කියලා. ඇයි ඒ? සමහර විට මේ තත්ත්වය ඇත්ත නම් මොකද වෙන්නේ? ඉන්දියාව වාගේ රටකින් කරන ආහාර ආනයනය අපට නවත්වන්න වෙයි. ලෝකයේ වෙනත් රටවලටත් ආහාර අපනයනය නවත්වන්න වෙයි. ඒ නිසා අපේ රටේ වී නිෂ්පාදනය ඇතුළු සියලු කෘෂි භෝග නිෂ්පාදනවලට ලෝක වෙළෙඳ පොළේ ඉහළ මිලක් ලැබෙන්නත් පුළුවන්. ඒ අවස්ථාව අපට විතරක් නොවෙයි, ලෝකයේ ගොඩක් රටවලට ලැබෙන්න පුළුවන්. ඒ නිසා අපි ගොවීන්ටත් කියනවා, අඩු මිලට වී විකුණන්න ලැහැස්ති වෙන්න එපා කියලා. ඒ වාගේම ව්‍යාපාරිකයන්ටත් අපි කියනවා, ඔබ බය නැතිව වී මිලදී ගන්න, ඒකට සැලසුම් සහගත ආණ්ඩුවක් තමයි මේ බලයට පත්වෙලා තිබෙන්නේ කියලා.

අනෙක් පැත්තෙන්, පානීය ජලය පිළිබඳ ගැටලුවක් එන්න පුළුවන්. දැනටත් යම් යම් ප්‍රදේශවල ඒ සම්බන්ධ ගැටලු තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ එල් නිනෝ තත්ත්වය ගැන අද නොවෙයි, මීට කලිනුත් කිව්වා නේ. මට මතකයි, දැනට දවස් දෙකකට විතර කලින් කෙනෙක් කිව්වා, "රාජා හවතු ධම්මිකෝ" කියලා. එතකොට 2020-2021 කාලයේ මොන රජා ද දන්නේ නැහැ හිටියේ. ස්වාභාවික අනතුරක් කියන්නේ එහෙම දෙයක් තමයි. පානීය ජල ප්‍රශ්නයක් ආවොත්, ඒකට සැලසුමක් තිබෙන්න ඕනෑ. ඉතින්, අපි සැලසුම හැදුවා නේ. මා නියෝජනය කරන්නේ මහියංගනය ආසනය. අපේ ආසනයේ ජල සම්පාදන මණ්ඩලයට අයත් එක ටැංකියයි තිබුණේ. ඒ ටැංකියෙන් 10,000කට ජලය දෙන්න පුළුවන්. නමුත්, 13,000කට දීලා තිබෙනවා. නගරය ඇතුළු ගම්මානවල තවමත් පානීය ජල ප්‍රශ්නය තිබෙනවා. අපි මේ අවුරුද්දේ රුපියල් කෝටි 170ක් වෙන් කරලා දැවැන්ත ජල ව්‍යාපෘතියක් පටන් අරගෙන තිබෙනවා. ලොග්ගල් ඔය ජලාශයෙන් කියුබික් මීටර් 10,000ක් අරගෙන රිදීමාලියද්ද කොට්ඨාසයේ ටැංකි 7ක් ගහලා, රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 39කට ජලය දීලා, මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 3කට ජලය දීලා තිබෙනවා. ආරම්භ කරන්න තිබෙන ව්‍යාපෘතියත් ආරම්භ කළාට පසු ග්‍රාම නිලධාරි වසම් 77න් සියයට 90ට වඩා පානීය ජලය ලබා දෙන්න පුළුවන්. ඉතින් අපි සැලසුමක් එක්ක නේ වැඩේ කරගෙන යන්නේ. අපට ඉදිරි දැක්මක් තිබෙනවා නේ. ඒ අනුව නේ මේ වැඩ කරගෙන යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් කාරණයක් කියන්න තිබෙනවා. මීට දිනකට වාගේ පෙර අපේ ප්‍රදේශයට බලපෑ ගුරුවරුන්ගේ ප්‍රශ්නයක් තිබුණා. මෙතුමන්ලා දැන් එල් නිනෝ ගැන කථා කරනවා. මම කිව්වේ ඒකයි, මේ විපක්ෂය දැඩි නියහයකට අහුවෙලා තිබෙනවා කියලා. ලැබෙන ලැබෙන හැම මාතෘකාවකම එල්ලෙනවා. ඒ වැඩබලන ගුරුවරුන්ගේ, විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නය කවුද හැදුවේ? ඇත්තටම ගත්තොත්, ඒ ගුරුවරුන්ට කිසි චක්‍රලේඛනයක් තිබුණේ නැහැ, විදුහල්පති ධුර දරන්න. ඒ අය නිසි ක්‍රමයකට විදුහල්පති ධුරයේ පිහිටෙව්වා නම් රුපියල් 2,500ක් නොවෙයි, ඊට වඩා මුදලක් ඒ අයට දෙන්න ඕනෑ. ඒ විදුහල්පතිවරයෙක් රුපියල් 2,500ක් නොවෙයි, රුපියල් 5,000ක් හෝ 6,000ක් දරුවන් වෙනුවෙන්, පාසල වෙනුවෙන් වියදම් කරනවා. ඒ නිසා ඒ අයට රුපියල් 2,500 අහිමි වීමේ ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ. හැබැයි, වැරදි විධියට පත්වීම් දෙනකොට අසරණභාවයට පත් වෙන්නේ ගුරුවරුයි, විදුහල්පතිවරුයි. දැන් අපි ඒක නිවැරදි කරනවා. තව වැඩි කල් එම සටන් පාඨයේ එල්ලෙන්න අපි විපක්ෂයට ඉඩ තියන්නේ නැහැ. ගරු ආණ්ඩුකාරතුමාත්, කැබිනට් මණ්ඩලයත් මැදිහත් වෙලා ඒ ප්‍රශ්නය ඉතා ඉක්මනින් විසඳනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඇත්තටම අපට ඕනෑ ශක්තිමත් විපක්ෂයක්. මේ වාගේ කේඩෑරි, කැහැටු, වියළිලා ගිය විපක්ෂයක් නොවෙයි අපට ඕනෑ. අතට ගන්න ඕනෑ මොහොතේ සටන් පාඨය අතට ගන්න. ඒ ගත්ත සටන් පාඨය නිවැරදි වෙන්න ඕනෑ. ඕනෑ එකටයි, එපා එකටයි අත ගහන්න ගියාට පස්සේ වෙන දේ දන්නවා නේ. දැන් අර විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීමේ කාරණයට අත ගහන්න ගිහිල්ලා වෙච්ච දේ පෙනෙනවා නේ. හැම සටන් පාඨයක්ම විපක්ෂයට අයිති නැහැ. ඒ නිසා මහත්වරුනි, බලය ඉලක්ක කරගෙන යන්න. අපි එහෙම නේ ආවේ. අපි මහජන බලය ඉලක්ක කරගෙන තමයි අවුරුදු 60ක් තිස්සේ ගමනක් ආවේ. ඒක තමයි මේ ජයග්‍රහණයෙන් කෙළවර කළේ. ඒ නිසා අපි කියන්නේ මේ මහජන ආණ්ඩුව එහෙම ලේසියෙන් වට්ටන්න බැහැ කියන එකයි. ඔබතුමන්ලා කරපු විධියට අර සාම්ප්‍රදායික ලෙස නිල් සහ කොළ විධියට මාරු වන ආණ්ඩුවක් නොවෙයි, මේ. වට්ටි අම්මා කියලා කියපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එක දවසක කොළ පාට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තව දවසක නිල් පාට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමන් ඉන්න පක්ෂය මොකක්ද කියලා නෝනාවත් දන්නේ නැහැ. පුදුම වේගයකින් පක්ෂ මාරු කරන්නේ. එහෙම කටයුතු කරන එතුමන්ලා ප්‍රතිපත්ති ගැන, සැලසුම් ගැන දැවැන්ත වීරයෝ වාගේ අපට කියනවා. එහෙම නොවෙයි, ගමනක් යනවා නම් සැලසුම් සහගත වෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් කියන්නේ මෙච්චරයි. අපි හැදුවේ මහජනතාවගේ ආණ්ඩුවක්. ඒ මහජන ආණ්ඩුව අනිවාර්යයෙන්ම මේ රටේ ජනතාවගේ දුප්පත්කමට එරෙහි සටන ජයග්‍රහණයෙන් කෙළවර කරලා තමයි නවතින්නේ කියලා ප්‍රකාශ කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.51]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Presiding Member, Professor, බොහොම ස්තුතියි.

ඇත්තටම කලින් කථා කරපු මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ, දැන් විපක්ෂයේ කවුරුවත් නැහැ කියලා. ඔක්කොම ගෙදර ගිහිල්ලා අඩියක් ගහන්න. හැබැයි, දැන් අඩියක් ගහන්න විධියකුත් නැහැ, ගෙදර ගිහිල්ලා කන්න බොන්න විධියකුත් නැහැ, පඩියකුත් නැහැ, මොකුත් නැහැ. ඇවිල්ලා නිකම් කෑ ගහලා යනවා. ඒ නිසා මම එතුමාට කරුණාකරලා කියනවා, මම විතරයි මෙතැන විපක්ෂයෙන් වාඩි වෙලා හිටියේ කියලා. එම නිසා විපක්ෂයේ මන්ත්‍රීවරු ඉන්නවා වාගේ බොරුවට අත් දික් කර කර කථා කරන්නේ නැතුව පොඩ්ඩක් හිතලා කථා කරන්න කියලා මම ඒ මන්ත්‍රීතුමාට කියනවා.

Professor, අද මම කරන්නේ මගේ අන්තිම කථාව. මම අවුරුදු දෙකක් පාර්ලිමේන්තුවේ හිටියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ අවසාන කථාව ඉතාම ප්‍රයෝජනවත් කථාවක් විය යුතුයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අනිවාර්යයෙන්ම.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අනවශ්‍ය දේවල් කථා නොකර අවශ්‍ය දේ විතරක් කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අවශ්‍යම කාරණයක් විතරයි මම කථා කරන්නේ. චේ ගුවේරා කියා තිබෙනවා, “Better to die standing, than to live on your knees” කියලා. ඒ කියන්නේ, කකුල් නවාගෙන ජීවත් වනවාට වඩා හිටගෙන මැරෙන එක හොඳයි කියලා. Professor, මට එහෙම ජීවත් වෙන්න වුවමනාවක් නැහැ.

මම ඔබතුමාට කාරණයක් කියන්නම්. අපේ රටේ ලොකුම ලොකු ප්‍රොපෙසියෙක් ඉන්නවා. එයාගේ පුතාගේ නම තමයි, දිමුතු සුරසේන. 2026.08.19 දිනය දාලා UKවල journalism කරන ජසීම් ජමීල් කියන කෙනෙක් මට ලියුමක් එවා තිබෙනවා. මේ රටට ඉතා වැදගත් ප්‍රොපෙසියා ගැන කථා කරලා තිබෙනවා. එයාගේ පුතාගේ නම දිමුතු සුරසේන. Apartment 6 on 12th Floor, 64 Ward Place, Colombo 07 විකුණලා තිබෙනවා. ඒ ඔක්කෝම වටිනාකම Rs. 185 million. ඒ building එකට කියන්නේ, “The Grand” කියලා. හැබැයි, ඒ building එක විකිණුපු කෙනාගේ නම, Mr. Nihal Hettiarachchi. ගත්ත එක්කෙනාගේ නම දිමුතු සුරසේන. කවුරුවත් කලබල වෙන්න ඕනෑ නැහැ. දිමුතු සුරසේන කියන පුතා ගැන තමයි මම කථා කරන්නේ. එයාට රුපියල් මිලියන 185කට එම ගොඩනැඟිලි දීලා තිබෙනවා. මම නිකම් කියන්නේ. වෙන මොකුත් කියන්න නොවෙයි මම ආවේ.

හැබැයි, මම මතක් කරන්න කැමැතියි, 2021දී අපේ රටට "MV X-Press Pearl" කියලා සිංගප්පූරුවේ නැවක් ආපු බව, ඉන්දියාවේ ඉඳන් කොළඹට යන ගමන්. ඒකේ nitric acid, cosmetics ඇතුළු chemicals තිබුණා. එම නැව 2021 මැයි 20වන දා ගිනි ගත්තා. එම නැව දවස් 12ක් තිස්සේ ගිනි අරගෙන 2021 ජූනි 02වැනි දා මුහුදුබත් වුණා. ඒ සම්බන්ධයෙන් නඩුවක් දාලා, US Dollars 1 billion වන්දි ගෙවන්න කියලා ඒ කාලයේ හිටපු Chef Justice කියා තිබෙනවා. US Dollars 1 billion කියන්නේ, US Dollars 1,000 million. ඊට පස්සේ ඒ පුද්ගලයා ඉවත් වෙලා යනවා. ඊට පස්සේ එන්න හිටපු හොඳම Justice තමයි Justice Kodagoda. එතුමා ඒ committeesවලට පත් කරලා, ඊට පස්සේ five-judge bench එකක් දැම්මාම එතුමා ඉවත් වෙලා ගියා. කෝදාගොඩ මහත්තයා තමයි Chief Justice විධියට එන්න හිටපු එක්කෙනා. හැබැයි, කෝදාගොඩ මහත්තයා ඉවත් කළා, ඒ committee එකෙන්. ඊට පස්සේ five-judge bench එක three-judge bench එකක් කළා. Three-judge bench එක දැන් මේ නඩුව ඉවර කරලා තිබෙනවා. හැබැයි, බිලියන එකක් - US Dollarsවලින් මම කියන්නේ - එහෙම නැත්නම් මිලියන 1,000ක් ගෙවන්න කිව්වාම මිලියන 1ක් ගෙව්වා, local agent විසින් 2025 සැප්තැම්බර්වල. ඒ කියන්නේ, ලංකාවේ local agent. ඒ local company එක තමයි, Sea Consortium Lanka (Pvt.) Limited කියන්නේ. ඒගොල්ලන් US Dollars 1 million, එහෙම නැත්නම් අපේ සල්ලිවලින් මිලියන 300ක් ගෙව්වා. ඊට පස්සේ ඒ නඩුව ආපහු අපේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එහෙම ගත්ත ගමන්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒ නිසා එතුමා bench එකෙන් එළියට දමලා ඊට පස්සේ නඩුව වැහුවා. නඩුව වැහුවාම අපට පාඩුයි, US Dollar 999 million. ඒක 300න් වැඩි කරන්න මම දන්නේ නැහැ. මම එච්චර ඉගෙන ගත්ත කෙනෙක් නොවෙයි. ඒ නිසා මට ඒ ගැන තේරෙන්නේ නැහැ. ඒ ගැන හිතලා බලන්නකෝ. ඒ වෙනුවට එයාගේ පුතාට දීලා තිබෙනවා,- කාගේ පුතාද කියලා මම දන්නේ නැහැ. ඒකට DNA test එකක් කරන්න ඕනෑ. ඒක වෙනම කථාවක්. දිමුතු සුරසේනට බිලියන,- *[බාධා කිරීමක්]* කථා කරන්න එපා, අයියා. දිමුතු සුරසේන. Doctor කෙනෙක් වෙලා ඉඳලා මට ඔබතුමාට කියන්න බැහැ නේ,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා. එහෙම කිව්වොත් ඔබතුමාට පව්, ඔබතුමාගේ wifeවත් ඔබතුමාට රෑට ළඟට එන්න දෙන එකක් නැහැ. ඒ නිසා මම ඔබතුමාට එහෙම කියන්නේ නැහැ. ඒ නිසා කට වහගෙන ඉන්නකෝ.

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

Hon. Professor, මම ඔබතුමාට ගරු කරනවා. සාමාන්‍යයෙන් ඔය පුටුවේ වාඩි වෙන්න ඕනෑ ඔබතුමා වාගේ පුද්ගලයන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි කියලා කවදාවත් මම ඔබතුමාට කියන්නේ නැහැ. ඔබතුමාගේ academic qualificationsවලට වගකීම මම ගන්නවා. අපේ රටේ අය බලාපොරොත්තුවෙන් හිටියා, වල් පැළ ටික අයින් කරලා මල් පැළ ටිකක් දමන්න. හැබැයි, මේ වල් පැළ ටික උඩ බලාගෙන ඉන්නවා. මම නම කියන්න කැමති නැහැ. පව්, ඊට පස්සේ නැඟිටිනවා, මේක තමයි chance එක කියලා. හැබැයි, හිතලා බලන්නකෝ. *[බාධා කිරීමක්]* අනේ! මගේ කථාව අහන්නකෝ බබා. මගේ අන්තිම කථාව අහන්නකෝ. දැන් මම මේ කථා කරන්නේ,- *[බාධා කිරීමක්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
මාදුගොඩ මන්ත්‍රීතුමා, ඔබතුමා පිටුපසට යන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉන්නකෝ පොඩ්ඩක්, එයා මගේ හිතවතා. මම ඒ කථාවත් කියන්නම්. එයා මගේ හිතවතා. ඒ නිසා හය වෙන්න එපා. දිමුතු සූරසේන කියලා කිව්වාම ආණ්ඩුවේ අය නැඟිටින්නේ මොකටද? හෘදය සාක්ෂිය. මම දැන් මේ පාර්ලිමේන්තුව දාලා යනවා. ඇත්තටම මම මේ ගැන කියන්නම්. මම මේ කියන්නේ හරි සිංහලද දන්නේ නැහැ. අපේ දෙමළවලින් කියනවා, හැමෝම නිර්වස්ත්‍ර නම්, ඒ කියන්නේ එක්කෙනෙක්වත් underwearවත් අඳින්නේ නැත්නම් එතැන underwear එකක් ඇඳගෙන ඉන්න කෙනා මෝඩයි කියලා. මම දන්නේ නැහැ, ඒක සිංහලෙන් කියන්නේ කොහොමද කියලා. ඒ area එකේ හැමෝම නිර්වස්ත්‍ර නම් underwear එකක් ඇඳගෙන ඉන්න එක්කෙනාට මෝඩයා කියනවා. ඒ වාගේ, ඉස්සර මේ පාර්ලිමේන්තුව ඇතුළේදී මේ පුද්ගලයන් මට කිව්වා, psychiatric patient කෙනෙක් කියලා. මට කිසි ලෙඩක් නැහැ. මම ඒක අහලා තිබෙනවා. මම අංගොඩ වැඩ කර තිබෙනවා නේ. "බෙහෙත් බිව්වාද, සර්?" කියලා අහලා තිබෙනවා. මම තෙල්ලිපපලෙවල වැඩ කර තිබෙනවා, අංගොඩ වැඩ කර තිබෙනවා. අවුරුදු 20ක් මම හිටියේ medical sector එකේ. ඒ නිසා මට කිසි අවුලක් නැහැ. හැබැයි, දැන් ඔක්කොම ගහනවා. බලන්නකෝ. මොකක්ද හේතුව? *[බාධා කිරීමක්]* දැන් මම කථා කළේ දිමුතු සූරසේන ගැන. මම වෙන සූරසේනලා ගැන කථා කරලා නැහැ. ඔයාගේ තාත්තා වෙන්න ඇති, ඔයාගේ පුතා වෙන්න ඇති. මම ඒ ගැන කථා කළේ නැහැ. මේක තමයි අපේ රටට වෙලා තිබෙන්නේ.

කෝදාගොඩ මහත්තයා එළියට දාලා, හොඳ පුද්ගලයන් ටික එළියට දාලා අන්තිමට වල් පැළ ගෙනැත් දාලා තිබෙනවා. මේගොල්ලන් හිතනවා ඇති මට නඩුවක් තිබෙනවා නේ, ඒ නිසා මාව,- අනේ, පොලීසියට බැණපු එකටයි, yellow line එකේ දාපු එකටයි විතරයි මට නඩු තිබෙන්නේ. මාව හිරේ දාන්නකෝ. ඒකයි මම ඔයගොල්ලන්ට පෙන්වා දුන්නේ, "Better to die standing than to live on your knees" කියලා. අපි මැරෙන්නත් භය නැහැ. හැබැයි, කවදාවත් මම මගේ කකුල් නමලා, දණහිස් නමලා ඇවිල්ලා ඔයගොල්ලන්ගෙන් ලියුමක් අරගෙන ගිහිල්ලා අර නඩුවෙන් බේරෙන්නේ නැහැ. ඒ නිසායි මම යන්නේ. ඒක මතක තියා ගන්න. හැබැයි, Professor, මම කාලයක ඉඳලා හිතාගෙන හිටියා, අපේ දෙමළ මිනිස්සුයි, සිංහල මිනිස්සුයි කවදාවත් එකතු වෙන්නේ නැහැ කියලා. මේ පාර්ලිමේන්තුවට ආවාට පස්සේ,- අපේ වානක මාදුගොඩ අයියා හැමදාම ප්‍රභාකරන්ට බණිනවා ඔයගොල්ලන් දැක්කා නේ. අයියාගෙන් මම වැඳලා ඉල්ලුවා. අයියා මගේ ළඟ වාඩි වෙලා ඉන්නවා. අපේ ideology වෙනස්. මගේ ideology වෙනස්; මෙතුමාගේ ideology වෙනස්. හැබැයි, අපි එකට වාඩි වෙලා ඉන්නවා. නාමල් ඉන්නවා නම් ගෙනැල්ලා මෙතැන වාඩි කර ගන්නවා.

හැබැයි තමුන්නාන්සේලා බොරු කරලා තමයි මේ රට රවටන්නේ. අපට එහෙම බොරු කරන්න ඕනෑ නැහැ. මම අදත් කියනවා, හෙටත් කියනවා, එළියේ mediaවලටත් ගිහින් කියලා තිබෙනවා. මම සිංහල ජනතාවගේ හිත නාස්ති කරන්න, නැත්නම් රිදවන්න නොවෙයි ප්‍රභාකරන් දෙවියෝ කියලා කියන්නේ. මම ගරු කරන්නේ මගේ මිනිසුන්ට. මට අද කෝට් එකක් දාගෙන, ටයි එකක් දාගෙන මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්න පුළුවන්. හැබැයි 1992දී බෝම්බ පුපුරනකොට, එක එක බෝම්බ වැටෙනකොට මා බේරා ගත්ත මිනිස්සු දැන් බිම, යට. හැබැයි, තමුන්නාන්සේලා බේරාගත්ත මිනිස්සු ඔක්කොම ටික අද කකුල් නැතිව, අත් නැතිව ඉන්නවා. තමුන්නාන්සේලා ඒ අය ගැන කථා කරනවාද? ලජ්ජයි. ඔක්කොම ඇඳුම් ටික ගලවලා යන්න. පුතාගේ නම කිව්වාම නැඟිටියිද දන්නේ නැහැ. වානක මාදුගොඩ අයියා, අර එතුමාගේ නම මොකක්ද කියලා කියන්නකෝ. එදා වෙන කෙනෙකුගේ නම කිව්වා. කියන්නකෝ, අයියා ඉක්මනට. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා ඔබතුමාගේ කාලය නාස්ති කරගන්නවා නේ. නිකම් අපරාදේ නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, නැහැ. ඉන්නකෝ. ඒක ඔබතුමාට නාස්ති වෙනවා වුණාට mediaවලට ගිහින් බලන්නකෝ, Professor. Professor, මූලාසනයේ ඉඳගෙන ඔබතුමා හරි කියන්නකෝ, ප්‍රභාකරන් ත්‍රස්තවාදියා කියලා. මම time දෙන්නම්. මම time දෙන්නම්, ඔබතුමාට අද.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේ ඔබතුමාගේ කාලය. ඔබතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you.

ඒකත් කියන්න බැරි වෙලා ඉන්නේ. මේ ඉන්න මල් පැළ ටික කියන්නකෝ, ප්‍රභාකරන් ත්‍රස්තවාදියා කියලා. මෙතුමා කියනවා, ප්‍රභාකරන් ත්‍රස්තවාදියා කියලා. මම කිව්වා දෙවියෝ කියලා. අපි අපේ stand එකේ ඉන්නවා. හැබැයි, අපි එක එක්කෙනාට ආදරෙයි. අද වානක අයියා ඇවිත් අහනවා, "මල්ලි ඇත්තටම අන්තිම කථාවද?" කියලා. මම කිව්වා, "අන්තිම කථාව තමයි, අයියා. 31වැනි දා නඩුව තිබෙනවා. මම යනවා, මගේ රක්ෂාවට" කියලා. හැබැයි, ඔබතුමන්ලා රටට පට්ටපල් බොරුවක් කියන්නේ. මම බොරු කියන්නේ නැහැ, මගේ ජාතියට. මම මගේ ජාතියට ආදරේ නිසා මම ආදරේ සිංහල ජාතියට. අපි ඔට්ටුවක් දාමුද? එන්න කියන්නකෝ අනුර කුමාර දිසානායක අපේ ජනාධිපතිතුමාට. ගිහිල්ලා ඔට්ටුවක් දාමු, මමද, එයාද ඇත්ත කියන්නේ කියලා, මේ රටට. ඒ වාගේ ලජ්ජා නැති වැඩ තමයි තමුන්නාන්සේලා කරන්නේ. තමුන්නාන්සේලා කියන්නේ මුස්ලිම් නැහැ, සිංහල නැහැ, දෙමළ නැහැ කියලා. මම කියනවා, මම

දෙමළ කියලා. මම ඒක අමතක කරන්නේ නැහැ. මට දෙමළ කියලා කිව්වාම මාර සතුටක් හම්බ වෙනවා. හැබැයි, මම බදාගන්නේ සිංහල එක්කෙනා. ඇත්තටම සිංහල එක්කෙනා. හැබැයි, තමුන්නාන්සේලා වාගේ නිකම් උඩ වෙන කැලි, පල්ලෙහා වෙන කැලි නැහැ. මම එහෙම බදාගන්නේ නැහැ, කවදාවත්. මතක තියාගන්න. ඒක ඔයගොල්ලන්ගේ rainbow company. ඒ rainbow company අපට අදාළ නැහැ.

මම කැමතියි, නාමල් රාජපක්ෂ වාගේ සජිත් ප්‍රේමදාස වාගේ කට්ටිය කවුරු හරි කියනවා නම් තමන් සිංහල කියලා. මම ඔවුන්ට කැමතියි. හැබැයි, දෙමළත් නැහැ, සිංහලත් නැහැ කියලා අන්තිමට ඇවිල්ලා හැමෝටම වැඬේ දෙනවා නේ, ඔයගොල්ලන්. අවුරුදු දෙකක් දුන්නා නේ. කන්ටේනර් 323 සිද්ධිය බලන්න. මම ගිහිල්ලා පළමුවැනි දවසේ මේ කථාව කිව්වාම, කන්ටේනර් 323 ඇතුළේ කේපීගේ බඩු තිබුණා කිව්වාම, අද වෙනකම් ඔයගොල්ලන් inquire කළාද? මා බලෙන් එක්කගෙන ගියා, CID එකට. මොකක්ද වුණේ? සොයා ගත්තාද? Yellow line එකේ වාහනය නවත්වනකොට මම වැරදිකාරයා. හැබැයි, කන්ටේනර් 323ක් පන්නපු එක්කෙනා

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මෙහෙම තට්ටු කරලා කියනවා, මගේ යාළුවා මොකුත් කරන්නේ නැහැ කියලා. ලජ්ජයි! තමන්ගේ wife එක්ක ඇවිත් පාර්ලිමේන්තුවේ වාඩි වෙලා කාමරේත් දාගෙන. ලජ්ජයි. ඊට වඩා හොඳයි, 1972දී මහින්ද රාජපක්ෂ මහත්මයා වෙන කොහේ හරි දැම්මා නම් බඩු. තේරුණාද? මහින්ද රාජපක්ෂ මහත්මයා ඒ බඩු ටික එළියට දැම්මා නම් අපට ඔය කරදර එන්නේ නැහැ. ඇයි? BoC එකේ නේ වැඩ කළේ. BoC එකේ නේද වැඩ කළේ? පත්වීම දුන්නේ මහින්ද රාජපක්ෂ නේද? නාමල් මහත්මයා දැනුත් කියනවා, අයියා අනෙක් පැත්තෙ වාඩි කරවන්න කියලා. ලජ්ජා වෙන්න ඕනෑ අනේ.

මම තව එකක් කියන්නම්. අපි කථා කරන්නේ අපේ හදවතින්. අපට අදත් සිංහල මිනිස්සු කෑම දෙනවා. මම ගිහින් කඩවලින් කෑම ගන්නකොට මිනිස්සු කියනවා, "ඩොක්ටර් සල්ලි දෙන්න එපා" කියලා. අපි අපේ ජාතියට ආදරෙයි. ඊළඟ ආණ්ඩුවට විපක්ෂයේ මේගොල්ලන් ආවොත් කවදාවත් මම අපේ මිනිස්සු පාවලා දෙන්නේ නැහැ. මම ඇවිල්ලා ඇමතිකම් කළත්, කවදාවත් පාවලා දෙන්නේ නැහැ කියන එක මම මගේ මිනිසුන්ට කියනවා. මම මගේ මිනිසුන් වෙනුවෙන් පෙනී සිටිනවා. දැන් මට ඕනෑ නම් එක එක පක්ෂවලට එකතු වෙලා, ඕනෑ පක්ෂයකට එකතු වෙලා ඡන්ද ගන්න පුළුවන්. මට ඡන්ද ගන්න ඕනෑ නැහැ. මට National List එකෙන් හම්බ වෙනවා. අපේ මිනිසුන්ට අපි ආදරෙයි. හැබැයි, පරණ දේවල් මතක් කරන්න මම කැමති නැහැ. ඇයි? මගේ තාත්තාත් නැති වුණා. ඔයාලා චූටි චූටි බම්බු කථා ගැන කථා කරන්නේ නැතිව අහගන්න. මගේ තාත්තා නැති වුණා කොටියෙක් නිසා. හැබැයි, මම ඒක අමතක කරන්න ලැහැස්තියි. නාමල් රාජපක්ෂගේ තාත්තා වරදක් කරලා තිබෙනවා නම් ඒ ගැන බලාගන්න තිබුණේ මගේ තාත්තාට. මට බලාගන්න ඕනෑ නැහැ නාමලුත් එක්ක. එහෙම බලාගත්තා නම් ඊළඟ පරම්පරාවේ මගේ පුතාට ගිහිල්ලා නාමල්ගේ පුතාට කථා කරන්න බැහැ. හැබැයි, ඔයගොල්ලන් ඇති කරන්නේ ඒක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය තව විනාඩි දෙකයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Sir.

බලන්නකෝ, ත්‍රිකුණාමලයේ බුදු පිළිමය තිබ්බාම ජරා වැඩක් කළේ. පොලීසිය ආලා ඒක ඉස්සුවේ. හැබැයි, මම එහෙම කරන්නේ නැහැ. මම 2029දී හරි ඇවිල්ලා මේගොල්ලන් එක්ක, නැත්නම් සජිත් ප්‍රේමදාස සර් එක්ක ආණ්ඩු පක්ෂයේ වාඩි වෙලා හිටියොත් මම එහෙම කරන්නේ නැහැ. මට අපේ මිනිස්සු වෙනුවෙන් ඊළඟට එන ජනාධිපතිතුමා අඳුරගන්න වෙනවා. හැබැයි, ඔයාලාගේ දෙමළ MPsලා කවුද කියලාවත් දන්නවාද කියලා බලන්නකෝ, සිංහල ජනතාව. ඔයාලාගේ දෙමළ MPsලා කවුද කියලාවත් ඔයගොල්ලන් දන්නවාද? කවදාවත් නැහැ.

ඔයගොල්ලන්ගේ ටී-ෂර්ට් එක මගේ ළඟ තිබෙනවා. පුළුවන් නම් කවුරු හරි එවනවාද, ආපසු එවන්න.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ටී-ෂර්ට් එක ගෙදර තිබෙනවා. හරිද? ඒක මම බල්ලාට දමනවා කියලා හිතා ගත්තා. හැබැයි, එහෙම නරක දේවල් කරන්න බැහැ නේ. මේ අපේ ජනාධිපතිතුමා නේ. බල්ලත් කැමැති වෙන්නේ නැහැ ඒකට. ඒ නිසා මම එහෙම දැම්මේ නැහැ. හැබැයි, බල්ලාට කථා කරන්න පුළුවන් නම්, ඒ සතා කියයි දමන්න එපා කියලා. හැබැයි, මම දමන්නේ නැහැ, එහෙම කරන්නේ නැහැ. ටී-ෂර්ට් එක ගැන මම කියන්නේ. මට ඕනෑ නම් දණිස් නමාගෙන ඔයගොල්ලන් ළඟට ඇවිල්ලා ඔයගොල්ලන්ගෙන් ලියුමක් අරගෙන ගිහිල්ලා අර නඩුව බේරා ගන්න තිබ්බා. හැබැයි, අපි එහෙම නැහැ. ඇයි, නැඟිටලා යන්නේ බබා? නැඟිටලා යනවා බබාලා. හැබැයි, අපට එහෙම වුවමනාවක් නැහැ. අපි එහෙම කවදාවත් කරන්නේ නැහැ.

මේක මගේ අන්තිම කථාව. මම ඔයගොල්ලන්ට කවදාවත් වරදක් කරලා නැහැ. ඔයගොල්ලෝ කී සැරයක් කිව්වාද, "මල්ලී ඕක නවත්වන්න, අපි ලියුමක් හදලා දෙන්නම්" කියලා. මම ඒක ගත්තේ නැහැ නේ අද වෙනකම්; ඔයගොල්ලන් ළඟට ඇවිල්ලා ලියුමක් ගත්තේ නැහැ නේ. මගේ මිනිස්සුන්ට මම ආදරෙයි. සිංහල ජනතාවටත් ආදරෙයි. මුස්ලිම් ජනතාවටත් එහෙමයි. මම අන්තිම Adjournment Motion එක දැම්මේත් මුස්ලිම් ජනතාව ගැන. හැබැයි, මම එකක් කියන්නම්. බැරි වෙලා හරි 2029දී අපි ඡන්දය ඉල්ලුවොත්, මම ඡන්දය ඉල්ලන පැත්තට නම් කවදාවත් ඔයගොල්ලන් ඡන්දය ඉල්ලන්න එන්න එපා. මිනිස්සු ගහලා පන්නනවා. ඊට අමතරව තව එකක් කියන්න ඕනෑ. මම මේ පාර්ලිමේන්තුව ඇතුළේ කාගේ හරි, - හංස අයියා, Assistant Secretary-General, හදවතේ ඉන්නේ. අනෙක් එක්කෙනා Madam කුෂාණි රෝහණදීර. ඊට පස්සේ මේ ඉන්නා මල් පැළ ටික. මම ඔයගොල්ලන්ගේ හිත කඩලා තිබෙනවා නම්, ඇත්තටම මම කනගාටු වෙනවා. මගේ පැත්තට ඉන්න ඕනෑ කියලා කියපු කථාව, - මම ඔයගොල්ලන් එක්ක ඩීල් ගහලා මේ පැත්තේ වාඩිවෙන්නේත් නැහැ. මේ පැත්තේ ඩීල් ගහලා ඔයගොල්ලන් එක්ක වාඩිවෙන්නේත් නැහැ. ඒ වාගේම විපක්ෂ නායකතුමාත්, අනෙක් හැමෝමත් අඳුනනවා. අයියා, ඔබතුමාගේ නම කියන්නම්, පොඩ්ඩක් නැඟිටිනවාද? මහින්ද ජයසිංහ අයියා, නැඟිටිනවාද? මම ගියාට පස්සේ, "කෝ, අර්චුනා?" කියලා හොයන්න එපා. එදා නාමල්ව හොය හොයා කථා කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වේලාවක් ලබා දෙන්න.

ඔබතුමා ඇතුළු මේ පාර්ලිමේන්තුවේ සේවය කරන හැමෝටම මම ගොඩක් ආදරෙයි. 2029 හෝ එහෙම නැත්නම් පසුව කවදා හරි හෝ මේ පාර්ලිමේන්තුවට මම එනකොට මගේ විදියට එනවා. මම කවදාවත් පාට වෙනස් කරලා එන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුව ඇතුළේ මම මොකක් හරි වරදක් කරලා තිබෙනවා නම්, මට සමාවෙන්න. භාෂාවේ මොකක් හරි අඩුපාඩුවක් තිබ්බා නම් මට සමාවෙන්න. ඒවා මම හිතලා කරපු ඒවා නොවෙයි. අනෙක් එක,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අරවා මේවා කියපු දේවල් මම නිකම් ආතල් එකට, fun එකට කියපු ඒවා. එහෙම නැතිව එයාට කරදර කරන්න නොවෙයි. ඒ නිසා එයාගෙනුත් සමාව ඉල්ලනවා. ඒ වාගේම අර

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

- එයා නංගි කෙනෙක්, එයාගෙනුත් - සමාව ඉල්ලනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.06]

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර ප්‍රදේශවල ඇති වෙලා තිබෙන නියං තත්ත්වයට අදාළව රජය ගෙන තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳව පවත්වනු ලබන මෙම විවාදයේදී ඒ සම්බන්ධව අදහස් දැක්වීමට අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඇත්ත වශයෙන්ම මේ නියං තත්ත්වය මේ ලෝකයේ මුලින්ම ඇති වෙච්ච එක නොවෙයි. අපේ රට තුළත් ඉතිහාසයේදී ඇති වුණු විවිධාකාර, ඉතා බරපතළ නියං තත්ත්ව සම්බන්ධව වාර්තා වෙලා තිබෙනවා. විශේෂයෙන් බැමිණිතියා සාය කියන්නේ ක්‍රිස්තු පූර්ව ගණන්වල අපේ රට තුළ ඇති වුණු බරපතළ නියං තත්ත්වයක්. අපේ සිංහල සාහිත්‍ය ඇතුළේ මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් ලියූ ගම්පෙරළිය, කලියුගය වාගේ පොත්වලත්, ඩබ්ලිව්.ඒ. සිල්වා මැතිතුමා ලියපු "පිටිසර මිනිස්සු" නව කථා පොත තුළත්, කේ. ජයතිලකගේ "චරිත තුනක්" නව කථාව තුළත්, ඒ ඔක්කෝටම වඩා මම වැඩියෙන්ම කැමති ලෙනාර්ඩ් වුල්ෆ් ලියපු "The Village in the Jungle" කථාවේ සිංහල පරිවර්තනය වන "බැද්දේගම" පොතේ එන සිලිඳු, පුංචි මැණිකා හා හින්නි හාමිගේ ජීවිත හරහාත් ඒ කර්කශ ජීවිත සම්බන්ධව කියැවෙනවා. අපේ ඉතිහාසය පුරාම එවැනි කථා තිබෙනවා. ඒ නිසා මේක මේ අද ඇති වෙච්ච විශේෂ කාරණයක් නොවෙයි. මේ වාගේ නියං අපේ ඉතිහාසය පුරාම සිටි ජනතාව අත්විඳලා තිබෙනවා.

ඇත්තවශයෙන්ම වැස්ස ඇති වීමට කාරණා ගොඩක් බලපානවා. මේ දවස්වල ලංකාවට ඇති වී කාලගුණික තත්ත්වය සම්බන්ධව ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ ලෝකය පුරාම තිබෙන කාලගුණය සම්බන්ධ අනාවැකි පළ කරන විවිධ ආයතන විස්තර කරලා තිබෙනවා. ඒ අනුව ඇති වුණු එක තත්ත්වයක් තමයි එල් නිනෝ කියන තත්ත්වය. මේ දිනවල පැසිෆික් සාගරයේ උෂ්ණත්වය ඉහළ යෑම නිසා සුළං ප්‍රවාහවල වෙනස්වීම් සිදු වී තිබෙනවා. ඒ නිසා ඇති වන නියං තත්ත්වයක් ලංකාවට බලපානවා. ලංකාවට විතරක් නොවෙයි, දකුණු ආසියාවේ හැම රටකටම වාගේ ඒ තත්ත්වය බලපා තිබෙනවා. ඊට අමතරව මේ කාලයේම තමයි නිරිත දිග මෝසම් වැස්ස ක්‍රියාත්මක වන්නේත්. ඒකෙන් ලංකාවේ නිරිතදිග පළාත්වලට හොඳට වර්ෂාපතනය ලැබෙනවා. ඊට අමතරව, ඉන්දියන් සාගරයේ ඇති වී තිබෙන ද්වීකරණ තත්ත්වය, නැත්නම් Indian Ocean Dipole කියන තත්ත්වය නිසා මේ දිනවල ලංකාවේ දකුණු ප්‍රදේශයට වැස්ස වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා සමහර පළාත්වල නියං තත්ත්වයක් තිබුණත්, තෙත් කලාපයට අයත් විශේෂයෙන් මාතර, ගාල්ල, ගම්පහ, කෑගල්ල ආදි දිස්ත්‍රික්කවලත්, ඒ වාගේම හම්බන්තොට දිස්ත්‍රික්කයේ කොටසකත් අපට වැසි තත්ත්වයක් දකින්න ලැබෙනවා. නමුත් වියළි කලාපයේ ගොඩක් දිස්ත්‍රික්කවලට බලපා තිබෙන නියං තත්ත්වය නිසා ජල හිඟයක් ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන් පානීය ජලය සහ කෘෂිකාර්මික ජල පද්ධතිවලට ගැටලු ඇති වෙලා තිබෙනවා. මේ ගැටලු විසඳීම සඳහා රජය විධියට අප ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියන කාරණය පිළිබඳව අපේ ගරු ජල සම්පාදන ඇමතිතුමා හොඳ පැහැදිලි කිරීමක් කළා. ඒ වාගේම අපේ ආපදා කළමනාකරණ තත්ත්වය සහ ආපදා තත්ත්වයට අප මුහුණ දෙන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධව අපේ ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා හොඳ පැහැදිලි කිරීමක් කළා. ඊට අමතරව, අපේ ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා පැහැදිලි කළා, කෘෂි කර්මාන්තය පැත්තෙන් මේ නියං තත්ත්වයට මුහුණ දෙන්න අපේ රජය ක්‍රියාත්මක වන්නේ කොහොමද කියන කාරණය. ඉතින් මේ කාරණා ඔක්කෝම පොදුවේ ගත්තාට පසුව අපට තිබෙන ගැටලුව තමයි, මේ ජල ප්‍රශ්නය කෙටි කාලීනව විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවන එක.

2015 පැරිස් සම්මුතියේදී නිගමනය කර තිබෙනවා, 2030 වන කොට ගෝලීය උෂ්ණත්වය අංශක දෙකකින් පමණ ඉහළ යෑමට පුළුවන් බව. එසේ වුවහොත් ඉතාම බරපතළ ස්වාභාවික විපත්වලට, ස්වාභාවික ආපදාවලට මුහුණ දෙන්න අපට සිදු වෙනවා. අතීතයේ ස්වාභාවික විපත්ති සිදු වුණේ වර්ෂ 100කට සැරයක්, පරම්පරාවකට සැරයක් වාගේ ඉතා දිගු කාල පරතරයක් තියලායි. නමුත් ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑමත් එක්ක ඇති වන ස්වාභාවික විපත්වල, එහෙම නැත්නම් ආපදාවල තීව්‍රතාව වැඩි වෙලා තිබෙනවා. ඒ හේතුවෙන් එක විපත්තියක් ඇති වෙලා ඒක recover වෙන්න ඉස්සෙල්ලා තමයි තව විපත්තියක් ඇති වෙන්නේ. මේ නිසා අපි බරපතළ ගැටලුවලට මුහුණ දෙමින් සිටිනවා. පසුගිය අවුරුද්දේත් "දිට්වා" සුළි කුණාටුව නිසා අපේ පරිසරයේ බරපතළ විපර්යාසයක් ඇති වුණා. ඉතින්, පානීය ජල හිඟයක් ඇති වුණොත් බවුසර්වලින් වතුර බෙදලා, එහෙම නැත්නම් කෘෂි කර්මාන්තයේ පොඩි පොඩි වෙනස් කිරීම් කරලා කෙටි කාලීන විසඳුම් රජය විධියට ලබා දෙන්න අපට පුළුවන්

වුණත්, අපේ රටේ තීරණ ගන්නා ව්‍යවස්ථාදායකය විධියට අපි මීට වඩා බරපතළ අයුරින් මේ ප්‍රශ්නය සැලකිල්ලට ගන්න අවශ්‍යයි. මොකද, ඇත්ත වශයෙන්ම අප අද ගන්නා මේ තීරණ මත තමයි අපේ අනාගත පරම්පරාවට මේ රටේ ජීවත් වීමේ අයිතිය, ජීවත් වීමේ හැකියාව, ජීවත් වීමේ පහසුකම් කියන කාරණා තීරණය වන්නේ. අද අපට හඬක් තිබුණත්, මේ රටේ හඬක් නැති මිනිසුන්ගේ, එනම් වියළි කලාපයේ දුෂ්කර ප්‍රදේශවල ජීවත් වන මිනිසුන්ගේ, ඒ වාගේම කැලෑවල ජීවත් වන හඬක් නැති -තම ප්‍රශ්න කීමට නොහැකි- සතුන්ගේ පවා ජීවත් වීමේ අයිතිය තීරණය වන්නේ අප අද ගන්නා තීරණ මතයි. ඇත්ත වශයෙන්ම රජය විධියට අප මේ තීරණ ගන්නවා වාගේම අපේ පාර්ලිමේන්තු කණ්ඩායම, ශ්‍රී ලංකා දේශගුණය පිළිබඳ පාර්ලිමේන්තු සංසදය හැටියට පසුගිය වකවානුව පුරාම මේ සම්බන්ධව විවිධාකාර විද්‍යාඥයන් එක්ක සාකච්ඡා කරමින් එල් නිනෝ තත්ත්වය, මේ IOD තත්ත්වය සහ ලෝකයේ උෂ්ණත්වය ඉහළ යෑම නිසා ඇති වන පාරිසරික විපත් සම්බන්ධව සාකච්ඡා කළා; තවමත් සාකච්ඡා කරමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තෙන්ම ගත්තොත්, ජලය කියන්නේ දැන් ප්‍රධාන ප්‍රශ්නයක්. ලෝකයේ ජනාවාස බිහි වෙලා තිබෙන්නේම ජලය මූලික කර ගෙනයි. එක්කෝ ගංගා, එහෙම නැත්නම් වැස්ස මූලික කරගෙන තමයි ජනාවාස බිහි වෙලා තිබෙන්නේ. ඉතින් ඇත්ත වශයෙන්ම ජලය මිනිස් ජීවිතවල විතරක් නොවෙයි, සතුන්ගේ ජීවිතවලත් ඉරණම තීරණය කරන ප්‍රධාන සාධකය වනවා. අපි පුංචි කාලයේ ඇළවලින්, ගඟෙන් වතුර බොනවා අපට මතකයි. තවත් පහු වෙන කොට, අපේ තරුණ කාලය වෙද්දී ඇළවලින් එහෙම වතුර බොන්න බැරි වුණා. දැන් වන කොට සමහර ගංගාවලින් නාන්නත් බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එම නිසා අපට සිද්ධ වෙලා තිබෙන්නේ ටැප්වලින්, එහෙම නැත්නම් මුදල් ගෙවා ජලය ලබා ගන්නයි. අපි දැන් බෝතල් වතුර සල්ලි දීලා අරගෙනයි බොන්නේ. ඇත්ත වශයෙන්ම ඉදිරි කාලයේදී, එනම් තවත් අවුරුදු 10කට, 15කට පසුව අපේ පවුලේ budget share එකේ ලොකුම වියදම වතුර සඳහා වෙන්න පුළුවන්. ඒ නිසා ජල ප්‍රශ්නයට අපි මීට වඩා සාර්ථක උත්තර සොයන්න අවශ්‍යයි.

ඇත්තටම ගත්තොත්, අප විශාල වශයෙන් මහන්සි වුණත් මේකට උත්තරය සොයන්න අපට බැහැ. මොකද, මේක ගෝලීය ප්‍රශ්නයක්. ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑමට හේතු වන සාධකවලට අපි උත්තර සොයන්න අවශ්‍යයි. අප පමණක් නොවෙයි, උත්තර සොයන්න ඕනෑ. මොකද, ඇත්ත වශයෙන් අපි නොවෙයි මේකට ප්‍රධාන චූදිතයන් වන්නේ. චීනය, ඇමෙරිකාව වාගේ රටවල් විශාල ප්‍රමාණයක් කාබන්ඩයොක්සයිඩ් සහ හරිතාගාර වායු නිකුත් කරනවා. අපි නිකුත් කරන්නේ නොසැලකිය හැකි ප්‍රමාණයක්. ඒ කියන්නේ, සියයට දශම බිංදුවයි අටක් වාගේ ඉතා කුඩා ප්‍රමාණයක් තමයි අප නිකුත් කරන්නේ. හැබැයි, අප කුඩා ප්‍රමාණයකින් ඒ වායු නිකුත් කළාට ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම නිසා අපට වන හානිය, ස්වාභාවික විපත්වලින් අපට වන හානිය ඉතා වැඩියි. ඒ නිසා අපේ රටේ ජල ගැලීම්, නාය යෑම් වාගේ විශාල ස්වාභාවික විපත් ඇති වෙනවා. එම නිසා ඒකට උත්තර සොයන්න විශාල මුදලක් වැය කරන්න අපට සිද්ධ වෙනවා. අප නිකුත් කරන අවම කාබන් ප්‍රමාණය වෙනුවෙන් අපට ලැබිය යුතු පංගුව අපට ලැබෙන්න අවශ්‍යයි, ඉතා විශාල ප්‍රමාණයක් කාබන්ඩයොක්සයිඩ් පිට කරන දියුණු රටවලින්. එම නිසා කාබන් වෙළෙඳාම - carbon trading - කියන සංකල්පය හරහා අපි carbon creditsවලට අනුගත වෙලා සිටිනවා. අපි ඒ ගිවිසුම් ආදියට අත්සන් කරලා තිබෙනවා. මේ කාරණය ගැන දකුණු ආසියානු රටවල් විධියට අපි සටන් කරන්න අවශ්‍යයි. ඒ වාගේම පාර්ලිමේන්තුවේ පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව අපි හැමෝම සටන් කරන්න අවශ්‍යයි. මොකද, කාබන් අරමුදලින් - ඒ පාරිසරික අරමුදලින් - අපට හිමි පංගුව අපට තවම ලැබෙන්නේ නැහැ. අද අපට විපත්තියක් වුණාට පසුව දාන දෙනවා වාගේ charity විධියට තමයි ඒ මුදල් දෙන්නේ. එහෙම නොවෙයි, අපට හිමි පංගුවක් තිබෙනවා. ඒ පංගුව ලබා ගන්න අපි සටන් කළ යුතුයි. ඒ පංගුව අපට ලැබිය යුත්තේ අපේ වනාන්තරවලින් කාබන්ඩයොක්සයිඩ් උරා ගැනීම ආදිය වෙනුවෙන්. අපේ කර්මාන්තවලිනුත් කාබන්ඩයොක්සයිඩ් පිට කිරීම අවම කරන්න අපි විවිධාකාර උපාය මාර්ග පාවිච්චි කරනවා. අපි ජල විදුලිය තමයි වැඩියෙන් පරිභෝජනය කරන්නේ. ඒ විධියට අප විශාල වශයෙන් කාබන්ඩයොක්සයිඩ් පිට කිරීම අඩු කරලා, ඒ වාගේම කාබන්ඩයොක්සයිඩ් උරා ගන්නා විශාල උපක්‍රමවලට ගිහිල්ලා තිබුණත් ලෝකයේ විශාල වශයෙන් කාබන්ඩයොක්සයිඩ් මුක්ත කරන රටවලින් කාබන් අරමුදලේ අපට හිමි පංගුව අද අපට ලැබෙන්නේ නැහැ. ඒ පංගුව ලබා ගැනීම සඳහා දේශපාලන භේදයකින් තොරව පක්ෂ, විපක්ෂ හැමෝම එකතු වෙන්න ඕනෑ කියා මා යෝජනා කරනවා. ඒ සඳහා අපට සහයෝගය දක්වන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

සියලුදෙනාටම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.15]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் உள்ள ஊறணி பாலம் முதல் பொத்துவில் வரையான RDAக்குச் சொந்தமான வீதியின் அநேக இடங்கள் போக்குவரத்துச் செய்ய முடியாத அளவுக்கு மிகவும் பாதிக்கப்பட்டு, குன்றும் குழியுமாகக் காணப்படுகின்றது. இதனை விரைவில் புனரமைப்புச் செய்ய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். அத்துடன், P17 செங்காமம் அல்-மினா பாடசாலையின் மேற்குத் தார் வீதியானது மிகவும் மோசமாகப் பாதிக்கப்பட்டு போக்குவரத்துச் செய்ய முடியாமல் உள்ளது. P18 குடாக்கள்ளி வீதி, அல்-அப்சான் பாடசாலை வீதி, P5 மையவாடி வீதி, P7 நூரானியாப் பள்ளிவாசல் வீதி என்பனவும் மிகவும் மோசமான நிலைமையில் போக்குவரத்துச் செய்ய முடியாதுள்ளது. இவைகளைப் பிரதேச சபையினால் புனரமைக்க முடியாமல் உள்ளது. அதற்குக் காரணம் அவை நீளமான வீதிகளாக இருப்பதாகும். எனவே, அரசானது இவ்வீதிகளைப் புனரமைப்புச் செய்துதர வேண்டுமென்று மிகவும் அன்புடன் கேட்டுக் கொள்கின்றேன்.

இந்தப் பாராளுமன்றத்தில் அமைச்சர்கள், பிரதி அமைச்சர்கள் கிழக்கு மாகாணத்தில் உள்ள அரசியல்வாதிகள், அதிகாரிகள் நூற்றுக்கணக்கான ஏக்கர் காணிகளை களவாகப் பிடித்து வைத்திருக்கின்றார்கள் என்று அடிக்கடி கூறுகின்றார்கள். இந்த அரசானது அவ்வாறானவர்களின் பெயர் விபரங்களை இந்தச் சபையிலே தெரியப்படுத்தி, பிழையான முறையில் இவ்வாறு காணிகள் வழங்கப்பட்டிருந்தால், வழங்கிய அதிகாரிகள், உத்தியோகத்தர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுத்து,

[ගරු එම්.එස්. අබ්දුල් වාසිද් මහතා]

மீண்டும் அந்தக் காணிகளை அரச காணிகளாகப் பெற்றுக்கொள்ள முடியாதா? என்று இந்தச் சபையிலே கேட்கின்றேன். நான் சார்ந்த பொத்துவில் பிரதேசம் இதிலே மிகவும் முக்கியம் வாய்ந்ததாகக் காணப்படுகின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 1990ஆம் ஆண்டு யுத்தம் காரணமாகப் பாதிக்கப்பட்டு, இடம்பெயர்ந்த பொத்துவில் பிரதேச செயலாளர் பிரிவின் கனகர் கிராம மக்களின் 176 குடும்பங்களை மீளக்குடியமர்த்த அரச காணிகள் தயார்படுத்தப்பட்டு, சுமார் 76 பேருக்கு மாத்திரமே ஆவணங்கள் வழங்கப்பட்டு, வீடுகள் அமைக்கும் வேலைகள் ஆரம்பிக்கப்பட்டுள்ளன. ஏனைய 100 பேரையும் மிகவும் விரைவாக மீளத் தெரிவுசெய்து, மீளக்குடியமர்த்த ஆவன புரிய வேண்டும் என்பதுடன், இவர்களுக்கான அடிப்படை வசதிகளான மின்சாரம், போக்குவரத்து, குடிநீர் போன்றவற்றையும், யானைகளிடமிருந்து பாதுகாப்பும் வழங்க அரசு ஆவன புரிய வேண்டுமென்று இந்தச் சபையிலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

යුද්ධය කාලයේදී - 1990 ගණන්වල - සාමය ඇති කිරීමට රටට උදව් කළ විශේෂ කාර්ය බලකායේ නිලධාරින්ගේ උසස්වීම් පිළිබඳව මම මේ සභාවේ තුන් වතාවක් කථා කරලා තිබෙනවා. නමුත් මේ වනතුරු ඒ සම්බන්ධව මොන වගේ පියවරක් ගෙන තිබෙනවාද කියලා මා දන්නේම නැහැ. ගරු ඇමතිතුමනි, මේ ගැන හරියට සොයා බලා සුදුසුකම් ලබා ගත් STF නිලධාරින්ට උසස්වීම ලබා දීමට කටයුතු කරන්න කියලා මම ඉල්ලනවා. අනෙකුත් ආරක්ෂක අංශ නිලධාරින්ට ක්‍රමක්‍රමයෙන් උසස් වීම් ලබා දෙනවා නම් STF නිලධාරින්ට විතරක් ඒක වෙන්නේ නැත්තේ ඇයි කියලා මම අහන්න කැමතියි.

கடந்த கால வெள்ளம் காரணமாகப் பாதிக்கப்பட்ட பொத்துவில், அக்கரைப்பற்று, அட்டாளைச்சேனை, லகுகலை போன்ற பிரதேச செயலாளர் பிரிவுகளில், அம்பாறை அரசாங்க அதிபரின் உத்தரவின் பிரகாரம் உலர் உணவுகள் வழங்கப்பட்டன. எனினும், பாதிக்கப்பட்ட மக்களுக்கு வழங்கப்பட்ட இந்த உலர் உணவுக்கான கொடுப்பனவுகளை அதனை வழங்கிய நிறுவனங்கள் இன்னமும் பெற்றுக்கொள்ள முடியவில்லை. Rauff Traders, Majidhaz, MIMN Traders போன்ற வியாபார நிலையங்கள் முறையிட்டும் இதுவரையும் அந்தக் கொடுப்பனவுகள் வழங்கப்படவில்லை. பல தடவை நானும் இந்தப் பாராளுமன்றத்திலே பேசி, மாண்புமிகு ஜனாதிபதியிடத்தில் நேரில் எடுத்துக் கூறியிருந்தும்கூட, இன்றுவரை அவர்களுக்கான அந்தக் கொடுப்பனவு வழங்கப்படவில்லை. அரச ஊழியர்கள் தவறு செய்திருந்தால் அவர்களைத் தண்டித்து, குறிப்பிட்ட பொருட்களை வழங்கிய கடை உரிமையாளர்களுக்கு நிதியை வழங்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்று இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன்.

பொத்துவில் முதல் பெரிய நீலாவணை வரைக்கும் மீன்பிடித் தொழிலை மேற்கொள்ளும் மீனவர்களது நலன் கருதி, கல்முனையில் வானொலித் தொடர்பு மையம் ஒன்றினை அமைத்துக் கொடுக்க வேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன். இதன்மூலம் அப்பகுதி மீனவர்கள் நன்மையடைவார்கள். மேலும் அப்பகுதி மீனவர்களின் தேவை கருதி அப்பிராந்தியம் சார்பாகப் பொதுவான ஓர் இடத்தில் ice factory ஒன்று அமைக்கப்பட வேண்டும் என்பதுடன், மீனவர்கள் இடமாற்றப்படவுள்ள பொத்துவில் குடாக்கள்ளி எனும் இடத்தில் lighthouse ஒன்றை அமைக்க அரசானது நடவடிக்கைகளை எடுக்க வேண்டும் என்றும் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

2004ஆம் ஆண்டு ஏற்பட்ட சுனாமி அனர்த்தம் காரணமாகப் பாதிக்கப்பட்டு வீடுகளை இழந்த மக்களுக்காக அரசும், அரச சார்பற்ற நிறுவனங்களும் வீடுகளை அமைத்து வழங்கின. இதில் அரச நிலங்களில் அமைக்கப்பட்ட மாற்று வீடுகளுக்கான நில உரிமை ஆவணங்கள், உரிமப் பத்திரங்கள் இன்றுவரைக்கும் வழங்கப்படாமல் இருப்பது மக்களுக்குச் செய்யும் அநியாயமாகும். குறிப்பாக, பொத்துவிலில் செங்காமம், கோமாரி, சர்வோதயபுரம், ஜெய்க்கா, சங்கமன்கண்டி போன்ற இடங்களின் சுனாமிப் பாதிப்பாளர்களைக் குறிப்பிடலாம். இவ்வாறு பாதிக்கப்பட்டவர்களது நில உரிமப் பத்திரத்தை விரைவில் வழங்க அரசு நடவடிக்கை எடுக்க வேண்டும். மேலும், சவூதி அரசால் வழங்கப்பட்ட நுரைச்சோலை வீட்டுத் திட்டத்தை இன்றுவரை மக்களுக்கு வழங்க முடியாத நிலை இருக்கின்றது. எனவே, அதிலுள்ள தடைகளை நீக்கி, நீதிமன்ற நடவடிக்கைகளை மதித்து, புதிய அரசினது இரண்டாவது ஆண்டு நிறைவு வேளையிலாவது இந்த வீடுகளைப் பாதிக்கப்பட்டவர்களுக்கு வழங்க வேண்டும் எனக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இச்சபையில் பொத்துவில் மற்றும் அதனைச் சூழவுள்ள பிரதேச மாணவர்களின் கல்வி உரிமை மற்றும் எதிர்கால வாய்ப்புகளுடன் தொடர்புடைய மிகவும் முக்கியமான ஒரு விடயத்தை முன்வைக்க விரும்புகின்றேன். இலங்கையின் க.பொ.த உயர்தரக் கல்வியில் மாணவர்களுக்குப் பல்வேறு துறைகளில் கல்வியைத் தொடர்வதற்கான வாய்ப்புகள் வழங்கப்படுகின்றன. குறிப்பாக, உயர்தரத்தில் முக்கியமாக விஞ்ஞானப் பிரிவு, உயிரியல் விஞ்ஞானப் பிரிவு, வர்த்தகப் பிரிவு, கலைப் பிரிவு, தொழில்நுட்பப் பிரிவு ஆகிய ஐந்து கல்விப் பிரிவுகள் காணப்படுகின்றன. இந்த ஐந்து பிரிவுகளும் மாணவர்களின் வெவ்வேறு திறமைகள், ஆர்வங்கள் மற்றும் எதிர்கால இலக்குகளுக்கு ஏற்ப கல்வியைத் தெரிவுசெய்வதற்கான வாய்ப்பை வழங்குகின்றன. ஆனால், பொத்துவில் பிரதேசத்தில் இந்த ஐந்து பிரிவுகளில் நான்கு பிரிவுகள் மட்டுமே மாணவர்களுக்குக் கிடைக்கின்றன. தொழில்நுட்பப் பிரிவு இதுவரை அங்கு அறிமுகப்படுத்தப்படவில்லை. இதற்கு வளப் பற்றாக்குறை, போதுமான ஆய்வுகூட வசதிகள் இல்லாமை, உபகரணங்களின் பற்றாக்குறை மற்றும் தகுதியான ஆசிரியர்கள் இல்லாமை போன்ற முக்கிய காரணங்கள் குறிப்பிடப்படுகின்றன.

இலங்கையில் உயர்தர தொழில்நுட்பப் பிரிவு 2013ஆம் ஆண்டு அறிமுகப்படுத்தப்பட்டுத் தற்போது 13 ஆண்டுகள் கடந்துள்ள நிலையில், இன்று நாட்டின் பல பகுதிகளிலுமுள்ள மாணவர்கள் இந்தப் பிரிவைத் தெரிவுசெய்து கல்விகற்று வருகின்றனர். ஆனால், பொத்துவில் மாணவர்கள் மட்டும் இந்த வாய்ப்பை இன்னும் முழுமையாகப் பெறமுடியாத நிலை தொடர்கிறது. இது மிகவும் கவலைக்குரிய விடயமாகும். தொழில்நுட்பப் பிரிவு ஏன் முக்கியமானது என்றால், இன்றைய உலகம் தொழில்நுட்பத்தை அடிப்படையாகக் கொண்டதாக மாறியுள்ளது. செயற்கை நுண்ணறிவு, தகவல் தொழில்நுட்பம், மென்பொருள், பொறியியல், கட்டுமானத் தொழில்நுட்பம், விவசாயத் தொழில் நுட்பம், உற்பத்தி, ஆற்றல், இயந்திரவியல் மற்றும் பல புதிய துறைகள் வேகமாக வளர்ந்து வருகின்றன.

இந்தச் சூழ்நிலையில், எமது மாணவர்களுக்குப் புத்தக அறிவு மட்டுமல்லாமல், நடைமுறை அறிவு மற்றும் தொழில்நுட்பத் திறன்களும் அவசியமாகின்றன. தொழில்நுட்பப் பிரிவானது மாணவர்கள் தங்களுடைய கைகளால் தொழிற் பயிற்சிகளை மேற்கொள்வதன்மூலம் கற்றுக்கொள்ளவும் நடைமுறைப் பிரச்சினைகளுக்குத் தீர்வு காணவும் புதிய தொழில்நுட்பங்களைப் புரிந்துகொள்ளவும் எதிர்கால வேலைவாய்ப்புகளுக்கும் உயர் கல்விக்கும் தங்களைத் தயார்படுத்திக்கொள்ளவும் உதவுகிறது. ஆனால், பொத்துவில் மாணவர்களுக்கு இந்த வாய்ப்பு இல்லாததால், தொழில்நுட்பத் துறையில் ஆர்வமுள்ள மாணவர்கள் தங்களுடைய விருப்பத்திற்கேற்ப கல்வியைத் தொடர முடியாமல் போகின்றது. சில மாணவர்கள் வேறு நகரங்களுக்குச் செல்ல வேண்டிய நிலை ஏற்படுகிறது. பொருளாதார வசதியுள்ள குடும்பங்களுக்கு அது சாத்தியமாக இருக்கலாம். ஆனால், சாதாரண மற்றும் குறைந்த வருமானம் பெறும் குடும்பங்களைச் சேர்ந்த மாணவர்களுக்கு அது மிகவும் கடினமானது. ஒரு மாணவன் பொத்துவிலில் பிறந்ததற்காக அவனுடைய கல்வி வாய்ப்பு குறைக்கப்படக் கூடாது.

இதற்கு நான் அரசாங்கத்திடம் ஒரு நடைமுறை ரீதியான உடனடித் தீர்வையும் முன்வைக்க விரும்புகிறேன். தொழில்நுட்பப் பிரிவை முழுமையாக ஆரம்பிப்பதற்கு உட்கட்டமைப்பு, ஆய்வுகூடம் மற்றும் ஆசிரியர் பற்றாக்குறை போன்ற பிரச்சினைகள் இருந்தால், அந்தப் பிரச்சினைகள் தீரும் வரை மாணவர்களைக் காத்திருக்கச் செய்யக் கூடாது. குறைந்தபட்சம் ஆரம்பக் கட்டமாக, online மற்றும் டிஜிட்டல் முறையியல் தொழில்நுட்பப் பிரிவை பொத்துவில் தேசிய பாடசாலைகளில் அறிமுகப்படுத்த வேண்டும். இதற்காக online வகுப்புகளை நடத்தலாம். நாட்டின் வேறு பகுதிகளில் உள்ள தகுதியான ஆசிரியர்களின் சேவையை இணையத்தினூடாகப் பெறலாம். நேரடி video classes மற்றும் interactive classes நடத்தலாம். மாணவர்களுக்கு digital learning materials வழங்கலாம். Visual laboratory வசதிகளை உருவாக்கலாம். இணையத்தினூடாக simulation மற்றும் practical training வழங்கலாம். Digital library - e-library வசதிகளை ஏற்படுத்தலாம். மாணவர்களுக்குத் தேவையான software மற்றும் technology-based learning platforms வழங்கலாம். பின்னர் தேவையான நிதி மற்றும் வளங்கள் கிடைக்கும்போது முழுமையான physical laboratory வசதியை உருவாக்கலாம். ஆய்வுகூடம் இல்லை என்ற காரணத்தால் கல்வியை நிறுத்த வேண்டிய அவசியமில்லை. இன்றைய டிஜிட்டல் உலகில் virtual laboratory மூலமாகவும் மாணவர்களுக்கு பல நடைமுறை அனுபவங்களை வழங்க முடியும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්. අබ්දුල් වාසිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මට තව පොඩි වේලාවක් දෙන්න.

இதற்காக கல்வி அமைச்சு ஏற்கனவே நாட்டில் உள்ள பல்கலைக்கழகங்கள், தொழில்நுட்ப நிறுவனங்கள் மற்றும் திறமையான ஆசிரியர்களுடன் இணைந்து Central Online Technology Education Programme ஒன்றை உருவாக்கலாம். அதன்மூலம் பொத்துவிலில் மட்டுமன்றி, இதேபோன்ற வசதிகள் இல்லாத நாட்டின் ஏனைய பின்தங்கிய பிரதேச மாணவர்களுக்கும் தொழில்நுட்பக் கல்வியை வழங்க முடியும். எனவே, கௌரவ கல்வி அமைச்சரிடம் பின்வரும் கோரிக்கையை நான் முன்வைக்கிறேன்:

1. பொத்துவில் பிரதேசத்தில் தொழில்நுட்பப் பிரிவை அறிமுகப்படுத்துவதற்கான உடனடி ஆய்வை மேற்கொள்ள வேண்டும்.
2. குறைந்தபட்சம் ஒரு தேசிய பாடசாலையிலாவது இந்தப் பிரிவை ஆரம்பிக்க வேண்டும்.
3. முழுமையான physical facilities ஏற்படுத்தப்படும் வரை, online classes, virtual laboratory, digital library மற்றும் remote training வசதிகளை உடனடியாக ஆரம்பிக்க வேண்டும்.
4. தேவையான தகுதியான ஆசிரியர்களை நியமிப்பதற்கும் பயிற்சி வழங்குவதற்கும் நடவடிக்கை எடுக்க வேண்டும்.
5. தேவையான ஆய்வுகூடங்கள், கணினிகள், இணைய வசதிகள், மென்பொருட்கள் மற்றும் தொழில்நுட்ப உபகரணங்களுக்கு நிதி ஒதுக்க வேண்டும்.

நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇන්ටන් ජයකොඩි නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.23]

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කථා කරන්නේ එල් නිනෝ තත්ත්වය පිළිබඳවයි. රටක් හැටියට අපට එයින් ඇති වෙන ප්‍රබලතම ව්‍යසන හැටියට ගන්න වෙන්නේ ජල හිඟකම සහ ජල අතිරික්තයයි. ඇත්තටම ගත්තොත්, අපි මේ ගැන සලකා බලන්න ඕනෑ, දත්ත මත. එහිදී විශේෂයෙන්ම අපට වර්ෂාව ලැබෙන්නේ කොහොමද, නියං කාලයක් එන්නේ කොහොමද කියලා බලන්න ඕනෑ. අපේ රටට ලැබෙන ජල ප්‍රමාණය ගත්තොත්, මාර්තු සිට අප්‍රේල් දක්වා පවතින පළමු අන්තර් මෝසම් කාලසීමාවේ සමස්ත වර්ෂාපතනයෙන් සියයට 14ක ප්‍රමාණයක්ද, මැයි සිට සැප්තැම්බර් දක්වා පවතින නිරිතදිග මෝසම් කාලසීමාවේ සියයට 30ක ප්‍රමාණයක් ද ලැබෙනවා. ඒ වාගේම ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වා වන දෙවන අන්තර් මෝසමෙන් සියයට 30ක සහ ඊශානදිග මෝසමෙන් සියයට 26ක වර්ෂාපතනයක් ලැබෙනවා. විශේෂයෙන්ම එල් නිනෝ තත්ත්වය ගැන සාකච්ඡා කිරීමේදී මාස් පතා ලැබෙන වර්ෂාපතන රටාව පිළිබඳ නිවැරදිව අධ්‍යයනය කිරීම ඉතාම වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ වියළි කලාපය ගත්තොත්, වියළි කලාපයට අඩුම ජල ප්‍රමාණයක් ලැබෙන්නේ ජූලි-සැප්තැම්බර් සහ පෙබරවාරි-අප්‍රේල් මාසවලදීයි. විශේෂයෙන්ම ගත්තොත්, වසරේ මාස හතක් වාගේ කාලයක් ඇතුළත වියළි කලාපයට සමස්ත ජල ප්‍රමාණයෙන් සියයට 25යි ලැබෙන්නේ. මෙම කලාපයට වැඩිම ජල ප්‍රමාණයක් ලැබෙන්නේ මැයි සහ ඔක්තෝබර් සිට ජනවාරි දක්වා වූ කාලසීමාව තුළ. ඒ කාලය තුළ සියයට 75කට ආසන්න ජල ප්‍රමාණයක් ලැබෙනවා.

[ගරු ඇන්ටන් ජයකොඩි මහතා]

තෙත් කලාපය ගත්තොත්, අවම ජල ප්‍රමාණයක් ලැබෙන්නේ දෙසැම්බර් සිට මාර්තු දක්වා සහ අගෝස්තු යන මාස 5 තුළ. ඒ කාලය තුළ සියයට 25ක ජල ප්‍රමාණයක් ලැබෙනවා. ඒ වාගේම අප්‍රේල්, මැයි, ජුනි, ජූලි, සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් කියන මාස හතක කාලය තුළ සියයට 75ක ජල ප්‍රමාණයක් ලැබෙනවා. මේ තත්ත්වය අපි සලකා බැලුවොත්, මේ වනවිට විශේෂයෙන්ම වියළි කලාපය ආශ්‍රිතව දිස්ත්‍රික්ක ගණනාවක ජනතාව ජල හිඟයේ ගැටලුවට මුහුණ පාලා තිබෙනවා. ඇත්තටම ගත්තොත්, මේක සාමාන්‍යයෙන් අපේ රටට ජල හිඟකම එන කාලයක්, කුඩා වැව් හිඳෙන කාලයක්. ඒ නිසා ඇත්තටම මේක එල්-නිනෝ තත්ත්වයක වර්ධනයක්ම නොවෙයි. නමුත්, අපි පුරෝකථනය කරනවා මේ ආශ්‍රිතව එල් නිනෝ තත්ත්වයක් ගොඩනැඟෙන්න පුළුවන් කියලා.

ඒ වාගේම, අනෙක් පැත්තෙන් ඉදිරියට එන ඊශානදිග අන්තර් මෝසමත් සමඟ ලැබෙන වර්ෂාපතනය හේතුවෙන් සාමාන්‍ය ජල ගැලීම් ප්‍රමාණයක් ඇති වෙනවා. එල් නිනෝ තත්ත්වයත් එක්ක මේ තත්ත්වය තව ප්‍රමාණයකින් තීව්‍ර වෙන්න පුළුවන්. තෙත් කලාපයට ලබන අවුරුද්දේ, විශේෂයෙන්ම දෙසැම්බර් මුල ඉඳලා මාර්තු, අප්‍රේල් වෙනතෙක් ජල හිඟයක් තිබෙනවා. එල් නිනෝ තත්ත්වය නිසා ඒක තව ප්‍රමාණයක් තීව්‍ර වෙන්න පුළුවන්. ඒ පුරෝකථනය තමයි තිබෙන්නේ. ඒ නිසා රටක් හැටියට අපි මේ තත්ත්වයට මුහුණ දෙන්නේ කොහොමද කියලා අවධානය යොමු කළ යුතු වෙනවා. මේකට සාර්ථකව මුහුණ දෙන්න ගරු ජනාධිපතිතුමා ඇතුළු අපේ ආණ්ඩුව අවශ්‍ය කටයුතු සූදානම් කරමින් යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම කියන්න කැමතියි, අපි පරිසර අමාත්‍යාංශය විධියට මේ වෙනුවෙන් මොනවාද කරලා තිබෙන්නේ කියන එක. පරිසර අමාත්‍යාංශය විධියට අපට මෙම ගැටලුවට ආකාර දෙකකින් මුහුණ දෙන්න වෙනවා. පළමුව, ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම නිසා ඇති වෙන දේශගුණික විපර්යාසවලට මුහුණ දීමට සිදු වෙනවා. දෙවනුව, එල් නිනෝ තත්ත්වය නිසා නරකම තැනකට අපට මුහුණ පාන්න සිදු වුණොත් ඒ වෙනුවෙන් කෙටි කාලීනව අපි මොනවාද සිද්ධ කරන්නේ කියන කාරණයට මුහුණ දෙන්න වෙනවා. දේශගුණික විපර්යාසවලට මුහුණ දීම සඳහා අපි ජල සම්පත් මණ්ඩලය සමඟ එකතු වෙලා ජලධර - aquifers - සංරක්ෂණය කර ගැනීම සඳහා දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් සකසා එය ක්‍රියාත්මක කරමින් යනවා. ජලය ලබා ගැනීම වෙනුවෙනුත්, ජලධර සුපෝෂණය කිරීම වෙනුවෙනුත් අපි දැනට අනාරක්ෂිතව තිබෙන වනාන්තර ප්‍රමාණයක් රක්ෂිත බවට පරිවර්තනය කරනවා. අපි ඒ කටයුත්ත තවත් ඉස්සරහට තීව්‍ර කරමින් යනවා, විශේෂයෙන්ම මේ පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම සහ ජල චක්‍රය ආරක්ෂා කර ගැනීම සඳහා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කියන්න සතුටුයි, අක්කරවලින් ගත්තොත්, අක්කර 160,000කට වැඩි වනාන්තර ප්‍රමාණයක් අපි මේ වෙනකොට රක්ෂිත බවට ප්‍රකාශයට පත් කරලා තිබෙන බව. කෙටි කාලීන වැඩ හැටියට ගත්තොත්, අතහැරලා දාපු නළ ළිං අපි ජල සම්පත් මණ්ඩලය හරහා මේ වෙනකොට සුද්ධ කරමින් යනවා. ඒවායේ capacity එක, yield එක වැඩි කර ගැනීම සඳහා ඒවා සුද්ධ කරලා ස්ථාපනය කරන්න අපි ක්‍රියාත්මක වෙමින් සිටිනවා. අද වන විටත් - පසුගිය ටිකේමත් - කුරුණෑගල දිස්ත්‍රික්කයේ එවැනි විශාල වැඩ කොටසක් ඉෂ්ට කරමින් පවතිනවා. රට පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාවල ඉල්ලීම් මත එවැනි දේවල් සිද්ධ කරමින් යනවා. ඒ වාගේම, අලුතින් නළ ළිං ඉදි කිරීම සඳහා අවශ්‍ය locations ලබා දීම සඳහාත් කටයුතු කරනවා. විශේෂයෙන් දුෂ්කර තත්ත්වයක් උදා වුණොත් පානීය ජලය ලබා දීම සඳහා නළ ළිං ඉදි කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතිනවා.

ඊළඟට, යාල ජාතික වනෝද්‍යානයේ සතුන්ට වතුර නැති වෙයි කියලා මාතෘකාවක් එළියට එනවා, විශේෂයෙන්ම සමාජ මාධ්‍ය ඔස්සේ ඒක බරපතළ ලෙස එනවා. හැබැයි, මේ වනතුරු යාල ජාතික වනෝද්‍යානය එහෙම නරකම තැනකට යොමු වෙලා නැහැ. කොහොම වුණත්, සත්වයන්ගේ පැවැත්ම සඳහා අපි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා සිමෙන්ති සහ කොන්ක්‍රීට්වලින් ඉදි කරන ලද pondsවලට වතුර පුරවමින් යනවා. ඒ වාගේම ස්වාභාවිකව නිර්මාණය වෙලා තිබෙන pondsවලට වතුර දමමින් යනවා. ගංගා ආශ්‍රිතව, solar panels මාර්ගයෙන් ජලය පොම්ප කරමින් යනවා. ඒ වාගේම අනෙක් පැත්තෙන්, බවුසර් මඟින් ජලය ලබා දීමේ කටයුතු සිද්ධ කරමින් යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යාල වාගේ වනාන්තරයක් ගත්තොත්, එහි තිබෙන හැම පරිසර පද්ධතියකටම ජලය ලබා දීමේ හැකියාවක් අපට නැහැ. අපි කරන්නේ, සත්වයන්ගේ පැවැත්ම වෙනුවෙන් අවශ්‍ය කරන ජල ප්‍රමාණය ලබා දෙන එකයි. ඊට අමතරව මින්නේරිය, කවුඩුල්ල සහ අනෙකුත් ප්‍රදේශවල එවැනි තත්ත්වයක් නැහැ. මේ දක්වා ඉතිහාසය ගත්තොත්, අපට ජලය ලබා දීමට අවශ්‍ය කරන එවැනි වටපිටාවක් නිර්මාණය වෙලා නැහැ. මොකද, මින්නේරිය වාගේ තැන්වල බින්දුවටම වතුර සිඳිලා නැහැ. කවුඩුල්ල වාගේ තැන්වලත් එහෙමයි. එතකොට සතුන්ගේ පැවැත්මට - survival එකට - ඒ ජල ප්‍රමාණය ලබා ගැනීමේ හැකියාව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යාල වාගේ ප්‍රදේශයක් ගත්තොත්, සාමාන්‍යයෙන් ජලය හිඟකම නිසා ඇතැම් කාලවලදී - සැප්තැම්බර් මාසයේදී - යාල වනෝද්‍යානය වසා දමා තිබෙනවා. මොකද, සතුන්ට ඇති වන stress එක අවම කර ගැනීම සඳහා. නමුත්, පසුගිය කාලයේ එවැනි තත්ත්වයක් වාර්තා වුණේ නැහැ, දිගටම යාල ජාතික වනෝද්‍යානය විවෘතව තිබුණා. හැබැයි, මීට දශක ගණනාවකට පෙර සම්ප්‍රදායක් විධියටම සැප්තැම්බර් මාසයේදී යාල ජාතික වනෝද්‍යානය වහලා තිබුණා. නමුත්, අපිට දැන් ඒක කරන්න බැහැ. මොකද, සංචාරක කර්මාන්තය ගොඩක් ඉහළට ඇවිල්ලා තිබෙනවා. අපි ඒක වහනවා නම්, මාස තුනකට විතර කලින් දැනුම් දෙන්න ඕනෑ. නමුත්, අපිට දැන් මෙවැනි තත්ත්වයක් යටතේ ඒක සිදු කර ගැනීම අමාරුයි. මොකද, මාස තුනකට කලින් ඒක පුරෝකථනය කර ගැනීමේ අපහසුවක් අපට තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)

මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද මේ එල් නිනෝ තත්ත්වය පිළිබඳව යම් කිසි අතිශයෝක්තියකින් ප්‍රචාරය කරලා තිබෙනවා. හැබැයි, අපි එල් නිනෝ තත්ත්වය අවතක්සේරු කරන්නේත් නැහැ. එල් නිනෝ තත්ත්වයෙන් අපිට නරකම දේ සිද්ධ වුණත්, ඒ නරකම දේවල් සඳහා මුහුණ දීමට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ රජය සකසමින් යනවා. අපිට ඒක හරියටම කියන්න බැරි, අපේ රට දූපතක් වීම

නිසා අපේ කාලගුණික විපර්යාස අපට predict කරන්න බැරිවීම. පානීය ජලය, කර්මාන්ත සඳහා අවශ්‍ය කරන ජලය සහ කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය කරන ජලය සම්බන්ධයෙන් තමයි අපිට බලපෑම එන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි කෘෂි කර්මාන්තය සඳහා තමයි සියයට 88ක් පමණ ජලය පාවිච්චි කරන්නේ. ආණ්ඩු පක්ෂයෙන් සිදු කරනු ලබන සාකච්ඡාවලදී ඒකට අවශ්‍ය කරන පිළියම් අපි දැක්කා. ඒ වාගේම ආහාර සුරක්ෂිතතාව වෙනුවෙනුත් අවශ්‍ය වැඩ පිළිවෙළ ගරු ඇමතිතුමා සහ ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කළා. අපි රජයක් විධියට ජනාධිපතිතුමාගේ උපදෙස් මත - ජනාධිපතිතුමා මේ වෙනුවෙන් විශාල දායකත්වයක් සපයනවා - මේ එල් නිනෝ තත්ත්වය මත ඇති විය හැකි, ඇති වෙන්න පුළුවන් කියලා අනුමාන කරන නරකම තත්ත්වයට මුහුණ දීමට අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2026 සැප්තැම්බර් 08වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2026 செப்ரெம்பர் 08, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Tuesday, 08th September, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.